# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2023



රුහුණ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

றுஹுணு பல்கலைக்கழகம்
இலங்கை

University of Ruhuna
Sri Lanka

මාතර, ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව

# 2023

**රුහුණ විශ්වවිද්‍යාලය**

**මාතර, ශ්‍රී ලංකාව**

රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරනු ලැබූ සම්මත ආකෘති අනුගමනය කරමින් පිළියෙළ කරනු ලැබීය. මෙම වාර්තාව විශ්වවිද්‍යාලය සහ එහි පීඨ, අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන හා ඒකක පිළිබඳ තොරතුරු හා දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි.

# විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර

## *දැක්ම*

දැයේ ප්‍රමුඛතම බුද්ධිමය කේන්ද්‍රස්ථානය බවට පත්වීම

## *මෙහෙවර*

ඉගැන්වීම්, පර්යේෂණ සහ සේවා මගින් සමාජයට සේවය කිරීම පිණිස දැනුම හා කුසලතා වර්ධනය කිරීම

# උපකුලපතිතුමන්ගේ පණිවුඩය



මැනවින් සංවිධිත උපාය මාර්ග සමගින් අභියෝගවලට මුහුණ දීම මගින් සාර්ථකව සිය කාර්යයන් ඉටු කිරීමට 2023 වසරේදී රුහුණ විශ්වවිද්‍යාලය සමත් විය. 2023 වර්ෂය 2019.01.01 සිට 2023.12.31 දක්වා වූ අපගේ පස් අවුරුදු සංයුක්ත සැලැස්මේ පස්වන වසරයි.

වර්ෂය තුළදී අන්තර්ජාතික සම්මන්ත්‍රණ/සම්මේලන තුනකට සත්කාරකත්වය ලබා දීමට විශ්වවිද්‍යාලයට හැකි විය. සැසි හයකින් සමන්විත වූ රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් 14 සහ 15 ලෙස දෙදිනක් තුළ පැවැත්වූ අතර උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිලාභීන් 2581 දෙනෙකුට උපාධි පිරි නැමීය.

රුහුණ විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් පවත්වනු ලබන ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය සඳහා වූ වැඩසටහන් සමාලෝචනයේ දී ලකුණු 100 න් 90 ක් ලබා ගනිමින් “ඒ” ශ්‍රේණිය හිමි කර ගන්නා ලදී. මෙය අධ්‍යයන වැඩසටහන සඳහා "ඉතා හොඳයි" මට්ටමේ කාර්ය සාධනයක් සේ සැලකේ.

සමුද්‍රීය ඉංජිනේරු හා නාවුක වාස්තු විද්‍යා විශේෂීකරණ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන, ඒ අකාරයේ පළමු උපාධි වැඩසටහන වන අතර සමුද්‍රීය ඉංජිනේරු සහ නාවුක වාස්තු විද්‍යාව සඳහා වෙනම අධ්‍යයනාංශයක් 2023 නොවැම්බර් මස ගැසට් කරන ලදී.

ජාත්‍යන්තර වෙබ්මිතික ශ්‍රේණිගත කිරීමේදී ජාතික මට්ටමින් සිව්වැනි ස්ථානය හිමිකර ගැනීමට රුහුණ විශ්වවිද්‍යාලයට හැකි විය. නිර්මාණශීලී ක්ෂේත්‍රයන්හි සහ ක්‍රීඩා කටයුතුවලදී රුහුණ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් හා ශිෂ්‍යයින් යන දෙපිරිසම බොහෝ ජයග්‍රහණ අත්කර ගන්නා ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ශිෂ්‍යාවක් 5 වැනි විවෘත ඉන්දියානු පැරා මලල ක්‍රීඩා ජාත්‍යන්තර ශූරතාවලිය -2023 සඳහා සහභාගිවීමට සුදුසුකම් ලැබූ අතර, එහිදී ඇය කාන්තා මීටර 100 ඉසව්වේ රිදී පදක්කම හිමි කර ගත්තාය.

රුහුණ විශ්වවිද්‍යාලය ජපානයේ කනසාවා, කගාවා සහ සයිටාමා විශ්වවිද්‍යාල, තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනය හා තම්මාසට් විශ්වවිද්‍යාලය, රුමේනියාවේ බ්‍රසොව් හි ට්‍රාන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය, චීනයේ චීන විද්‍යා ආයතනය හා චීන කෘෂිකර්ම විද්‍යා ආයතනය, නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලය, ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් රාජ්‍ය විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ විද්‍යා සහ තාක්ෂණය පිළිබඳ කොචින් විශ්වවිද්‍යාලය සමග සාර්ථක ගෝලීය හවුල්කාරීත්ව ස්ථාපිත කර ගන්නා ලදී.

2024 වසරේදී විශ්වවිද්‍යාලයේ නව පරිච්ඡේදයක් ආරම්භ කරනු පිණිස 2023 වසරේ අත්දැකීම් සුපරික්ෂාකාරීව විශ්ලේෂණය කිරීම වැදගත් වේ. සිය ආරම්භයේ සිට වසර 45 ක අත්දැකීම් සහිත රුහුණ විශ්වවිද්‍යාලය මේ වන විට ශ්‍රී ලංකාවේ මැනවින් ස්ථාපිත පරිණත විශ්වවිද්‍යාලයක් බවට පත්ව තිබේ. කෙසේ වෙතත්, ශාස්ත්‍රීය සාධනය සඳහා සැබවින්ම ප්‍රබෝධජනක පරිසරයක් නිර්මාණය කිරීමට හා ගුණාත්මක උසස් ඉගෙනුමක් කරා ප්‍රවේශය පුළුල් කිරීමට තවත් බොහෝ දෑ කළ යුතු බව මෙහි ලා සටහන් කළ යුතුය.

තවද ජාත්‍යන්තර කීර්තිධර විශ්වවිද්‍යාලයක් ලෙස අප නැගී සිටීමට නම්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අභිවර්ධනය පිණිස සියලු කාර්යමණ්ඩල සාමාජිකයන් විශිෂ්ඨ දායකත්වයක් ලබා දීම අවශ්‍ය වන අතර, එමගින් 2024 වසරේදී වඩ වඩාත් ජාත්‍යන්තර කීර්තියට පත්වීමට හැකි වනු ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන
උප කුලපති
රුහුණ විශ්වවිද්‍යාලය

## පටුන

**කොටස I– සාමාන්‍ය තොරතුරු**

රුහුණ විශ්වවිද්‍යාලය පිළිබඳ හැඳින්වීමක් 1
රුහුණ විශ්වවිද්‍යාලය පිළිබඳ සැකෙවින් 2
විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය 3
පාලන අධිකාරිය
විශ්වවිද්‍යාලයේ පාලක සභාව 4
විශ්වවිද්‍යාලයේ සනාතන සභාව 5

**කොටස II – සුවිශේෂ සංවර්ධන කාර්යයන්**

රුහුණ විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්ම 2019 - 2023 10
ආයතනික ඉලක්කවල ප්‍රගතිය 11
2023 වසරේ සුවිශේෂී සිදුවීම් 23
ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සමග රුහුණ විශ්වවිද්‍යාලයීය ඉලක්ක ගැලපුම 24
තිරසාර සංවර්ධනය මත පාදක අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව 27

**කොටස III – සංඛ්‍යාලේඛන (කාර්යමණ්ඩල තොරතුරු)**

අනුමත සේවක සංඛ්‍යාව හා වත්මන් කාර්යමණ්ඩලය (සමස්ත කාර්යමණ්ඩලය) 30
සේවක වර්ගීකරණය 31
මුළු කාර්ය මණ්ඩලය 35
බඳවා ගැනීම්/ විශ්‍රාම යාම් 36

**කොටස IV – සංඛ්‍යාලේඛන (ශිෂ්‍ය තොරතුරු)**

ශිෂ්‍ය පැතිකඩ 37
ශිෂ්‍ය ජනගහණය 37
ශිෂ්‍ය ව්‍යාප්තිය 38
සපයනු ලැබූ නවාතැන් පහසුකම් 43
නවාතැන් පහසුකම් - පීඨ අනුව 43
මූල්‍ය ආධාර 45
ශිෂ්‍ය සංගම් හා සමිති 46
සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය 47

**කොටස V – ප්‍රාග්ධන ප්‍රදානයේ අරමුදල් බෙදී යාම**

ප්‍රාග්ධන වියදම 54
සිදුකරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 54
නිමා කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 55

**කොටස VI – පීඨ වාර්තා**


| | |
|---|---|
| කෘෂිකර්ම පීඨය | 56 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 58 |
| ඉංජිනේරු පීඨය | 61 |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | 69 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 71 |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 73 |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | 80 |
| වෛද්‍ය පීඨය | 83 |
| විද්‍යා පීඨය | 85 |
| තාක්ෂණ පීඨය | 88 |


**කොටස VII – සම්මාන සහ විශේෂ උත්සව**


| | |
|---|---|
| ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ සමුළු | 90 |
| ජාතික සහ ජාත්‍යන්තර සම්මාන | 97 |
| ජාත්‍යන්තර සහයෝගිතා | 102 |
| අනෙකුත් විශේෂ සිදුවීම් | 107 |


**කොටස VIII – පුස්තකාලය**


| | |
|---|---|
| පුස්තකාල සමාලෝචනය | 113 |


**කොටස IX – සුබසාධන සේවා**


| | |
|---|---|
| වෛද්‍ය මධ්‍යස්ථානය | 116 |
| ශාරීරික අධ්‍යාපන අංශය | 118 |


**කොටස X – ඒකක/ මධ්‍යස්ථාන වාර්තාව**


| | |
|---|---|
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | 120 |
| ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය | 123 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය | 126 |
| තත්ත්ව ආරක්ෂණ ඒකකය | 130 |
| නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය (CMLC) | 132 |
| සංස්කෘතික මධ්‍යස්ථානය | 134 |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | 137 |
| සමාජීය ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය (SCR) | 138 |


**කොටස XI – සහායක සේවා**


| | |
|---|---|
| සාමාන්‍ය පරිපාලන අංශය | 139 |
| නෛතික හා ප්‍රලේඛන කටයුතු | 139 |

**කොටස XII – මූල්‍ය ප්‍රකාශන**


| | |
|---|---|
| ගණන් දීමේ නිලධාරියාගේ සහතිකය | 141 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 142 |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය | 144 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 146 |
| අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය | 148 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 150 |


**කොටස XIII – විගණකාධිපතිගේ වාර්තාව සහ පිළිතුරු**


| | |
|---|---|
| විගණකාධිපතිගේ වාර්තාව | 171 |
| විගණකාධිපතිගේ වාර්තාව සඳහා පිළිතුරු | 179 |

# කොටස I

# සාමාන්‍ය තොරතුරු

# රුහුණ විශ්වවිද්‍යාලය පිළිබඳ හැඳින්වීමක්



රුහුණ විශ්වවිද්‍යාලයේ මූලාරම්භය වූ රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය එවකට අග්‍රාමාත්‍යව සිටි ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් 1978 අගෝස්තු මස 27 වන දින විවෘත කරනු ලැබිය. ආරම්භයේදී, කෘෂිකර්ම, විද්‍යා, වෛද්‍ය සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ ඇතුළුව එහි ප්‍රාරම්භක පීඨ ආරම්භයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය සහ කැළණිය විශ්වවිද්‍යාලය වැනි ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලවලට අනුයුක්තව පැවැතුණි.

රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය වසර හයකට වැඩි කාලයක් මාතර, මැද්දවත්ත, කාර්මික විද්‍යාල පරිශ්‍රයෙහි පවත්වාගෙන යනු ලැබිය. 1984 පෙබරවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කරනු ලැබීමෙන් අනතුරුව මාතර වැල්ලමඩමෙහි ඉන්දීය සාගරයට මුහුණ ලා පිහිටි රමණීය කඳු ගැටයක අග්‍රගණ්‍ය ගෘහ නිර්මාණාත්මක සංකීර්ණයක එය නිල වශයෙන් ස්ථාපිත කරනු ලැබිය.

රුහුණ විශ්වවිද්‍යාලයේ ව්‍යාප්තියත් සමගින් වෙනත් පරිශ්‍රයන් කිහිපයක විවිධ පීඨ ස්ථාපනය කරනු ලැබිය. කෘෂිකර්ම පීඨය කඹුරුපිටිය මාපලානේ ස්ථාපිත කර තිබේ. වෛද්‍ය පීඨය ගාල්ල කරාපිටියේ පිහිටා ඇති අතර අනෙක් පීඨ දෙක එනම් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය සහ විද්‍යා පීඨය මාතර වැල්ලමඩම පරිශ්‍රයේ පිහිටා ඇත.

පසුව එළැඹි වසරවල දී තවත් පීඨ හයක් ස්ථාපිත කරනු ලැබිය. ඉංජිනේරු පීඨය 1999 වසරේ ගාල්ලේදී ස්ථාපනය කරනු ලැබූ අතර කළමනාකරණ හා මූල්‍ය පීඨය වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ ස්ථාපිත කරනු ලැබූයේ 2003 වසරේදීය. තවද, ප්‍රධාන පරිශ්‍රය තුළම ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය 2005 වසරේදී පිහිටවූ අතර එය දිවයිනේ සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුළම එම විෂය ක්ෂේත්‍රය සඳහා පීඨයක් ඇති කළ පළමු අවස්ථාව විය. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ආරම්භ කරනු ලැබූයේ 2011 වසරේදීය. මෑතකාලීනව රුහුණ විශ්වවිද්‍යාලයට එක් කළ පීඨ වනුයේ 2016 වසරේ කඹුරුපිටියේ ස්ථාපිත තාක්ෂණ පීඨය සහ 2017 වසරේ කරාපිටියේ ස්ථාපිත කල සම සෞඛ්‍ය විද්‍යා පීඨයයි.

අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් 14,985 දෙනෙක්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් 2,277 දෙනෙක් සහ ආචාර්යවරුන් 608 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යයන කාර්යමණ්ඩලයක් සහිත රුහුණ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතන අතුරින් එකකි. පීඨ දහයකින් සමන්විත එය ශ්‍රී ලංකාවේ වඩාත්ම විවිධාංගීකෘත විශ්වවිද්‍යාලය වන අතර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව දිවයිනේ දෙවන විශාලතම විශ්වවිද්‍යාලයයි. වෙබ්මිතික ශ්‍රේණිගතකිරීම අනුව රුහුණ විශ්වවිද්‍යාලය 2023 වසරේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අතර පස්වැනි ස්ථානයේද ලෝක විශ්වවිද්‍යාල අතර 2336 වන ස්ථානයේද ශ්‍රේණිගත කර තිබුණි.

# රුහුණ විශ්වවිද්‍යාලය සැකෙවින්

**10**
පීඨ

**59**
අධ්‍යයනාංශ

**17**
අංශ

**14**
මධ්‍යස්ථාන/ඒකක

**14985**
උපාධි අපේක්ෂකයන්

**2277**
පශ්චාත් උපාධිලාභීන්

**608**
අධ්‍යයන කාර්ය මණ්ඩලය

**40**
පරිපාලන, මූල්‍ය සහ අනෙකුත් විධායක නිලධාරීන්

**60**
අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

**797**
අනධ්‍යන කාර්ය මණ්ඩලය

# විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය



# පාලන අධිකාරිය

**රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති** –පූජ්‍ය ආචාර්ය අකුරැටියේ නන්ද නායක හිමි

## විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය

විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලය එහි විධායක සභාව සහ පාලන අධිකාරිය වන්නේය. 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වන වගන්තියෙන් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වන වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාලයේ පාලක සභාව 2023 වසර තුළ පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**උපකුලපති** - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා

**නියෝජ්‍ය උපකුලපති** - මහාචාර්ය ඊ.පී.එස්. චන්ද්‍රන මහතා

**පීඨයන්හි පීඨාධිපතිවරු**

| | |
|---|---|
| කෘෂිකර්ම පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඩී. වන්නිආරච්චි මහතා |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය කේ.ජී.ඉමේන්ද්‍ර මහතා |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය එච්. චිත්‍රාල් අඹවත්ත මහතා |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | මහාචාර්ය එච්.බී. අසාන්ති මිය<br>මහාචාර්ය කේ.එච්.එම්.ඒ. දීපානන්ද මහතා (පෙබරවාරි මස සිට) |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.පී. ජයතිස්ස මහතා<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩී.ඒ.එල්. ලීලාමනී මිය (අප්‍රේල් මස සිට වැඩ බලන පීඨාධිපති) |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | මහාචාර්ය උපාලි පන්නිලගේ මහතා |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | මහාචාර්ය පී.ඒ.පී.එස්. කුමාර මහතා |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය අයි.වී. දේවසිරි මහතා |
| විද්‍යා පීඨය | මහාචාර්ය පී.ඒ. ජයන්ත මහතා<br>මහාචාර්ය ඩී.එච්.එන්. මුණසිංහ මිය (ජූලි සිට) |
| තාක්ෂණ පීඨය | ආචාර්ය කේ.ජී.එස්.එච්. ගුණවර්ධන මහතා |

**පත්කළ සාමාජිකයන්**

| | |
|---|---|
| පූජ්‍ය බඹරන්දේ අමරවංශ හිමි | අද්මිරාල් ටී.එස්.ජී සමරසිංහ මහතා |
| සම්මානිත මහාචාර්ය චන්ද්‍රානි ලියනගේ මිය | ඉස්තිහාර් සුහියන් මහතා |
| සුදත් ජයසේකර මහතා | යූ.ජී.ඩී. චානක කාරියවසම් මහතා |
| කේ.එන්. සමරසිංහ මහතා | සරත් සිරිවර්ධන මහතා |
| ආර්.සී. ද සොයිසා මහතා | කපිල මනම්පේරි මහතා |
| තුසිත පී. වනිගසිංහ මහතා | සුමේධ කුලතුංග මහතා |

| | |
|---|---|
| සනාතන සභාවේ නාමිතයන් | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. සුබසිංහ මහතා<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වජිර බුළුගහපිටිය මිය |
| **ලේඛාධිකාරී (නිල බලයෙන් ලේකම්)** | පී.එස්. කළුගම මිය |

# විශ්වවිද්‍යාලයේ සනාතන සභාව

සනාතන සභාවට විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය සහ පොදු මග පෙන්වීම තිබිය යුත්තේය. 1985 අංක 7 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව ස්ථාපනය කර ඇති සනාතන සභාව විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අධිකාරිය වේ.

වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| **උපකුලපති** | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා |
| **නියෝජ්‍ය උපකුලපති** | මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා |
| **පීඨයන්හි පීඨාධිපතිවරු** | |
| කෘෂිකර්ම පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඩී. වන්නිආරච්චි මහතා |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය කේ.ජී. ඉමේන්ද්‍ර මහතා |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය එච්.චිත්‍රාල් අඹවත්ත මහතා |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | මහාචාර්ය කේ.එච්.එම්.ඒ. දීපානන්ද මහතා |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.එම්.සී.එස් ද සිල්වා මහතා |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | අයි.ආර්. ප්‍රියන්ත මහතා |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | මහාචාර්ය එම්.කේ.වන්නිආරච්චිගේ මහතා |
| වෛද්‍ය පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න මහතා |
| විද්‍යා පීඨය | මහාචාර්ය ඩී.එච්.එන්. මුණසිංහ මිය |
| තාක්ෂණ පීඨය | මහාචාර්ය පී.කේ.එස්.සී. ජයසිංහ මහතා |
| **පුස්තකාලයාධිපති** | නිමල් හෙට්ටිආරච්චි මහතා |
| **ලේඛකාධිකාරී (නිල බලයෙන් ලේකම්)** | පී.එස්. කළුගම මිය |

## අධ්‍යයනාංශ ප්‍රධානීන්

### කෘෂිකර්ම පීඨය

| | |
|---|---|
| කෘෂි ජීව විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය අමානි මාන්නක්කාර මිය |
| කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ඩබ්ලිව්. එන්. සිල්වා මිය |
| කෘෂි ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජී.වයි. ජයසිංහ මයා |
| පශු විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ඩී. සේනාරත්න මිය |
| බෝග විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ඩබ්ලිව්.ජී.ඩී. ලක්මිණි මිය |
| ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය ඒ.ඒ.එම්. සුබෝධිනී මිය |
| පාංශු විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඩබ්ලිව්.එම්.සී.ජේ. විජේකෝන් මයා |

### සම සෞඛ්‍ය විද්‍යා පීඨය

| | |
|---|---|
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ජේ.ඒ.එන්. සඳමාලි මිය |
| හෙද විද්‍යා අධ්‍යයනාංශය | බී.අයි. වික්‍රමාරච්චි මිය |
| ඖෂධවේද අධ්‍යයනාංශය | වී.එම්. පතිරාජ මහතා |

### ඉංජිනේරු පීඨය

| | |
|---|---|
| සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය ජේ.එම්.ආර්.එස්. අප්පුහාමි මහතා |
| විද්‍යුත් හා තොරතුරු ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය එම්.ආර්. උඩවල්පොල මහතා |
| විෂයාන්තර අධ්‍යයන අධ්‍යයනාංශය | ආචාර්ය ඩී.එම්. කුමුදු එන් සෙනෙවිරත්න මිය |
| සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා හා නාවුක වාස්තු විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය සුමිත් බඳුගේ මහතා |
| යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය පී.ජී.සී.ආර්. ගාල්ලගේ මහතා |

**ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය**

| | |
|---|---|
| ධීවර හා ජලජීවී වගා අධ්‍යයනාංශය | ආචාර්ය එස්.එස්. හේරත් මිය |
| සාරස විද්‍යා සහ ජල තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය යූ.ඒ.ඩී. ජයසිංහ මයා |
| සාගර විද්‍යා සහ සමුද්‍රීය භූ විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඩී.එම්.යූ.ඒ.කේ. ප්‍රේමරත්න මයා |

**මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය**

| | |
|---|---|
| ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එච්.කේ. සරත් මයා |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය | ආර්.එම්.විජයවර්ධන මයා |
| භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ජී.පී.ටී.එස්. හේමකුමාර මයා |
| ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එම්.ඩී. බණ්ඩාර මයා |
| පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය | පූජ්‍ය මාකොළ මංගල හිමි |
| රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය | ආචාර්ය අයි.ආර්.අකුරුගොඩ මිය |
| සමාජ විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එම්.ඒ.සී.ජී. විජේසුන්දර මිය |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය | ආචාර්ය එස්.ජී.එස්. සමරවීර මයා |
| සිංහල අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයන්ත අමරසිංහ මයා |
| තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය කේ.එච්. රාමනායක මයා |

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

| | |
|---|---|
| අලෙවිකරණ අධ්‍යයනාංශය | මහාචාර්ය ඒ.සී. කරුණාරත්න මයා |
| ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය | මහාචාර්ය පී.ඒ.පී. සමන්ත කුමාර මයා |
| මුදල් අධ්‍යයනාංශය | එම්.එස්. නානායක්කාර මිය |
| මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය | ආචාර්ය ජී.කේ.එච්. ගනේවත්ත මිය |
| කළමනාකරණ සහ ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය | පී.ඩී.එස්.ඩී. රොද්‍රිගු මිය |
| ගණකාධිකරණ අධ්‍යයනාංශය | කේ.ජී.පී.වී. ගුණරත්න මයා |

**වෛද්‍ය පීඨය**

| | |
|---|---|
| නිර්වින්දන වේද අධ්‍යයනාංශය | ආචාර්ය යූ.අයි. හපුආරච්චි මයා |
| කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය පී.ජී.සී.එල්. නානායක්කාර මයා |
| ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ජී.ඊ.ඩී ද සොයිසා මයා |
| ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය | මහාචාර්ය ටී.ටී. පොන්නම්පෙරුම මිය |
| අධිකරණ වෛද්‍ය අධ්‍යයනාංශය | මහාචාර්ය ජානකී වරුෂහැන්නදි මිය |
| වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ඒ.එස්. දිසානායක මයා |
| ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එස්.එස්. වික්‍රමසිංහ මයා |
| ධාත්‍රිකර්‍ම හා නාරිවේද අධ්‍යයනාංශය | මහාචාර්ය ඩී.එල්.ඩබ්ලිව්. දසනායක මයා |
| ළමා රෝග අධ්‍යයනාංශය | ආචාර්ය පී.පී. ජයවර්ධන මිය (පෙබරවාරි සිට) |
| පරපෝෂිත විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ටී.සී. යහතුගොඩ මයා |
| ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය කේ.ඒ.සී. වික්‍රමරත්න මයා |
| ඖෂධවේද අධ්‍යයනාංශය | මහාචාර්ය පී.එල්.ජී.සී. ලියනගේ මිය |
| කායික විද්‍යා අංශය | මහාචාර්ය ආර්.එස්.ජේ. ලෙනෝරා මයා |
| මනෝවෛද්‍ය විද්‍යා අධ්‍යානාංශය | ආචාර්ය ජී.ඩී. පුංචිහේවා මිය |
| ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යානාංශය | වෛද්‍ය කේ.පී.වී.ආර්. ද සිල්වා මයා |

**විද්‍යා පීඨය**

| | |
|---|---|
| උද්භිද විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය කේ.ඒ.එස්. කොඩිකාර මයා |
| රසායන විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ජී.බී.සී. සනත් මයා |
| පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එස්.එම්. විදානගමආච්චි මිය |
| ගණිත අධ්‍යයනාංශය | මහාචාර්ය බී.ජී.එස්.ඒග ප්‍රදීප් මයා |
| භෞතික විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා |
| සත්ව විද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්. ටී.එස්. ඩී. ප්‍රේමචන්ද්‍ර මිය |

**තාක්ෂණ පීඨය**

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය | මහාචාර්ය පී.කේ.එස්.සී. ජයසිංහ මයා |
| ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය කේ.එච්.ටී. කරුණාරත්න මයා |
| ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය වී.එච්.පී. විතාරණ මිය |

| | |
|---|---|
| බහු ශික්ෂණ අධ්‍යයන අධ්‍යයනාංශය | ආචාර්ය එච්. සී.සී. ද සිල්වා මිය |

**මහාචාර්යවරු**

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් අබේසිංහ මයා | උද්භිද විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයන්ත අමරසිංහ මයා | සිංහල විෂය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.කේ.බී. මුද්දුව මිය | ව්‍යාධි විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්. වසන්ත කුමාර මයා | කෘෂි ජීව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.එල්.ඒ.ජී. අල්විස් මයා | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී.එම්. නවරත්න මිය | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඩී. අබේසිංහ මිය | උද්භිද විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය විජිත් එස්. ජයමාන්න මයා | ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.කේ.අයි.යූ. අරුණ කුමාර මයා | බෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඉසුරානි ඉලේපෙරුම මිය | කායව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය | සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වජිරා පී.බුළුගහපිටිය මිය | රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිලක් පී.ඩී. ගමගේ මයා | සාරස විද්‍යාව සහ ජල තාක්ෂණ පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.ඩී. මහින්ද මයා | කායික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.එස්.බී.එම්. අතපත්තු මයා | පශු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස් සුබසිංහ මයා | බෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මංගල ද සොයිසා මයා | කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යූ.කේ ජයන්ත මයා | ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න මයා | වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.ඩී. පතිරණ මයා | වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් ලේකම්වසම් මයා | වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය බිලේෂ පෙරේරා මයා | චර්යා විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ඩී.පී.ආර්. රත්නසේකර මිය | කෘෂි ජීව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| පූජ්‍ය මහාචාර්ය බෙලිගල්ලේ ධම්මජෝති හිමි | පාලි සහ බෞද්ධාගම පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ආර්.ඩබ්ලිව් සෙනෙවිරත්න මයා | ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය සී.කේ. බෝධිනායක මිය | වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එච්.එම්.එම්. හේරත් මයා | වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ආර්.පී හේවාවසම් මිය | ජෛව රසායනය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එස් විජේතුංග මයා | කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය යූ.සී.පී. පෙරේරා මයා | අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්.ටී. නාපාගොඩ මිය | ජෛව රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය කේ.ඒ.පී.ඩබ්ලිව්. ජයතිලක මිය | ජෛව රසායනය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ආර්.ඒ. මෛත්‍රීපාල මයා | සාරස විද්‍යාව සහ ජල තාක්ෂණය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එච්.බී. අසන්ති මිය | සාරස විද්‍යාව සහ ජල තාක්ෂණය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය පී.එන්. රණසිංහ මයා | සාගර විද්‍යාව සහ සමුද්‍ර භූ විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එන්.වයි.හිරිමුතුගොඩ මිය | පශු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ජේ.ඩබ්ලිව්. හේවගේ මයා | රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම මයා | භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එල්.ඒ පනම්ගම මයා | රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එස් වන්නිආරච්චි මයා | රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය කේ.එන්. කුමාර මයා | රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්. හේමලිකා මිය | රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය පී.ඒ. ජයන්ත මයා | ගණිතය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය බී.ජී.එස්.ඒ. ප්‍රදීප් මයා | ගණිතය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එන් දහනායක මිය | කෘෂි ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඒ.එල්.රණවක මිය | කෘෂි ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය පී.ඩබ්ලිව්.ඒ. පෙරේරා මයා | සත්ව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එන්.පී. රණතුංග මිය | කෘෂි ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඩබ්ලිව්.එන්. ද සිල්වා මිය | කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඒ.එල් සන්දික මයා | කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ජී.පී.ටී.එස්. හේමකුමාර මයා | භූගෝල විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය කේ මාසකෝරල මයා | උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්.පී.කේ.එස්.කේ. ද සිල්වා මිය | සත්ව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය  කේ.බී. සුනීතා ගුණවික්‍රම මිය | සත්ත්ව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්.බී. සමරවික්‍රම මයා | කායව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එල්.ඩබ්ලිව්.ජී.ආර්. අල්විස් මිය | කායව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය සම්පත් ගුණවර්ධන මයා | කායික විද්‍යාව පිළිබඳ මහාචාර්ය |

| | |
|---|---|
| මහාචාර්ය එස්. එස්. ජයසිංහ මිය | ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්.ඩී හෙට්ටිආරච්චි මයා | න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඒ. ද එස් නාගහවත්ත මයා | ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩී.ජී.බී. විජයරත්න මයා | ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය පී.වී. ද සිල්වා මයා | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ටී.එස්.එල්.ඩබ්ලිව්. ගුණවර්ධන මයා | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ජී.එච්.එම්.ජේ. සුභාෂි ද සිල්වා මිය | සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්.ඩබ්ලිව්.ඉන්ද්‍රානි මිය | ගණකාධිකරණය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එම්.කේ.ඩී.කේ. පියරත්න මයා | කෘෂි තොරතුරු පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඩී.එල්.සී. කුමාරි මිය | බෝග විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ජී.ජී. තුෂාර චාමින්ද මයා | සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඩී.පී.අයි.එන්. පතිරණ මයා | පශු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඒ.එස්. දිසානායක මයා | වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ටී.ටී. පොන්නම්පෙරුම මිය | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ |
| මහාචාර්ය ජානකී වරුෂාහැන්නදි මිය | අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එස්.පී කහඳගමගේ මිය | සිංහල පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඒ.එස්. බණ්ඩාර මයා | පාලි හා බෞද්ධ මහාචාර්ය |
| මහාචාර්ය කේ.ඒ.එස්. කොඩිකාර මයා | උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඩබ්ලිව්.ජී.එස්.එම්. කුමාරි මිය | උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය කේ. වන්නිආරච්චි මයා | සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය ඒ.පී අත්තනායක මිය | ජීව රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය එච්.සී.පී. කරුණාසේන මයා | යාන්ත්‍රික හා නිෂ්පාදන පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය පී.එල්.එන්. ලක්ෂ්මන් මයා | ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය පී.බී.ටී.පී. කුමාර මයා | සාගර විද්‍යාව සහ සමුද්‍ර භූ විද්‍යාව පිළිබඳ මහාචාර්ය |
| මහාචාර්ය බී.සී. වල්පොල මිය | පාංශු විද්‍යාව පිළිබඳ මහාචාර්ය |

## සනාතන සභාවේ පීඨ නියෝජිතයන්

| | |
|---|---|
| කෘෂිකර්ම | ආචාර්ය අමානි මාන්නක්කාර මිය<br>ආචාර්ය ඒ.සී.පී. ප්‍රියංකර මයා |
| සම සෞඛ්‍ය විද්‍යා | එස්.එම්.ඊ.බී. වීරතුංග මිය<br>කේ.කේ.පී.එම්. කුමාරි ද සිල්වා මිය |
| ඉංජිනේරු | ආචාර්ය බී.ඒ.ඩී.එස්. විමලසේන මයා<br>ආචාර්ය කේ.එම්.අයි.යූ. රණවීර මිය |
| ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ | ආචාර්ය කේ.එස්.එස්. අතපත්තු මයා<br>ආචාර්ය කේ.ආර්. ගමගේ මිය |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | ආචාර්ය කේ.ඒ. නිශාන්ත මයා<br>ආචාර්ය බී.එච්.එම්.ඩබ්ලිව්. බෝහිංගමුව මයා |
| කළමනාකරණ හා මූල්‍ය | ආචාර්ය තිස්ස හේමරත්න මයා<br>කේ.ඒ.එස්. ශ්‍රියානි මිය |
| වෛද්‍ය | ආචාර්ය කේ.ඒ. ගුණරත්න මයා<br>ආචාර්ය ටී.ජී. ලියනගේ මිය |
| විද්‍යා | ආචාර්ය ටී.ජී. දයානන්ද මයා<br>ආචාර්ය එන් යාපගේ මයා |
| තාක්ෂණ | ආචාර්ය කේ.එම්.ඩබ්ලිව්. රජවත්ත මිය<br>ආචාර්ය ඒ.එම්. අජ්වාඩ් මයා |

## 2023 වසරේ පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීම | රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| **පාලක සභාව** | 12 |
| | |
| **පාලක සභා අනු කමිටු** | |
| විගණන හා කළමනාකරණ කමිටුව | 04 |
| ප්‍රාග්ධන හා පුනරුත්ථාපන වැඩ ප්‍රගති සමාලෝචන රැස්වීම | 12 |
| මුදල් කමිටුව | 12 |
| නිවාඩු හා ප්‍රදාන කමිටුව | 12 |
| දුක් ගැනවිලි කමිටුව | 3 (NAE) |
| ඉඩම්, ගොඩනැගිලි හා භූ අලංකරණ කමිටුව | 6 |
| ප්‍රසම්පාදන කමිටුව | 12 |
| නිවාස කමිටුව | 03 |
| | |
| **සනාතන සභාව** | 11 |
| **සනාතන සභා අනු කමිටු** | |
| කා.ම.ස. මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව | 3 |
| පුස්තකාල කමිටුව | 6 |
| විභාග වැරදි කමිටුව | 6 |
| අතුරු නීති සමාලෝචන කමිටුව | 4 |
| | |
| **පීඨ මණ්ඩල** | |
| කෘෂිකර්ම පීඨය | 10 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 11 |
| ඉංජිනේරු පීඨය | 10 + 7 (විශේෂ) |
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | 10 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 10 |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 10 |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | 11 |
| වෛද්‍ය පීඨය | 12 + 2 (විශේෂ) |
| විද්‍යා පීඨය | 10 + 7 (විශේෂ) |
| තාක්ෂණ පීඨය | 10 + 2 (විශේෂ) |

# කොටස II

# සුවිශේෂී සංවර්ධන කාර්යයන්

## රුහුණ විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්ම -2019-2023

2019-2023 කාල සීමාව සඳහා වන රුහුණ විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්ම 2018.08.13 දින පැවැති 382 වන පාලක සභාව විසින් අනුමත කරන ලදී.

2023 වසර සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2023.02.23 දින පැවැති 432 වැනි විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලදී.

### ඉලක්ක:

1. අධ්‍යාපනය, පර්යේෂණ හා සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම
2. අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම
3. අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරීම
4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම
5. යහපාලනය සහතික කිරීම
6. නව නිපැයුම් සහ නව්‍යකරණය දායාද කිරීම
7. අද්විතීයත්වය මූර්තිමත් කිරීම

### පුරුෂාර්ථ

- අභිමානය හා ගෞරවය
- නිර්මාණශීලීත්වය සුපෝෂණය කිරීම
- ශාස්ත්‍රීය විශිෂ්ටත්වය
- සමාජ වගකීම

# විශ්වවිද්‍යාලයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම

විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්මට අනුව 2023 වසර සඳහා පහත දැක්වෙන ප්‍රගතිය වාර්තා කරන ලදී.

## ඉලක්කය 01 ▶ අධ්‍යාපනය, පර්යේෂණ හා සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම

රුහුණ විශ්වවිද්‍යාලය පහත දැක්වෙන පීඨ දහයෙන් සමන්විත වේ.

1. කෘෂිකර්ම පීඨය
2. සම සෞඛ්‍ය විද්‍යා පීඨය
3. ඉංජිනේරු පීඨය
4. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
5. ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය
6. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
7. වෛද්‍ය පීඨය
8. කළමනාකරණ හා මූල්‍ය පීඨය
9. විද්‍යා පීඨය
10. තාක්ෂණ පීඨය

ජාතික සංවර්ධනය සඳහා රුහුණ විශ්වවිද්‍යාලය ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 19 ක උපාධිධාරීන් බිහිකරමින් වැඩිම පීඨ සංඛ්‍යාවක් සහිත ජාතික විශ්වවිද්‍යාලය බවට පත්ව තිබේ.

### ➢ උපාධි අපේක්ෂකයන් හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම පුළුල් කිරීම

2023 වන විට උපාධි අපේක්ෂක වැඩසටහන්වල බඳවා ගැනීම් උපාධි අපේක්ෂකයන් 500 කින් ඉහළ නැංවීමට රුහුණ විශ්වවිද්‍යාලය ඉලක්ක කරන ලද අතර එය රටේ ආර්ථික සංවර්ධනය සඳහා උපායමාර්ගිකව වැදගත් වනු ඇත. 2023 වසරේදී විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂකයන් 1670 දෙනෙකු බඳවා ගත් අතර පශ්චාත් උපාධි අපේක්ෂකයන් වාර්ෂිකව 5%කින් ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

| වර්ෂය | 2019 | 2023 |
|---|---|---|
| උපාධි අපේක්ෂක | 2244 | 3914 |
| පශ්චාත් උපාධි අපේක්ෂක | 250 | 204 |

## ➢ නව අධ්‍යයනාංශ හඳුන්වාදීම

**2019 වසරේදී රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයනාංශ 55ක් පැවැති අතර 2023 වසර වන විට එය අධ්‍යයනාංශ සංඛ්‍යාව 59 ක් විය.**

| 2019 වසර | 2023 වසර |
|---|---|
| 55 | 59 |

## ➢ නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම

ඩිප්ලෝමාධාරී හෙදියන් සඳහා පහත දැක්වෙන නව උපාධි වැඩසටහන සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් හඳුන්වා දෙන ලදී.

- ඩිප්ලෝමාධාරී හෙදියන් සඳහා හෙද විද්‍යා විද්‍යාවේදී උපාධිය

ඉංජිනේරු පීඨය උපාධි අපේක්ෂකයන් සඳහා පහත දැක්නෙ නව උපාධි වැඩසටහන හඳුන්වා දෙනු ලැබීය.

- සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා හා නාවුක වාස්තු විද්‍යා විද්‍යාවේදී උපාධිය

කළමනාකරණ හා මූල්‍ය පීඨය උපාධි අපේක්ෂකයන් සඳහා පහත දැක්වෙන නව උපාධි වැඩසටහන හඳුන්වා දෙනු ලැබීය.

- ව්‍යාපාර පරිපාලන උපාධිය (ගෞරව) මූල්‍ය
- ව්‍යාපාර පරිපාලන උපාධිය (ගෞරව) ව්‍යාපාර නීතිය*

(කාර්ය මණ්ඩලය නොමැතිවීම නිසා මෙම වැඩසටහන මෙතෙක් ක්‍රියාවට නංවා නොමැත)

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සියලු සාමාන්‍ය උපාධි වැඩසටහන් 2020 වසරේ සිට සිව් අවුරුදු විශේෂ උපාධි වැඩසටහන් බවට පත් කර ඇති අතර පහත දැක්වෙන නව උපාධි වැඩසටහන් හඳුන්වා දී ඇත.

- තොරතුරු තාක්ෂණ ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය
- විද්‍යාවේදී ගෞරව (භූගෝලීය තොරතුරු විද්‍යා)*

(*විද්‍යාවේදී ගෞරව (භූගෝලීය තොරතුරු විද්‍යා) උපාධි වැඩසටහන අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.)

දැනට ක්‍රියාත්මක උපාධි වැඩසටහන් සිව් අවුරුදු ගෞරව උපාධි වැඩසටහන් බවට පරිවර්තනය කිරීමට විද්‍යා පීඨය යෝජනාවක් ඉදිරිපත් කර ඇත.

- ජෛව විද්‍යා (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- භෞතික විද්‍යා (ගෞරව) විද්‍යාවේදී උපාධිය

- **නව දුරස්ථ පාඨමාලා හඳුන්වාදීම**

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

හෙද විද්‍යා අධ්‍යයනාංශය විසින් පහත දැක්වෙන උසස් සහතිකපත්‍ර පාඨමාලා සම්පාදනය කරන ලදී.

- උග්‍ර උවටැන් හෙද සේවා උසස් සහතික පත්‍ර පාඨමාලාව
- වාධර්කවේද හෙද සේවා උසස් සහතික පත්‍ර පාඨමාලාව
- ස්නායුපරිහාරක අක්‍රම සඳහා පූර්ණ උවටැන් උසස් සහතික පත්‍ර පාඨමාලාව

**ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය**

- ධීවර කර්මාන්තයට අදාළ චාරිත්‍රමය නීතිය සහ ජාත්‍යන්තර නීතිකරණ
- විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ රෝපණය
- මත්ස්‍ය පසු අස්වනු තාක්ෂණික ක්‍රම

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ ඩිප්ලෝමාවක් සඳහා යෝජනාවක් දැනටමත් ඉදිරිපත් කර ඇත.
- ඓතිහාසික අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා යෝජනාවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. (පාසල් ගුරුවරුන්, වෘත්තිකයන් සහ සාමාන්‍ය මහජනයා ඉලක්ක කරනු ලැබේ)
- රාජ්‍ය සේවකයන් වෙනුවෙන් තිරසර සාමය සඳහා අන්තර්කරණ සේවා සැපයුම පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

- මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව
- ව්‍යවසායකත්ව කළමනාකරණ ඩිප්ලෝමාව

විද්‍යා පීඨය

- පයිතන්හි දත්ත විශ්ලේෂණය හා යන්ත්‍ර ඉගෙනුම් පිළිබඳ පුහුණුව
- පයිතන් භාවිතා කරමින් ක්‍රමලේඛන මූලිකාංග පිළිබඳ පුහුණු පාඨමාලාව
- ජාල හා පද්ධති පරිපාලනය පිළිබඳ පුහුණු පාඨමාලාව
- ජාවා භාවිතා කරමින් අරමුණු දිශානත ක්‍රමලේඛය පිළිබඳ පුහුණු පාඨමාලාව
- ඇජයිල් ක්‍රමවේද සහිත මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පුහුණු පාඨමාලාව

- **නව මාර්ගගත පාඨමාලා හඳුන්වාදීම**

**ඉංජිනේරු පීඨය**

- ධම්මික හා ප්‍රිසිලා පෙරේරා පදනම (ඩීපී පදනම) සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේ. මෙම සහයෝගිතාවයේ අරමුණ වන්නේ දත්ත විද්‍යාව, යන්ත්‍ර ඉගෙනුම සහ කෘත්‍රිම බුද්ධිය සංවර්ධනය පිළිබඳ නොමිලේ මාර්ගගත වැඩසටහනක් සැපයීමයි.
- ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ නියමු වැඩසටහනක් ලෙස සහතිකපත්‍ර පාඨමාලා 6 ක් හඳුන්වාදීම.

- **නව පොදු අර්ස හුවමාරු පද්ධතියක් හඳුන්වාදීම**
  වෛද්‍ය පීඨය විදේශීය ශිෂ්‍යයන් සඳහා පොදු අර්ස හුවමාරු පද්ධතියක් ක්‍රියාවට නංවන ලදී.

- **විදේශීය සංවිධාන සමග නව හවුල්කාරිත්ව වැඩසටහන් හඳුන්වාදීම**
  රුහුණ විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ විසින් පහත දැක්වෙන අවබෝධතා ගිවිසුම් අත්සන් තබන ලදී.

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

- එරස්මස්+ ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය - හෙද අධ්‍යයනාංශය
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඉන්දුනීසියාවේ මුහම්මදියා සෙමරාංග් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම- හෙද අධ්‍යයනාංශය
- එරස්මස්+ ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය, වයස්ගතවීම, හෙද අධ්‍යයනාංශය
- සදර්න් හෙල්ත් එන්එච්එස් පදනම් භාරය සමග පර්යේෂය සහයෝගීතාව- හෙද අධ්‍යයනාංශය
- චුලාභෝන් උපාධි ආයතනය සමග අවබෝධතා ගිවිසුම - ඖෂධවේද අධ්‍යයනාංශය
- රුසියානු ෆෙඩරේෂනයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සයිබීරියානු රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුම - ඖෂධවේද අධ්‍යයනාංශය
- තාක්ෂණ පැවැරුම් කාර්යාලය සහ පින්ලේ කලම්බු (පුද්) සමාගම අතර අවබෝධතා ගිවිසුම- ඖෂධවේද අධ්‍යයනාංශය

**කෘෂිකර්ම පීඨය**

කෘෂිකර්ම පීඨයට විවිධ විශ්වවිද්‍යාල/අධ්‍යාපන ආයතන සමග පහත සබැඳි වැඩසටහන් තිබේ.

- කෘෂිකර්ම පීඨය සහ ලියුබ්ලියානා විශ්වවිද්‍යාලය, ස්ලෝවේනියාව
- රුහුණ විශ්වවිද්‍යාලය සහ කියුජිං සාමාන්‍ය විශ්වවිද්‍යාලය, චීනය
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ෂිබාවුරා තාක්ෂණික ආයතනය, ජපානය
- කෘෂි ඉංජිනේරු විද්‍යාව සහ පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය සහ සදාහරිත වැවිලි සමාගම

**කළමනාකරණ සහ මූල්‍ය පීඨය**

- කොළඹ කොටස් වෙළඳපොළ සමග අවබෝධතා ගිවිසුම
- වර්ෂය තුලදී තවත් අවබෝධතා ගිවිසුම් තුනක් කෙටුම්පත් කළ අතර අනුමතිය අපේක්ෂාවෙන් පසුවේ.

**වෛද්‍ය පීඨය**

- ළමා අපයෝජන විමර්ශන සඳහා වීඩියෝ පටිගත කිරීමේ පහසුකමක් වෝහාරික වෛද්‍ය අධ්‍යයනාංශයේ ස්ථාපිත කිරීම පිණිස ළමා ආරක්ෂණ අධිකාරිය සහ වෝහාරික වෛද්‍ය අධ්‍යයනාංශය අතර නව අවබෝධතා ගිවිසුමක් අත්සන් තබනු ලැබීය.
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ආහාර පර්යේෂණ ඒකකය, ගන්නෝරුව අතර අවබෝධතා ගිවිසුමක් 2023.05.24 දින අත්සන් තබනු ලැබීය.

### ඉංජිනේරු පීඨය

- යන්ත්‍ර ඉගෙනුම් සහ දත්ත විද්‍යාව පිළිබඳ නොමිලේ විවෘත පාඨමාලා පැවැත්වීම පිණිස ඩීපී එඩියුකේෂන් සමග අවබෝධතා ගිවිසුමක් 2023 ජූලි 12 වැනි දින අත්සන් තබන ලදී.
- සමුද්‍රීය අධ්‍යයන අංශයේ විද්‍යාගාර පහසුකම් බෙදාහදා ගැනීම සඳහා සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා සහ නාවුක වාස්තු විද්‍යා අධ්‍යයනාංශය තාක්ෂණික ආයතනය (ITUM) සහ මොරටුව විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.
- 2023 මාර්තු 30 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා නාවික රාජ්‍ය තාන්ත්‍රික සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. අවබෝධතා ගිවිසුමට අනුව, සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා සිසුන්ට පිරිනමන වෘත්තීය මොඩියුල පැවැත්වීම සඳහා අවශ්‍ය සම්පත් දායකයින් එම සංගමය විසින් සපයනු ඇත.
- 2023 ජූනි 15 දින, කොචින් විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය (CUSAT) සමඟ වැල්ලමඩමේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද්දේ සමුද්‍ර විද්‍යාව/ජීව විද්‍යාව සහ සමුද්‍ර ඉංජිනේරු/නැව් තැනීම සඳහා විශ්වවිද්‍යාල දෙක අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවයක් ඇති කර ගැනීම පිණිසය. CUSAT සතුව සමුද්‍ර ඉංජිනේරු සිසුන් සඳහා අංගසම්පූර්ණ පුහුණු නෞකාවක් ඇත. එය සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා සහ නාවුක වාස්තු විද්‍යා සිසුන්ට ප්‍රයෝජනයට ගතහැකි අතර, එම සිසුන්ට ඉන්දියාවේ CUSAT හි පුහුණුව / සීමාවාසික පුහුණුව ලබා ගැනීමට අවස්ථාව ලැබේ.

### මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

- රුමේනියාවේ බ්‍රසොව් හි ට්‍රාන්සිල්වේනියා විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

### විද්‍යා පීඨය

- විද්‍යා පීඨය ජාතික ඉංජිනේරු සහ පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) සමඟ 2023 දෙසැම්බර් මාසයේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය.

## ඉලක්කය 02 ► අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම

➢ ආචාර්ය උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් ඇති ආචාර්යවරුන්

| 2019 | 2023 |
|---|---|
| **42%** | 55% |

➢ **2023 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩල ව්‍යාප්තිය**

| පීඨය | අධ්‍යයනාංශ භාර මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම | 05 | 05 | 16 | 01 | 26 | 07 | 08 | **68** |
| සම සෞඛ්‍ය විද්‍යා | - | - | 02 | - | 23 | 02 | 13 | **40** |
| ඉංජිනේරු | 01 | - | 04 | - | 46 | 01 | 23 | **75** |
| ධීවර හා සමුද්‍රීය විද්‍යා හා තාක්ෂණ | 02 | 01 | 02 | - | 11 | 02 | 09 | **27** |
| මානව .ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | 01 | - | 05 | 04 | 65 | 10 | 16 | **101** |

| පීඨය | අධ්‍යයනාංශ බාර මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| කළමනාකරණ හා මූල්‍ය | - | - | 06 | 01 | 32 | 08 | 10 | **57** |
| වෛද්‍ය | 13 | 06 | 26 | 03 | 35 | 07 | 19 | **106** |
| විද්‍යා | 02 | 07 | 14 | 01 | 42 | 07 | 23 | **96** |
| තාක්ෂණ | 01 | - | 01 | - | 07 | 01 | 29 | **38** |
| එකතුව | **25** | **19** | **76** | **10** | **287** | **45** | **150** | **608** |

- **නවීන ඉගැන්වීම් පහසුකම් සහිත දේශන ශාලා සහ විද්‍යාගාර**

ඉංජිනේරු පීඨය

- EUSL බලශක්ති ව්‍යාපෘතිය යටතේ සුළං බලශක්ති මාර්ගගත දුරස්ථ විද්‍යාගාරය

**ධීවර සහ සමුද්‍රීය විද්‍යා හා තාක්ෂණ පීඨය**

- සෑම දේශන ශාලාවකම බහු මාධ්‍ය පරිගණක, අන්තර්ජාල සහ ආසන පහසුකම් දැනටමත් පවතී.

කළමනාකරණ හා මූල්‍ය පීඨය

- සියලුම දේශන ශාලාවල නවීන ඉගැන්වීම් ඉගෙනුම් පහසුකම් තිබේ.
- පරිගණක විද්‍යාගාරයක් හා භාෂා ඉගෙනුම් විද්‍යාගාරයක් සියලු උපකරණවලින් සමන්විත වීම.

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය**

- විද්‍යාගාරය ස්ථාපිත කිරීම නිමා කර ඇති අතර ශිෂ්‍යයන් එය භාවිතයට ගනියි.
- සියලු පහසුකම් සහිත පරිගණක විද්‍යාගාරයක් පිහිටුවීම නිමා කර ඇති අතර එහි වරකට ශිෂ්‍යයන් 15 දෙනෙකු සඳහා ඉඩ පහසුකම් ඇත.
- ඉංග්‍රීසි භාෂා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම සිදු කර ඇති අතර එහි වරකට ශිෂ්‍යයන් 10 දෙනෙකුට පහසුකම් තිබේ.
- AHEAD ව්‍යාපෘතිය යටතේ සුහුරු පංති කාමරයක් ස්ථාපිත කර ඇති අතර එහි වරකට ශිෂ්‍යයන් 50 දෙනෙකුට පහසුකම් සැපයිය හැකිය.

**තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය**

- පරිගණක 100 කින් සමන්විත පරිගණක විද්‍යාගාරයක් ස්ථාපිත කරන ලදී.

**භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**

- සිතියම් විද්‍යා විද්‍යාගාරයක් සහ අධ්‍යයනාංශ ශ්‍රවණාගාරය වැඩි දියුණු කර ඇත.

## ➢ තත්ත්ව ආරක්ෂණ වැඩි දියුණු කිරීම්

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

- අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කමිටු රැස්වීම් අටක් පීඨයේ පවත්වන ලදී.
- ක්‍රියාදාම හා කමිටු සඳහා සම්මත මෙහෙයුම් පරිපාටි හඳුන්වාදීම
- වෛද්‍ය ශිෂ්‍යයින් සඳහා විද්‍යාගාර රසායනාගාර පුහුණු අත්පොත හඳුන්වාදීම

**ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය**

- අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කමිටු වෙබ් අඩවිය ස්ථාපිත කරන ලදී.
- ධීවර සහ සාගර විද්‍යා උපාධි වැඩසටහනේ විද්‍යාවේදී ගෞරව උපාධි පළමු වැඩසටහන් සමාලෝචනය සම්පූර්ණ කරන ලදී.
- පීඨාධිපතිගේ කාර්යාලය සඳහා සම්මත මෙහෙයුම් පරිපාටිය සකස් කරන ලදී.
- සමපදස්ථ ඇගයීම් ක්‍රියාදාමය සුසංවිධිත කරන ලදී.
- උපාධි වැඩසටහනේ විෂයමාලා සිතියම සකස් කරන ලදී.
- විභාග ප්‍රශ්නපත්‍රවල බ්ලූම් වර්ගීකරණයේ ක්‍රියාකාරී ක්‍රියාපද භාවිතය විශ්ලේෂණය කරන ලදී.
- අනුස්ථාපන වැඩසටහනේදී සිසුන්ට රසායනාගාර සහ ක්ෂේත්‍ර ආරක්ෂණ මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී
- සමුද්‍ර හා මිරිදිය උපාධිය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියේ පළමු විෂයමාලා සංශෝධනය යෝජනා කරන ලදී.
- පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රශ්න පත්‍ර ඇගයීම සහ ආකෘතිවලට ලකුණු ඇතුළත් කිරීම සඳහා වඩා යහපත් පිළිවෙත් ප්‍රවේශයන් සංවර්ධනය කිරීම පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

**පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය**

- විභාග ක්‍රියාවලිය පිළිබඳ නව අත්පොතක් සකස් කිරීම.
- පර්යේෂණ උපාධි අතුරු නීති සංශෝධනය කරමින් පවතී.
- ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධි හා සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධි වැඩසටහන්වල විෂයමාලාව සංශෝධනය කරන ලදී.
- විභාග පරීක්ෂකයන් තිදෙනෙකු විසින් පර්යේෂණ උපාධි නිබන්ධන ක්‍රියාවලිය ඇගයීම හඳුන්වා දෙන ලදී.

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

- ශිෂ්‍ය ප්‍රතිපෝෂණ ආකෘති පත්‍ර සහ සමපදස්ථ ඇගයීම් සහ ඇගයීම් යාන්ත්‍රණ හඳුන්වා දෙන ලදී.
- සීමාවාසික සඟරාව හඳුන්වා දෙන ලදී.
- පාඨමාලා ඒකක සම්බන්ධීකාරකවරුන් සඳහා පත්වීමේ ලිපියක් හඳුන්වා දීම.
- පීඨ මණ්ඩලය විසින් පත්කළ කමිටුවලට අදාළ කාර්යයන් පිළිබඳ හඳුන්වාදීම.

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

- සිසුන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීම, සම වයසේ සමාලෝචන දිරිමත් කිරීම, විෂයමාලා සංශෝධනය කිරීම, ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගැනීම, ක්‍රියාවලි පසු විපරම් කිරීම සඳහා නිතිපතා රැස්වීම් පැවැත්වීම

**වෛද්‍ය පීඨය**

- ළමා රෝග අධ්‍යයනාංශයේ ශිෂ්‍ය ඉගෙනුම් පැතිකඩ සංශෝධනය කරන ලදී.
- කෙටි සායනික පත්වීම් සඳහා පැමිණෙන සිසුන් සඳහා ශිෂ්‍ය ලොග් පොතක් හඳුන්වා දෙන ලදී

**තාක්ෂණ පීඨය**

- මධ්‍ය වාර්ෂික ඇගයීම් ක්‍රමය හඳුන්වා දීම මගින් අධ්‍යයන කාල සටහන වැඩි දියුණු කරන ලදී.
- පීඨ අතුරු ව්‍යවස්ථා සංශෝධනය ආරම්භ කරන ලදී.

➢ **රුහුණ විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම**

**වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම–**

| | 2019 | 2023 |
|---|---|---|
| **ශ්‍රී ලංකා ශ්‍රේණිගත කිරීම** | 04 | 05 |
| **ලෝක ශ්‍රේණිගත කිරීම** | 2504 | 2398 |

## ඉලක්කය 03 ► අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරීම

➢ **2023 උපාධි ප්‍රදානෝත්සවය වන විට පීඨ අනුව උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති හැකියාව**

| පීඨය | ස්ත්‍රී/පුරුෂභාවය | සේවා නියුක්ත (%) | ඌන රැකියා නියුක්ත (%) | රැකියා විරහිත (%) | පශ්චාත් උපාධි ශිෂ්‍යයන් (%) | වෙනත් (%) |
|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම | කාන්තා | 50.3% | 16.6% | 22.9% | 4.5% | 5.7% |
| | පිරිමි | 64.1% | 15.6% | 15.6% | 1.6% | 3.1% |
| | එකතුව | **54.3%** | **16.3%** | **20.8%** | **3.6%** | **5.0%** |
| සම සෞඛ්‍ය විද්‍යා | කාන්තා | 65.7% | 15.7% | 18.6% | 0.0% | 0.0% |
| | පිරිමි | 76.0% | 16.0% | 4.0% | 0.0% | 4.0% |
| | එකතුව | **67.7%** | **15.7%** | **15.7%** | **0.0%** | **0.8%** |
| ඉංජිනේරු | කාන්තා | 77.8% | 9.3% | 5.6% | 1.9% | 5.6% |
| | පිරිමි | 76.1% | 6.3% | 15.9% | 1.1% | 0.6% |
| | එකතුව | **76.5%** | **7.0%** | **13.5%** | **1.3%** | **1.7%** |
| ධීවර සහ සාගර විද්‍යා සහ තාක්ෂණ | කාන්තා | 45.5% | 9.1% | 36.4% | 0.0% | 9.1% |
| | පිරිමි | 40.0% | 10.0% | 50.0% | 0.0% | 0.0% |
| | එකතුව | **42.9%** | **9.5%** | **42.9%** | **0.0%** | **4.8%** |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | කාන්තා | 13.8% | 11.2% | 72.2% | 0.6% | 2.2% |
| | පිරිමි | 26.7% | 10.7% | 58.7% | 0.0% | 4.0% |
| | එකතුව | **16.0%** | **11.1%** | **69.8%** | **0.5%** | **2.6%** |
| වෛද්‍ය | කාන්තා | 85.3% | 5.3% | 6.3% | 0.0% | 3.2% |
| | පිරිමි | 67.2% | 12.1% | 13.8% | 1.7% | 5.2% |
| | එකතුව | **78.4%** | **7.8%** | **9.2%** | **0.7%** | **3.9%** |
| කළමනාකරණ හා මූල්‍ය | කාන්තා | 53.8% | 13.3% | 30.0% | 0.4% | 2.5% |
| | පිරිමි | 68.4% | 5.1% | 23.9% | 0.9% | 1.7% |
| | එකතුව | **58.5%** | **10.6%** | **28.0%** | **0.6%** | **2.2%** |

| පීඨය | ස්ත්‍රී/පුරුෂභාවය | සේවා නියුක්ත (%) | ඌන රැකියා නියුක්ත (%) | රැකියා විරහිත (%) | පශ්චාත් උපාධි ශිෂ්‍යයන් (%) | වෙනත් (%) |
|---|---|---|---|---|---|---|
| විද්‍යා | කාන්තා | 58.2% | 15.9% | 20.1% | 4.2% | 1.6% |
| | පිරිමි | 69.7% | 8.3% | 17.4% | 2.3% | 2.3% |
| | එකතුව | **62.9%** | **12.8%** | **19.0%** | **3.4%** | **1.9%** |
| තාක්ෂණවේද | කාන්තා | 51.4% | 21.6% | 8.1% | 13.5% | 5.4% |
| | පිරිමි | 71.3% | 9.2% | 13.8% | 1.1% | 4.6% |
| | එකතුව | **65.3%** | **12.9%** | **12.1%** | **4.8%** | **4.8%** |
| මුළු එකතුව | | **54%** | **11.5%** | **30.1%** | **1.7%** | **2.7%** |

➢ **උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් සඳහා කර්මාන්ත පුහුණුව/අධිරෝපණ පුහුණුව/සීමාවාසික පුහුණුව සැපයීම**

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

- ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලයේ අනුග්‍රහය යටතේ ඖෂධවේද ශිෂ්‍යයන්ට ACE ෆාමසියුටිකල්, නවෙස්ට් ෆාමසියුටිකල්, සිලෝජෙන් ලංකා පුද්ගලික සමාගම, ගැස් වර්ල්ඩ් පුද්ගලික සමාගම යන ආයතනවල පුහුණු අවස්ථා කිහිපයක් හඳුන්වා දෙන ලදී.

**ඉංජිනේරු පීඨය**

- ඉංජිනේරු අධ්‍යාපන මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක ඩී.එස් ද සිල්වා මහතා 20,21 සහ 22 වැනි කාණ්ඩවල ශිෂ්‍යයන් 796 දෙනෙකු සඳහා කර්මාන්ත පුහුණු ස්ථාපන සම්බන්ධීකරණය කරන ලදී.

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

ශාස්ත්‍රවේදී පාඨමාලාවේ 4000 මට්ටමේ පහත දැක්වෙන ශිෂ්‍යයන් රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ආයතනවල සිය සීමාවාසික පුහුණුව සම්පූර්ණ කරන ලදී. (ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රාජ්‍ය හා පුද්ගලික බැංකු, පාසල් හා රාජ්‍ය නොවන සංවිධාන)

| අධ්‍යයනාංශය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය | 23 |
| සමාජ විද්‍යා අධ්‍යයනාංශය | 61 |
| සිංහල භාෂා අධ්‍යයනාංශය | 57 |
| ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 36 |
| භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | 25 |
| ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය | 68 |

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

- ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධි වැඩසටහනේ සති 24 ක සීමාවාසික පුහුණු අවශ්‍යතාවයක් තිබේ. (කලින් පැවැති සති 16 ක අවශ්‍යතාව 2023 වසරේදී සති 24 දක්වා ඉහළ නංවන ලදී.) 2023 දී සීමාවාසික වැඩසටහනට ඇතුලත් කර ගනු ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 386කි.)

**විද්‍යා පීඨය**

- පරිගණක විද්‍යා උපාධි වැඩසටහනේ අවසන් සමාසිකයේ සීමා වාසික පුහුණුව සපයන අතරතුර තොරතුරු තාක්ෂණය කර්මාන්තය පිළිබඳ පුහුණුවක් (IFS සමාගමේ හිටපු මානව සම්පත් උපදේශක) පුබුදු ලියනගේ මහතා විසින් 2023 මාර්තු මාසයේදී සපයන ලදී.
- කැල්සි සමාගම විසින් පවත්වනු ලැබූ ටෙක් ටෝක් වැඩසටහන - ජූලි, 2023 පවත්වන ලදී.
- රුහුණ විශ්වවිද්‍යාලයේ IFS සැසිය, 2023 මැයි පවත්වන ලදී.
- කර්මාන්ත දිශානත ඉගෙනුම් සැසි 2023, ප්‍රමුඛ පෙළේ තො.තා. සමාගම්වල තො.තා. විශේෂඥයන් විසින් පවත්වන ලදී.

**තාක්ෂණ පීඨය**

පහත දැක්වෙන උපාධි වැඩසටහන් සඳහා තාක්ෂණ පීඨය කර්මාන්ත පුහුණුව සපයන ලදී.

| උපාධි වැඩසටහන | මට්ටම | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| ඉංජිනේරු තාක්ෂණය | 3 | 80 |
| ජෛව පද්ධති තාක්ෂණය | 3 | 47 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 4 | 45 |

## ඉලක්කය 04 ► යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම

➢ **ආබාධ සහිත ශිෂ්‍යයන් සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (CSWD)- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

- ආබාධ සහිත ශිෂ්‍යයන් සඳහා මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද අතර ඒ සඳහා පහසුකම් අන්තර්කරණ අධ්‍යාපන එරස්මස් ව්‍යාපෘතිය මගින් සපයන ලදී.

➢ දැඩි ආර්ථික/සමාජීය අවශ්‍යතා පවතින සිසුන් සඳහා මූල්‍ය සහාය සැපයීම.

| පීඨය | මහපොළ ශිෂ්‍යත්ව ලාභීන් සංඛ්‍යාව | ශිෂ්‍යාධාර ලාභීන් සංඛ්‍යාව | අනෙකුත් ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | ශිෂ්‍ය ජනගහණය | ශිෂ්‍යත්වයක් හිමිවූ ශිෂ්‍යයන්ගේ % |
|---|---|---|---|---|---|
| කෘෂිකර්මය | 324 | 501 | 07 | 1257 | 66.18% |
| සම සෞඛ්‍ය විද්‍යා | 224 | 428 | 07 | 891 | 73.96% |
| ඉංජිනේරු | 736 | 422 | 02 | 2072 | 55.98% |
| ධී.ස.වි.හා තා. | 126 | 215 | 07 | 501 | 69.46% |
| මා.ශා. හා ස.වි. | 554 | 1719 | 27 | 2590 | 88.80% |
| කළමනාකරණ | 584 | 1361 | 16 | 2329 | 84.19% |
| වෛද්‍ය | 369 | 198 | 54 | 1403 | 44.26% |
| විද්‍යා | 710 | 821 | 10 | 1857 | 82.98% |
| තාක්ෂණ | 595 | 295 | 10 | 1242 | 72.46% |
| එකතුව | **4222** | **5960** | **140** | **14142** | **65%** |

- **යටිතල පහසුකම් සංවර්ධනය**

**ඉංජිනේරු පීඨය**

- යුරෝපීය සංගම් ශ්‍රී ලංකා බලශක්ති ව්‍යාපෘතිය යටතේ සුළං බලශක්ති මාර්ගගත දුරස්ථ විද්‍යාගාරයක් ස්ථාපිත කරන ලදී.

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

- නව පීඨ සංකීර්ණයක් ඉදිකිරීම් සිදුවෙමින් පවතී.

**ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය**

- අතිරේක බඳවා ගැනීම් සඳහා ලැබුණු අරමුදල් භාවිතා කරමින් නව රසායන විද්‍යාගාරයක් ස්ථාපිත කරන ලදී.
- එසේම, අතිරේක බඳවා ගැනීමේ අයවැය යටතේ අනෙකුත් අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

**මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය**

- Wi-Fi සම්බන්ධතා වලින් සමන්විත වායු සමීකරණය කරන ලද දේශන ශාලා දෙකක්, භාෂා විද්‍යාගාරය, පුස්තකාලය සහ පරිගණක විද්‍යාගාරයක් තිබීම.

**වෛද්‍ය පීඨය**

- නව ගොඩනැගිලි දෙකක් ඉදිකරමින් පවතී. (මහාචාර්ය වාට්ටු සංකීර්ණය සහ දොළොස් මහල් ගොඩනැගිල්ල) වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් 2024 මැද භාගයේදී අවසන් වනු ඇත.
- කෙසෙල්ගස්හේන ඉඩමේ වාරික ගෙවමින් පවතී.
- එළිමහන් රංග පීඨයේ ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර 2024 අප්‍රේල් වන විට නිමා වනු ඇත.
- මුළුමණින්ම අරමුදල් මගින් ආධාර සපයන ලද නව විවෘත අධ්‍යයන ප්‍රදේශ ඉදිකරන ලදී.
- මහාචාර්ය වාට්ටු සංකීර්ණයේ ඇඳන් සහ අනෙකුත් අවශ්‍යතා පරිත්‍යාග හරහා රැස් කර ගන්නා ලදී.

**විද්‍යා පීඨය**

- පීඨ සංකීර්ණය සඳහා Wi-Fi පහසුකම් සැපයීම.

**තාක්ෂණ පීඨය**

- පරිගණක 50 ක් සහිත පරිගණක විද්‍යාගාරයක් ඉදිකරන ලදී.

## ඉලක්කය 05 ► යහපාලනය සහතික කිරීම

- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලදී.

| | |
|---|---|
| **දේශීය පුහුණු** | 43 |
| **සේවාරම්භක පුහුණුව** | 01 |

# ඉලක්කය 06 ► නව්‍යකරණය සහ නව නිපැයුම් දායාද කිරීම

## ➢ නව නිපැයුම් හා නව්‍යකරණ

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

- වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඒ.එම්.එස්.එස්. අමරසිරි මහතාට "වකුගඩු රෝගය සඳහා ඖෂධ පැලෑටි සංයෝගයක් සහ එහි ප්‍රතිකර්ම ක්‍රමවේදය" මැයෙන් යුතු නව්‍යකරණය සඳහා පේටන්ට් බලපත්‍රය හිමි විය.
- ආචාර්ය කේ.බී. ගුණවර්ධන ඇතුළු කණ්ඩායමට පහළ පරාසයේ මුත්‍රා ප්‍රෝටීන් ප්‍රමාණ කිරීම සඳහා සල්ෆර් සාලිසිලික් අම්ල (එස්එස්ඒ) ක්‍රමය ප්‍රශස්ත කිරීම පිළිබඳ උපාධි පර්යේෂණ අධ්‍යයනය සඳහා පේටන්ට් බලපත්‍රයක් ලැබී ඇත.

**විද්‍යා පීඨය**

- නව නිපැයුම් සහ නවෝත්පාදන සම්මාන ප්‍රදාන කිරීමේ උත්සවය 2023.12.08 දින රුහුණ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාරික සබැඳියා ඒකකය සහ දකුණු පළාත් සභාවේ සහයෝගය ඇතිව පවත්වන ලද අතර, සිසුන් 314 දෙනෙකු පදක්කම් ලබා ගත්හ. මීට අමතරව වාණිජකරණ අංශය යටතේ මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ඉන්දික මහතා රන් පදක්කමක් ද, මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම කාර්මික අංශය යටතේ රන් පදක්කමක් ලැබූ අතර, ආචාර්ය ඩබ්ලිව්.ජී.ඩී. චතුරංගට AHEAD/ICE යටතේ රන් පදක්කමක් හිමි විය
- නැවත සැකසිය හැකි සංචලිත ස්නායුක ජාල ප්‍රොසෙසරය - ආයතනික කාණ්ඩයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ රන් පදක්කම (ආයතනික කාණ්ඩයේ හොඳම නව නිපැයුම් සම්මානය සඳහා වූ විශේෂ සම්මානය.)
- නව්‍ය වාණිජ ශ්‍රේණියේ දුරේක්ෂ ප්‍රාථමික දර්පණ නිෂ්පාදන තාක්ෂණය - ආයතනික කාණ්ඩයේ භෞතික විද්‍යා ක්ෂේත්‍රයේ රන් පදක්කම

**තාක්ෂණික පීඨය**

- ඉංජිනේරු තාක්ෂණ ශිෂ්‍යයන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම
- FOT නව්‍යකරණ වැඩසටහන හරහා නව්‍යකරණයන් සිදු කිරීමට සිසුන් දිරිමත් කරන ලදී.

# ඉලක්කය 07 ► අද්විතීයත්වය මූර්තිමත් කිරීම

ධීවර හා සමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨය ප්‍රජාව සඳහා පහත දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලා හඳුන්වා දෙන ලදී.

- සංචාරක සේවා ඩිප්ලෝමාව - කෙරී ගෙන යන
- සමුද්‍රීය සේවා සහ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව - කෙරී ගෙන යන

# 2023 වසරේ විශේෂ සිදුවීම්

## 5 වැනි ඉන්දියානු විවෘත පැරා මලල ක්‍රීඩා ජාත්‍යන්තර ශූරතාවලිය - 2023

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ශිෂ්‍යාවක් වන ඩබ්.ඒ.කේ.කේ. දයානි මෙනෙවිය (HS/2020/18351), මෙම ශූරතාවලියේදී මීටර 100, මීටර 400 සහ දුර පැනීම යන ඉසව්වලදී පදක්කම් තුනක් දිනා ගන්නා ලදී. ඇය 2023 මැයි 5 සිට මැයි 7 දක්වා ඉන්දියාවේ බැංගලෝර් හි පැවති 5 වන ඉන්දීය විවෘත පැරා මලල ක්‍රීඩා ජාත්‍යන්තර ශූරතාවලියේ තරඟ වදින අතර ආසියානු පැරා මලල ක්‍රීඩා ශූරතාවලියට සහ ලෝක පැරා මලල ක්‍රීඩා ශූරතාවලියට ඉදිරිපත් වූවාය. ඇය එහිදී රිදී පදක්කම් දෙකක් සහ ලෝකඩ පදක්කමක් දිනා ගත්තාය.

## ගුරුදේව රවීන්ද්‍රනාත් තාගෝර්ගේ 82 වැනි ගුණානුස්මරණය

ගුරුදේව රවීන්ද්‍රනාත් තාගෝර්ගේ 82 වැනි ගුණානුස්මරණයේදී, හම්බන්තොට ඉන්දියානු කොන්සල් ජෙනරාල් කාර්යාලය හා ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ සමග එක්ව 2023 අගෝස්තු 7 වනදා රුහුණ විශ්වවිද්‍යාලයේ රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේදී ගුරුදේව රවීන්ද්‍රනාත් තාගෝර්ගේ උඩුකය ප්‍රතිමාවක් විවෘත කරන ලදී.








# රුහුණ විශ්වවිද්‍යාලයේ ඉලක්ක ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක සමග පෙළ ගැස්වීම

| ශ්‍රී ලංකා තිරසර සංවර්ධන ඉලක්ක | රුහුණ විශ්වවිද්‍යාල ඉලක්ක |
|---|---|
| **ඉලක්කය 4. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා දිරිගැන්වීම** | **ඉලක්කය 2. අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම**<br>• වර්ෂ 2023 වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 70%ක් ආචාර්ය උපාධි හෝ ආචාර්ය උපාධි සමාන සුදුසුකම් සපුරා ඇති බව සහතික කිරීම<br>• පීඨයන්හි සියලු වැඩසටහන් සමාලෝචන සම්පූර්ණ කිරීම සහ ආයතනික සමාලෝචනය සඳහා විශ්වවිද්‍යාලය සූදානම් කිරිම.<br>• වයි-ෆයි පහසුකම් පුළුල් කිරීම මගින් 2023 වන විට සියලු අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පහසුකම් වෙත ප්‍රවේශය සැපයීම.<br>✓ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ වයි-ෆයි ආවරණ කලාප ප්‍රතිශතය ඉහළ නැංවීම.<br>✓ වයි-ෆයි මගින් ආවරණය වන නේවාසිකාගාර ප්‍රතිශතය ඉහළ නැංවීම<br>✓ අධ්‍යයන කාර්ය මන්ඩලයේ සියලු දෙනා සඳහා පුද්ගලික පරිගණක ලබාදෙන බව සහතික කිරීම |
| | **ඉලක්කය 3. අධ්‍යාපන සහ පර්යේෂණ අදාළත්වය අභිවර්ධනය කිරීම**<br>• වර්ෂ 2023 වන විට උපාධිය ලබා වසරක් තුළ සමස්ත රැකියා නියුක්තතාව 95% දක්වා ඉහළ නැංවීම පිණිස සියලු උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වල විෂයමාලා සංශෝධනය කිරීම.<br>• වර්ෂ 2023 වන විට සියලු විෂයමාලාවන්ට නිමැවුම් පාදක අධ්‍යාපන මූලධර්ම ක්‍රමවේද හඳුන්වාදීම සම්පූර්ණ කිරිම. |
| | **ඉලක්කය 4. යුක්තිය සහ සාධාරණත්වය සවිබල ගැන්වීම**<br>• විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා සැපිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් වර්ෂ 2023 වන විට ප්‍රධාන ගොඩනැගිලිවලට සැපයීම සහතික කිරීම.<br>• වර්ෂ 2023 වන විට විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් 25 දෙනෙකු සඳහා ඉගෙනුම් පහසුකම් වැඩිදියුණු කිරීම. |
යුරෝපීය සංගම් ප්‍රදානය මගින් අරමුදල් සපයන බ්‍රිටේ (BRITAE) ව්‍යාපෘතිය යටතේ සුහුරු කෘෂි පාරිසරික පද්ධති පාදක ප්‍රත්‍යාස්ථිති මධ්‍යස්ථානය (අති නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂන පහසුකම්වලින් සමන්විත සියලු උපකරණ සහිත නවීන සම්පත් මධ්‍යස්ථානය) ස්ථාපිත කිරීම නිමා කළ අතර ජාත්‍යන්තර නියෝජිතායතන විසින් අරමුදල් සපයන ව්‍යාපෘති කිහිපයක පීඨය නිරතව සිටියි. වයි-ෆයි ජාලය පුළුල් කිරීම ද සිදු කරමින් පවතී.

මගේ අදහස වනුයේ මූල්‍යමය හා අනෙකුත් බාධක මධ්‍යයේ වුව ද, 2023 වසර තුළ පීඨය සාර්ථකව සිය කාර්යයන් ඉටු කළ බව වන අතර කැපවීමෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලයක් හා ශිෂ්‍යයන් සමග කටයුතු කිරීමට ලැබීම ගැන මම සතුටු වන්නෙමි.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම / සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/ සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | උණ ගස පිළිබඳ වැඩමුළුව - 2023 ඔක්තෝබර් 13 වැනි දින ආචාර්ය අයි.ආර්. පලිහක්කාර විසින් පවත්වන ලදී | වැවිලි අංශයේ සේවා යෝජකයින් සහ උපාධි අපේක්ෂකයින් |
| | විද්‍යාතා වැඩසටහනේ සංවර්ධන නිලධාරීන් සඳහා වැඩමුළුව - ගාල්ල, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරන ලදී. | විද්‍යාතා වැඩසටහනේ සංවර්ධන නිලධාරීන් (11) - ගාල්ල |
| | කොහිලවලින් අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන, කෘෂිකර්ම පීඨයේ, තාක්ෂණ හුවමාරු ඒකකය (TTC) විසින් සංවිධානය කරන ලදී. | සුළු පරිමාණ ව්‍යවසායකයින් (සහභාගීකයන් 24) |
| | ආහාර පිරිසැකසුම සහ සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරන ලදී | කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (සහභාගීකයන් 50) |
| | "රස ගුණ වරුණ ආහාර තාක්ෂණ පුහුණු වැඩමුළුව" සංවිධානය කරන ලද්දේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය සහ ක්‍රීඩා, යෞවන කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසිනි. | මාතර, ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල සුළු පරිමාණ ව්‍යවසායකයින් (සහභාගීකයන් 30) |
| සබැඳි වැඩසටහන් | කෘෂිකර්ම පීඨය සහ ලියුම්ලියානා විශ්වවිද්‍යාලය, ස්ලෝවේනියාව | |
| | රුහුණ විශ්වවිද්‍යාලය සහ කියුෂිං සාමාන්‍ය විශ්වවිද්‍යාලය, චීනය | |
| | රුහුණ විශ්වවිද්‍යාලය සහ ෂිබාවුරා තාක්ෂණික ආයතනය, ජපානය | |
| | කෘෂි ඉංජිනේරු විද්‍යා සහ පරිසර අධ්‍යයනාංශය සහ සදාහරිත වැවිලි සමාගම | |

**ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 04 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 02 |
| දේශීය සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 04 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ නිබන්ධන | 04 |
| වාචික ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 20 |
| පෝස්ටර් ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 05 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 01 |
| එකතුව | **40** |

# සම සෞඛ්‍ය විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

නව තාක්ෂණයෙන් උපරිම වාසි ලබා ගනිමින් සහ අපගේ මානව සම්පත් උපරිම කර ගනිමින් නොසැලෙන කැපවීමෙන් අපගේ අධ්‍යයන හා අනෙකුත් ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගනිමින් ආර්ථික අභියෝග මධ්‍යයේ අධිෂ්ඨානයෙන් කටයුතු කර සම සෞඛ්‍ය විද්‍යා පීඨය 2023 වසරේදී සිය නොපසුබස්නා බව සහ කැපවීම නිදර්ශනය කරන ලදී. අධ්‍යාපනික අංශයෙන් ගත් කළ, 2023 දෙසැම්බර් 14 දින පැවැති උපාධි ප්‍රදානෝත්සවයේදී ඖෂධවේද ගෞරව උපාධිධාරීන් 55 ක්, හෙද විද්‍යා ගෞරව උපාධිධාරීන් 49 ක් සහ වෛද්‍ය රසායනාගාර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිධාරීන් 22 ක් ඇතුළුව සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක උපාධි ලැබීම අප සාඩම්බරයෙන් සැමරුවෙමු. පර්යේෂණවලට අදාළව, අඛණ්ඩව සයවැනි වසර සඳහා වර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සනිටුහන් කරමින් සම සෞඛ්‍ය විද්‍යා පීඨය සිය පළමු පර්යේෂණ සම්මන්ත්‍රණය වන iRuFARS – 2023 සඳහා සත්කාරකත්වය දරන ලද අතර එහිදී සම සෞඛ්‍ය විද්‍යාවන්හි දැනුම අභිවර්ධනය කිරීම පිණිස වන අපගේ කැපවීම පිළිබිඹු කරමින් නිබන්ධන 104 ක් ප්‍රකාශයට පත් කරන ලදී. හෙද විද්‍යා සහ වෛද්‍ය රසායනාගාර විද්‍යා 15 වන ශිෂ්‍ය කාණ්ඩයේ සහ ඖෂධවේද 13 වන ශිෂ්‍ය කාණ්ඩයේ සමාරම්භක උත්සවය 2023 ජූලි 17 වනදා පැවැත්වූ අතර අධ්‍යයනාංශ තුනෙහිම අධ්‍යයන කටයුතුවල ආරම්භය 2023 අගෝස්තු 02 වැනි දින සිදු විය.

මෙහෙයුම් සුමටතාව සහ අඛණ්ඩ වැඩි දියුණුව සහතික කරමින් වර්ෂය තුළ පීඨ මණ්ඩල රැස්වීම් එකොළහක් පවත්වන ලදී.

ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම්වලට අදාළව, සම සෞඛ්‍ය විද්‍යා පීඨ ප්‍රජාව ක්‍රියාශූරව කටයුතු කරමින් 2023 අප්‍රේල් 20 දින අළුත් අවුරුදු උත්සවය, ජූනි 22 සිට 25 දක්වා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී විභව අයෝජකයන් සමග නිෂ්පාදන/නව නිපැයුම් සඳහා වාණිජකරණ අවස්ථා, 2021/2022 ශිෂ්‍ය කණ්ඩායම සඳහා සමාරම්භය හා දිව්රුම් දීමේ උත්සවය, 2023 අගෝස්තු 25 වැනිදා 2021/2022 හෙදවිද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා හිස්වැසුම් පැළඳවීමේ උත්සවය, 2023 දෙසැම්බර් 19 වැනිදා කරාපිටිය ශික්ෂණ රෝහලේ නත්තල් කැරොල් ගී ප්‍රසංගය සහ තවත් එවැනි උත්සව හා විශේෂ අවස්ථා රැසක් සංවිධානය කරනු ලැබීය. අවසාන වශයෙන් 2023 වසර සම සෞඛ්‍ය විද්‍යා පීඨය සැලකිය යුතු ජයග්‍රහණ සහ වැදගත් සන්ධිස්ථාන සපිරි වසරක් වූ අතර, අධ්‍යාපනයේ, පර්යේෂණයේ සහ ප්‍රජාව සමග කටයුතු කිරීමේ විශිෂ්ඨත්වය කෙරෙහි අපගේ කැපවීම අපි තහවුරු කරන අතර 2024 වර්ධනයේ හා සාර්ථකත්වයේ තවත් වසරක් වේ යැයි ඉත සිතින් අපේක්ෂා කරන්නෙමු

### පීඨ සමාලෝචනය

| වැඩසටහන/ | ක්‍රියාකාරකම /සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | • හෙද විද්‍යා අධ්‍යයනාංශය විසින් සකස් කරන ලද උසස් සහතිකපත්‍ර පාඨමාලා<br>- උග්‍ර උවටැන් හෙද සේවා උසස් සහතිත පත්‍ර පාඨමාලාව<br>- වාධර්කවේද හෙද සේවා උසස් සහතික පත්‍ර පාඨමාලාව<br>හෙද විද්‍යා අධ්‍යයනාංශය පිරිනමන කෙටි පාඨමාලා<br>- සත්කාර සේවා උසස් සහතික පත්‍ර පාඨමාලාව<br>- සූති විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව<br>- ශමනක සත්කාරක උසස් සහතික පත්‍ර පාඨමාලාව<br>- ස්නායුපරිහාරක අක්‍රම සඳහා පූර්ණ උවටැන් උසස් සහතිත පත්‍ර පාඨමාලාව<br>- ඩිප්ලෝමාධාරී හෙදියන් සඳහා හෙදසේවා විද්‍යාවේදී උපාධිය | |
| විෂයමාලා සංවර්ධනය<br><br>(පාඨමාලා ඒකක/ විෂයය වැඩි දියුණු කිරීම) | පහත දැක්වෙන නව උපාධි වැඩසටහන් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු පීඨය අඛණ්ඩව සිදු කරන ලදී.<br><br>1. මහජන සෞඛ්‍ය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය<br>2. සෞඛ්‍ය තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය (ප්‍රධාන ක්ෂෙත්‍රයන් තුනක්, එනම් කන්තුක තාක්ෂණවේදය, විද්‍යුත් ස්නායු රෝග විනිශ්ච තාක්ෂණවේද ආවරණය කරයි)<br>3. සෞඛ්‍ය මැදිහත්වීම් චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි. |

| | | |
|---|---|---|
| | උපාධිය(සංලග්න හා විකලාංග හා ව්‍යාවෘතික චිකිත්සාව)<br>**<u>හෙද විද්‍යා අධ්‍යයනාංශය</u>**<br>හෙද විද්‍යා උපාධි වැඩසටහනේ විද්‍යාවේදී ගෞරව උපාධියේ විෂයමාලාව ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රියාදාමය අධ්‍යයනාංශය මේ වන විට සිදුකරමින් පවතියි.<br><br>**<u>ඖෂධවේද අධ්‍යයනාංශය</u>**<br>ඖෂධවේද උපාධි වැඩසටහනේ විෂයමාලාව ප්‍රතිශෝධනය කිරීම අධ්‍යයනාංශය අඛණ්ඩව සිදු කරයි.<br><br>සායනික විද්‍යා සහ මහජන සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය සහ මූලික විද්‍යා අධ්‍යයනාංශය පිහිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාදාමය ආරම්භ කර තිබේ. | ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය සඳහා විදේශයන්හි රැකියා සඳහා වැඩි අවස්ථා හිමිවනු ඇතැයි පීඨය අපේක්ෂා කරයි. |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | 2021 වසර තුළ ශිෂ්‍යයන් හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පීඨය වැඩමුළු ගණනාවක් පැවැත්වූ අතර ඒවායින් කිහිපයක් පහත දැක්වේ. | |
| ප්‍රජා සේවා | හෙදියන් සඳහා වැඩමුළු- ELENEC, පර්යේෂණ වැඩමුළුව | |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ඔක්තෝබර් 12 වැනි දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයට නිෂ්පාදන වාණිජකරණය කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම කරන ලද්දේ වී.එම් පතිරාජ මෙනෙවිය, වෛද්‍ය සවින්ති අමරසිරි සහ ඔසුසල් අධ්‍යයනාංශයේ සිසුන් විසිනි. | |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව 10<br>දුක් ගැනවිලි පැමිණිලි කමිටුව 07<br>නේවාසිකාගාර, ආපනශාලා හා ආරක්ෂක කමිටුව 02<br>දේශන ශාලා කමිටුව 03<br>ශිෂ්‍යත්ව කමිටුව 06<br>පර්යේෂණ කමිටුව 07<br>නවක වද මර්ධන කමිටුව 16<br>අත් පොත් කමිටුව 04<br>ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචන කමිටුව 08<br>තාක්ෂණික පැවරුම් ඒකක 05 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ හා ප්‍රමාණය)<br><br>-දේශීය<br>-ජාත්‍යන්තර | - ලෝක ප්‍රතික්ෂුද්‍රජීවී පිළිබඳ දැනුවත් කිරීමේ සතිය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන දූර්වලයි - වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය<br>- සක්‍රීය පුරවැසි වැඩසටහන මෙහෙයවීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීමේ වැඩමුළුව<br>- හෙදියන් සඳහා වැඩමුළුව - හෙද අධ්‍යයනාංශය<br>- Elenec වැඩමුළුව - හෙද අධ්‍යයනාංශය<br>- සිසුන් සඳහා සායනික ඖෂධ වැඩමුළුව - ඖෂධවේද අධ්‍යයනාංශය<br>- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මානසික සෞඛ්‍ය ප්‍රථමාධාර වැඩමුළුව<br><br><u>වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් පවත්වන ලද වැඩසටහන්</u><br>- "අධ්‍යයන සාර්ථකත්වය කරා මතක ශක්තිය වැඩි කිරීම" පිළිබඳ මාර්ගගත වෙබ් සම්මන්ත්‍රණය<br>- වෘත්තීය ඉංග්‍රීසි පරීක්ෂණය පිළිබඳ මාර්ගගත වෙබ් සම්මන්ත්‍රණය 'ගෝලීය අවස්ථාවන් සඳහා ඔබ සූදානම් වන්න'<br>- සෞඛ්‍ය සේවකයින් සඳහා නිශ්චයෝක්තිකත්වය<br>- වෘත්තීය ඉංග්‍රීසි පරීක්ෂණය<br>- "වර්තමාන ආර්ථික අර්බුදය හා පෝෂණ සමතුලිතතාවය" - නවෝත්පාදන සමාජය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය<br>- "පශ්චාත් ලේඛන පර්යේෂණ අවස්ථා සහ ප්‍රකාශන" පිළිබඳ වැඩමුළුව | |

| | | |
|---|---|---|
| සබැඳි වැඩසටහන් | - ජාත්‍යන්තර හෙද ශිෂ්‍යයන් සඳහා විදේශ වෛකල්පික විෂය වැඩසටහන<br>- ස්නායු සත්කාර ව්‍යාපෘතිය | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 25 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 07 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 03 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 77 |
| පොත්වල ඡේද | 01 |
| එකතුව | **116** |

# ඉංජිනේරු පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් තුනේ වැඩසටහන් සමාලෝචන සම්පූර්ණ කරන ලද අතර ඉංජිනේරු වැඩසටහන් තුනම “A” ශ්‍රේණිය ලබා ගනිමින් ඉහළ මට්ටමක කාර්යසාධනයක් ලබා ගන්නා ලදී. එම උපාධි වැඩසටහන් තුන, එනම් සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය මෙම වැඩසටහන් සමාලෝචන ක්‍රියාදාමයට ලක් කරන ලදී. සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා නාවුක වාස්තු විද්‍යා විශේෂඥතා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන සමුද්‍රීය කර්මාන්තය විසින් එල්ල කරන අභියෝගවලට මුහුණ දීමේ හැකියාව සහිත නිපුණ ඉංජිනේරු වෘත්තිකයන් බිහිකිරීම පිණිස වූ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පුරෝගාමී ප්‍රයත්නයකි. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ ආදර්ශ පාඨමාලා සහ පුහුණුව, සහතිකකරණය සහ නැවත අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රමිතිවල දක්වා ඇති එම සංවිධානය විසින් නිශ්චිතව නියම කර ඇති අවශ්‍යතා සමග අනුකූල වන සේ මෙම වැඩසටහන සැලසුම් කර ඇත. වාණිජ නාවික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් (DGMS) විසින් නියම කර ඇති අවශ්‍යතා මගින් වැඩසටහන තවදුරටත් පාලනය වේ.

සිසුන් 521 දෙනෙකුගෙන් යුත් 24 වන කණ්ඩායම 2023 මැයි 2 වන දින ඉංජිනේරු පීඨයට ඇතුළත් කරන ලදී.
පීඨයේ ඉංජිනේරු අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුවේ සහාය ඇතිව ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකාවේ විවිධ කර්මාන්තවල මාස තුනක සහ මාස හයක කාර්මික පුහුණුවීම් සංවිධානය කරන ලදී.ජපානයේ සයිටම් විශ්වවිද්‍යාලයේ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යනාංශය සමඟ සහයෝගයෙන් 'තිරසර සංවර්ධනය සඳහා සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා පරිචයන්හි ප්‍රගමන' පිළිබඳ 9 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ACEPS 2023) 2023 මාර්තු 16 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේදී පවත්වන ලදී. ACEPS පවත්වනු ලැබූයේ ආසියානු කලාපයේ භාවිතා කරනු ලබන උසස් තිරසර ඉංජිනේරු විද්‍යා භාවිතයන් සහ ඒ ආශ්‍රිත පර්යේෂණ නිමැවුම් සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සපයනු පිණිසය. "සිවිල් ඉංජිනේරු විද්‍යාවේ මෑත කාලීන ප්‍රගමනය" (UGRS-2023) පිළිබඳ 12 වැනි උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 ඔක්තෝබර් මස 06 වැනි දින ඉංජිනේරු පීඨයේදි සාර්ථකව පවත්වන්නට යෙදුණි. අවසාන වසරේ උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබිණි. සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශ 12 වන පර්යේෂණ සම්මන්ත්‍රණයට සමගාමීව තිරසාර සිවිල් සහ පාරිසරික ඉංජිනේරු පිළිවෙත් (JSCEEP) සඟරාවේ 1 වන කලාපය දියත් කරන ලදී.

යුරෝපීය සංගමයේ Erasmus plus මගින් අරමුදල් සපයනු ලබන ශ්‍රී ලංකා වසර දෙකක කාල සීමාවක් සම්පූර්ණ කළ අතර එහි ඉදිරි කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර ඒ සඳහා විදේශීය පාර්ශවකරුවන් සය දෙනෙකු හා දේශීය පාර්ශවකරුවන් හතර දෙනෙකු දායකත්වය ලබා දේ.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය විසින් කරන ලද ඉල්ලීමක් පාදකව අන්තර්ශික්ෂණ අධ්‍යයන අධ්‍යයනාංශය මොඩියුල IS 5311 පරිගණක ඉංජිනේරු විද්‍යා උපාධිය සඳහා විවික්ත ගණිතය හඳුන්වා දෙන ලදී. | පීඨයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| ප්‍රජා සේවා | ජාතික පාසලක විද්‍යා දින ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන භාණ්ඩ සපයන ලදී. | පාසල් ශිෂ්‍යයන් |
| | ආචාර්ය ටෙරන්ස් එම්.රෙන්ගරාසු සහ ආචාර්ය ඩබ්ලිව්.එම්.කේ.ආර්.ටී.ඩබ්. බණ්ඩාර ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය විසින් සංවිධානය කරන ලද තාක්ෂණික දින උත්සවයට ගෞරවනීය ආරාධිතයන් සහ විශේෂ ආරාධිතයන් ලෙස සහභාගී | පාසල් ශිෂ්‍යයන් |

| | | |
|---|---|---|
| | විය. ආචාර්ය ටෙරන්ස් එම්. රෙන්ගරාසු මහතා මෙම අවස්ථාවට ඉංජිනේරු තාක්ෂණ අධ්‍යාපනයේ අපේක්ෂාවන් පිළිබඳ දේශනයක් පවත්වන ලදී. | |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂය වැඩි දියුණු කිරීම) | 24 වැනි ශිෂ්‍ය කාණ්ඩය සඳහා නව විෂයමාලාව හඳුන්වා දීම | පීඨයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | ආචාර්ය තුෂාර වික්‍රමාරච්චි සහ ආචාර්ය අරුණෝද බස්නායක "රුහුණ විශ්වවිද්‍යාලයේ දුරස්ථ සංවේදක චන්ද්‍රිකා ග්‍රාහක භූ ස්ථාන පද්ධතියක් ස්ථාපිත කිරීමේ යෝජනාවක් සංවර්ධනය කිරීම" පිළිබඳ වැඩමුළුවකට පීඨයේ නාමිතයන් ලෙස සහභාගී විය. | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | ආචාර්ය අරුණෝද බස්නායක දෙදින වැඩමුළුවලට සහභාගී විය; WS2: ඉහළ හැකියාවන් සහිත සිසුන් බිහි කළ හැකි ඉගැන්වීම් ක්‍රියාකාරකම් තෝරා ගැනීම සහ WS3: උසස් අධ්‍යාපන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වූ ශ්‍රී ලංකා සංගමය (SLAIHEE) විසින් පවත්වනු ලබන සිසුන් අඛණ්ඩව භාවිතා කරන කුසලතා, ක්‍රම සහ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා ඇගයීම් සැලසුම් කිරීම. | |
| | ආචාර්ය චම්පික එල්ලාවල විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද "සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව" සඳහා සහභාගී විය. | |
| | ආචාර්ය ටෙරන්ස් රෙන්ගරසු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද "විෂයමාලා සැලසුම් පිළිබඳ වැඩමුළුව" සඳහා සහභාගී විය. | |
| | ආචාර්ය එස්.එන්. මල්කාන්ති මිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "ශිෂ්‍යයින් තුළ වෙනස්කම් ඇති කිරීමේදී කථිකාචාර්ය/ සම්පස්ථ ආචාර්ය/උපදේශක භූමිකාව: සම්ප්‍රදායික චින්තනයේ සිට (සම්මුතිගත චින්තනය) මාන චින්තනයට" මැයෙන් වූ එක්දින වැඩමුළුවකට සහභාගී විය. | |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | 2022 උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික සමාලෝචනය සඳහා සමාලෝචක ලෙස ආචාර්ය නන්දිත හෙට්ටිආරච්චි සහභාගී විය. | දේශීය කර්මාන්ත |
| | ආචාර්ය කේ.ජේ.සී. කුමාර, ශ්‍රී ලංකා කෘත්‍රිම බුද්ධි සංගමයේ - ජාත්‍යන්තර කෘත්‍රිම බුද්ධි සමුළුවේ තාක්ෂණික සැසියක සභාපතිවරයෙකු සහ සමාලෝචකයෙකු ලෙස සහභාගී විය. | දේශීය කර්මාන්ත |
| | ආචාර්ය ඩී.අයි.පී. පෙරේරා මිය ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයේ කාර්මික අධ්‍යයන උපාධිය සඳහා වැඩසටහන් සමාලෝචකයෙකු ලෙස සහභාගී විය. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් |
| | ආචාර්ය ඉන්දිකා පෙරේරා මහත්මිය මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ වැඩසටහන් සමාලෝචන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළාය. | මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් |
| | මහාචාර්ය එච්.සී.පී. කරුණාසේන සහ ආචාර්ය රුවන් ගාල්ලගේ රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ 20 වැනි අධ්‍යයන සැසියේ විද්වත් මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කළහ. | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | ආචාර්ය කේ.සී. වික්‍රමසිංහ මහතා ඉංජිනේරු තාක්ෂණ ධාරාව සඳහා 2022 උසස් පෙළ ලකුණු කිරීමේ කමිටුවේ ප්‍රධාන පරීක්ෂකවරයෙකු ලෙස සේවය කළේය. | විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | ආචාර්ය ක්‍රිෂාන් වික්‍රමසිංහ මහතා ඉංජිනේරු තාක්ෂණවේද ධාරාවේ උසස් පෙළ ගුරුවරුන් සඳහා වන "සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහනේ" විෂයමාලා සංවර්ධන කමිටුවේ (CDC) සම්පත් දායක ලෙස කටයුතු කළේය. | විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය |

| වැඩසටහන | ක්‍රියාකාරකම/සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමවුම |
|---|---|---|
| | ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් පවත්වනු ලබන හරිත ආශ්‍රිත වෘත්තීය පුහුණු වැඩසටහන සඳහා සම්පත් දායකයෙකු ලෙස මහාචාර්ය තුෂාර චාමින්ද සහභාගී විය. | දේශීය කර්මාන්ත |
| | ආචාර්ය අරුණෝද බස්නායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාරිසරික හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාවේදී බාහිර උපාධි වැඩසටහන ඇගයීම සඳහා වැඩසටහන් සමාලෝචකයකු ලෙස කටයුතු කළේය. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි ශිෂ්‍යයන් |
| | මහාචාර්ය සුධීර ද සිල්වා සහ මහාචාර්ය තුෂාර චාමින්ද 2023 අප්‍රේල් 28 වන දින කැලණිය විශ්වවිද්‍යාලයේ පැවති ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ CVCD විශිෂ්ටතා සම්මාන 2022 සඳහා ඇගයුම් මණ්ඩලයේ සේවය කළහ. | කැළණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් |
| | GAP විද්‍යා පාසල සහ ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් සංවිධානය කරන ලද "හරිත ගොඩනැගිලි පිළිවෙත් තුළින් පාරිසරික තිරසාරත්වය සහතික කිරීම" යන මැයෙන් වූ වැඩමුළුවට සම්පත් දායකයෙකු ලෙස මහාචාර්ය තුෂාර චාමින්ද මහතා සහභාගී විය. | දේශීය කර්මාන්ත |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය මගින් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ විද්‍යාවේදී ඉංජිනේරු උපාධි වැඩසටහන ඇගයීම සඳහා පත් කරන ලද වැඩසටහන් සමාලෝචන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස මහාචාර්ය සුධීර ද සිල්වා මහතා කටයුතු කළේය. ඉහත සමාලෝචනය 2023 මැයි 11 සහ 12 යන දිනවල පැවැත්විණි. | මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් |
| | 2023 මැයි 26 වන දින පැවති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා උපදේශකයෙකු ලෙස මහාචාර්ය තුෂාර චාමින්ද මහතා සහභාගී විය. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| | ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් "නාගරික ජල කළමනාකරණය පිළිබඳ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ රාමුව තුළ කලාපීය පර්යේෂණ ජාලය පිහිටුවීම" සඳහා ශ්‍රී ලාංකික සාමාජිකයෙකු ලෙස මහාචාර්ය තුෂාර චාමින්ද පත් කරන ලදී. | සාමාන්‍ය මහජනතාව |
| | මහාචාර්ය කේ. වන්නිආරච්චි මහතා 2023 මැයි 29 සිට 31 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු උපාධි වැඩසටහන සඳහා ඇගැයීම් සිදුකිරීමට ඇගැයීම් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සහභාගි විය. | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් |
| | ආචාර්ය ටෙරන්ස් රෙන්ගරාසු, ආචාර්ය වාසල බණ්ඩාර සහ ආචාර්ය අරුණෝධ බස්නායක ඉංජිනේරු තාක්ෂණ විෂය සඳහා අ.පො.ස උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ඇගයීම - 2023 හි ප්‍රධාන පරීක්ෂකවරුන් ලෙස දායක වේ. | විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | ආචාර්ය ටෙරන්ස් එම්. රෙන්ගරාසු මහතා 2023 ජූලි 12 දින සිට පැවති අ.පො.ස.(උ/පෙළ) 2022 ඉංජිනේරු තාක්ෂණ ප්‍රායෝගික විභාගයේ සම පාලකවරයෙකු ලෙස සහභාගී විය. | විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | ආචාර්ය ජේ.එම්.ආර්.එස්. අප්පුහාමි 2023 ජුනි 1 වැනි දින ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) "යුරෝ කේත සඳහා ජාතික ඇමුණුම් සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම" රැස්වීමට සහභාගී විය. | දේශීය ඉංජිනේරු ප්‍රජාව |
| | ආචාර්ය ජේ.එම්.ආර්.එස්. අප්පුහාමි 2023 ජුනි 8 වැනි දින පවත්වන ලද ශ්‍රී ලංකා සුළං බල ඉංජිනේරු සංගමයේ (SLAWE) සමාරම්භක මහා සභා රැස්වීමට සහභාගී වූ අතර සංගමයේ කමිටු සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. | දේශීය ඉංජිනේරු ප්‍රජාව |
| | ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ රුහුණු ශාඛාව සඳහා "ඉංජිනේරු, වාස්තු විද්‍යා, සහ මැනුම්" අංශයේ ආංශික සම්බන්ධීකාරක ලෙස මහාචාර්ය තුෂාර චාමින්ද තේරී පත් විය. | ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය |
| | ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් 2023 ජූලි 10 සිට 13 දක්වා සංවිධානය කරන ලද "ගොඩනැගිලි තුළ තිරසාර ජල කළමනාකරණය පිළිබඳ තිව්‍ර පාඨමාලාව" සඳහා සම්පත් | ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය |

| | | |
|---|---|---|
| | දායකයෙකු ලෙස මහාචාර්ය තුෂාර වාමින්ද සහභාගී විය. | |
| | ආචාර්ය ටෙරන්ස් එම්.රෙන්ගරාජු මහතා සහ ආචාර්ය ඩබ්ලිව්.එම්.කේ.ආර්.ටී.ඩබ්. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මිනුම් වැඩ කඳවුරේ සම්පත් දායකයන් ලෙස සහභාගී විය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් |
| | 2023 සැප්තැම්බර් 18 වැනි දින පැවති රුහුණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ (CCPDHE) - 2023 උසස් අධ්‍යාපනය පිළිබඳ වෘත්තීය සංවර්ධනය සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාවේ 5 වන මොඩියුලය පිළිබඳ වැඩමුළුව සඳහා සම්පත් දායකයෙකු ලෙස මහාචාර්ය සුධීර ද සිල්වා මහතා කටයුතු කළේය. | අළුතින් පත් කළ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | මහාචාර්ය නදීජ් ප්‍රියංකර මහතා සහ මහාචාර්ය තුෂාර වමින්ද මහතා රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ අනෙකුත් විද්වතුන් සමඟ 2023 ඔක්තෝම්බර් 30 වැනි දින "ශ්‍රී ලංකාවේ ක්‍රිකට් තණතීරු සංවර්ධනය කිරීමේදී භූ-ඉංජිනේරු සහ තණ තීරු තණ කොළ කළමනාකරණයේ විද්‍යාත්මක ප්‍රවේශය" පිළිබඳ විභව පර්යේෂණ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ කොළඹදී පැවති රැස්වීමකට සහභාගී වූහ. , | සාමාන්‍ය මහජනතාව |
| | මහාචාර්ය තුෂාර වාමින්ද සහ ආචාර්ය ජේ.එම්.ආර්.එස්. අප්පුහාමි 2023 දෙසැම්බර් 7 වන දින රත්මලාන, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ "සිවිල් සහ ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන සඳහා කර්මාන්ත උපදේශක මණ්ඩල (ICB) රැස්වීමට සහභාගී විය. | දේශීය ඉංජිනේරු ප්‍රජාව |
| ජාත්‍යන්තර මට්ටමේදී දායකත්වය | මහාචාර්ය එච්.සී.පී. කරුණාසේන, 2023 ඔක්තෝම්බර් 30-31 දින දක්වා ඉන්දියාවේ චෙන්නායිහි, ඉන්දියානු තාක්ෂණ ආයතනයේ (IIT) මද්‍රාසියේ සාගර ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පැවති "සාගර බලශක්තිය - මෑත කාලීන ප්‍රවණතා පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව" හිදී දේශනයක් පවත්වන ලදී.. දේශනයේ මාතෘකාව වූයේ "ශ්‍රී ලංකාවේ දකුණුදිග ප්‍රදේශයේ මුහුදු රළ බලශක්තිය වෙත අන්තර්දෘෂ්ටියක්, ආකෘතිකරණයේ සිට සැබෑ මුහුදේ යෙදවීම්" යන්නයි. | ශාස්ත්‍රසේවී ප්‍රජාව, පර්යේෂණ ප්‍රජාව, සිසුන්. |
| | මහාචාර්ය තුෂාර වාමින්ද 2023 මාර්තු 24 සහ 31 අතර, ඉන්දියාවේ ඩෙහ්රාඩුන්, පෙට්‍රෝලියම් සහ බලශක්ති අධ්‍යයන විශ්වවිද්‍යාලයේ AMR සහ SARS-CoV-2 හි පාරිසරික මානයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහ නියැදීම් ව්‍යාපාරයකට සහභාගී විය. මහාචාර්ය තුෂාර වාමින්ද මෙම සම්මන්ත්‍රණයේදී ප්‍රධාන දේශනයක් ද පැවැත්විය. | ශාස්ත්‍රසේවී ප්‍රජාව, පර්යේෂණ ප්‍රජාව, සිසුන්. |
| | ජපානයේ හිටොසුභාෂි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය යුරිනා ඔටාකි සහ තවත් පර්යේෂකයන් දෙදෙනෙකු සහයෝගී පර්යේෂණ කටයුතු සඳහා අධ්‍යයනාංශයට පැමිණ 2023 අගෝස්තු 18 සිට අගෝස්තු 22 දක්වා මහාචාර්ය තුෂාර වාමින්ද සමඟ සාකච්ඡාවක් පැවැත්විය. | ශාස්ත්‍රසේවී ප්‍රජාව, පර්යේෂණ ප්‍රජාව, සිසුන් |
| | ජපානයේ හොකයිඩෝ බුන්ක්යෝ විශ්වවිද්‍යාලයේ (HBU) ජාත්‍යන්තර අධ්‍යයන පීඨයේ ප්‍රධානියා සහ පීඨාධිපතිවරයා, ජපානයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා ද කැටුව ඉංජිනේරු පීඨය විසින් මුල පුරා රුහුණ විශ්වවිද්‍යාලය සමඟ අත්සන් කරන ලද ඔවුන්ගේ අවබෝධතා ගිවිසුමේ කොටසක් ලෙස 2023 සැප්තැම්බර් 27 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය. මෙම වැඩසටහන සම්බන්ධීකරණය කළේ මහාචාර්ය තුෂාර වාමින්ද විසිනි. | ශාස්ත්‍රසේවී ප්‍රජාව, පර්යේෂණ ප්‍රජාව, සිසුන් |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | ඉංජිනේරු පීඨ මණ්ඩලය — 68<br>නිවාස අනු කමිටුව — 05<br>පීඨ පර්යේෂණ කමිටුව — 08<br>ඉංජිනේරු විද්‍යා අධ්‍යයන මණ්ඩලය — 12<br>තො.ස.තා. කළමනාකරණ කමිටුව — 06<br>පීඨ දුක්ගැනවිලි කමිටුව — 06 | |

| | |
|---|---|
| ගොඩනැගිලි හා ඉඩම් කමිටුව | 08 |
| ආරක්ෂක කමිටුව | 12 |
| පීඨයේ තාක්ෂණ පැවැරුම් CEL | 05 |
| නේවාසිකාගාර හා ආපනශාලා කමිටුව | 10 |
| ක්‍රීඩා උපදේශන කමිටුව | 02 |
| පීඨයේ තත්ත්ව ආරක්ෂණ ඒකකය | 10 |
| ඉංජිනේරු පීඨයේ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියේ විෂයමාලාව හා අතුරු නීති ප්‍රතිශෝධන අනු කමිටුව | 12 |
| ආචාර ධර්ම සමාලෝචන කමිටුව | 06 |
| නවක වද මර්ධන කමිටුව | 11 |
| පුස්තකාල කමිටුව | 12 |
| ප්‍රතිඵල සැකසුම් මෘදුකාංග සංවර්ධන කමිටුව | 07 |
| රුහුණ ඉංජිනේරු පීඨයේ සුබසාධන අරමුදල (WeF-REF) | 10 |

| | | |
|---|---|---|
| ලැබුණු අරමුදල් (අරමුණ සහ මුදල් ප්‍රමාණය)<br>-දේශීය<br>-ජාත්‍යන්තර | ආචාර්ය ගීත් ප්‍රියංකර, ආචාර්ය චතුර සෙනෙවිරත්න, සහ ආචාර්ය මධුශංක ලියනගේ (විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සහකාර මහාචාර්ය) “Blockchain Enabled RF Radiation Exposure Level Mesurements in Wireless Mobile Networks”. පර්යේෂණ ව්‍යාපෘති යෝජනාව සඳහා 2022/2023 ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ පර්යේෂණ ප්‍රදානය රු. 500000 දිනා ගන්නා ලදී. | |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් තුන පිළිබඳ වැඩසටහන් සමාලෝචනය සම්පූර්ණ කරන ලද්දේ ඉංජිනේරු වැඩසටහන් තුනම උසස් “A” ශ්‍රේණි සමඟින් ගුණාත්මක භාවයෙන් ඉහළ මට්ටමේ සාධනයක් ලබමිනි. | ඉංජිනේරු පීඨයේ උපාධි අපේක්ෂකයින් |
| | මහාචාර්ය චමින්ද කරුණාසේන මහතා ක්වීන්ස්ලන්ත තාක්ෂණික විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ යාන්ත්‍රික, වෛද්‍ය සහ ක්‍රියාදාම ඉංජිනේරු විද්‍යා පාසලේ ගරු සහකාර මහාචාර්යවරයකු ලෙස වසර දෙකක කාල සීමාවක් සඳහා පත් කරනු ලැබීය. විද්‍යාවේ ප්‍රගමනය උදෙසා ඔහුගේ විශිෂ්ඨ පර්යේෂණ හා නව්‍යකරණය පිළිගැනීමක් ලෙස මෙය ප්‍රදානය කරන ලදී. | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | 2023 ජුනි 7 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ දී පැවැත්වුණු 19 වැනි අධ්‍යයන සැසියේදී ඉංජිනේරු, තාක්ෂණ හා විද්‍යා සැසියේ හොඳම ඉදිරිපත් කරන්නා ලෙස ආචාර්ය කේ.ජේ.සී.කුමාර සම්මාන ලැබීය. | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | 2023 සැප්තැම්බර් 2 වන දින IMechE ශ්‍රී ලංකා අංශ විසින් සංවිධානය කරන ලද දකුණු ආසියානු කලාපීය තරඟාවලිය සඳහා සහභාගිවන්නන් තෝරා ගැනීම සඳහා Speak Out for Engineering තරඟය සඳහා යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශයේ 4 වන අධ්‍යයන වාරයේ ශිෂ්‍ය ලක්දිනු ද සිල්වා සහභාගී වී ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී. | උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අවසන් වසරේ උපාධි අපේක්ෂකයකු වන විදුර බණ්ඩාර විජේකෝන් 2023 IET තරුණ වෘත්තිකයන්ගේ තාක්ෂණික සම්මන්ත්‍රණය ජයග්‍රහණය කළේය. ඔහුගේ “පද්ධති අවස්ථිති බව පුරෝකථනය කිරීම සඳහා යන්ත්‍ර ඉගෙනුම් පදනම් වූ ප්‍රවේශයන් පිළිබඳ විවේචනාත්මක තක්සේරුව” යන නිබන්ධනය ඔහුට හොඳම තාක්ෂණික නිබන්ධන සම්මානය හිමිකර දුන්නේය. | |
| | 2019 වසරේ Cleaner Production සඟරාවේ "ශ්‍රී ලංකාවේ නේවාසික වැසිජල භාවිතයේ සුලභතාව සහ මහජන පිළිගැනීම" පිළිබඳ විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා මහාචාර්ය තුෂාර චමින්ද මහතා ජනාධිපති සම්මානය දිනා ගන්නා ලදී. සම්මාන උළෙල | අධ්‍යයන කාර්ය මණ්ඩලය |

| | | |
|---|---|---|
| | 2023 නොවැම්බර් 21 වැනි දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. | |
| | ආචාර්ය ජී.අයි.පී. පෙරේරා මිය සහ ආචාර්ය ක්‍රිෂාන් වික්‍රමසිංහ 2020 වසරේ විද්‍යා පර්යේෂණ සඳහා වන ගෞරවනීය ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබූහ. | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | මහාචාර්ය තුෂාර චාමින්ද විසින් අප්‍රේල් 7 වැනි දින පේරාදෙණිය ජල තාක්‍ෂණ ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානයේ පැවති ජාත්‍යන්තර ජල සංගමයේ තරුණ ජල වෘත්තිකයන්ගේ (IWA-YWP) ශ්‍රී ලංකා ශාඛාවෙහි සමාරම්භක රැස්වීමේදී පූර්ණ සැසි දේශනයක් පවත්වන ලදී. | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | 2023 මාර්තු 16 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේදී ජපානයේ සයිටම් විශ්වවිද්‍යාලයේ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් තිරසාර සංවර්ධනය සඳහා සිවිල් සහ පාරිසරික ඉංජිනේරු භාවිතයන් පිළිබඳ 9 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ACEPS 2023) පවත්වන ලදී. | ACEPS පිහිටුවන ලද්දේ ආසියානු කලාපයේ භාවිතා වන උසස් තිරසාර ඉංජිනේරු භාවිතයන් සහ ඒ ආශ්‍රිත පර්යේෂණ ප්‍රතිඵල සාකච්ඡා කිරීම සඳහා සංසදයක් සැපයීම සඳහා ය. |
| | "සිවිල් ඉංජිනේරු විද්‍යාවේ මෑත කාලීන දියුණුව" (UGRS-2023) පිළිබඳ 12 වන උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 ඔක්තෝබර් 06 වන දින ඉංජිනේරු පීඨයේදී සාර්ථකව පැවැත්විණි. | අවසාන වසරේ උපාධි අපේක්ෂකයින් (ඔවුන් සියල්ලන්ටම ඔවුන්ගේ අවසාන වසර පර්යේෂණ ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබුණි)<br>සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශය 12 වන UGRS සමඟ සමගාමීව තිරසාර සිවිල් සහ පාරිසරික ඉංජිනේරු පිළිවෙත් (JSCEEP) සඟරාවේ 1 වන කලාපය දියත් කරන ලදී. |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු ශිෂ්‍ය සංගමය විසින් "ROBAX'23" මැයෙන් දින දෙකක වැඩමුළුවක් 2023 පෙබරවාරි 1 සහ 2 යන දිනවල පවත්වන ලදී. | IEEE RAS සමඟ සහයෝගීතාවයෙන් යුත් 22 වන සහ 23 වන කාණ්ඩවල සිසුන් සඳහා. මෙම වැඩමුළුවේ අරමුණ වන්නේ රොබෝ තාක්ෂණයේ වැදගත්කම සහ භාවිතය විස්තර කිරීම, Wokwi මාර්ගගත වේදිකාව මත පදනම් වූ Arduino ක්‍රමලේඛනය සහ රොබෝ සමාකරණ, අවශ්‍ය උපකරණ සහිත බලුටූත් පාලන රොබෝව සකස් කිරීම (කණ්ඩායම් ක්‍රියාකාරකම්) විස්තර කිරීමයි. |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු ශිෂ්‍ය සංගමය විසින් "රුහුණ ධාවන තරඟ පිළිබඳ ප්‍රේරණ සැසිය" | සිය වරණය මත ඉංජිනේරු පීඨයෙන් රුහුණ ධාවන තරඟ කණ්ඩායමට එක්වූ ශිෂ්‍යයන් සඳහා |
| | XbotiX 2023, විද්‍යුත් හා තොරතුරු සංගමය යාන්ත්‍රික ඉංජිනේරු සංගමය, IET සහ IEEE ශිෂ්‍ය සංගම් සමඟ සහයෝගිතාවයෙන් සංවිධානය කරන වාර්ෂික රොබෝ තරඟාවලියේ 7 වන අදියර 2023 ජූලි 10 වන දින පීඨ පරිශ්‍රයේදී සාර්ථකව අවසන් විය. | උපාධි අපේක්ෂකයින්, පාසල් ළමුන් |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද "සාර්ක් හුවමාරු වැඩසටහන අතරතුර ජපානයේ ලබාගත් අත්දැකීම් බෙදාගැනීම" මැයෙන් සැසියක් 2023 අප්‍රේල් 23 වන දින පැවැත්විණි. | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශයේ අවසන් වසරේ ශිෂ්‍යයන්. ජපානයේ පැවැති හුවමාරු වැඩසටහන සඳහා සහභාගි වූ එස්.ටී.ආර්. ප්‍රනාන්දු සහ එම්.අයි. ෆ්‍රැන්සිස්කු මෙම සැසිය පවත්වන ලදී. |

| | | |
|---|---|---|
| | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු ශිෂ්‍ය සංගමය සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ තරුණ සාමාජික අංශය (IESLYMS) රුහුණ ශිෂ්‍ය ශාඛාව විසින් ටෙක්නෝ ජාතික ප්‍රදර්ශනයේදී CAD Eager නිර්මාණ තරඟය සංවිධානය කරන ලදී. | 2023 වසර සඳහා රටේ ප්‍රමුඛ වෘත්තිකයන්ගේ සහාය ඇතිව ඔවුන්ගේ අත්දැකීම් ඉංජිනේරු උපාධි අපේක්ෂක ප්‍රජාවේ ප්‍රතිලාභය පිණිස බෙදා හදා ගැනීම පිණිස වෙබ් සම්මන්ත්‍රණ අටක් අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදී. |
| | ඉංජිනේරු වෘත්තියේ කාන්තාවෝ සහ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ආයතනයේ රුහුණ විශ්වවිද්‍යාල ශාඛාව විසින් අන්තර් විශ්වවිද්‍යාල තරඟයක් ලෙස සංවිධානය කරන ලද Eminence 3.0 අගෝස්තු 26 වැනිදා සාර්ථකව පවත්වන ලදී. | ඉංජිනේරු පීඨවල උපාධි අපේක්ෂකයින්. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් ඇතුළු කණ්ඩායම් 27ක් තරගයට සහභාගි වූහ. |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුව සහ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ආයතන (IEEE) ශිෂ්‍ය ශාඛාව 2023/09/02 දින IEEE ඉලෙක්ට්‍රොනික නිර්මාණ තරගයේ පළමු වටයේ සම සත්කාරකත්වය දරන ලදී. SparkLink 1.0 2023 සැප්තැම්බර් 10 වන දින විදුලි හා තොරතුරු ඉංජිනේරු අධ්‍යයනාංශයේදී පැවැත්විණි. | උපාධි අපේක්ෂකයන් |
| | අධ්‍යයනාංශය හා රුහුණ විශ්වවිද්‍යාලයේ සිවිල් හා පාරිසරික සංගමය එක්ව "ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි නවා බිම් නැංගුරම් සැලසුම් හා ජම්බාර ගැසීම" පිළිබඳ වැඩමුළුව 2023 ජූනි 9 වැනි දින ඉංජිනේරු රංජන් ප්‍රනාන්දු මහතා විසින් පවත්වන ලදී. | උපාධි අපේක්ෂකයන් |
| සබැඳි වැඩසටහන් | ඕස්ට්‍රේලියාවේ රාජකීය මෙල්බර්න් තාක්ෂණ ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය අතර ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන | මෙමගින් ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් ඇති කරනු ලබන අතර එයින් රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ සුවිශේෂී හැකියාවන්ගෙන් යුතු ශිෂ්‍යයන් ආකර්ෂණය කර ගැනීමට රාජකීය මෙල්බර්න් තාක්ෂණික ආයතනයට හැකියාව ඇති කරයි.<br>මෙම ඒකාබද්ධ සහයෝගිතාව හරහා රුහුණ විශ්වවිද්‍යාලයට සහයෝගිතා පර්යේෂණ සිදු කිරීමට, ප්‍රකාශන පළ කිරීමට, සම්මන්ත්‍රණ හා ශාස්ත්‍රීය සැසිවලට සහභාගි වීමට, ශාස්ත්‍රීය ලිපි ලේඛන හා අනෙකුත් තොරතුරු හුවමාරු කර ගැනීමට, පීඨ කාර්ය මණ්ඩල හුවමාරු කර ගැනීමට, ඒකාබද්ධ බඳවා ගැනීම් ඇතුළුව සහයෝගිතා පර්යේෂණ පුහුණු වැඩසටහන් පිළිබඳ ගවේෂණය කිරීමට හා රුහුණ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය වැඩි දියුණු කිරීමට හැකියාව ලැබෙනු ඇත. |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු ශිෂ්‍ය සංගමය සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ තරුණ සාමාජික අංශය (IESLYMS) රුහුණු ශිෂ්‍ය ශාඛාව විසින් ටෙක්නෝ ජාතික ප්‍රදර්ශනයේදී CAD Eager නිර්මාණ තරඟය සංවිධානය කරන ලදී. | ශිෂ්‍යයන් හා සාමාන්‍ය මහජනතාව |
| | මහාචාර්ය තුෂාර වාමින්දගේ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතියක් යටතේ ජපානයේ ටෝකියෝ හි සති දෙකක පුහුණු වැඩසටහනකට සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශයේ අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු (ඉසුර වික්‍රමනායක සහ ශලනි රාජපක්ෂ) සහභාගී විය. ඔවුන්ගේ පුහුණු | පීඨයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |

| | | |
|---|---|---|
| | වැඩසටහනට 2023 පෙබරවාරි 8 සිට 21 දක්වා ටෝකියෝ හි ඔචනොමිසු විශ්වවිද්‍යාලයේ qPCR යන්ත්‍රයක් භාවිතයෙන් ජලය සහ පාංශු සාම්පල වලින් වෛරස් විශ්ලේෂණය ඇතුළත් විය. | |
| | සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශයේ අවසාන වසරේ උපාධි අපේක්ෂකයකු වන එල්.ජී.පී. පෙරේරා (EG/2018/3416), මහාචාර්ය තුෂාර චාමින්ද සමඟ සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ජපානයේ ටෝකියෝ හි ඔචනොමිසු විශ්වවිද්‍යාලයේ 2023 ඔක්තෝබර් 24 සිට 31 දක්වා පුහුණු වැඩසටහනකට සහභාගී විය. | පීඨයේ උපාධි අපේක්ෂකයන් |
| | සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශයේ අවසන් වසරේ ශිෂ්‍යයෙකු වන S. සසිවරාජන් මහතා, මහාචාර්ය තුෂාර චාමින්ද සමඟ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන යටතේ 2023 අගෝස්තු 26 සිට සැප්තැම්බර් 1 දක්වා ජපානයේ කනසාවා විශ්වවිද්‍යාලයේ පුහුණු වැඩසටහනකට සහභාගී විය. | පීඨයේ උපාධි අපේක්ෂකයන් |
| | 2023 පෙබරවාරි 21 සිට 28 දක්වා ජපානයේ පැවති සාක් හුවමාරු වැඩසටහන (JENESYS) සඳහා 20 වන කණ්ඩායමේ සිසුන් දෙදෙනෙකු වන එස්.ටී.ආර්. ප්‍රනාන්දු සහ එම්.අයිත ෆ්‍රැන්සිස්කු. සහභාගී විය. | මෙම වැඩසටහන බලශක්තිය යන තේමාව කෙරෙහි අවධානය යොමු කරන ලද අතර ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලය විසින් තෝරා ගැනීම සිදු කරන ලදී. එම කාලය තුළ ඔවුන්ට කවාසාකි හි මෙගා සූර්ය බලාගාරයක් නැරඹීමට, චිබා වාණිජ විශ්වවිද්‍යාලයේ සූර්ය බලශක්ති උත්පාදනය, ඔහාරා වරායේ අක්වෙරළ සුළං බලශක්ති උත්පාදනය සහ ජපන් සංස්කෘතික ක්‍රියාකාරකම් කිහිපයකට සහභාගී වීමට අවස්ථාව ලැබුණි. ජපානයේ නව්‍ය සහ තිරසාර භාවිතයන් ඉගෙන ගැනීමට සහ ගවේෂණය කිරීමට මෙය ඔවුන්ට කදිම අවස්ථාවක් විය. |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 11 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 06 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 14 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 09 |
| සංස්කරණ කාර්යය | 01 |
| එකතුව | 47 |

# ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

2023 වසර 2005 වසරේදී ස්ථාපිත කරනු ලැබූ ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ 18 වැනි වසරයි. වත්මනෙහි පීඨය ධීවර හා සාගර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය සහ සාගර හා මිරිදිය විද්‍යා ගෞරව උපාධිය ලෙස උපාධි වැඩසටහන් දෙකක් පවත්වයි. පළමුව සඳහන් කළ පාඨමාලාවට අදාළව පීඨය මේ දක්වා ධීවර සහ ජලජීවී වගාව යන ක්ෂේත්‍රයන්හි විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත උපාධිධාරීන් කණ්ඩායම් 13 ක් බිහි කොට තිබේ. දෙවන උපාධි වැඩසටහනේ තෙවන ශිෂ්‍ය කාණ්ඩය සාගර විද්‍යාව, සමුද්‍රීය භූ විද්‍යාව හෝ සාරස විද්‍යාව සහ ජල තාක්ෂණය විෂයන්හි විශේෂ උපාධි හිමි කර ගත්තේය. උපාධි වැඩසටහන් දෙක සඳහා වාර්ෂිකව බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 2023 වසරේදී 210 දක්වා ඉහළ නැංවීමට පීඨය එකඟ විය. රටේ අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස සහ බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නංවනු පිණිස පීඨය සාගර සේවා සහ සම්පත් කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන නම් නව උපාධි වැඩසටහනක් හඳුන්වා දීමට අදාළ කටයුතු පීඨය විසින් මූල්‍ය හා කළමනාකරණ පීඨය සමග ඒකාබද්ධව ආරම්භ කර තිබේ. වාරිත්‍රමය නීතිය, ධීවර කර්මාන්තයට අදාළ ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ, විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වගාව සහ මත්ස්‍ය පසු අස්වනු ශිල්ප ක්‍රම නමින් කෙටි පාඨමාලා තුනක් සකස් කර විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හරහා ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. කොවිඩ්-19 වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන්ඇති වූ අතපසු වූ වැඩ කඩිනමින් නිමා කරමින් ප්‍රමාදයකින් තොරව ශිෂ්‍යයන්ට උපාධි පිරි නැමීමට අවශ්‍ය පියවර පීඨය ගෙන තිබේ.

එසේම, ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් පීඨය අඛණ්ඩව සිදුකළ අතර, ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි විද්‍යාගාරයක් ලෙස ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ සාරස විද්‍යා හා ජලතාක්ෂණ අධ්‍යයනාංශයේ විද්‍යාගාරයේදී දකුණු පළාතේ කර්මාන්තශාලාවල ජලය සහ අපජලය පරීක්ෂා කිරීම වැනි සේවාවන් මගින් සමාජීය සේවාවන් ඉටු කරන ලදී. සමාජය සමග දැනුම හා අත්දැකීම් බෙදාහදා ගනිමින් පීඨයේ ශිෂ්‍යයන්, කාර්ය මණ්ඩලය හා ආදි විද්‍යාර්ථීන් වෙබ් සම්මන්ත්‍රණ කිහිපයක් පැවැත්වීය. අධ්‍යයන කාර්ය මණ්ඩලය විසිනු ඉටු කළ ජාතික සේවාවන්ට ධීවර කටයුතු සඳහා ජාතික විද්‍යා පදනමේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු ලෙස මහාචාර්ය කේ.එච්.එම්.ඒ. දීපානන්ද මහතා සේවය කිරීම ඇතුළත් විය.

පීඨ සාමාජිකයන් 2023 වසරේදී ජාත්‍යන්තර සුවිගත වාරසඟරාවල ලිපි 19 ක් සහ විවිධ සංසදවලදී උධෘත 55ක් ප්‍රකාශයට පත් කර තිබේ, ඊට අමතරව, කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ප්‍රකාශන සඳහා 2023 වසර තුළ ලත් උපුටන සංඛ්‍යාව 450කට ආසන්න විය.

### පීඨ සමාලෝචනය

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | දූ.අ.අ.ඒකකයේ අධ්‍යයන මණ්ඩලය හරහා හඳුන්වා දීම පිණිස ධීවර කර්මාන්තයට අදාළ වාරිත්‍රමය නීතිය, ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ, විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වගාව සහ මත්ස්‍ය පසු අස්වනු ශිල්ප ක්‍රම නමින් කෙටි පාඨමාලා තුනක් සම්පූර්ණ කරන ලදී. | ධීවර ප්‍රජාවේ සාමාජිකයන්, ධීවර සහ ජලජීවී වගා ක්ෂෙත්‍රයන් හා සම්බන්ධ කුඩා පරිමාණ ව්‍යවසායකයන් සහ රාජ්‍ය නිලධාරින්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම |
| ගාස්තු අයකරන පාඨමාලා | සමුද්‍රීය සේවා සහ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හරහා ආරම්භ කිරීමට අනුමතිය ලබා දෙන ලදී. | සමුද්‍රීය සේවා අංශයේ රැකියා වෙළඳපොළෙහි පවතින හිදැස පිරවීම සහ පීඨ දෙක අතර (ධී.සා.වි.තා සහ මූ.ක.පීඨ) අත්දැකීම් බෙදාහදා ගැනීම |
| ප්‍රජා සේවා | ජලය සහ අප ජලය පරීක්ෂාව සඳහා සාරස විද්‍යා සහ ජල තාක්ෂණ අධ්‍යයනාංශයේ ඇති ධී.සා.වි.පීඨයේ සේවා විද්‍යාගාරය අඛණ්ඩව පවත්වා ගැනීම (ශ්‍රී ලංකා මධ්‍යම පරිසර | පරිසර දූෂණය අවම කිරීම පිණිස ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රාදේශීය |

| | | |
|---|---|---|
| | අධිකාරියේ ලියාපදිංචි විද්‍යාගාරයකි) | කර්මාන්ත දැනුවත් කිරීම. |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/ විෂය වැඩිදියුණු කිරීම) | විෂයමාලා සංවර්ධන හා අධීක්ෂණ කමිටුව සඳහා යොමු කිරීම් අනුදේශ සකස් කරන ලදී. | කමිටුවේ සාමාජිකයන්ගෙන් කාර්යක්ෂම හා ඵලදායි සේවයක් සහතික කිරීම. |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ සංවර්ධන වැඩසටහන් සඳහා කාර්යමණ්ඩල සාමාජිකයන් (අධ්‍යයන හා අනධ්‍යයන) සහභාගී විය. | කාර්ය මණ්ඩලයේ ධාරිතාවය ගොඩ නැංවීම |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | මහාචාර්ය කේ.එච්.එම්.ඒ.දීපානන්ද- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ඇතුළත් කිරීම, ප්‍රතීතනය සහ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී. | අදාළ ජාතික ආයතන සමග දැනුම හා අත්දැකීම් බෙදාහදා ගැනීම |
| ලැබුණු අරමුදල් (අරමුණ සහ මුදල් ප්‍රමාණය)<br>-දේශීය<br>-ජාත්‍යන්තර | ACIAR ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වා ගෙන යාම. | ධී.ස.වි. පීඨයේ අධ්‍යයන මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පශ්චාත් උපාෂ පිරි නමයි<br><br>විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීමට උපකාර වේ. |
| පවත්වනු ලැබූ වැඩමුළු/ සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ උ/පෙ ජෛවපද්ධති තාක්ෂණ ශිෂ්‍යයන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. | ශිෂ්‍යයන්ගේ උ/පෙ විෂය නිර්දේශයේ ප්‍රායෝගික අංශ පිළිබඳව ඔවුනට සෘජු ප්‍රායෝගික අත්දැකීම් ලැබේ. |
| | මත්ස්‍ය පශ්චාත් අස්වනු හසුරුවීම හා පිරිසැකසුම් කිරීම පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. | මාදම්පාගම විද්‍යාත මධ්‍යස්ථානයෙන් තෝරා ගත් කාන්තාවන් 25 දෙනෙකු මත්ස්‍ය පශ්චාත් අස්වනු හසුරුවීම හා පිරිසැකසුම් කිරීම පිළිබඳ පුහුණුවක් ලැබිය. |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සූචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 20 |
| උපුටා දැක්වීමේ සූචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 02 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 01 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 44 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 05 |
| පොත් | 01 |
| පොත්වල ඡේද | 01 |
| එකතුව | 74 |

# පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

උසස් ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ සඳහා විශිෂ්ඨත්වයේ උත්කෘෂ්ඨ මධ්‍යස්ථානයක් වීම ඉලක්ක කරගනිමින් විවිධ ක්ෂෙත්‍රයන්හි උසස් දැනුමැති ඉහළ මට්ටමේ විද්වතුන් සහ පර්යේෂකයන් බිහිකිරීමට පීඨය කැපව සිටියි. පසුගිය වසර තුළ පීඨයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ රටේ පැවැති ආර්ථික අර්බුදය මධ්‍යයේ වුව ද, සුළු ලාබ ආන්තිකයක් සහිතව දැනට පවතින සියලු වැඩසටහන් පවත්වා ගෙන යාමයි. කළින් පැවැති සාමාන්‍ය තත්ත්වයන්ට සාපේක්ෂව දැනට පවත්වා ගෙන යන වැඩසටහන් සඳහා කිසිදු අඩුවීමකින් තොරව නව ශිෂ්‍ය කණ්ඩායම් බඳවා ගැනීමට පීඨයට හැකි විය. කෙසේ වෙතත්, සුපුරුදු පරිදි විද්‍යාව පදනම් කරගත් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීම්වල යම් අඩුවක් මෙම වසරේදී ද දක්නට ලැබුණු අතර එය අනෙකුත් විශ්වවිද්‍යාලයන්ට ද පොදු වූ සංසිද්ධියක් විය.

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත විස්තරය | ප්‍රතිලාභීන්/නිමවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පශ්චාත් උපාධි වැඩසටහන් | සංවර්ධන සැලසුම් ශාස්ත්‍රපති උපාධි වැඩසටහන හඳුන්වා දෙනු ලැබූ අතර නව පශ්චාත් උපාධි වැඩසටහන් 5 ක් සඳහා විෂයමාලා සංවර්ධනය කරමින් පවතී. | අළුත් ශිෂ්‍යයන් 35 දෙනෙකු බඳවා ගන්නා ලදී. |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂය වැඩිදියුණු කිරීම) | ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති හා සමාජ විද්‍යා ශාස්ත්‍රපති විෂයමාලා සංශෝධනය කරන ලදී. | |

## ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍ය බඳවා ගැනීම් - 2023

| පශ්චාත් උපාධි වැඩසටහන | අළුතින් බඳවා ගැනීම් | මුළු බඳවා ගැනීම් |
|---|---|---|
| කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සහ සංවර්ධන විද්‍යාපති උපාධිය | 11 | 23 |
| ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය | - | 143 |
| ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය | 43 | 158 |
| සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යාපති උපාධිය | - | 47 |
| භෝග නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 12 | 92 |
| සංවර්ධන සැලසුම් ශාස්ත්‍රපති විභාගය | 35 | 35 |
| ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | - | 238 |
| සාමය හා සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය | - | 39 |
| සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 40 | 174 |
| ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය | - | 40 |
| ජල හා පාරිසරික ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය | - | 17 |
| එකතුව | 141 | 1006 |

### පර්යේෂණ උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය බඳවාගැනීම්

| පශ්චාත් උපාධි වැඩසටහන | අළුතින් ඇතුලත්කර ගැනීම් | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| දර්ශනපති | **10** | **131** |
| දර්ශනවිශාරද | **09** | **72** |

### පශ්චාත් උපාධි වැඩසටහන් පාඨමාලාවලින් ලැබූ ආදායම

| තථ්‍ය ආදායම (රු.) | තථ්‍ය වියදම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|
| **109,306,899.23** | 27,428,399.52 | 81,878,499.71 |

# මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

සිය මෙහෙවර වන "වෘත්තීය නිපුණතා සහිත ගුණාත්මක උපාධිධාරීන් බිහි කිරීම සහ නූතන පර්යේෂණ හරහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා දැනුම උත්පාදනය කිරීම" යන සිය මෙහෙවරින් රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ කාර්යයන් මෙහෙයවනු ලබයි. ඉංග්‍රීසි, ආර්ථික විද්‍යාව, සමාජ සංඛ්‍යානය, පුරා විද්‍යාව, ඉතිහාසය, සමාජ විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, බෞද්ධ සංස්කෘතිය පිළිබඳ බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය පිළිබඳ බෞද්ධ අධ්‍යයනය, පාලි, සහ දේශපාලන විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය වැනි විෂය ක්ෂේත්‍ර පරාසයක් ආවරණය කරමින් ශාස්ත්‍රපති ගෞරව උපාධි 13 ක් පිරිනැමීමෙන් මෙම කැපවීම පිළිබිඹු කෙරේ. අලුතින් පිහිටුවන ලද තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය මෙන්ම උසස් සහතිකපත්‍ර පාඨමාලා 06 ක් සහ නූතන භාෂා කේන්ද්‍ර කර ගනිමින් සහතික පත්‍ර පාඨමාලා 02 ක් පිරිනමන නූතන භාෂා සහ ශිෂ්ටාචාර මධ්‍යස්ථානය (CMLC) ඇතුළුව අධ්‍යයන දෙපාර්තමේන්තු 10 කින් පීඨය සමන්විත වේ.

2023 වසර තුළ පීඨයේ ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත සමාලෝචනයක් විශ්වවිද්‍යාලයේ අරමුණු යටතේ පහත දක්වා ඇත.

### අධ්‍යාපනය, පර්යේෂණ සහ සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම-

2023 දී රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය අධ්‍යාපනය, පර්යේෂණ සහ සේවා සඳහා ප්‍රවේශය පුළුල් කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. භෞතික යටිතල පහසුකම්වල සහ මානව සම්පත්වල සීමාවන් පැවැතියේ වුව ද, පීඨය සිය අධ්‍යයන වැඩසටහන් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන ගිය අතර අළුතින් ශිෂ්‍යයන් 721 දෙනෙකු බඳවා ගන්නා ලදී. . පීඨය මෙම වසරේ ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණය වූයේ දීර්ඝ කාලයක් පුරා පැවැති අවශ්‍යතාවයක් සපුරාලමින්තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් හඳුන්වා දීමයි.

එසේම භූගෝලීය තොරුතුරු විද්‍යා උපාධිය නම් උපාධි වැඩටසහනක් සඳහා ද තවත් යෝජනාවක් ද සම්පූර්ණ කර සනාතන සභාවේ සහ පාලන මණ්ඩලයේ අනුමතිය ලබා ගැනීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ මණ්ඩලයෙන් ලැබුණු අදහස් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන අනුමැතිය ලබා ගැනීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. ඊට අමතරව, ආගණනීය ආර්ථික විද්‍යාව පිළිබඳ නව උපාධි අපේක්ෂක වැඩසටහනක් අනුමැතිය සඳහා පීඨයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය වෙත ඉදිරිපත් කර ඇත. තවද, විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හරහා ඉදිරිපත් කරනු ලැබීම පිණිස ආර්ථික විද්‍යාව, ආගණනීය ආර්ථික විද්‍යාව සහ සමාජ සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි හඳුන්වාදීම සඳහා තවත් යෝජනා තුනක් ඉදිරිපත් කර ඇත.

එපමණක් නොව, සංවර්ධන සැලසුම් පිළිබඳ නව ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් භූගෝල විද්‍යා අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලදී. වර්ෂය තුළදී අධ්‍යාපනය පිළිබඳ නව ශාස්ත්‍රපති උපාධියක් සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා යෝජනා දෙකක් සම්පූර්ණ කර සනාතන සභාවේ අනුමතිය ලබා ගන්නා ලදී. දැනට පවතින ඉංග්‍රීසි ඩිප්ලෝමාව/උසස් ඩිප්ලෝමාව සහ මනෝවිද්‍යා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව අඛණ්ඩව පවත්වාගෙන යන අතරම අන්තර්කරණ සේවා සැපයීම මගින් තිරසර සාමය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් සහ ඓතිහාසික අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් දූරස්ථ ඉගෙනුම් පාඨමාලාවන්ට අළුතින් එක් කරන ලදී.

නව මාර්ගගත පාඨමාලා හඳුන්වාදීමේ අවශ්‍යතාවය සපුරාලමින් පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය සහ සිංහල අධ්‍යයනාංශය එක්ව මාර්ගගත පාඨමාලා දෙකක් සකස් කිරීම ආරම්භ කර ඇත. කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය හුවමාරුව සඳහා රුමේනියාවේ බ්‍රාසොව්හි ට්‍රාන්සිල්වේනියා විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් පීඨය අත්සන් තබන ලදී.

පර්යේෂණ හා ප්‍රකාශන පළකිරීම ගත් කළ 2023 වසරේදී සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර සමාලෝචන සඟරාවේ නිකුතු 04ක් ප්‍රකාශයට පත්කරන ලදී. ඊට අතිරේකව පීඨයේ අධ්‍යයනාංශ තුන මගින් පීඨ මට්ටමේ සඟරා සහ පුවත් පත්‍රිකා ප්‍රකාශයට පත් කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ

පර්යේෂණ සහ ප්‍රකාශන මධ්‍යස්ථානය පීඨයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා වැඩමුළු සහ සිදුවීම් කිහිපයක් පවත්වන ලදී.

**අධ්‍යාපන පර්යේෂණ සහ සේවාවන්හි ගුණාත්මකභාවය අභිවර්ධනය කිරීම-**

පීඨයේ ආචාර්යවරුන්ගෙන් ආසන්න වශයෙන් 90% කට පශ්චාත් උපාධි සුදුසුකම් තිබේ. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත මට්ටම (70%) හා සැසඳීමේදී ආචාර්ය උපාධි දරන්නන්ගේ ප්‍රතිශතය තවමත් අඩු මට්ටමක පවතින අතර එය 2023 වසර තුළදී එය පෙර පැවැති 43% සිට 45% දක්වා සුළු වශයෙන් වර්ධනය විය. ආචාර්ය උපාධි සම්පූර්ණ කිරීම සඳහා පීඨය අඛණ්ඩව සිය ආචාර්යවරුන් දිරිමත් කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැනටමත් ආචාර්යවරුන් 09 දෙනෙකු ලියාපදිංචි වී ආචාර්ය උපාධි හදාරමින් ඇත. ස්වයංකෘත පරිපාලන පද්ධති සඳහා ඉලක්ක සපුරා ගැනීමට පීඨය සමත් වූ අතර (70%) ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලිය, ශිෂ්‍ය කළමනාකරණය සහ විභාග කළමනාකරණය අභිවර්ධනය කිරීම පිණිස සම්පූර්ණ ස්වයංක්‍රිය ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS-100%) සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS-100%) පූර්ණව ක්‍රියාවට නංවා ඇත. එපමණක් නොව පරිගණක 100කින් සමන්විත නව පරිගණක විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට පීඨයට හැකි විය. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ අවශ්‍යතාවන්ට අනුකූලව සියලු උපාධි වැඩසටහන්වල වත්මන් විෂය මාලාවේ මැදි සමාලෝචනය පීඨය සම්පූර්ණ කරන ලදී.

**අධ්‍යාපනයේ සහ පර්යේෂණවල අදාළත්වය අභිවර්ධනය කිරීම-**

අළුතින් හඳුන්වා දුන්/ප්‍රතිශෝධිත සිව් අවුරුදු උපාධි වැඩසටහන් 12 ක් පිරි නැමීම පීඨය අඛණ්ඩව සිදු කරයි. පීඨයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකයේ ආදාන සමගින් පීඨයේ විෂයමාලා සංවර්ධන කමිටුව සමාජීය අවශ්‍යතා ප්‍රකාරව උපාධි වැඩසටහන් 12 තවදුරටත් වැඩි දියුණු කිරීම පිණිස මැදි සමාලෝචනය නිමා කරන ලදී. පීඨයට අළුතින් බඳවා ගත් සිසුන් සඳහා 2023 වසරේදී ද තීව්‍ර ඉංග්‍රීසි භාෂා හා තොරතුරු තාක්ෂණ පාඨමාලා පවත්වනු ලැබීය. විශ්වවිද්‍යාල අපේක්ෂාවන් හා සසඳන විට උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති ප්‍රතිශතය තවමත් පහළ මට්ටමක පැවතියද, විෂය ක්ෂේත්‍රයට අදාළව පමණක් නොව නායකත්ව කුසලතා, ජීවිතය පිළිබඳ දැක්ම සහ මනෝ විහිති සුසමාදර්ශය ඇතුළුව අනෙකුත් විවිධ අංශවලින් ද දැනුම හා කුසලතා ඇති සේවා යෝජ්‍ය උපාධිධාරීන් බිහි කිරීමට පීඨය උපරිමයෙන් කටයුතු කර ඇත. වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය සමග සහයෝගීව රැකියා වෙළඳපොළ තුළ සිසුන් මුහුණ දෙන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වැඩමුළු සහ පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. දැනට පවතින උපාධි වැඩසටහන් 12 සඳහාම සීමාවාසික පුහුණුව ඇතුළත් කර ඇති අතර අප විසින් සකස් කර ක්‍රියාත්මක කිරීමට සූදානම් වන අනෙකුත් උපාධි වැඩසටහන් ද උපාධි අපේක්ෂකයින්ට රැකියා පුහුණුව ලබා දීම සඳහා සීමාවාසික පුහුණුව අනිවාර්ය විෂයක් ලෙස ඇතුළත් කර ඇත. පීඨයේ සියලු උපාධි වැඩසටහන් 2023 වසරේ සිසුන්ට සීමාවාසික පුහුණුව ලබා දෙන ලදී.

**සාධාරණත්වය සහ යුක්තිය සහතික කිරීම -**

පීඨය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකින්ම උපාධි වැඩසටහන් පවත්වයි. පීඨය විසින් 2023 වර්ෂයේදී ආබාධ සහිත සිසුන් 05 දෙනෙකු බඳවා ගත් අතර, මීට පෙර බඳවාගත් ආබාධ සහිත සිසුන් සඳහා අඛණ්ඩ අධ්‍යාපනය ලබා දෙන ලදී. Erasmus + අරමුදල් සැපයීම යටතේ ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීමේ ව්‍යාපෘතිය 2023 නොවැම්බර් 15 දක්වා අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබූ අතර විශ්වවිද්‍යාලයේ සියලු පීඨයන්හි ආබාධ සහිත සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස විශේෂ අවශ්‍යතා ශිෂ්‍ය ඒකකය යොදා ගන්නා ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය ජාතික සාම කවුන්සිලය සමඟ එක්ව බහුත්වවාදය සහ සාමය සහ සහජීවනය පිළිබඳ සිසුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු මාලාවක් පවත්වන ලදී. පීඨය එහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ මාසික දායකත්ව සහිතව ශිෂ්‍ය සුභසාධන අරමුදල යටතේ. 2023 වසර තුළ සිසුන් 60 කට පමණ මූල්‍ය ආධාර ලබා දුන්නේය.

**යහපාලනය අභිවර්ධනය කිරීම -**

පීඨයේ සියලුම තාවකාලික පුරප්පාඩු පුරවන ලද නමුත් රජයේ වත්මන් ප්‍රතිපත්ති හේතුවෙන් ස්ථිර පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් ප්‍රමාද විය. පීඨයේ ශිෂ්‍ය උපදේශන සහ ශිෂ්‍ය මිත්‍රෝපදේශන වැඩසටහන් සාර්ථකව අඛණ්ඩව කර ගෙන යනු ලැබීය. පීඨය විසින් පත්කරනු ලැබූ දුක් ගැනවිලි කමිටුව විසින් ශිෂ්‍ය දුක් ගැනවිලි වෙන් වෙන්ව ආමන්ත්‍රණය කරන ලදී.

| වැඩසටහන | ක්‍රියාකාරකම /සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | **තොරතුරු සහ තාක්ෂණ අධ්‍යයනාංශය**<br>තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | ආසන්න වශයෙන් වර්ෂයකට උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් 150ක් පමණ |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | **භූගෝල විද්‍යා අධ්‍යනාංශය**<br>ඓතිහාසික අධ්‍යයන ඩිප්ලෝමාව සඳහා වන යෝජනාව ඉදිරිපත් කරන ලදී. | පාසල් ගුරු භවතුන්, වෘත්තිකයන් සහ සාමාන්‍ය මහජනතාව ඉලක්ක කරනු ඇත. |
| | **තොරතුරු සහ තාක්ෂණ අධ්‍යයනාංශය**<br>භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ ඩිප්ලෝමාව සඳහා යෝජනාවක් දැනටමත් ඉදිරිපත් කර ඇත | වෘත්තිකයන් ඉලක්ක කරනු ඇත. |
| ප්‍රජා සේවා | **පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය**<br>• ධර්ම සාකච්ඡා වැඩසටහන් පවත්වන ලදී.<br>• දකුණු පළාත් පාසල්වල අ.පො.ස (උ.පෙළ) සිසුන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. | පොදු මහජනතාව<br><br>දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන් |
| | **සමාජ විද්‍යා අධ්‍යයනාංශය**<br>මා/දෙයියන්දර අතපත්තුකන්ද මහා විද්‍යාලයේදී ප්‍රජා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් පවත්වන ලදී. | ශිෂ්‍යයන්, දෙමාපියන් සහ ගුරු භවතුන් |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>අ.පො.ස (උ.පෙළ) සිසුන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. | උසස් පෙළ ශිෂ්‍යයන් හා ගුරු භවතුන් |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>දකුණු පළාතේ සමාජ ආර්ථික සංවර්ධන හවුල්කාරිත්ව වැඩසටහන අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබීය. | ප්‍රජාව සහ ශිෂ්‍යයන් |
| | ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ දේශීය ආහාර සංරක්ෂණය පිළිබඳ වැඩමුළුව, 2023 මාර්තු | දේශීය ආහාර පිරිසැකසුම්වල නියැළෙන ප්‍රජාව |
| | පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් ගුරුවරුන් සඳහා සංවිධානය කළ අධ්‍යාපන වැඩමුළුව | දහම් පාසල් ගුරුවරුන් |
| | දකුණු පළාතේ තෝරා ගත් ප්‍රදේශවල ධීවර ජනතාවගේ සම්ප්‍රදායික චාරිත්‍රවිධි | ශිෂ්‍යයන් හා ප්‍රජාව අතර අත්දැකීම් හුවමාරුව |
| | **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**<br>දකුණු පළාතේ උසස් පෙළ භූගෝල විද්‍යා ගුරුවරුන් ඉලක්ක කරමින් භූගෝල විද්‍යා අධ්‍යනාංශය විසින් ගුරු පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබීය | • පාසල්වල භූගෝල විද්‍යා විෂය උගන්වන ගුරු භවතුන්<br>• වැඩසටහන්වල අරමුණ වූයේ සිය ඉගැන්වීම් කුසලතා හා භූගෝල විද්‍යා දැනුම වැඩි දියුණු කර ගැනීම පිණිස ගුරුවරුන් වෙත වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීමයි. එහි ඉලක්කය වූයේ සහභාගී වූ ගුරුවරුන්ට වඩා සඵල සහ සිසුන් සමග හොඳින් සම්බන්ධ වන ශික්ෂකයන් බවට ඔවුන් පත් කිරීමයි. |
| | **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**<br>ලවණ බාධකය නිසා මතුව ඇති සමාජ ආර්ථික සහ පාරිසරික ගැටලු සම්බන්ධයෙන් නිල්වලා ගංගා ද්‍රෝණියේ ජීවත්වන ගොවීන් සහ ජාතික ජලසම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි අදාළ රජයේ ආයතන සමග සාකච්ඡාවක් අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදී. | නිල්වලා ගංගා නිම්නයේ ජනතාව ලවණ බාධකයේ ප්‍රතිඵල පිළිබඳව ගැඹුරු විශ්ලේෂණයක් සිදු කිරීම සහ නිල්වලා ගංගා ද්‍රෝණියේ ජීවත්වන ගොවීන් විසින් මුහුණ දෙන වත්මන් ගැටලු හඳුනා ගැනීම |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂය වැඩි දියුණු කිරීම) | **මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**<br>මුළු අර්ස අවශ්‍යතාව 130 සිට 120 දක්වා අඩුකිරීම පිණිස දැනට පවතින ගෞරව උපාධි වැඩසටහන් සඳහා මැදි සමාලෝචන ක්‍රියාදාමයක් පවත්වන ලදී. | පීඨයේ ශිෂ්‍යයන් |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**<br>අළුතින් පත්කරනු ලැබූ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු | පරිවාස කාර්ය මණ්ඩල සාමාජිකයන් CCPDHE සඳහා |

| | | |
|---|---|---|
| | | ලියාපදිංචි කරන ලදී. |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | **පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය**<br>• මාර්ගගත ආරාධිත දේශන සහ සාකච්ඡා පවත්වන ලදී.<br>උපාධි අපේක්ෂකයන් සඳහා "නැණදිරිය" ශිෂ්‍යත්ව වැඩසටහන ස්ථාපිත කරන ලදී. | • උපාධි අපේක්ෂකයන් හා කාර්ය මණ්ඩලය<br>• උපාධි අපේක්ෂකයන් |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>ඓතිහාසික රුහුණ පිළිබඳ ප්‍රාථමික මූලාශ්‍ර එකතුවක් පවත්වා ගෙන යාම: දකුණු පළාත පදනම් කරගත් උපාධි අපේක්ෂකයන් හා පශ්චාත් උපාධි පර්යේෂකයන් යන දෙපිරිසේම දකුණු පළාත පාදක පර්යේෂණ අවශ්‍යතා (ඉතිහාසය) | • පර්යේෂකයන් හා ශිෂ්‍යයන්<br>• රටේ ජාතික/ප්‍රාදේශීය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස සිදු කර ඇති පර්යේෂණවල ප්‍රතිශතය<br>• මූලාශ්‍ර එකතුවක් අධ්‍යයනාංශයේ පවත්වා ගෙන යනු ලැබේ. |
| | **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**<br>ජාතිකව වැදගත් මාතෘකා පිළිබඳ පර්යේෂණ ප්‍රකාශන | • පර්යේෂණ ප්‍රකාශන<br>• උපුටා දැක්වීම් |
| ජාත්‍යන්තර මට්ටමේ දායක්තවය | **පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය**<br>බෞද්ධ අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (ICBS 2023) | 'බෞද්ධ භාවනාව' පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>ඉන්දියාවේ තමිල්නාඩුවේ අන්නමාලි විශ්වවිද්‍යාලය සමග සහයෝගිතා හුවමාරු වැඩසටහනක් සංවිධානය කිරීම | ව්‍යාපෘති යෝජනා අදාළ විශ්වවිද්‍යාලයට යවා ඇති අතර ඒවා අදාළ පාර්ශ්වයන් විසින් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතී |
| | **භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**<br>• ජාත්‍යන්තර වැදගත් කමින් යුත් අධ්‍යයන ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රකාශන<br>• විදේශීය පුහුණු අවස්ථා | පර්යේෂණ ප්‍රකාශන<br>උපුටා දැක්වීම්<br>ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය**<br>සංස්කාරක මණ්ඩලය (RUICHSS 2023) - අධ්‍යනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 5 | **ප්‍රතිලාභීන්** - විද්වතුන්, පර්යේෂකයන් හා වෘත්තිකයන් |
| | **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය**<br>සංස්කාරක මණ්ඩලය (RUICHSS 2023) –අධියනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 5 | **නිමවුම-** උසස් අධ්‍යාපනය තුළ ආබාධ සහිත සිසුන්ගේ අවශ්‍යතා සහ උචමනාවන් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම |
| | **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය**<br>• සංස්කාරක මණ්ඩලය (RASAS 2023) – අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 2<br>• සංස්කාරක මණ්ඩලය (RASAS 2023) – අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 1 | **ප්‍රතිලාභීන්** - උපාධි අපේක්ෂකයන්<br><br>**නිමවුම** - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ උපාධි අපේක්ෂකයින් විසින් කරන ලද පර්යේෂණ මගින් ලබාගත් නව දැනුම බෙදා හැරීම |
| | **පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය**<br>• වෘ.මා.ඒ. අධ්‍යයනාංශ සම්බන්ධීකාරක<br>• නූ.හා.ශි.ම අධ්‍යයනාංශය සම්බන්ධීකාරක<br>• ශිෂ්‍ය සුබසාධන අරමුදල - භාණ්ඩාගාරික<br>• නියෝජ්‍ය පීඨ විනය පාලක<br>• අ.ත.ආ.ඒ සාමාජික<br>• විෂයමාලා කමිටු සාමාජික | |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>• දකුණු පලාත පාදක පර්යේෂණ සිදු කිරීම<br>අධ්‍යයනාංශයේ සාමාජිකයන් පහත දැක්වෙන පර්යේෂණ සිදුකරන ලදී.<br>✓ ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පාරම්පරික වෛද්‍ය විද්‍යාව සහ සංස්කෘතික අනන්‍යතාවය<br>✓ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව සහ අත් බෙහෙත් භාවිතය පිළිබඳ අධ්‍යයනයක් | |

| | | |
|---|---|---|
| | රෝග සුව කිරීමේ ප්‍රතිකාර ක්‍රමය (දෙවිනුවර ප්‍රදේශයෙන්)<br><br>දකුණු පළාතේ තෝරාගත් ප්‍රදේශවලින්<br>✓ ධීවර ජනතාවගේ සම්ප්‍රදායික චාරිත්‍ර | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | • යුරෝපා සංගමයේ Erasmus+ වැඩසටහනේ සහාය ඇතිව අරමුදල් සපයන අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු ව්‍යාපෘතිය (ENACT) හරහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය සහ ප්‍රතිසංස්කරණ වැඩිදියුණු කිරීම. – යුරෝ 27,964.04 | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීමට සහ උසස් අධ්‍යාපනයේ වත්මන් සහ අනාගත නවීකරණ ප්‍රයත්නයන් සහ ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතාව ගොඩනැංවීමෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පාලනය, කළමනාකරණය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. |
| | 2020-2024 දක්වා ක්‍රියාත්මක වන Erasmus+ ධාරිතාව ගොඩනැගීමේ ව්‍යාපෘතියක් මගින් අරමුදල් සපයන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (IncEdu)<br>- යුරෝ 7,000 | IncEdu හි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන් සඳහා ඇති අවස්ථා සමාන කිරීම සඳහා ආධාරක පද්ධතියක් සංවර්ධනය කිරීම වන අතර එබැවින් ආබාධ සහිත සිසුන්ට උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ක්‍රියා කරයි. |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය**<br>හොඳම කාව්‍ය පරිවර්තනය සඳහා 2023 රාජ්‍ය සාහිත්‍ය සම්මානය | "තුටින් පිරී ගිය එක් මොහොතක්" කාව්‍ය ග්‍රන්ථය සඳහා කාව්‍යයේ හොඳම පරිවර්තනය සඳහා 2023 රාජ්‍ය සාහිත්‍ය සම්මානය ඉන්දු ගමගේ මහත්මිය වෙත පිරිනමන ලදී - ඇය සසංක පෙරේරා සමඟ එක්ව ජලාල් අල්-දීන් මුහම්මද් රූමිගේ තෝරාගත් කවි පරිවර්තනයේ සම කර්තෘත්වය දරන ලදී. |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | **පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය**<br>බෞද්ධ අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICBS 2023) | 'බෞද්ධ භාවනාව' පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම |
| | **සමාජ විද්‍යා අධ්‍යයනාංශය**<br>මා.ශා. හා ස.වි.පීඨය විසින් සංවිධානය කරනු ලැබූ රුහුණ කලා ශිෂ්‍ය වාර්ෂික සැසි සඳහා සත්කාරකත්වය දරන ලදී. | ශිෂ්‍යයන් |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>• මාතර ඓතිහාසික වෙහෙරහේන පූර්වාරාම රජමහා විහාරයේ පෞරාණික සිතුවම් සංරක්ෂණ ව්‍යාපෘතිය. 2023 නොවැම්බර් 24, 2023 දෙසැම්බර් අවසානය දක්වා. | රුහුණ විශ්ව විද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සහයෝගීතා ප්‍රයත්නයක් වන පෞරාණික සිතුවම් සංරක්ෂණ ව්‍යාපෘතියේ වාර්තාගත කිරීමේ කණ්ඩායමේ සාමාජිකයින් ලෙස සිසුන්ට සේවාවක් කළේය.<br><br>සංස්කෘතික උරුමයන් සංරක්ෂණය සඳහා කැපවීම, සහ ආදර්ශමත් දායකත්වය පෙන්නුම් කරන ලදී. |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>• "පර්යේෂණ නිබන්ධනයක් ලියන්නේ කෙසේද" යන මාතෘකාව යටතේ එක් දින මාර්ගගත වැඩමුළුව<br><br>• ඉතිහාසය හා පුරා විද්‍යාවේ අන්තර්ශික්ෂා ප්‍රවේශ පිළිබඳ | 2023 ජුනි 27 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදී. |

| | | |
|---|---|---|
| | එක් දින වැඩමුළුව (ඉතිහාසය) | 2023 ජුනි 16 වෙනිදා රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදී. |
| | **සම්මන්ත්‍රණ**<br>• උසස් අධ්‍යාපනයේ විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්කරණය පිළිබඳ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ 9 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (RUICHSS) 2023 සැප්තැම්බර් 14 වැනි දින පැවැත්විණි. | විද්වතුන් සහ අනෙකුත් විශේෂඥයන්, සාමාන්‍ය මහජනතාව |
| | • 8 වැනි රුහුණු කලා ශිෂ්‍ය වාර්ෂික සැසිවාරය (RASAS) 2023 සැප්තැම්බර් 15 වැනි දින පැවැත්විණි. | විද්වතුන් සහ අනෙකුත් විශේෂඥයන්, සාමාන්‍ය මහජනතාව |
| | **වැඩමුළු**<br>**අ.ත.ආ.ඒ./ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**<br>• වැඩසටහන් සමාලෝචනය සඳහා සූදානම් වීම - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කාන්ති කේ.ඒ.එස්. යාපා මිය, භෞතික විද්‍යා අධ්‍යයනාංශය | අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය |
| | • වැඩසටහන් සමාලෝචනයට හැඳින්වීමක් - මහාචාර්ය මහින්ද අතපත්තු, අධ්‍යක්ෂ/ ත.ආ.කමිටුව, රුහුණ විශ්වවිද්‍යාලය විසිනි | අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය |
| | පීඨයේ කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය හා අන්තර්කරණ අධ්‍යාපන ඒකකය<br>• ආබාධිතතාව, පුනරුත්ථාපනය සහ ඇතුළත් අධ්‍යාපනය - ටී.පී.එන්. ගීත් කුමාර, අධ්‍යක්ෂ /වැඩසටහන, නවජීවන පුනරුත්ථාපන මධ්‍යස්ථානය, තංගල්ල විසිනි. | පීඨයේ කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය හා අන්තර්කරණ අධ්‍යාපන ඒකකය |
| | • ආබාධ සහිත සිසුන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සහ උවමනාවන්- පියුමි ඉරේෂා මහත්මිය - විශේෂ අධ්‍යාපන ප්‍රධානී, නවජීවන පුනරුත්ථාපන මධ්‍යස්ථානය, තංගල්ල | පීඨයේ කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය හා අන්තර්කරණ අධ්‍යාපන ඒකකය |
| | • පරිගණක සහ අදාළ උපකරණ නඩත්තු කිරීම - තො.තා. අධ්‍යයනාංශයේ ප්‍රධානී ආචාර්ය කෝකිල රාමනායක සහ තොරතුරු තාක්ෂණ සහ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක වරුණ ගමගේ මහතා විසිනි. | පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | **සමාජ විද්‍යා අධ්‍යයනාංශය**<br>• නව උදාවක් අදියර 02 - අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය තරඟය<br>• කුරුණෑගල දිස්ත්‍රික්කයේ මානාව ගම්මානයේ මානව විද්‍යා පර්යේෂණයක් පැවැත්වීය<br>• කුරුණෑගල දිස්ත්‍රික්කයේ මානාව ගම්මානයේ සමාජ විද්‍යා පර්යේෂණයක් පැවැත්වීය | ශිෂ්‍යයන් |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br>ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පුරාණ රෝහණ රාජධානියේ වයඹ දිග ප්‍රදේශයේ ඓතිහාසික හා පුරාවිද්‍යා ක්ෂේත්‍ර ගවේෂණය. | ඉතිහාසය පිළිබඳ B.A (ගෞරව) විශේෂ උපාධි වැඩසටහන (තුන්වන වසර උපාධි අපේක්ෂකයින්) සඳහා ආරම්භ කරන ලදී |
| | **ඉතිහාසය හා පුරා විද්‍යා අධ්‍යයනාංශය**<br><br>ඉපැරණි මානවුලුපුර රම්බා විහාරස්ථානයේ පුරාවිද්‍යා ක්ෂේත්‍ර ගවේෂණය, උච්චවලිකා විහාරයේ පුරාවිද්‍යා චෛත්‍ය (ස්ථූප) සංරක්ෂණය සහ ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ අම්බලන්තොට පිහිටි ගොඩවාය පුරාවිද්‍යා ස්ථානවල ක්ෂේත්‍ර ගවේෂණය. | තෙවන වසර උපාධි අපේක්ෂකයින් සඳහා ආරම්භ කරන ලදී |
| සබැඳි වැඩසටහන් | **ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය**<br>ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලය සමඟ සහයෝගයෙන් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද ඉංග්‍රීසි භාෂා අධිශිෂ්‍යත්ව (ELF) වැඩසටහන 2023 ඔක්තෝබර් 9 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මිරියම් වැස්ක්වෙස් මහත්මිය විසින් මෙහෙයවනු | **ප්‍රතිලාභීන් -**<br>මා.ශා.ස.වි. උපාධි අපේක්ෂකයන්<br><br>**නිමවුම-**<br>මා.ශා.ස.වි. උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි භාෂා |

| | | |
|---|---|---|
| | ලැබේ. රිෂිනි ජයරත්න මහත්මිය වැඩසටහන සම්බන්ධීකරණය කරයි. | දැනුම වැඩි දියුණු කිරීම |
| | **පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය**<br>උපාධි අපේක්ෂකයින් සඳහා එළඹ සිටි සිහිය වැඩසටහන (වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමඟ) | විශ්වවිද්‍යාල සිසුන් අතර එළඹ සිටි සිහිය වර්ධනය කිරීම සඳහා (වැඩසටහන් දෙකක් පවත්වා ඇත) |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 13 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 14 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 27 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 17 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 54 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල උපුටන | 04 |
| පොත් | 11 |
| පොත්වල ඡේද | 13 |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 13 |
| සංස්කරණ කාර්යය | 14 |
| එකතුව | 180 |

# කළමනාකරණ සහ මූල්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශන

රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේදී 2003 අප්‍රේල් 29 වන දින ස්ථාපිත කරනු ලැබූ කළමනාකරණ හා මූල්‍ය පීඨය අධ්‍යයනාංශ හයකින් සමන්විත වේ. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 6 හි ස්ථානගත කර ඇති උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් හයක් පීඨය වත්මනෙහි පිරි නමයි. වාර්ෂිකව සිසුන් 700ක් බඳවා ගන්නා මෙම පීඨය ශ්‍රී ලාංකේය තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කරමින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ව්‍යාපාර කළමනාකරණ වෘත්තියෙහි මතුව එන අවශ්‍යතා සපුරාලිය හැකි උසස් මට්ටමේ උපාධිධාරීන් බිහිකිරීම තුළින් විශ්වවිද්‍යාලයට මෙන්ම සමාජයටද සුවිශේෂී මෙහෙවරක් සිදු කරයි. උපාධි අධ්‍යයන වැඩසටහන් හැරුණු විට, උසස් අධ්‍යාපන ප්‍රවේශය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා උපාධි අධ්‍යයන පීඨය මඟින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් දෙකක් සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මඟින් පිරිනමන ඩිප්ලෝමා වැඩසටහනක් පීඨය විසින් සම්බන්ධීකරණය කරයි.

මෑතකාලීන අභියෝග සහ මූල්‍ය බාධා මධ්‍යයේ වුවද, පීඨය කිසිදු බාධාවකින් තොරව සිය අධ්‍යයන වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සමත් වී ඇත. එපමණක් නොව, සිසුන්ගේ දියුණුව සඳහා, කර්මාන්තය සවිබල ගැන්වීම සඳහා සහ ප්‍රජාවට සේවයක් ලෙස පවත්වනු ලබන විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් අතින් ද පීඨය අතිමහත් ප්‍රගතියක් ලබා ඇත. ඊට සමගාමීව, පීඨයේ ආචාර්යවරුන් දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හරහා කලාපීය වශයෙන් අදාළ පර්යේෂණ පැවැත්වීම සහ දැනුම බෙදා හැරීම සඳහා ක්‍රියාකාරීව නිරත වෙමින් විද්‍යාත්මක ප්‍රජාවට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්හ.

| වැඩසටහන | ක්‍රියාකාරකම්/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
| --- | --- | --- |
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය | උපාධි අපේක්ෂකයන් |
| අළුතින් හඳුන්වා දුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | තිරසාර මානව සම්පත් කළමනාකරණය, මානව සම්පත් විගණනය, පුද්ගලික වර්තනාකම් නිර්මාණය, මානව සම්පත් විශ්ලේෂණ, ගිණුම්කරණය සහ මූල්‍ය විශ්ලේෂණයේ පරිගණක යෙදුම්, මූල්‍ය අවදානම් කළමනාකරණය, සමකාලීන ගිණුම්කරණ පිළිවෙත්, ගිණුම්කරණ පර්යේෂණ සඳහා දත්ත විශ්ලේෂණය, ආයතනික මූල්‍ය සහ අවදානම් කළමනාකරණය, ව්‍යාපාර සැලසුම්කරණය සහ ව්‍යාපාර සංවර්ධනය, ඩිජිටල් ව්‍යාපාර සහ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය, නවෝත්පාදන සහ තාක්ෂණික ව්‍යවසායකත්වය, ඩිජිටල් මූල්‍ය, ඩිජිටල් අලෙවිකරණය, වෙබ් සැලසුම් සහ සංවර්ධනය, සැපයුම් දාමය සහ සැපයුම් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, පර්යේෂණ ක්‍රමවේද, ගිණුම්කරණයේ පරිගණක යෙදුම්, සංචාරක ව්‍යවසායකත්වය, සමාජ හා හරිත ව්‍යවසායකත්වය, පර්යේෂණ සඳහා දත්ත විශ්ලේෂණය, ව්‍යවසායකත්ව විද්‍යාගාරය, ව්‍යාපාර විශ්ලේෂණ, සැපයුම් දාම කළමනාකරණය, කාර්ය සම්පාදන කළමනාකරණය, විද්‍යුත් වාණිජ්‍යය, සැපයුම් දාම නවෝත්පාදන, ප්‍රසම්පාදන කළමනාකරණය සහ ගෝලීය මූලාශ්‍ර, ද්‍රව්‍ය කළමනාකරණය, සම්පූර්ණ තත්ත්ව කළමනාකරණය, ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු, , අවදානම් කළමනාකරණය, හරිත සැපයුම් දාම කළමනාකරණය, උපාය මාර්ගික සැපයුම් දාමය සහ සැපයුම් කළමනාකරණය, සැපයුම් දාම විශ්ලේෂණ සහ ආකෘති නිර්මාණය, ගෝලීය සැපයුම් දාම | උපාධි අපේක්ෂකයන් |

| | | |
|---|---|---|
| | කළමනාකරණය, ජාත්‍යන්තර වෙළඳ සහ සයිබර් ගනුදෙනු නීතිය | |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | මා.ස.ක. ඩිප්ලෝමාව | බඳවාගනු ලැබූ ශිෂ්‍යයන් |
| | ව්‍යවසායකත්ව කළමනාකරණ ඩිප්ලෝමාව | ව්‍යවසායකයින් සහ අභිප්‍රේත පාර්ශවයන් |
| ගාස්තු අයකරන පාඨමාලා | ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති | • බඳවාගනු ලැබූ ශිෂ්‍යයන් හා විශ්වවිද්‍යාලයේ පරදු දරන්නන් |
| | ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති | • බඳවාගනු ලැබූ ශිෂ්‍යයන් හා විශ්වවිද්‍යාලයේ පරදු දරන්නන් |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | • බඳවාගනු ලැබූ ශිෂ්‍යයන් හා විශ්වවිද්‍යාලයේ පරදු දරන්නන් |
| ප්‍රජා සේවා | • විවිධ වැඩසටහන්වලදි සම්පත් පුද්ගල දායකත්වය<br>• ව්‍යවසායකයින් සහ සමුපකාර සේවකයන් සඳහා වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම (දැනුම බෙදාහදා ගැනීමේ සැසි)<br>මානව සම්පත් සංවර්ධන කවය සිය වාර්ෂික ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය වූ "අත්වැල" සංවිධානය කරන ලදී. එහිදී අධ්‍යාපන පරිසරය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් ප්‍රතිලාභියා ලෙස මා/කනහැලපිටිය කණිෂ්ඨ විද්‍යාලය, අකුරැස්ස තෝරා ගන්නා ලදී. | සහභාගිකයන්<br><br>සමුපකාර සේවකයන්<br><br>මා/අකුරැස්ස කනහැලගම කණිෂ්ඨ විද්‍යාලයේ ශිෂ්‍යයන් 130 දෙනෙක් |
| විෂයමාලා සංවර්ධනය | • උපාධි වැඩසටහන් හයක විෂයමාලා ප්‍රතිශෝධනය කරන ලදී. | උපාධි අපේක්ෂකයන් |
| | • ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති විෂයමාල ප්‍රතිශෝධනය සිදුකරමින් පවතී. | පශ්චාත් උපාධි අපේක්ෂකයන් |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | ග්‍රන්ථමිතික විශ්ලේෂණය සමඟ ක්‍රමානුකූල සාහිත්‍ය සමාලෝචනය හරහා පර්යේෂණ ප්‍රකාශනය වැඩි කිරීම පිළිබඳ වැඩමුළුව | රුහුණ විශ්වවිද්‍යාලයේ සියලු ආචාර්යවරුන් |
| | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | අළුතින් බඳවාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යන සහායක කාර්ය මණ්ඩලය |
| | මෘදු කුසලතා පිළිබඳ පුහුණු සැසිය | කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අනධ්‍යන කාර්ය මණ්ඩලය |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ප්‍රධාන විභාග පරීක්ෂකවරුන් ලෙස 2022-23 අපොස උසස් පෙළ විභාගයට දායකත්වය ලබා දෙන ලදී. | විභාග දෙපාර්තමේන්තුව හා උ/පෙ. වාණිජ ධාරාවේ සිසුන් |
| | මහා පරිමාණ හොඳම ව්‍යවසායක තේරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී-හම්බන්තොට වාණිජ මණ්ඩලය | දකුණු පළාතේ මහා පරිමාණ ව්‍යවසායකයන් |
| | වි.ප්‍ර.කො.ස. මට්ටමින් වැඩසටහන් සමාලෝචන මණ්ඩලවලට දායක වන ලදී. | විශ්වවිද්‍යාල |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | "පර්යේෂණ ලිවීම හා ප්‍රකාශනය" පිළිබඳ වැඩමුළුව | ආචාර්යවරුන් හා ප්‍රජාව |
| | ව්‍යාපාරික අදහස් ඉදිරිපත් කිරීම ඇගයීම | එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් මෙට්රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පාසලේ ශිෂ්‍යයන් |
| කමිටු හා ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | • විෂයමාලා සංවර්ධන කමිටුව - සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්<br>• පීඨ පුස්තකාල කමිටුව<br>• පීඨ ආචාර ධර්ම සමාලෝචන කමිටුව<br>• රුහුණ විශ්වවිද්‍යාලය සඳහා ප්‍රකාශන ප්‍රතිපත්ති පිළිබඳ කමිටුව<br>• දුක්ගැනවිලි කමිටුව<br>• රන් පදක්කම් කමිටුව<br>• අතුරු නීති සමාලෝචන කමිටුව<br>• ක්‍රීඩා උපදේශක මණ්ඩලය<br>• කලරු මාධ්‍ය ගැලරිය<br>• සීමාවාසික කමිටුව<br>• පීඨ ශ්‍රේණිගත කිරීමේ කමිටුව | |
| සම්මාන/පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම වෙනුවෙන් සාධන සහතිකය - ආචාර්ය තෙදූෂිකා ද සිල්වා | |
| | ඇලන් මැක්ග්‍රෙගර් ත්‍යාගය 2023 - ගිණුම්කරණ හා මූල්‍ය පීඨය, ඔටාගෝ විශ්වවිද්‍යාලය, නවසීලන්තය | |

| | | |
|---|---|---|
| | නවසීලන්තයේ ඩනෙඩින්හි ඔටාගෝ විශ්වවිද්‍යාලයේ ඕස්ට්‍රේලියානු හා නවසීලන්ත අලෙවිකරණ ඇකඩමියේ ආචාර්ය උපාධි අපේක්ෂක ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයේ ඉහළින්ම නිර්දේශිත නිබන්ධන තුනෙන් එකක් සඳහා සම්මානය | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර සහ දේශීය) | කළමනාකරණ හා ආර්ථික විද්‍යා ජාත්‍යන්තර සම්මේලනය 2023 (ICME 2023) | දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයන්, ශිෂ්‍යයන් හා කර්මාන්ත |
| | ව්‍යාපාර සංසදය 2023 | |
| | Idea Cloud 2023 | |
| | "ව්‍යාපෘති යෝජනා ලිවීම" පිළිබඳ වැඩමුළුව | ගිණුම්කරණ අධ්‍යයනාංශයේ 3000 මට්ටමේ උපාධි අපේක්ෂකයන් |
| | "රජයේ ආදායම හා වියදම වාර්තාගත කිරීම" පිළිබඳ වැඩමුළුව | ගිණුම්කරණ අධ්‍යයනාංශයේ 4000 මට්ටමේ උපාධි අපේක්ෂකයන් |
| | ගිණුම්කරණයේදී එම් එස් එක්සෙල් භාවිතය පිළිබඳ වැඩමුළුව | 4000 මට්ටමේ උපාධි අපේක්ෂකයන් |
| | අලෙවිකරණ අධ්‍යයනාංශය විසින් ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය හා එක්ව “අනාගතය සමඟ හමුවක්” යන තේමාව යටතේ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. | අලෙවිකරණ විශේෂායන 3000 මට්ටමේ උපාධි අපේක්ෂකයන් |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | ශිෂ්‍ය නායක මණ්ඩලය සඳහා නිල පදක්කම් පැළඳවීමේ උත්සවයේදී මහාචාර්ය ඒ.සී. කරුණාරත්න මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වී ආරාධිත දේශනය පවත්වන ලදී. | පාසල් ශිෂ්‍යයන් හා ගුරු භවතුන් (300) |
| | මාතර මධ්‍ය මහා විද්‍යාලයේ වාණිජ දින උත්සවයේ ආරාධිත දේශනය මහාචාර්ය ඒ.සී.කරුණාරත්න මහතා විසින් පවත්වන ලදී | පාසල් ශිෂ්‍යයන් (250) |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| **උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන** | **16** |
| **උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන** | **13** |
| **මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන** | **36** |
| **වාචික ඉදිරිපත්කිරීම්වල උධෘත** | **20** |
| **පොත්වල පරිච්ඡේද** | **01** |
| **එකතුව** | **76** |

# වෛද්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

2023 වසරේදී පීඨය කිසිදු අවහිරතාවයකින් තොරව පීඨයේ කටයුතු සිදු කිරීමට හැකි විය. 45 වන කණ්ඩායමේ (2021 උසස් පෙළ කණ්ඩායම) නව සිසුන් කණ්ඩායම 2023 පෙබරවාරි 07 වන දින ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කළේය. විභාග කිසිදු ප්‍රමාදයකින් තොරව පවත්වනු ලැබූ අතර එක් ශිෂ්‍ය කාණ්ඩයක් (39 වන ශිෂ්‍ය කාණ්ඩය) 2023 දෙසැම්බර් මස උපාධිය ලැබීය.

පවතින මූල්‍ය අර්බුද මධ්‍යයේ වුවද මහල් 12 කින් යුත් ගොඩනැගිල්ල සහ මහල් 10 කින් යුත් මහාචාර්ය වාට්ටු සංකීර්ණය ඇතුළත් ප්‍රාග්ධන ව්‍යාපෘති දෙකෙහිම ඉදිකිරීම් සඳහා අරමුදල් ලබා ගැනීමට පීඨයට හැකි විය. චීනයේ ගුආන්ගෂාවු පළාතේ ඉහළ පෙළේ දූත කණ්ඩායමක් පීඨයේ සංචාරය කළ අතර මහාචාර්ය වාට්ටු සංකීර්ණය සඳහා අවශ්‍ය සියලු ඇඳන් පරිත්‍යාගයක් ලෙස ලබා දීමට ප්‍රතිඥා දුන්නේය. මේ සඳහා කටයුතු පිළියෙළ කරන ලද්දේ ප්‍රසවවේද හා නාරිවේද අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සරත් කුලරත්න මහතාගේ සහයෝගීතාවය තුළිනි. එම ඇඳන් 2023 දෙසැම්බර් මාසයේදී පීඨයට ලැබුණි. උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු සුරේෂ් රාඝවන් මහතා නොවැම්බර් 6 වැනි දින පීඨයේ සංචාරයක නිරත වූ අතර උපකුලපති, සියලු අධ්‍යයනාංශවල ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් සමග පැවැති සාකච්ඡාවේදී, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතීතන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු හේතුවෙන් 2022 උසස් පෙළ විභාගයේ බඳවා ගැනීම්වලදී අතිරේක ශිෂ්‍යයන් 300 දෙනෙකු බඳවා නොගැනීමට එකඟ වුණි.

### ශ්‍රී ලංකා වෛද්‍ය සභා ප්‍රතීතනය

ශ්‍රී ලංකා වෛද්‍ය සභා ප්‍රතීතන කණ්ඩායමේ ප්‍රවේදිතා ආමන්ත්‍රණය කරනු පිණිස මාර්ග සිතියමක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ අතර පීඨ මණ්ඩලයට වාරිකව වාර්තා කරමින් විශේෂ කමිටුවක් විසින් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නංවමින් තිබේ.

### පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ගාස්තු අයකරන පාඨමාලා | වෛකල්පික විෂය පාඨමාලා | විදේශ වෛද්‍ය ශිෂ්‍යයන් |
| ප්‍රජා සේවා | සක්‍රීය ආවේක්ෂණ මගින් කරාපිටිය ශික්ෂණ රෝහලේ අහිතකර ඖෂධ ප්‍රතික්‍රියා නිරීක්ෂණය කිරීම | අදාළ අවස්ථාවන්හි දී අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂවරයාට සහ ජාතික මධ්‍යස්ථානයට දැනුම් දීම. |
| | ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් සඳහා ළමා ලිංගික අපයෝජන සහ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | තවත් බොහෝ සිසුන් කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරකම්, විෂය ඒකාබද්ධ කිරීම, වැඩිදියුණු කළ වෘත්තීයමය සංරචක සහ පූර්ව සායනික සහිත නව විෂය මාලාව සැලසුම් කර ඇති අතර දැන් අනුමත කිරීමේ ක්‍රියාවලියේ පවතී. | නව අන්තර්ගතයෙන් සිසුන්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත. ඒවායින් සමහරක් ප්‍රතීතනය පිළිබඳ බාහිර සහ වැඩසටහන් සමාලෝචනය මගින් යෝජනා කරනු ලැබේ. |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | සාමාජික - රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මණ්ඩලය (භෞතවේද අධ්‍යයනාංශය) | පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ විද්‍යාවේදී හෙද උපාධිය සඳහා දේශන පැවැත්වීම | රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී හෙද උපාධිය |
| | අනෙකුත් පීඨවල විභාගවලට සහභාගී වීම | අවසාන වෛද්‍ය විද්‍යා විභාගය |
| | APLS සහ NALS වැඩසටහන්වලට සහභාගිවීම | සියලු ස්ථරවල පූර්ව සීමාවාසිකයන් හා සෞඛ්‍යරක්ෂණ සේවකයන් පුහුණු කිරීම |
| | ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශයේ සහ ඇම්ස්ටර්ඩෑම් | ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් |

| | | |
|---|---|---|
| | විශ්වවිද්‍යාලයේ ගිම්හාන නිවාඩු වැඩසටහන සති හතරක් පුරා පවත්වන ලදී | |
| ප්‍රජා විහිදුම් ක්‍රියාකාරකම් | එක්සත් රාජධානියේ කීල්ස් විශ්වවිද්‍යාලයේ පීඨාධිපති සහ වෛද්‍ය අතුල සුමතිපාල යන අයගෙන් සමන්විත විද්වතුන් කණ්ඩායමක් පීඨයේ සංචාරයක් සඳහා පැමිණි පවුල් වෛද්‍ය විද්‍යාව සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ සහයෝගිතා කිහිපයක් සඳහා සිය අභිලාෂය පළ කළහ. | පවුල් වෛද්‍ය විද්‍යාවේ සහ අධිකරණ වෛද්‍ය විද්‍යාවේ සහයෝගිතා |
| | කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද "Varsity Battles ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රශ්න විචාරාත්මක තරඟය 2023" සඳහා වෛද්‍ය උපාධි අපේක්ෂකයින් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී විය. | අපේ ශිෂ්‍යයන් ජයග්‍රාහී කණ්ඩායම විය. |
| සබැඳ වැඩසටහන් | ඩියුක් රුහුණ පර්යේෂණ සහයෝගිතාව | විශ්වවිද්‍යාල දෙකෙහිම කාර්යමණ්ඩල හා ශිෂ්‍යයන් |
| පර්යේෂණ ප්‍රදාන | | මාස 08ක් සඳහා 2023 ජනවාරි 26 වන දින RISE (R21) අධ්‍යයන කටයුතු සඳහා ඩියුක් විශ්ව විද්‍යාලය හරහා NIH, USA (National Institute of Health) වෙතින් ප්‍රදානය ලබා දුණි<br><br>.2023 ජූනි මස 19 වන දින මාස 08 ක ඩියුක්-රුහුණු ප්‍රධාන කටයුතු සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ ඩියුක් විශ්ව විද්‍යාලයේ ඩියුක් ග්ලෝබල් හෙල්ත් ඉන්ස්ටිටියුට් වෙතින් ප්‍රදානය හිමි වුණි.<br><br>2023 සැප්තැම්බර් 18 වන දින SEARCh (ECHO) අධ්‍යයන කටයුතු සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ ඩියුක් විශ්ව විද්‍යාලය හරහා ආරක්ෂක උසස් පර්යේෂණ ඒජන්සිය (DARPA) වෙතින් හිමි වුණි. |

**ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය**

| වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | **36** |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | **10** |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | **12** |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | **22** |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | **119** |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | |
| පොත් | **8** |
| එකතුව | **207** |

# විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

විද්‍යා පීඨය රුහුණ විශ්වවිද්‍යාලයේ පුරෝගාමී පීඨ අතුරින් එකකි. එය තුන් අවුරුදු කාල සීමාවක් සහිත විද්‍යාවේදී සහ පරිගණක විද්‍යාවේදී සාමාන්‍ය උපාධි සහ සිව් අවුරුදු කාල සීමාවකින් යුත් විද්‍යාවේදී (ගෞරව), පරිගණක විද්‍යාවේදී (ගෞරව) සහ මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානනය පිළිබඳ ගෞරව උපාධි පිරි නමයි. පීඨය විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 550 දෙනෙකු ද (ජෛව විද්‍යා ධාරාව සඳහා සිසුන් 250 ක් ද භෞතික විද්‍යා ධාරාව සඳහා සිසුන් 300 ක් ද ලෙස), පරිගණක විද්‍යා උපාධි වැඩසටහන සඳහා සිසුන් 100 දෙනෙකු ද මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යානන උපාධි වැඩසටහන සඳහා සිසුන් 50 දෙනෙකු ද බඳවා ගනියි. පීඨ සිසුන්ට මූලික විද්‍යාත්මක සංකල්ප, විද්‍යාත්මක ක්‍රම මූලධර්ම සහ ඒවායේ යෙදීම් පිළිබඳ මනා දැනුමක් ලබා දෙන හොඳින් සැලසුම් කරන ලද පාඨමාලා ඒකක තෝරා ගැනීමේ නිදහස ඇත. අනෙකුත් විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ මූලික දැනුම ලබා ගැනීම සඳහා විවිධ පීඨ මගින් පිරිනමනු ලබන විෂයයන් ඉගෙන ගැනීමට සිසුන්ට අවස්ථාව තිබේ. පීඨයෙන් උපාධි හිමි කර ගන්නා සිසුන්ට ඉංග්‍රීසි සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ අත්‍යවශ්‍ය කුසලතා ඇති අතර විෂය කරුණු පිළිබඳ මනා දැනුමක් ද ඇත.

විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය උපාධි අපේක්ෂක සහ උපාධි මට්ටමේ ඉගැන්වීම් සඳහා දැඩි කැපවීමක් පෙන්නුම් කරන අතරම නව්‍ය, උසස් තත්ත්වයේ පර්යේෂණවල නියැලී සිටිති. පීඨයේ ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් විද්‍යාඥයන් සමඟ කටයුතු කිරීමට උපාධි හා පශ්චාත් උපාධි පර්යේෂණ අවස්ථා තිබේ. පීඨය රුහුණ ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ සමුළුව (RISTCON) සහ රුහුණ විද්‍යා පර්යේෂණ කවය යටතේ උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය මගින් වාර්ෂිකව අන්තර්ජාල සඟරාවක් ලෙස ‘රුහුණ විද්‍යා සඟරාව ප්‍රකාශයට පත් කෙරේ.

නවෝත්පාදකයින් සහ නව නිපැයුම්කරුවන් , පර්යේෂකයන්, විද්වතුන්, කළමනාකරුවන්, සහ නිර්මාණශීලී සහ ගෝලීය චින්තකයින් ලෙස සමාජයේ කැපී පෙනෙන භූමිකාවක් ඉටු සඳහා ඵලදායි හා කාර්යක්ෂම සන්නිවේදන ක්‍රම සහ විවිධ විෂය බාහිර හා බාහිර ක්‍රියාකාරකම් ඉගෙන ගැනීමට අවස්ථාව සලසා දීමෙන් සිසුන් නිරන්තරයෙන් වෙනස් වන ලෝකයක සමෘද්ධිමත් වීමට හැකියාව ඇති ජීවිත කාලය පුරාම ඉගෙන ගන්නන් බවට පත් කිරීමට පීඨයේ වැඩසටහන් උපකාරී වේ.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම්/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වා දුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සහ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය තත්ත්ව ආරක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ රෙගුලාසි යටතේ ලියාපදිංචි වී ගෞරව උපාධියක් ලබා ගන්නා සිසුන් |
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | පරිගණක විද්‍යාව පිළිබඳ කෙටි පාඨමාලා හයක් | |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හා ව්‍යාප්ති පාඨමාලා | තොරතුරු තාක්ෂණ කෙටි පාඨමාලා | ප්‍රජාව, සහභාගිකයන්ට දැනුම හා සහතිකපත්‍ර ලබා දුණි. |
| ප්‍රජා සේවා | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ වැඩමුළු - පරිගණක විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වන ලදී. | දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන් සහ ගුරු භවතුන් |
| | අ.පො.ස. උසස් පෙළ ලකුණු ලබා දීමේ පටිපාටිය පිළිබඳ වැඩමුළුවක් ගාල්ල, දකුණු පළාත් සභා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානයේදී 2023 අගෝස්තු 4 වැනි දින පවත්වන ලදී. | දකුණු පළාතේ ගුරු භවතුන්/ උ.පෙ. ප්‍රශ්න පත්‍ර ඇගයීම පිළිබඳ යාවත්කාලීන වූ දැනුම |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/ | ප්‍රායෝගික පාඨමාලා ප්‍රතිශෝධනය - භෞතික විද්‍යා අධ්‍යයනාංශය | ශිෂ්‍ය ප්‍රජාව/ විෂයමාලාව යාවත්කාලීන කරන ලදී. |

| | | |
|---|---|---|
| විෂයය වැඩි දියුණු කිරීම) | | |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය විසින් පැවැත් වූ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පිලිබඳ වැඩමුළුව - පැය 30 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය/දැනුම වැඩි දියුණු කිරිම හා යාවත්කාලීන කිරීම |
| | උසස් අධ්‍යාපානයේ වෘත්තීය සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව | |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය හා දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවි නැණ ව්‍යාපෘතිය පිළිබඳ වැඩමුළුව | දකුණු පළාතේ කෘෂිකර්ම උපදේකයන්.<br>යෙදුම භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම |
| | කෘෂිකාර්මික පාරිසරික පද්ධති පර්යේෂණ කණ්ඩායම<br><br>මෙය සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවගේ ජීවනෝපාය ක්‍රියාකාරකම්වලට සහාය දැක්වීම පිණිස ජංගම දුරකථන පාදක තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණයකි.<br><br>එය:<br>• බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව<br>• සැලර්නෝ විශ්වවිද්‍යාලය, ඉතාලිය<br>• පරිගණක විද්‍යා පාසල, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව සහ<br>• රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.<br>යන විශ්වවිද්‍යාලවල විවිධ වෘත්තීමය පර්යේෂණ විද්වතුන්ගෙන් සමන්විත වේ. | |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | • ශිෂ්‍ය ඉල්ලීම් අනු කමිටුව - 07<br>• අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය - 11<br>• අධ්‍යයන මණ්ඩලය -<br>• පර්යේෂණ කමිටුව -26<br>• පාඨමාලා සම්බන්ධීකරණ කමිටුව -<br>• පීඨ අතුරු ව්‍යවස්ථා කමිටුව - 07<br>• සිව් අවුරුදු උපාධි වැඩසටහන - 14<br>• ආචාරධර්ම සමාලෝචන කමිටුව -<br>• පුස්තකාල කමිටුව -<br>• පීඨ දිනය - 07<br>• RISTCON –<br>• අත්පොත් කමිටුව -08 | පීඨය/ පීඨ ක්‍රියාකාරකම් අවබිරයකින් තොරව සිදු කිරීම |
| ලැබුණු ප්‍රදාන (අරමුණ හා ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | පීඨ ප්‍රදාන -2023 (ආචාර්ය තුෂාංගි මිය, ආචාර්ය සුගන්දිමා මිය, ගිල්මිණි මිය සහ ලොරෙන්සුහේවා මහතාට හිමිවුණි. | |
| සම්මාන/පේටන්ට් බලපත්‍/ විශේෂ සාධන | ලෙෙලි ඉවත්කිරීමේ යන්ත්‍රය<br>• 19 වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවයේදී වැඩිම ප්‍රදානලාභියා සඳහා **උපකුලපති සම්මානය** | මහාචාර්ය ඩබ්ලියු.ඒ. ඉන්දික මහත්මිය,<br>පරිගණක විද්‍යා අධ්‍යයනාංශය |
| | • දකුණු පළාත් නව නිෂ්පාදන හා නව්‍යකරණ තරඟය, ප්‍රතිවින්‍යාසගත කළ හැකි CNN සකසනය සඳහා හොඳම නව්‍යකරණ සම්මානය , 2023 දෙසැම්බර්<br><br>• දකුණු පළාත් නව නිෂ්පාදන හා නව්‍යකරණ තරඟයේදී ප්‍රතිවින්‍යාසගත කළ හැකි CNN සකසනය සහ නව්‍යකරණ වාණිජ ශ්‍රේණියේ දුරේක්ෂ ප්‍රාථමික කැඩපත පිරිසැකසුම් තාක්ෂණය සඳහා රන් පදක්කම් දෙකක් , 2023 දෙසැම්බර් | දේශීය පැළෑටි කොටස්වලින් නවතාවයෙන් යුතු කෘත්‍යාත්මක ආහාර සකස් කිරීම සඳහා මෙය පිරි නැමුණි. ප්‍රජාව සහ විශ්වවිද්‍යාලයට ප්‍රතිලාභ හිමි වුණි විශ්වවිද්‍යාලවල සුවිශේෂී නිපුණතා සහිත විද්වතුන් සඳහා පිරිනමන මෙම සම්මානය ගෝලීයව පිළිගනු ලබයි. මෙනිසා, චීන විද්‍යා ඇකඩමියේ රසායන විද්‍යා ආයතනයේ බාහිර |

| | | |
|---|---|---|
| | | විද්‍යාඥයෙකු ලෙස මාස නවයක් සඳහා යම් ශාස්ත්‍රීය හා පර්යේෂණ සහයෝගීතාවයකට සහභාගී වීමට හැකි වේ |
| | **1)** ආයතන කාණ්ඩය යටතේ දකුණු පළාත් නව නිපැයුම් / නවෝත්පාදන තරගයේ රන් පදක්කම් **(7)** සහ රිදී පදක්කම **(1) -** වජිර පී. බුළුගහපිටිය **2** | . |
| | **2)** 2023/2024 සඳහා චීනයේ චීන විද්‍යා ඇකඩමියේ PIFI සම්මානය - වජිර පී. බුළුගහපිටිය [කණ්ඩායම් වැඩ] | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මාන (අභ්‍යන්තර හා දේශීය) | 203.01.28 දින පවත්වන ලද "ශාක නෙමටෝඩා පණු ගැටළු හඳුනා ගැනීම" | ප්‍රජාව |
| | එප්පාවල පොස්පේට් නිධියේ සම්භවය | මහජනතාව /විශ්වවිද්‍යාල/විද්‍යාඥයින් සඳහා දැනුවත්භාවය |
| | පරිගණක ජාලකරණය - ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය තේමාව යටතේ | |
| | පාසල් උසස් පෙළ සිසුන් සඳහා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය රුහුණ පරිච්ඡේදය යටතේ සංවිධානය කරන ලද "පරිගණක ජාලකරණ වැඩමුළුව"- 2023, තේමාව: විද්‍යා රාජ්‍යතාන්ත්‍රිකත්වය | |
| | විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම යටතේ **"ආයතනික කෝෂ්ඨාගාර වැඩමුළුව"** සංවිධානය කරන ලදී. | |
| | විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වූ කමිටුව - 2023 | |
| | ආසියා පැසිෆික් උසස් ජාලය (APAN57) සාමාජිකත්වය, බැංකොක්, තායිලන්තය, 2024 ජනවාරි | |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | මූලාා බෝගයක් ලෙස උණ ගස්- ශ්‍රීලවිස තේමාව යටතේ | වැවිලිකරුවන් දැනුවත් කිරීම - දකුණු පළාත |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | **27** |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | **03** |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | **33** |
| පොත්වල ඡේද | **03** |
| එකතුව | **66** |

## තාක්ෂණ පීඨය

### පීඨාධිපතිගේ ප්‍රකාශය

2023 වසර සඳහා මූල්‍යමය බාධක සහ මානව හා භෞතික සම්පත් සීමිතව පැවැතීම වැනි බොහෝ ගැටලුවලට මුහුණ පෑව ද, රුහුණ විශ්වවිද්‍යාලයේ ලාබාලතම පීඨය වන තාක්ෂණ පීඨය නගා සිටුවීමට අප පියවර කිහිපයක් ගෙන ඇත්තෙමු. සියලුම අධ්‍යයන වැඩසටහන් සියලුම මට්ටම් සඳහා භෞතිකව පවත්වන ලද අතර සියලුම උපාධි වැඩසටහන් ප්‍රායෝගික නැඹුරුවක් සහිත පාඨමාලා වන බැවින් සිසුන්ගේ පැමිණීම දැඩි ලෙස නිරීක්ෂණය කරන ලදී. අන්තර්ජාල පහසුකම් සහිත ස්වයං අධ්‍යයන පරිසරයන් සැපයීම සඳහා පරිගණක සංචිතය සිසුන් සඳහා පෙරවරු 7:00 සිට පස්වරු 7:00 දක්වා විවෘතව පවතී. අතිරේකව බඳවා ගත් සිසුන් සඳහා බොහෝ ඉගැන්වීම් ඉගෙනුම් පහසුකම් සැපයීමට අවශ්‍ය බැවින් AHEAD ප්‍රදාන යටතේ ලිවීම් පෑඩ් සහිත පුටු 133ක් මිලදී ගන්නා ලදී.

පීඨයේ පළමු ජාත්‍යන්තර සම්මන්ත්‍රණය රුහුණු නවෝත්පාදන හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (RICIT) නමින් 2023 නොවැම්බර් 24 දින පැවැත්විණි. පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන්, පීඨයේ බහුතර කනිෂ්ඨ කථිකාචාර්යවරුන් අතර පීඨයේ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා මෙම වගකීම භාර ගන්නා ලද අතර බෙදාගත් නව දැනුම බෙදා හැරීම සඳහා මංපෙත් විවර කරන ලදී.

ජපානයේ ඔකයාමා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය මහිරෝ මයිඩා මෙම සම්මන්ත්‍රණයට ප්‍රධාන කථිකයා ලෙස භෞතිකව සහභාගී වූ අතර අනෙකුත් ප්‍රධාන දේශකයන් ඇමරිකා එක්සත් ජනපදයේ සහ ඕස්ට්‍රේලියාවේ සිට මාර්ගගතව සහභාගී විය. එදිනම අපි අවසන් වසර සිසුන්ගේ පර්යේෂණ නිෂ්පාදන ප්‍රදර්ශනයක් පැවැත්වූ අතර මෙම අවස්ථාවට විද්වතුන් සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් රැසක් සහභාගී විය.

අධ්‍යයන වැඩසටහනේ දෙවන සමාසිකයේ දී පීඨාධිපතිවරයා වශයෙන් මම ශිෂ්‍ය උපදේශකයන් සහ පීඨ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සිසුන්ගේ විනය සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමි. සිදුවීම් සංවිධානය කිරීම, ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම, අවසර ලබා ගැනීම, වගවීම සහ වගකීම භාර ගැනීම යන කරුණු සම්බන්ධයෙන් සිසුන් සමඟ නිල සන්නිවේදනයේ කැපී පෙනෙන දියුණුවක් අත්කර ගන්නා ලදී. මේ වන විට සිසුන් තාක්ෂණ පීඨයේ අධ්‍යයන කටයුතු කඩාකප්පල් කරන සහ සාමය කඩවන කිසිදු කටයුත්තක නොයෙදී වගකීම් සහගත විශ්වවිද්‍යාල සිසුන් ලෙස කාලය සතුටින් භුක්ති විඳිමින් නිදහසේ සිය කාලය ගත කරයි.

### පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ප්‍රජා සේවා | උ/පෙළ පාසල් සිසුන් සඳහා ඉංජිනේරු තාක්ෂණ විද්‍යාගාරවල සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රසායනාගාරවල වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. | පාසල් කිහිපයක උ/පෙ ශිෂ්‍යයන් |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයන් උසස් අධ්‍යාපනයේ වෘත්තීය සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාවට සහභාගි විය | පීඨයේ කාර්ය මණ්ඩලය |
| | අභ්‍යන්තර තත්ත්ව පාලන ඒකකය විසින් වැඩමුළු පවත්වන ලදී | |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කමිටු යටතේ පීඨයේ අධ්‍යයන මණ්ඩලවල කමිටු පත් කොට එම එක් එක් කමිටුවට අවශ්‍ය සාමාජික සංඛ්‍යාව පත්කරන ලදී. | එක් එක් අනු කමිටුවේ පීඨ මණ්ඩලය අනුමත වෙන් වෙන් යොමුකිරීම් අනුදේශ තිබේ. |
| සම්මාන/පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | විදුලි ත්‍රිරෝද රථයක් හා විදුලි බෝට්ටුවක් සංවර්ධනය කිරීම | |
| පවත්වනු ලැබූ වැඩමුළු/ | විෂයමාලා සිතියම් ගත කිරීම පිළිබඳ වැඩමුළුව | අධ්‍යයන කාර්ය මණ්ඩලය |

| | | |
|---|---|---|
| සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා ප්‍රාදේශීය) | පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය යටතේ වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. | ශිෂ්‍යයන් |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සූචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 01 |
| වාචික ඉදිරිපත්කිරීම්වල උද්ධෘත | 24 |
| එකතුව | **25** |

# VII කොටස

# සම්මාන සහ විශේෂ සිදුවීම්

# ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන

## 20 වැනි අධ්‍යයන සැසිය හා 19 වැනි උපකුලපති ප්‍රදානෝත්සවය-2023

රුහුණ විශ්වවිද්‍යාලයේ 20 වැනි අධ්‍යයන සැසිය සහ 19 වැනි උපකුලපති ප්‍රදානෝත්සවය 2023 ජූනි 07 වැනි දින පවත්වන ලදී. මෙම වසරේ සම්මාන ප්‍රදානෝත්සවය සඳහා සත්කාරකත්වය කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් දරනු ලැබූ අතර එය අතිශයින් සාර්ථකව නිමා විය. එහි සමාරම්භක උළෙල ධීවර හා සමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

20 වැනි අධ්‍යයන සැසිය සහ 19 වැනි උපකුලපති ප්‍රදානෝත්සවයේ තේමාව වූයේ "ප්‍රත්‍යාස්ථිතික හා ප්‍රගාමී සමාජයක් සඳහා බුද්ධිමය සහ ව්‍යවසායකත්ව තෙරපුමක්" යන්නයි. මෙහිදී ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ ශ්‍රී ලංකාවේ බොහෝ අංශයන්හි පරිණාමනය සහ නව්‍යකරණය ප්‍රේරණය කළ ප්‍රායෝගික අත්දැකීම් සහිත ව්‍යාපාරික ලොව ප්‍රමුඛයකු වූ සහ එනිසාම ප්‍රත්‍යාස්ථිතික හා ප්‍රගාමී සමාජයක් සඳහා අවශ්‍ය කරනු ලබන බුද්ධිමය හා ව්‍යවසායකත්ව තෙරපුම පිළිබඳ වචනයේ පරිසමාප්ති අර්ථයෙන්ම විශේෂඥයකු වන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රාරම්භක උපකුලපති ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා ය.

රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ආචාර්ය ඒ.එම්.එස්.එස් අමරසිරි මහතා විසින් “ශ්‍රී ලාංකේය වෘක්ෂලතාවලින් වෘක්කආරක්ෂක චිකිත්සා විධි සොයා යෑමේ අභිරහස හෙළිදරව් කිරීම” යන මැයෙන් දේශනය පවත්වන ලදී. 20 වැනි අධ්‍යයන සැසිවල මුද්‍රිත වාර්තා කෘෂිකර්මය, පරිසරය සහ ජෛව විද්‍යා, පරිගණක සහ තොරතුරු විද්‍යාව, තාක්ෂණය, ආර්ථික විද්‍යාව, මූල්‍ය සහ කළමනාකරණය, අධ්‍යාපනය, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා, ඉංජිනේරු, තාක්ෂණ සහ ව්‍යවහාරික විද්‍යා, මානව සෞඛ්‍ය, ඖෂධ සහ වෛද්‍ය විද්‍යාව, ශුද්ධ විද්‍යාව, ගණිතය සහ සංඛ්‍යානය ඇතුළුව විවිධ විෂය ක්ෂේත්‍රවලින් ලැබුණු විස්තෘත උද්ධෘත 92 කින් ද්විත්වාන්ධ සමපදස්ථ සමාලෝචන ක්‍රියාවලියක් හරහා තෝරා ගනු ලැබූ උධෘත 82 ක් සහිතව ප්‍රකාශයට පත් කරන ලදී.

19 වැනි උපකුලපති ප්‍රදානෝත්සවයේ දී, කැපී පෙනෙන කාර්ය සාධනය හා විශිෂ්ඨ දායකත්වය වෙනුවෙන් පර්යේෂණ, නව නිපැයුම්, ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධනය සහ විශ්වවිද්‍යාලයේ සංවර්ධනයට ලබා දුන් දායකත්වය වෙනුවෙන් විද්වතුන් හට සම්මාන ප්‍රදානය කරන ලදී.

ඒ අනුව, පහත දැක්වෙන ආචාර්යවරුන් සහ ශිෂ්‍යයන් වෙත සම්මාන ප්‍රදානය කරන ලදී.

- විශිෂ්ටතම විද්වතා: මහාචාර්ය සුධීර ද සිල්වා මයා, ඉංජිනේරු පීඨය
- ඉහළම ප්‍රදානලාභී : මහාචාර්ය ඩබ්ලියු. ඒ. ඉන්දික මිය, විද්‍යා පීඨය
- විශිෂ්ඨතම ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධක: මහාචාර්ය ඩී.ඒ.එල්. ලීලාමනි මිය, කෘෂිකර්ම පීඨය
- විශිෂ්ඨතම තරුණ පර්යේෂක : ඩබ්ලිව්.ඒ.එච්.එම්. කරුණාරත්න මයා, තාක්ෂණ පීඨය
- විශිෂ්ඨතම ශිෂ්‍ය නව නිපැයුම්කරු/නවෝත්පාදක: ඒ.ජී.පී.ඩී. අලහකෝන් මයා, උපාධි අධ්‍යයන පීඨය

## කළමනාකරණය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ 12 වැනි ජාත්‍යන්තර සම්මේලනය (ICME)

රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් සංවිධානය කරන ලද කළමනාකරණය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ 12 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICME), "ආර්ථික අවපාතයේ සිට යථා තත්ත්වයට පත්වීම: කළමනාකරණය සහ ආර්ථිකයේ කාර්යභාරය" යන තේමාව යටතේ 2023 අගෝස්තු 16 වැනි දින පීඨ පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදී. මෙම වසරේ සම්මන්ත්‍රණය දෙමුහුන් ජාත්‍යන්තර සම්මේලනයක් ලෙස පුද්ගලයන් 100 කට ආසන්න පිරිසකගේ සහ මාර්ගගතව සහභාගි වූ 100 කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්වූ අතර මෙම සම්මේලනයේ තාක්ෂණික සැසිවල නිමවුම වූයේ පර්යේෂණ කටයුතු: සම්මේලනයේ මුද්‍රිත වාර්තා ප්‍රකාශයට පත් කිරීම, පීඨ සඟරාව/ දකුණු ආසියානු ව්‍යාපාරික අන්තර්දෘෂ්ටි සඟරාව සඳහා ලිපි ආදියයි.

## මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ 9 වැනි ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS 2023)

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ රුහුණ විශ්වවිද්‍යාලයේ 9 වැනි ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS 2023) 2023 සැප්තැම්බර් 14 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි. මෙම වසරේ තේමාව වූයේ 'උසස් අධ්‍යාපනයේ විවිධත්වය, සාධාරණත්වය සහ අන්තර්කරණය' යන්නයි. මෙම සම්මේලනය එරස්මස්+ ධාරිතා ගොඩ නැංවීමේ ව්‍යාපෘතිය "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ආබාධ සහිත ශිෂ්‍යයන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීම" සමග සහයෝගිතාවයෙන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන සහභාගි වූ අතර ක්‍රොඒෂියාවේ සැග්රෙබ් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන හා පුනරුත්ථාපන විද්‍යා පීඨයේ මහාචාර්ය ලෙලියා කිස්-ග්ලාවස් විශේෂ ආරාධිතයකු ලෙස මෙම අවස්ථාවට එක් විය. දේශීය හවුල්කාර විශ්වවිද්‍යාල වන පේරාදෙණිය විශ්වවිද්‍යාලය (සම්බන්ධීකරණ විශ්වවිද්‍යාලය), රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා තාක්ෂණ මණ්ඩපය සහ යුරෝපීය විශ්වවිද්‍යාල හතරක, එනම් මැසාරික් විශ්වවිද්‍යාලය, චෙක් ජනරජය, රුමේනියාවේ බ්‍රසොව් හි ට්‍රාන්සිල්වේනියා විශ්වවිද්‍යාලය, ක්‍රොඒෂියාවේ සැග්‍රෙබ් විශ්වවිද්‍යාලය සහ ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලය නියෝජිතයින් මෙම සමුළුවට සහභාගී විය. සම්මන්ත්‍රණයේදී, තේමා 15ක් යටතේ පැවති තාක්ෂණික සැසිවාරයේදී දේශීය හා ජාත්‍යන්තර විද්වතුන් සිය පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කළ අතර සම්මන්ත්‍රණ මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන ප්‍රකාශයට පත් කරන ලදී.

## සම සෞඛ්‍ය විද්‍යා පීඨ ජාත්‍යන්තර පර්යේෂණ සාකච්ඡා මුළුව (iRuFARS) සහ පූර්ව රැස්වීම් වැඩමුළුව

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ජාත්‍යන්තර පර්යේෂණ සාකච්ඡා මුළුව සහ පූර්ව රැස්වීම් වැඩමුළුව 2023 නොවැම්බර් 9 සහ 10 යන දෙදින තුළ පැවැත්වුණි. මෙම සම්මන්ත්‍රණයේ තේමාව වූයේ "නිදහසේ වසර 75ක් ඔබ්බට ගිය සෞඛ්‍ය පර්යේෂණ" යන්නයි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා සහභාගී විය. සම්මන්ත්‍රණයේ ප්‍රධාන කථිකයා වූයේ ස්වීඩනයේ ක්‍රිස්ටියන්ස්ටාඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මාර්ටින් පියර්සන්ය. සෞඛ්‍ය වෘත්තිකයන් 200කගේ පමණ සහභාගීත්වයෙන් "නිරෝගී වයස්ගත වීමක් භුක්ති විඳීම" යන තේමාව යටතේ මෙම සම්මේලනයට පෙර වැඩමුළුව පවත්වන ලදී. නියුරෝකෝ කණ්ඩායම ඇතුළු ජාතික සහ ජාත්‍යන්තර සහභාගිවන්නන් මෙම අවස්ථාවට සහභාගී වූහ.

## රුහුණ කලා ශිෂ්‍යයන්ගේ 8 වැනි වාර්ෂික සැසිය (RASAS 2023)

රුහුණ කලා ශිෂ්‍ය 8 වන වාර්ෂික සැසිවාරය (RASAS 2023) රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් 2023 සැප්තැම්බර් 15 වැනි දින සංවිධානය කරන ලදී. "හෙට බිහිවන පර්යේෂකයන්ගේ ජීව ගුණය" යන තේමාව යටතේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය විසින් මෙවර උත්සවය සංවිධානය කරන ලදී. පර්යේෂණ දිශානත සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා පර්යේෂණ ප්‍රයත්නවල සක්‍රීයව නිරත වීමට උපාධි අපේක්ෂකයින් පෙළඹවීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණයි. මෙම සම්මන්ත්‍රණයේ මුඛ්‍ය අරමුණ වූයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ උපාධි අපේක්ෂකයින් විසින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන හරහා සිදුකරන ලද පර්යේෂණවලින් ලබාගත් නව දැනුම ව්‍යාප්ත කිරීමයි. එහිදී තේමා 11ක් යටතේ උද්ධෘත 53ක් විය.

## බෞද්ධ අධ්‍යයන පිළිබඳ 2වැනි ජාත්‍යන්තර සම්මේලනය

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ 2 වැනි ජාත්‍යන්තර සමුළුව 2023 දෙසැම්බර් 20 වැනි දින “මානසික සෞඛ්‍ය පිළිබඳ බෞද්ධ යාන්ත්‍රණ” යන තේමාව යටතේ පැවැත්විණි. මානසික සෞඛ්‍යය මිනිස් යහපැවැත්මේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර එය අපගේ සිතුවිලි, හැඟීම් සහ හැසිරීම් වලට බලපෑම් කරයි.

## රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ 11 වැනි වාර්ෂික අධ්‍යයන සැසිය (FMAS) - 2023

රුහුණ විශ්වවිද්‍යාලයීය 11 වැනි වාර්ෂික වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසි (FMAS 2023) “සෞඛ්‍ය සේවා සැපයීමේදී ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම” යන තේමාව යටතේ 2023 අගෝස්තු මස 14 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ මහාචාර්ය ටී.ඩබ්ලිව්. වික්‍රමනායක ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා ප්‍රධාන අමුත්තා ලෙස එම අවස්ථාවට එක් විය.

රුහුණ විශ්වවිද්‍යාලයේ සම්මානිත මහාචාර්ය රයිෆි මොහිදීන් මහතා "තාක්ෂණය හා වෛද්‍යවිද්‍යාව අන්තර්ඡේදනය: ඩිජිටල් සෞඛ්‍යයේ අවස්ථා සහ අභියෝග" මැයෙන් ප්‍රධාන දෙසුම පවත්වන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ න්‍යෂ්ඨික වෛද්‍ය විද්‍යාවේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මංජුල හෙට්ටිආරච්චි මහතා 2023 වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසියේ ආරාධිත දේශනය "කලාපීය සහ ජාතික මට්ටමින් ඩිජිටල් සෞඛ්‍යය මූලාරම්භය: ජාතික නව දරු උපත් පරීක්ෂා කිරීමේ තොරතුරු පද්ධති දත්ත සමුදාය සංවර්ධනය කිරීම" යන මාතෘකාව යටතේ පවත්වන ලදී.

## 10 වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය -RISTCON 2023

රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් 2023 වසරේ සංවිධානය කරනු ලැබූ 10 වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය 2023 ජනවාරි 18 වැනි දින පවත්වනු ලැබූ අතර එහි අරමුණ වූයේ ප්‍රමුඛ පෙළේ විද්වතුන්, පර්යේෂකයන් සහ පර්යේෂණ ශිෂ්‍යයන්ට තම නව්‍යකරණ, ප්‍රවේදිතා, මුහුණ පෑ ප්‍රායෝගික අභියෝග සහ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයන්හි යොදා ගත් විසඳුම් ඉදිරිපත් කිරීම සහ සාකච්ඡා කිරීම පිණිස ප්‍රමුඛ බහුශික්ෂණ සාකච්ඡා මණ්ඩපයක් සැපයීමයි

## නව්‍යකරණය සහ තාක්ෂණය පිළිබඳ රුහුණ ජාත්‍යන්තර සම්මේලනය 2023 (RICIT 2023)

රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් සංවිධානය කරනු ලැබූ පළමු ජාත්‍යන්තර සම්මේලනය (RICIT 2023) 2023 නොවැම්බර් 24 වැනි දින පීඨ පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන්නට යෙදුණි. සම්මේලනයේ තේමාව වූයේ "තාක්ෂණික පරිණාමනය: නව්‍යකරණ හා ප්‍රවණතාවල මඟ හසුරුවා ගැනීම" යන්නයි. රුහුණ විශ්වවිද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා ප්‍රධාන අමුත්තා ලෙස මෙම අවස්ථාවට එක් වූ අතර සම්මේලනයේ ප්‍රධාන දෙසුම පැවැත්වූයේ ජපානයේ ඔකයාමා විශ්වවිද්‍යාලයේ පාරිසරික හා ජීවී විද්‍යා උපාධි පාසලේ මහාචාර්ය මොරිහිරෝ මෙඉඩා මහතාය.

විද්‍යාව සහ කෘෂිකර්මය, ඉංජිනේරු තාක්ෂණය, පරිගණක විද්‍යාව සහ කළමනාකරණය හා ව්‍යවසායකත්වය ලෙස තාක්ෂණික සැසි හතරක් පැවැත්වුණි. ඉදිරිපත් වූ සිය ගණනකට වැඩි අත් පිටපත් අතුරින් සම්මේලනය සඳහා බාර ගනු ලැබුයේ 57 ක් පමණි. සම්මන්ත්‍රණයට සමගාමීව, නව නිපැයුම්කරුවන්ට අවස්ථාවක් සැලසීම පිණිස පීඨ පරිශ්‍රයේ නිෂ්පාදන ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී.

## මානව සම්පත් තොරතුරු පද්ධතිය පිළිබඳ වැඩමුළුව

MintHRM ආයතනය සමග සහයෝගීතාවයෙන් මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය එහි උපාධි අපෙක්ෂකයන්ට මානව සම්පත් තොරතුරු පද්ධතිය පිළිබඳ වැටහීමක් ලබා දෙනු පිණිස වැඩමුළුවක් සංවිධානය කරනු ලැබීය. මානව සම්පත් තොරතුරු පද්ධතිය පිළිබඳ වැඩමුළු දහයක විස්තීරණ වැඩමුළු මාලාවක අවසන් වැඩමුළුව ලෙස එම සැසිය 2023 ජූලි 20 වැනි දින කළමනාකරණ හා මූල්‍ය පීඨයේදී පවත්වන ලදී. MintHRM හි ප්‍රධාන විධායක නිලධාරී/සම ප්‍රාරම්භක නාමල් ගුණවර්ධන මහතා සහ සම ප්‍රාරම්භක තනූජා මාස්කෝරාළ මහත්මිය සම්භාවනීය අමුත්තන් ලෙස එම අවස්ථාවට සහභාගී විය.

## ලක්ෂ්මන් කදිරගාමර් ආයතන- යුරෝපා සංගම් සම්මේලනය මගින් පවත්වන ලද ජාතික අධිකරණ බලය ඉක්මවූ ජෛවවිවිධත්ව ගිවිසුම (BBNJ) පිළිබඳ සම්මන්ත්‍රණය

ජාතික අධිකරණ බලය ඉක්මවා ජෛව විවිධත්වය පිළිබඳ ගිවිසුම පිළිබඳ සම්මේලනය ජාත්‍යන්තර සාමය සහ නීතියේ ආධිපත්‍යය සඳහා වන මැක්ස් ප්ලැන්ක් පදනම් ෆෙඩ්රින් නියුමාන් පදනම සහ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා යුරෝපීය සංගම් දූත මණ්ඩලය සමහ සහයෝගිතාවයෙන් ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය විසින් සංවිධානය කරන ලදී. 2023 නොවැම්බර් 24 වැනි දින පැවැති මෙම සම්මේලනයට රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂකයන් සිව් දෙනෙකු සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් සිව් දෙනෙකු සහභාගි විය. ගෝලීය සමුද්‍රීය ජෛවවිවිධත්වය පිළිබඳ වටිනා දැනුම් සම්භාරයක් ලබා ගැනීමට සහ විශේෂඥයන් සමග සාකච්ඡාවලට සහභාගි වීමට එහිදී ඔවුනට අවස්ථාව උදා වුණි.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, කළමනාකරණ හා මූල්‍ය සහ විද්‍යා පීඨ පහත දැක්වෙන සම්මේලන/වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වන ලදී.

| තේමාව | සංවිධානය කරනු ලැබුයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගික යන් සංඛ්‍යාව | නිමවුම |
|---|---|---|---|---|---|
| **මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය** | | | | | |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැය 20 ක අධ්‍යාපනික වැඩසටහන "අධ්‍යයන සැකසුම් තුළ ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ ප්‍රවේශය"** | ක්‍රොඒෂියාවේ සාග්‍රෙබ් විශ්වවිද්‍යාලය සමඟ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2022 දෙසැම්බර් 14-16 සහ 2023 මාර්තු 28 | අධ්‍යයන කාර්ය මණ්ඩලය | 75 | තේමාව යටතේ දැනුම වැඩි දියුණු කිරීම |
| **"ශ්‍රී ලංකාව අර්බුදයක සිටින විට ජාත්‍යන්තර ප්‍රජාවට කළ හැකි දේ."** | නෝර්වේහි ඇග්ඩර් විශ්ව විද්‍යාලය සමඟ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 සැප්තැම්බර් 20 | ඇග්ඩර් විශ්වවිද්‍යාලයේ සිසුන් | 50 | නව දැනුම ලබා ගැනීම. |

| තේමාව | සංවිධානය කරනු ලැබුයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව | නිමවුම |
|---|---|---|---|---|---|
| සමාජ විද්‍යා පර්යේෂණවල ගුණාත්මක තොරතුරු මූලාශ්‍ර සහ ඒවායේ විශ්ලේෂණය | කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 ඔක්තෝබර් 27 | තරුණ අධ්‍යයන කාර්ය මණ්ඩලය | 70 | නව දැනුම ලබා ගැනීම. |
| "2024 අයවැය සහ අනාගතය සඳහා ස්ථාවර බලාපොරොත්තුව" පිළිබඳ සාකච්ඡාව | රුහුණ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 නොවැම්බර් 21 | අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් | 150 | නව දැනුම ලබා ගැනීම. |
| "අයවැය - 2024, එය ස්ථාවර අනාගතයකට පෙරවදනක් ද?" | කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 නොවැම්බර් 18 | අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් | 200 | නව දැනුම ලබා ගැනීම. |
| රට බංකොලොත් කර ප්‍රජාතන්ත්‍රවාදය හැකිලිය හැකිද, | රුහුණ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 නොවැම්බර් 16 | ශ්‍රී ලාංකික ජනතාව | නොදනී | නව දැනුම ව්‍යාප්තිය |
| "අය වැය සහ අපි" සිරස රූපවාහිනියේ විකාශය වූ සජීවී වැඩසටහන | සිරස රූපවාහිණිය | 2023 නොවැම්බර් 16 | ශ්‍රී ලාංකික ජනතාව | නොදනී | නව දැනුම ව්‍යාප්තිය |
| ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරයේ පදනම - ජාතියට ශක්තිය සැපයීමේදී ආහාර සුරක්ෂිතතාවයේ කාර්යභාරය | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ආර්ථික විද්‍යාඥයින්ගේ සංසදය (SLFUE): ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 2023 දෙසැම්බර් 22 | අධ්‍යයන කාර්ය මණ්ඩලය | 150 | තේමාව යටතේ දැනුම වැඩි දියුණු කිරීම |
| පාර්ලිමේන්තු සීමාවාසික සේවාභිමුඛ වැඩසටහන | ශ්‍රී ලංකා ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය | 2023.03.01 සිට 2023.03.03 දක්වා | විශ්ව විද්‍යාල වල තෝරාගත් සීමාවාසිකයින් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් | සිසුන් හතර දෙනෙකු සහ එක් කාර්ය මණ්ඩල සාමාජිකයකු | - |

| තේමාව | සංවිධානය කරනු ලැබුයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව | නිමවුම |
|---|---|---|---|---|---|
| **කළමනාකරණ හා මූල්‍ය පීඨය** | | | | | |
| **උපාධි අපේක්ෂක පර්යේෂණ සංසදය -2023** | කළමනාකරණ හා මූල්‍ය පීඨය | 2023 අගෝස්තු 16 | උපාධි අපේක්ෂකයින් | 50 ක් පමණ | පර්යේෂණ කටයුතු: සම්මේලන මුද්‍රිත වාර්තා ප්‍රකාශන |
| **ව්‍යාපාරික සංසදය 2023** | කළමනාකරණ හා මූල්‍ය පීඨය | 2023 අගෝස්තු 16 | ව්‍යවසායකයින් සහ ව්‍යාපාරික නායකයින් | 100 ක් පමණ | දැනුම බෙදාගැනීමේ සැසිය, ව්‍යවසායකයින් සහ ව්‍යාපාර අතර ජාලගත කිරීම |
| **Idea Cloud 2023** | කළමනාකරණ හා මූල්‍ය පීඨය | 2023 අගෝස්තු 16 | උපාධි අපේක්ෂකයින් | 50 ක් පමණ | නව නිපැයුම් සහ නවෝත්පාදන පිළිබඳ දැනුම බෙදාගැනීමේ සැසිය, තෝරාගත් නව්‍ය අදහස් සඳහා සම්මාන |
| **විද්‍යා පීඨය** | | | | | |
| **2023 අ.පො.ස. (සා/පෙ) විභාගයට පෙනී සිටින සිසුන් ඉලක්ක කරමින් ගණිතය සහ විද්‍යා සම්මන්ත්‍රණ මාලාව** | රුහුණ විශ්වවිද්‍යාලයේ ගණිත අංශයේ ගණිත හා සංඛ්‍යාන සංගමය (RUMSS), රුහුණ විශ්වවිද්‍යාලය, | පළමු සැසිය<br>2023 අප්‍රේල් 29 සහ 30<br>දෙවන සැසිවාරය 2023 මැයි 13 සහ 14 | පාසල් ශිෂ්‍යයන් | පාසල් සිසුන් 35 | සමාජ සේවාවක් ලෙස පාසල් ශිෂ්‍යයන් සඳහා අ.පො.ස. (සා/පෙ) ඉලක්ක කරමින් විෂය කරුණු පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම. |

## කාර්ය මණ්ඩල ජයග්‍රහණ

## වෛද්‍ය පීඨය

### දේශන

"ළමා ස්ථූලතාවයේ විෂම චක්‍රය බිඳ දැමීම: කාලීන අවශ්‍යතාවයක්" පිළිබඳව මහාචාර්ය අරුණ ද සිල්වා මහතා ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ දී එස්.සී. පෝල් දේශනය ජූලි 27 වැනිදා පවත්වන ලදී. මහාචාර්ය අරෝෂ දිසානායක මහතා විසින් 2023 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලයේ දී "අර්ථය සොයා යාමේ මගේ ගමන" මැයෙන් ටී.වරගුණම් දේශනය පවත්වන ලදී. ආචාර්ය එල්.ඒ.එන්.දර්ශන මහතා"ශ්‍රී ලංකාවේ පිරිමින් අතර නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය: අර්බුදය සහ හානිය අවම කිරීම" මැයෙන් සැප්තැම්බර් මාසයේදී රජයේ වෛද්‍ය සංගම් දේශනය පවත්වන ලදී. වෛද්‍ය ලලින්දි ද සිල්වා මිය විසින් 2023 දෙසැම්බරයේ දී චර්මීය ලීෂ්මේනියා රෝගයට එරෙහි සටනේදී රෝග විනිශ්චය කිරීමේ නවෝත්පාදනයේ සිට අවදානම් සිතියම්ගත කිරීම සහ නව චිකිත්සා විධි යන මාතෘකාව යටතේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී දේශනය ඉදිරිපත් කරන ලදී.

ප්‍රජා වෛද්‍ය අංශයේ ආචාර්ය අයි. එල්. ඒ. එන්. දර්ශන මහතා, ශ්‍රී ලංකා ස්නායු විශේෂඥයින්ගේ සංගමයේ 2023 වාර්ෂික සම්මේලනයේ වාචික ඉදිරිපත් කිරීම් තරඟයේ දී "අධි අවදානම් ළදරුවන්ගේ තුළ මස්තිෂ්ක පරාශ්ලථය කලින් හඳුනාගැනීමේදී සාමාන්‍ය චලන තක්සේරුවේ (GMA) සහ හැමර්ස්මිත් ළදරු ස්නායු විද්‍යා පරීක්ෂණය (HINE) රෝග විනිශ්චය වලංගුභාවය: ශ්‍රී ලාංකීය රෝගී සත්කාරක සැකසුම් සඳහා විකරණය කරන ලද ප්‍රවේශයක් " යන නිබන්ධනය සඳහා ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලදී. එය ළමා ස්නායු රෝග ඒකකය, කරාපිටිය ශික්ෂණ රෝහල, ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සහ ළමා රෝග අධ්‍යයනාංශය සහ නිව් මෙක්සිකෝ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය මගින් ස්නායු ආබාධ කල්තියා හඳුනාගැනීමේ සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතියක් මත පදනම් විය.

ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අයි එල්.ඒ.එන්. දර්ශන මහතා ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාලයේ 25 වැනි වාර්ෂික විද්‍යා සම්මේලනයේදී 2023 මැයි මාසයේදී සිදු කරන ලද "අධි අවදානම් සහිත ළදරුවන් අතර වර්ධන ආබාධ කල්තියා හඳුනාගැනීම: ශ්‍රී ලාංකේය පසුබිමෙන් විකරණය කරන ලද ප්‍රවේශයක සාර්ථක කතාව" යන මාතෘකාව යටතේ වාචික ඉදිරිපත් කිරීම සඳහා හොඳම නිබන්ධනය සඳහා වෛද්‍ය ගාමිණී කරුණාරත්න සම්මානය දිනා ගන්නා ලදී.

වෛද්‍ය වර්ෂා ද සොයිසා මිය 2023 අගෝස්තු 3-5 දක්වා මැලේසියාවේ ෂා අලාම්, සෙලන්ගෝර් හි පැවති මැලේසියානු වර්ධකභෘත්‍ය වෛද්‍ය සම්මේලනයට සහභාගී විය. "සම්පත්-සීමිත සායනික පසුබිමක වැඩිහිටි වැඩිහිටියන්ගේ දෛනික ජීවත්වීමේ ශාරීරික ක්‍රියාකාරකම් සඳහා වේගවත් පරීක්ෂාව" යන මාතෘකාවෙන් වෛද්‍ය වර්ෂා විසින් ඉදිරිපත් කරන ලද සහ වර්ෂා ද සොයිසා, එස්. ලේකම්වසම්, එන්. රත්නායක, ඩී.පලගසිංහ, ටී.අබේගුණසේකර, සහ එච්.ඩයස් විසින් කර්තෘත්වය දරන ලද, වාචික සාරාංශය දකුණු සහ අග්නිදිග ආසියානු රටවලින් වාචික සාරාංශ 85 කින් දෙවන හොඳම සම්මානය ලබා ගත්තේය.

අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ අරාබි සංගමය විසින් සංවිධානය කරන ලද අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ 6 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට මහාචාර්ය යූ.සී.පී පෙරේරා මහතා 2023 දෙසැම්බර් 5 සිට 7 දක්වා සහභාගී විය. එසේම 2023 නොවැම්බර් 20-24 දිනවල සිඩ්නිහි පැවති ජාත්‍යන්තර අධිකරණ විද්‍යා සංගමය විසින් සංවිධානය කරන ලද එම සංගමයේ 23 වැනි ත්‍රෛවාර්ෂික රැස්වීමට ද ඒ මහතා සහභාගී විය.

# ජාතික හා ජාත්‍යන්තර සම්මාන

## ජාතික සම්මාන

| පීඨය | සම්මාන කාණ්ඩය | සම්මානයේ නම | සම්මාන විස්තරය | ප්‍රදානය කරන්නා සහ රට | සම්මානලාභීන්ගේ නම/නම (ශිෂ්‍යයා/කාර්ය මණ්ඩලය/අධ්‍යයනාංශය/ පීඨය/විශ්වවිද්‍යාලය) |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම | පර්යේෂණ | ජනාධිපති සම්මානය | විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මානය | ජාතික පර්යේෂණ සභාව, ශ්‍රී ලංකාව | ඩී.ඒ.එල්. ලීලාමනී, එච්.අයි.පී.එස්. පියරුවන්, පාංශු විද්‍යා අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය |
| කෘෂිකර්ම | පර්යේෂණ | SUSRED සම්මානය | පශ්චාත් උපාධි අධීක්ෂණය සඳහා SUSRED සම්මාන | ජාතික විද්‍යා පදනම | ඩී.ඒ.එල්. ලීලාමනී,, පාංශු විද්‍යා අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය, එස් සුබසිංහ බෝග විද්‍යා අධ්‍යයනාංශය, කෘ.පීඨය |
| සම සෞඛ්‍ය විද්‍යා | පර්යේෂණ | හොඳම වාචික ඉදිරිපත් කිරීම | උඩෘත ඉදිරිපත් කිරීම සඳහා | පශ්චාත් වෛද්‍ය විද්‍යා උපාධි ආයතනය | අධ්‍යයන සාමාජික - ආචාර්ය නිර්මලා රත්නායක, ආචාර්ය වර්ෂා ද සොයිසා, තිළිණ අබේගුණවර්ධන, ආචාර්ය ධම්මික පලංගසිංහ, මහාචාර්ය සරත් ලේකම්වසම්, හර්ෂනී ඩයස් මෙනෙවිය. |
| සම සෞඛ්‍ය විද්‍යා | ක්‍රීඩා | ජාතික විනිසුරු | ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනයේ ජාතික විනිසුරු 2023 | ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය | ආර්.එම්.සී. ශාමලී, ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක ශ්‍රේණිය III, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| සම සෞඛ්‍ය විද්‍යා | ක්‍රීඩා | 1 වන මට්ටමේ පුහුණුකරු | ටයිකොන්ඩෝ පුහුණුකරු I මට්ටම සම්පූර්ණ කරන ලදී. | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය/ ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය | ආර්.එම්.සී. ශාමලී, ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක ශ්‍රේණිය III, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| සම සෞඛ්‍ය විද්‍යා | ක්‍රීඩා | ශාරීරික යෝග්‍යතා උපදේශක | ශාරීරික යෝග්‍යතා උපදේශක පාඨමාලාව - ජා.වෘ.පු. 4 වන මට්ටම සම්පූර්ණ කර ඇත | ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | ආර්.එම්.සී. ශාමලී, ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක ශ්‍රේණිය III, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| වෛද්‍ය | වෙනත් | අන්තර් පීඨ ව්‍යුහ විද්‍යා ප්‍රශ්නාවලිය | අන්තර් පීඨ ව්‍යුහ විද්‍යා ප්‍රශ්නාවලිය 2023 | අන්තර් පීඨ ව්‍යුහ විද්‍යා ප්‍රශ්නාවලිය 2023 | |

| පීඨය | සම්මාන කාණ්ඩය | සම්මාන යේ නම | සම්මාන විස්තරය | ප්‍රදානය කරන්නා සහ රට | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍යයා/කාර්ය මණ්ඩලය/අධ්‍යයනාංශය /පීඨය/විශ්වවිද්‍යාලය) |
|---|---|---|---|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා | හොඳම නිබන්ධන සම්මානය (වාචික ඉදිරිපත් කිරීම) | | | 20 වන අධ්‍යයන සැසි සහ 19 වන උපකුලපති සම්මාන 2023 | මහාචාර්ය එච්.එච්.පීරිස් |
| සම සෞඛ්‍ය විද්‍යා | වාචික ඉදිරිපත් කිරීම් සඳහා ප්‍රථම ස්ථාන ත්‍යාගය සහ වාචික ඉදිරිපත් කිරීම සඳහා ආචාර්ය සී.පාලසුන්තෙරම් ත්‍යාගය | | | ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යාඥයින්ගේ 32 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය | ආචාර්ය කේ.ජී ජයසේකර වෛද්‍ය |
| වෛද්‍ය | පර්යේෂණ | හොඳම නිබන්ධන ය | වාචික ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥයින් ගේ ආයතනය | ආචාර්ය අයි.එල්.ඒ.එන්. දර්ශන, ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| වෛද්‍ය | | වසංගත රෝග විද්‍යාවේ මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | | කැළණිය විශ්වවිද්‍යාලය . | වෛද්‍ය වින්ද්‍යා රාජකරුණා, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| වෛද්‍ය | පර්යේෂණ | ජනාධිපති සම්මාන | 2019/2020 පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන | | සම්මානිත මහාචාර්ය මිරානි වීරසූරිය, මහාචාර්ය චන්න යහතුගොඩ, ආචාර්ය එන්.එල්. ද සිල්වා, මහාචාර්ය චම්පිකා බෝධිනායක, මහාචාර්ය ත්‍යාගි පොන්නම්පෙරුම සහ මහාචාර්ය අජිත් නාගහවත්ත. |
| වෛද්‍ය | පර්යේෂණ | රන් පදක්කම් | නවෝත්පාදන සඳහා රන් පදක්කම් දෙකක් දිනා ගත්තේය | දක්ෂිණ නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය (RIIE 2023) | මහාචාර්ය චන්දන වික්‍රමරත්න |

| පීඨය | සම්මාන කාණ්ඩය | සම්මානයේ නම | සම්මාන විස්තරය | ප්‍රදානය කරන්නා සහ රට | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍යයා/කාර්ය මණ්ඩලය/අධ්‍යයනාංශ ය/පීඨය/විශ්වවිද්‍යාලය) |
|---|---|---|---|---|---|
| වෛද්‍ය | වෙනත් | අන්තර් පීඨ ළමා රෝග ප්‍රශ්න විචාරාත්මක තරඟය | ළමා රෝග විශේෂඥයන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද අන්තර් පීඨ ළමා රෝග ප්‍රශ්න විචාර තරඟය | ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥයන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද අන්තර් පීඨ ළමා රෝග ප්‍රශ්න විචාර තරඟය | |
| වෛද්‍ය | වෙනත් | අන්තර් පීඨ ව්‍යුහ විද්‍යා ප්‍රශ්න විචාරාත්මක තරඟය | අන්තර් පීඨ ව්‍යුහ විද්‍යා ප්‍රශ්න විචාර තරඟය 2023 | අන්තර් පීඨ ව්‍යුහ විද්‍යා ප්‍රශ්න විචාර තරඟය 2023 | |
| ඉංජිනේරු | ජනාධිපති සම්මානය | ශ්‍රී ලංකාවේ වඩාත්ම ගෞරවනීය විද්‍යාත්මක පර්යේෂණ සම්මාන | 2019 වසරේ ජර්නල් ඔෆ් ක්ලීනර් ප්‍රඩක්ෂන්ස් සඟරාවේ “ශ්‍රී ලංකාවේ නේවාසික වැසි ජලය භාවිතයේ පවතින බව සහ මහජන පිළිගැනීම” විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා | ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව | මහාචාර්ය තුෂාර චමින්ද |
| ඉංජිනේරු | 2020 විද්‍යා පර්යේෂණ සඳහා ගෞරවනීය ජනාධිපති සම්මානය. | ගෞරවනීය ජනාධිපති සම්මානය. | 2020 විද්‍යා පර්යේෂණ සඳහා සම්මානය | ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව | ආචාර්ය ජී.අයි.පී. පෙරේරා මිය ආචාර්ය ක්‍රිෂාන් වික්‍රමසිංහ |
| ඉංජිනේරු | පර්යේෂණ | හොඳම තාක්ෂණික නිබන්ධන සම්මානය | "බල පද්ධතිවල පද්ධති අවස්ථිති බව පුරෝකථනය කිරීම සඳහා යන්ත්‍ර ඉගෙනුම්-පාදක ප්‍රවේශයන් පිළිබඳ විවේචනාත්මක තක්සේරුව"සඳහා හොඳම තාක්ෂණික පත්‍රිකා සම්මානය හිමි වීම. | ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ තරුණ වෘත්තිකයන් - ශ්‍රී ලංකාව | විදුර බණ්ඩාර විජේකෝන් |

| පීඨය | සම්මාන කාණ්ඩය | සම්මානයේ නම | සම්මාන විස්තරය | ප්‍රදානය කරන්නා සහ රට | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍යයා/කාර්ය මණ්ඩලය/අධ්‍යයනාංශය/පීඨය/විශ්වවිද්‍යාලය) |
|---|---|---|---|---|---|
| ඉංජිනේරු | ඉංජිනේරුවන් සඳහා ස්පීක් අවුට් ශ්‍රී ලංකා අවසන් තරඟය | ශූරයා | රුහුණ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ IMechE රුහුණ ශිෂ්‍ය ශාඛාව නියෝජනය කරමින් Speak Out for Engineers (SofE) ශ්‍රී ලංකා අවසන් තරඟයේ ශූරයා ලෙස £ 300 ක ජයග්‍රාහී මුදලක් සමගින් ජයග්‍රහණය හිමි කර ගන්නා ලදී. | IMechE ශ්‍රී ලංකා අංශය | ලක්දිනු ද සිල්වා මහතා |
| ඉංජිනේරු | Glamour femme '23 අන්තර් විශ්වවිද්‍යාල ඉංග්‍රීසි විවාද තරඟාවලියේ ශූරතාවය | ශූරතාවලිය | රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු හා වෛද්‍ය පීඨවල උපාධි අපේක්ෂකයන්ගෙන් සමන්විත ඉංග්‍රීසි විවාද කණ්ඩායම | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ වි.වි.ඉ. ආයතනයේ ශිෂ්‍ය ශාඛාව | කේ.ආර්.එස් කැකුලාවල පී.එස්.එල් ද සිල්වා ආර්.ආර් හපුආරච්චි |
| ඉංජිනේරු | 20 වන අධ්‍යයන සැසිය, රුහුණ විශ්වවිද්‍යාලය | ඉංජිනේරු, තාක්ෂණ සහ විද්‍යා සැසිය සඳහා හොඳම ඉදිරිපත් කරන්නා | 2023 ජුනි මස 7 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේදී පැවැත්වුණු 20 වැනි අධ්‍යයන සැසිය | රුහුණ විශ්වවිද්‍යාලය | ආචාර්ය කේ.ජේ.සී. කුමාර |

## ජාත්‍යන්තර සම්මාන

| පීඨය | සම්මාන කාණ්ඩය | සම්මාන යේ නම | සම්මාන විස්තරය | ප්‍රදානය කරන්නා සහ රට | සම්මානලාභීන්ගේ නම/නම් (ශිෂ්‍යයා/කාර්ය මණ්ඩලය/අධ්‍යයනාංශය/පීඨය/ විශ්වවිද්‍යාලය) |
|---|---|---|---|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා | පර්යේෂණ | හොඳම වාචික ඉදිරිපත් කිරීම 2 වන ස්ථානය | උඩෘත ඉදිරිපත් කිරීම සඳහා | මැලේසියානු වර්ධකභෘත්‍ය වෛද්‍ය සම්මේලනය, මැලේසියාව | අධ්‍යයන සාමාජික - ආචාර්ය නිර්මලා රත්නායක, ආචාර්ය වර්ෂා ද සොයිසා, තිළිණ අබේගුණවර්ධන, ආචාර්ය ධම්මික පලංගසිංහ, මහාචාර්ය සරත් ලේකම්වසම්, හර්ෂනී ඩයස් මෙනෙවිය. |
| සම සෞඛ්‍ය විද්‍යා | පර්යේෂණ | හොඳම වාචික ඉදිරිපත් කිරීම 3 වන ස්ථානය | උඩෘත ඉදිරිපත් කිරීම සඳහා | මැලේසියානු වර්ධකභෘත්‍ය වෛද්‍ය සම්මේලනය, මැලේසියාව | අධ්‍යයන සාමාජික - ආචාර්ය නිර්මලා රත්නායක, ආචාර්ය වර්ෂා ද සොයිසා, තිළිණ අබේගුණවර්ධන, ආචාර්ය ධම්මික පලංගසිංහ, මහාචාර්ය සරත් ලේකම්වසම්, හර්ෂනී ඩයස් මෙනෙවිය |
| සම සෞඛ්‍ය විද්‍යා | ක්‍රීඩා | ජාත්‍යන්තර විනිසුරු | 2023 පළමු ජාත්‍යන්තර ටයිකොන් ඩෝ ශූරතාවලියේ ජාතික/ජාත්‍යන්තර තීරක ලෙස නම් කර තීරකයකු ලෙස කටයුතු කරන ලදි. | ශ්‍රී ලංකා ටයිකොන් ඩෝ සම්මේලනය, ශ්‍රී ලංකාව | ආර්.එම්.සී. ශාමලී, ශාරීරික අධ්‍යාපන උපදේශක ශ්‍රේණිය III, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| ඉංජිනේරු | පර්යේෂණ | ගරු අනුබද්ධ මහාචාර්ය | මෙම සම්මානය විද්‍යාවේ උන්නතිය සඳහා ඔහු කළ විශිෂ්ඨ පර්යේෂණ සහ නවෝත්පාදනය අගය කිරීමක් ලෙස පිරි නමන ලදී. | ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර ජාත්‍යන්තර පර්යේෂණ. | මහාචාර්ය චමින්ද කරුණාසේන |

# ජාත්‍යන්තර සහයෝගීතා

## තිරසර සමුද්‍රීය සංවර්ධනය පිළිබඳ 8 වැනි චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩමුළුව

2023 අප්‍රේල් 25 වන දින, රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන හා පර්යේෂණ සඳහා වූ චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානය (CSL-CER) සහ චීන විද්‍යා ඇකඩමිය (CAS) දකුණු චීන මුහුදේ සාගර විද්‍යා ආයතනය (SCSIO), කොළඹ සැෆයර් රැස්වීම් ශාලාවේදී ඔවුන්ගේ 8 වැනි වාර්ෂික ඒකාබද්ධ වැඩමුළුව සාර්ථකව අවසන් කළේය. වැඩමුළුවේ මූලික අරමුණ වූයේ ඉන්දු පැසිෆික් සාගරයේ විචල්‍යතාවය සහ එහි පාරිසරික බලපෑම් මෙන්ම පාරිසරික ගැටළු සහ ඊට අනුරූප ප්‍රතිකර්ම ඇතුළු තීරණාත්මක මාතෘකා පිළිබඳ අර්ථවත් සාකච්ඡා සඳහා පහසුකම් සැලසීමයි. මෙම වසරේ වැඩමුළුවේ තේමාව වූයේ " තිරසාර සමුද්‍රීය සංවර්ධනය" යන්නයි. චීන මහජන සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත ටී බී කොහොන, ශ්‍රී ලංකාවේ මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී උපදේශක හූ වෙයි; රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන යන මහතුන් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

## ජපාන තානාපති මිසුකොෂි හිදෙආකි මහතාගේ සංචාරය

ජපාන තානාපති ගරු මිසුකොෂි හිදෙආකි මහතා තවත් දූත මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකු සමග 2023 මැයි 17 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ සංචරයක නිරත විය. නියෝජ්‍ය උපකුලපති ඊ.පී.එස්. චන්දන මහතා සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර විසින් ගරු හිදෙආකි මහතා සහ දූත මණ්ඩලය සාදරයෙන් පිළිගන්නා ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති අතිපූජ්‍ය ආචාර්ය අකුරටියේ නන්ද හිමියන්ගේ ප්‍රධානත්වයෙන් නිල රැස්වීමක් උපකුලපති කාර්යාලයේදී පැවැත්විණි. ජපානය සහ ශ්‍රී ලංකාව අතර කාලයාගේ ඇවෑමෙන් බුදුදහම තුළින් ගොඩනැගුණු සමීප සබඳතාව මෙම සාකච්ඡාවේදී අවධාරණය කෙරිණි.



සාකච්ඡාවෙන් අනතුරුව, තානාපතිවරයා රුහුණ විශ්වවිද්‍යාලයේ සංචාරය සිහිපත් කරමින් පැළයක් රෝපණය කළ අතර, විශ්වවිද්‍යාල පරිශ්‍රය අවට දර්ශන නැරඹීමට ද සහභාගි විය. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා ද මෙම අවස්ථාව සඳහා සහභාගී විය.

## ප්‍රංශ තානාපති ගරු ජෝ ෆොෂුවා පැක්ටෙට් මහතාගේ සංචාරය

ප්‍රංශ තානාපති ගරු ජෝ ෆොෂුවා පැක්ටෙට් මහතා කොළඹ ප්‍රංශ තානාපති කාර්යාලයේ තවත් නියෝජිතයින් කිහිප දෙනෙකු සමඟ 2023 පෙබරවාරි 10 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ සුහද සංචාරයක නිරත විය.

## රුහුණ විශ්වවිද්‍යාලය සහ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලය අතර සහයෝගිතා අධ්‍යයන වැඩසටහන

රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව හදාරන අවසන් වසර සිසුන් සහ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ අන්තර් ශික්ෂණ අධ්‍යයන අංශයේ සිසුන් සඳහා සති දෙකක සහයෝගීතා පුහුණු වැඩසටහනක් 2023 මාර්තු 6 සිට 18 දක්වා කාලය තුළ පවත්වන ලදී. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ දැනුම හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස සහභාගිවූවන් සියලු දෙනා සඳහා වටිනා ඉගෙනුම් අවස්ථා ලබා දීමයි. මෙම වැඩසටහන අතරතුර, සිසුන් සිද්ධි අධ්‍යයන, ක්ෂේත්‍ර චාරිකා සහ පර්යේෂණ ඇතුළු විවිධ ක්‍රියාකාරකම්වල නිරත විය. ශ්‍රී ලංකාවේ සහ නෙදර්ලන්තයේ ශිෂ්‍ය කණ්ඩායම් දෙක අතර සහක්‍රියාව ඔවුන්ගේ අධ්‍යාපනික ගමන සාරවත් කරමින් අදහස් සහ ඉදිරි දර්ශනවල ශක්තිමත් හුවමාරුවකට පහසුකම් සැලසීය. ඇම්ස්ටර්ඩෑම් හි සිසුන් ශ්‍රී ලාංකීය සගයන් සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියා තුළින් පර්යේෂණ අදහස් වර්ධනය කිරීම මෙම අවස්ථාවෙහිදී කැපී පෙනුණි.

## චීන විද්‍යා ඇකඩමියේ විද්‍යාඥයන්ගේ සංචාරය

චීන විද්‍යා ඇකඩමිය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා එම ඇකඩමියේ (CAS) විද්‍යාඥයින් කණ්ඩායමක් 2023 මැයි 25 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණියහ. සාගර ජීව විද්‍යාත්මක සම්පත්, සමුද්‍ර ක්ෂීරපායින් සහ වෙරළ ගිලා බැසීම් කෙරෙහි අවධානය යොමු කරමින්, අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවල දැනුම හුවමාරු කර ගැනීම සහ ඒකාබද්ධ ගවේෂණය සඳහා පහසුකම් සැලසීම මෙම සංචාරයේ අරමුණ විය.

## පොත් පරිත්‍යාගය: යුරෝපා සංගම් සම-අරමුදල් සහිත තිරසර තාක්ෂණික ආර්ථික සමාජීය (TESS) ව්‍යාපෘතිය

යුරෝපා සංගම් සම-අරමුදල් සහිත තිරසර තාක්ෂණ-ආර්ථික-සමාජීය ව්‍යාපෘතිය මගින් පොත් හැත්තෑ හයක් විශ්වවිද්‍යාල ප්‍රධාන පුස්තකාලයට පරිත්‍යාග කර ඇත. මහාචාර්ය තුසිත ගුණවර්ධනගේ සම්බන්ධීකරණය ඇතිව මෙම ව්‍යාපෘතිය මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ව්‍යවසායකත්වය, බලශක්ති කළමනාකරණය, දත්ත විශ්ලේෂණය, අවදානම් කළමනාකරණය සහ හරිත සැපයුම් දාම කළමනාකරණය වැනි විවිධ විෂයයන් සඳහා පොත් පරිත්‍යාග කිරීම සඳහා යුරෝ 5,000ක් වෙන් කර ඇත. මෙම පොත් පුස්තකාලයට පරිත්‍යාග කිරීමෙන්, එම විෂය ක්ෂේත්‍ර තුළ පර්යේෂණ සංස්කෘතියක් ශක්තිමත් කිරීම සහ ව්‍යවසායකත්ව අවස්ථා නිර්මාණය කිරීම තිරසර තාක්ෂණ-ආර්ථික-සමාජීය ව්‍යාපෘති කණ්ඩායම අරමුණු කරයි.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ වැඩමුළුව

තිරසර තාක්ෂණ-ආර්ථික-සමාජීය ව්‍යාපෘති කණ්ඩායම සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, යුරෝපා සංගමය සම අරමුදල් සපයන තිරසර තාක්ෂණ-ආර්ථික-සමාජීය ව්‍යාපෘතිය සමග සහයෝගිතාවයෙන් එරස්මස්+ උසස් අධ්‍යාපනය සඳහා ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන යටතේ 2023 මැයි 08 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය සහ පර්යේෂණය සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයේ දී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම ප්‍රචාරණය පිණිස වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුවේ ඉලක්ක කණ්ඩායම වූයේ රුහුණ විශ්වවිද්‍යාලයේ සහ තිරසර තාක්ෂණ-ආර්ථික-සමාජීය ව්‍යාපෘතියේ හවුල්කාර විශ්වවිද්‍යාලවල අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්ය.

## කොචින් විද්‍යා හා තාක්ෂණ ආයතනය සමග අවබෝධතා ගිවිසුම

රුහුණ විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ කොචින් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් 2023 ජුනි 15 වැනි දින විශ්වවිද්‍යාල සනාතන සභා ශාලාවේදී අත්සන් කරන ලදී. හම්බන්තොට ඉන්දීය කොන්සියුලර් ජනරාල් පී.ආර් ඩිපින් මහතා, පීඨවල පීඨාධිපතිවරුන් සහ ආයතන දෙකේ අනෙකුත් සම්භාවනීය අමුත්තන් ඉදිරියේ දී ආයතනවල උපකුලපතිවරුන් දෙදෙනා මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ. මෙම අවබෝධතා ගිවිසුම මගින් ආයතන දෙක අතර ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු කර ගැනීමටත් සමුද්‍ර විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ කිරීමටත් හැකියාව ඇති කරනු ඇත.

## රුහුණ විශ්වවිද්‍යාලය සහ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ සහයෝගිතාව

සුවිශේෂී සහයෝගීතාවයක් ඇති කර ගනිමින්, ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලය සහ කෘෂි ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර අධ්‍යයනාංශය 2022 හා 2023 වර්ෂවල දින 12 ක පරිණාමනීය වැඩසටහනකට සත්කාරකත්වය දරන ලදී. මෙම මුලාරම්භය නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ අනාගත ග්‍රහලෝක අධ්‍යයන වැඩසටහනේ උපාධි අපේක්ෂකයින් සමඟ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂකයින් ඒකාබද්ධ කරන ලදී.

## මහාචාර්ය ටකාෂි ෆුජිනෝ මහතාගේ රුහුණ විශ්වවිද්‍යාල සංචාරය

ජපානයේ සයිටමා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය දීර්ඝ කාලයක් ඒකාබද්ධව කටයුතු කර ඇති අතර මෙම විශ්වවිද්‍යාල දෙක අතර පවතින අවබෝධතා ගිවිසුම 2023 ජුනි මාසයේදී අලුත් කරන ලදී. මෙම අවබෝධතා ගිවිසුම යටතේ සයිටම් විශ්වවිද්‍යාලයේ අවබෝධතා ගිවිසුමේ සම්බන්ධීකාරක මහාචාර්ය ටකේෂි ෆුජිනෝ මහතා 2023 නොවැම්බර් 03 සහ 04 යන දිනවල රුහුණ විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය. මහාචාර්ය ෆුජිනෝ නියෝජ්‍ය උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා සමග 2023 නොවැම්බර් 03 වනදා හා ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සමඟ නොවැම්බර් 04 වනදා ඵලදායී සාකච්ඡාවක් පැවැත්විය. මෙම සාකච්ඡාව මගින් ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරුව, පර්යේෂණ සහයෝගීතා සහ පශ්චාත් උපාධි අවස්ථා සඳහා ඇති හැකියාව ගවේෂණය කිරීමට අපට හැකි විය.

## තායිලන්තයේ බැංකොක්හි චුලාබෝර්න් උපාධි ආයතනයේ නියෝජිතයින්ගේ සංචාරය

තායිලන්තයේ බැංකොක් හි චුලාබෝර්න් උපාධි ආයතනයේ නියෝජිතයින් 2023 නොවැම්බර් 22 වන දින රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණියේ ආයතන දෙක අතර සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා ය. චුලාබෝර්න් උපාධි ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරමින් මෙම සහයෝගීතාව විධිමත් කිරීමට රැස්වීමේදී තීරණයකට එළැඹිණි.

## ඉංග්‍රීසි භාෂා අධිශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලය සමග සහයෝගීතාවයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය විසින් සංවිධානය කරනු ලැබූ ඉංග්‍රීසි භාෂා අධිශිෂ්‍යත්ව වැඩසටහන 2023 ඔක්තෝබර් 07 වන දින ආරම්භ විය. වෙනත් භාෂා කථා කරන්නන්ට ඉංගිසි භාෂාව ඉගැන්වීමේ ක්ෂේත්‍රයේ ඉහළම සුදුසුකම් සහිත එක්සත් ජනපද ශික්ෂකයෙකු වන මිරියම් වැස්ක්වෙස් මහත්මිය මෙම වැඩසටහන මාස 10 ක කාලයක් පුරා පවත්වන ලදී.

## ජර්මනියේ කීල් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උටා උල්රිච් මියගේ සංචාරය

ජර්මනියේ කීල් විශ්වවිද්‍යාලයේ විද්‍යාඥ ආචාර්ය උටා උල්රිච් මිය, සාරස විද්‍යා සහ ජල තාක්ෂණ අධ්‍යයනාංශයේ ආචාර්ය අසංක ජයසිංහ සහ ආචාර්ය ලිෂානි විජේවර්ධන යන අයගේ ආරාධනයෙන් 2023 මාර්තු 13 සිට 17 දක්වා ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ සංචාරයක නිරත විය. ඇයගේ සංචාරයේ පරමාර්ථය වූයේ සාරස විද්‍යා සහ ජල තාක්ෂණ අධ්‍යයනාංශය සමඟ පර්යේෂණ සහයෝගිතා ආරම්භ කිරීම වන අතර, ආචාර්ය අසංක ජයසිංහගේ පශ්චාත් උපාධි සිසුන් විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර අත්හදා බැලීම් අධීක්ෂණය කළාය. සංචාරය අතරතුර, "පළිබෝධනාශකවල පාරිසරික ඉරණම - ප්‍රවාහනය, පරිවර්තනය සහ පාරිසරික ධූලකවිද්‍යාත්මක බලපෑම්" පිළිබඳ ආරාධිත දේශනයකදී සිය විශේෂඥ දැනුම සහ පර්යේෂණ අත්දැකීම් බෙදා ගත්තාය.

## ජපානයේ හොකයිඩෝ බුන්ක්යෝ විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණීම

ජපානයේ හොකයිඩෝ බුන්ක්යෝ විශ්වවිද්‍යාලයේ සභාපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටොෂිහිරෝ වටනබේ සහ ජාත්‍යන්තර අධ්‍යයන පීඨයේ පීඨාධිපති මහාචාර්ය හරුමි ආබේ, ජපානයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා සමඟ 2023 සැප්තැම්බර් 27 වැනි දින, රුහුණ විශ්වවිද්‍යාලය සමඟ අත්සන් කරන ලද ඔවුන්ගේ අවබෝධතා ගිවිසුමේ වැඩසටහනේ කොටසක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණියහ. රුහුණ විශ්වවිද්‍යාලය සමඟ විභව සහයෝගීතා වැඩසටහන් සම්බන්ධයෙන් ජපාන කණ්ඩායම උපකුලපතිවරයා සමඟ ඵලදායී සාකච්ඡාවක නිරත විය. ජපානයේ හොකයිඩෝ බුන්ක්යෝ විශ්වවිද්‍යාලයේ සභාපතිවරයා රුහුණ විශ්වවිද්‍යාලය සමඟ නුදුරු අනාගතයේ දී නව ගෝලීය සබඳතා අධ්‍යයන වැඩසටහනක් දියත් කිරීමට කැමැත්ත පළ කළේය.

## ඩියුක් ග්ලෝබල් සෞඛ්‍ය ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය අතර දහහත් අවුරුදු හවුල්කාරිත්වය

ඩියුක් රුහුණ සහයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය 2006 දී පිහිටුවන ලද්දේ ඇ.එ.ජනපදයේ උතුරු කැරොලිනාහි ඩියුක් විශ්වවිද්‍යාලයේ ඩියුක් ගෝලීය සෞඛ්‍ය ආයතනයේ හියුබර්ට් -යියර්ගැන් මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ එක්ව සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ සහ ශිෂ්‍ය/වෛද්‍ය හුවමාරු වැඩසටහන් සඳහා ද්වි-දිශානුගත සහයෝගීතාවයට පහසුකම් සැලසීමේ උත්සාහයක් සමඟිනි.

ආයතන දෙක අතර දහහත් අවුරුදු හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම පිණිස ඩියුක් ගෝලීය සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය වෙන්ඩි ඕ'මීආරා මිය සහ ගෝලීය සෞඛ්‍යය සඳහා හියුබර්ට්-යියර්ගැන් මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ මහාචාර්ය ක්‍රිස් වුඩ්ස් මහතා 2023 නොවැම්බර් 1 සහ 2 දෙදින තුළ කරාපිටිය වෛද්‍ය පීඨයේ සංචාරයක නිරත විය.

ඩියුක් ගෝලීය සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂවරුන් ආයතන දෙක අතර පවතින විශිෂ්ඨ හවුල්කාරිත්වය සහ පර්යේෂණ හා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්වල ප්‍රගතිය සම්බන්ධයෙන් අදහස් දැක්වීය. මෙම සහයෝගීතාව සමග කටයුතු කිරීමේ උනන්දුවක් පෙන්නුම් කළ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර නව පර්යේෂණ අදහස් පිළිබඳ උද්යෝගීමත් සාකච්ඡාවක් බෙදා හදා ගන්නා ලදී. පසුගිය වසර 17 තුළ, ඉහළ ගුණාත්මක බවින් යුතු පර්යේෂණවල සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරමින් සහ ගෝලීය ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා බෝවන රෝග, මානසික සෞඛ්‍යය සහ ප්‍රජා සෞඛ්‍යය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික දත්තවලට දායක වෙමින් ඉහළ ගුණාත්මක බවින් යුතු විද්‍යාත්මක දත්ත උත්පාදනය කරමින් විද්වතුන් 50 කට වැඩි පිරිසක් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඩියුක්-රුහුණ සහයෝගීතාව සමඟ හවුල් වී ඇත. 2023 නොවැම්බරයේ පර්යේෂණ සඳහා වූ නවතම ජනාධිපති සම්මානය ඇතුළුව කීර්තිමත් සම්මාන රැසක් මෙම පර්යේෂණය දිනා ගෙන ඇත. මෙම දිගුකාලීන හවුල්කාරිත්වය සැබවින්ම රුහුණ විශ්වවිද්‍යාලයට මහඟු වත්කමක් වී ඇත.

## ශාස්ත්‍රීය සහභාගිත්ව

| පීඨය/අධ්‍යයනාංශය | දිනය/කාල සීමාව | රට | සහභාගිකයන් |
|---|---|---|---|
| ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය | දින 08 | ඇග්ඩර් විශ්වවිද්‍යාලය, නෝර්වේ | අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය | 2023.08.01 | පුත්‍රා විශ්වවිද්‍යාලය, මැලේසියාව | විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, භාෂා වෘත්තිකයන් 50 |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය | 25.11.2023 | අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු සංගමය (AARE) | අධ්‍යාපනයේ පර්යේෂකයන් 18 |
| මූල්‍ය හා කළමනාකරණ පීඨය | 2020 සිට 2023 දක්වා | නෝර්වේ (ප්‍රධාන සම්බන්ධීකරණය) - ශ්‍රී ලංකාවේ තාක්ෂණික-ආර්ථික-සමාජ තිරසාර සංවර්ධන පුහුණුව (TESS) - උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ධාරිතා ගොඩනැගීම – ඒකාබද්ධ ව්‍යාපෘතිය | පහත හවුල්කාර විශවිද්‍යාල ජාතික සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල නියෝජනය කරමින් මෙම ව්‍යාපෘතිය සමඟ කටයුතු කරයි: අග්නිදිග-නෝර්වේ විශ්වවිද්‍යාලය; එසෙක්ස් විශ්වවිද්‍යාලය- එක්සත් රාජධානිය; නෝවා විශ්වවිද්‍යාලය - පෘතුගාලය; ඩෙන්මාර්කයේ තාක්ෂණික විශවිද්‍යාලය; රුහුණ විශ්වවිද්‍යාලය; මොරටුව විශ්වවිද්‍යාලය; ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය |
| ධීවර හා සමුද්‍ර විද්‍යා සහ තාක්ෂණ පීඨය | "වෙරළ පාරිසරික ජලජීවී වගාව සහ ජෛව තාක්‍ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව | වෙරළ කලාප පර්යේෂණ ආයතනය, චීන විද්‍යා ඇකඩමිය, චීනය. | ධීවර හා ජලජීවී වගා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 2023.01.16 සිට 2023.01.22 දක්වා විශ්වවිද්‍යාල පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු (ENACT) වැඩසටහන | ජර්මනියේ ගොටින්ගන් විශ්වවිද්‍යාලය | අයි රේණුක ප්‍රියන්ත මහතා |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 2023.09.15 සිට 2023.09.24 දක්වා එරස්මස් + ගෝලීය සචලතාව යටතේ උපාධි සිසුන් සඳහා දේශන පවත්වන ලදී | නෝර්වේහි ඇඩ්ගර් විශ්වවිද්‍යාලය | අයි රේණුක ප්‍රියන්ත මහතා |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 2023.12.03 සිට 2023.12.07 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති Knowledge India ජාත්‍යන්තර සම්මුතියට සහභාගී විය | සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලය විසින් සංවිධානය කරන ලදී | ආචාර්ය අයි.ආර්. අකුරුගොඩ |

## වෙනත් විශේෂ සිදුවීම්

| වැඩසටහන/තේමාව | සංවිධානය කරනු ලැබූයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 ජනවාරි 19 වැනිදා | 3000 සහ 4000 මට්ටමේ සමාජ සංඛ්‍යාන සිසුන් | 55 |
| ශිෂ්‍ය නායකවරයාගේ කාර්යභාරය සහ වගකීම් | මන්තින්ද මහා පිරිවෙන සහ අනුර. විද්‍යාලය, මාතර. | 2023 දෙසැම්බර් | 4000 මට්ටමේ කාර්ය මණ්ඩලය සහ සිසුන් | 800 |
| නිෂ්පාදනයේ තත්ත්ව පාලන ක්‍රියා පටිපාටිය. | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 ජූලි 23 සහ 24 | 4000 මට්ටමේ කාර්ය මණ්ඩලය සහ සිසුන් | 55 |
| අන්තර් පීඨ සංඛ්‍යාන ප්‍රශ්න විචාර තරඟය | රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ගණිත අංශය සමඟ ඒකාබද්ධව රුහුණ විශ්වවිද්‍යාලයේ ගණිත හා සංඛ්‍යාලේඛන සංගමය | 2023 දෙසැම්බර් 20 | ආර්ථික හා සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයේ සිසුන් | 40 |
| QUT වෘත්තීය මිත්‍රෝපදේශනය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය, නිර්මාණාත්මක කර්මාන්ත අධ්‍යාපන හා සමාජ සාධාරණත්වය පිළිබඳ පීඨය, ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලය | 2023 (ජනවාරි සිට දෙසැම්බර් දක්වා) | QUT සිසුන්, පර්යේෂකයන්: ඉන්දු පැසිෆික් කලාපය | මිත්‍රෝපදේශ ලාභීන් 1, ශිෂ්‍යයන් 22 |
| හැෂ්ටැග් පරම්පරාවේ විචාරශීලී චින්තනය | රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ හැෂ්ටැග් පරම්පරාව | 2023.12.08 සිට 2023.12.10 දක්වා දින තුනක් | උපාධි අපේක්ෂකයින් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් | උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු සහ කාර්ය මණ්ඩල සාමාජිකයෙක් |
| ජාතික අධිකරණබලය ඉක්මවූ ජෛවවිවිධත්ව ගිවිසුම පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ සම්මන්ත්‍රණය | රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය | 24.11.2023 | උපාධි අපේක්ෂකයින් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් | උපාධි අපේක්ෂකයින් හතර දෙනෙක් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙක් |

| වැඩසටහන/තේමාව | සංවිධානය කරනු ලැබූයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ආරාධිත දේශනය ආචාර්ය පාලිත කොහොන මහතා | රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය සහ පර්යේෂණ සඳහා මධ්‍යස්ථානය | 31.10.2023 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් | උපාධි අපේක්ෂකයින් 300 කට වැඩි පිරිසක් |
| බහු-මාන අවදානම් පාත්‍ර බව පිළිබඳ ප්‍රතිපත්ති වාර්තාව එළිදැක්වීම | එ.ජා.ස.වැ. | 01.09.2023 | උපාධි අපේක්ෂකයින් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් | උපාධි අපේක්ෂකයින් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| ප්‍රසිද්ධියේ කතා කිරීම පිළිබඳ වැඩමුළුව | රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය (AHEAD ව්‍යාපෘතිය යටතේ) | 13.06.2023 | රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂකයින් | අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් 50 ක් |
| අන්තර්ගත සංවර්ධනය සඳහා කඩිනම් මාර්ගෝපදේශය පිළිබඳ වැඩමුළුව | | 29.05.2023 | | |
| ජීව දත්ත ලිවීම සහ සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීම. | රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය | 12.05.2023 | | |
| ඩිජිටල් ආරක්ෂාව වැසටහන | රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය (ඉන්ටර් නිව්ස් ශ්‍රී ලංකා හි මගපෙන්වීම ඇතිව) | 11.04.2023 | | |
| ආයතනික සන්දර්භයක් තුළ සෞඛ්‍ය සහ ආරක්ෂිත කළමනාකරණ භාවිතයන් පිළිබඳ ආරාධිත දේශන සැසිය | මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය | 23/01/2023 | 2000 මට්ටමේ මානව සම්පත් කළමනාකරණය විශේෂඥ සිසුන් | 2000 මට්ටමේ මානව සම්පත් කළමනාකරණය විශේෂඥ සිසුන් |
| නායකත්ව පුහුණු වැඩසටහන | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ සහයෝගීතාවයෙන් කළමනාකරණ සහ ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය | 01/05/2023 | 3000 මට්ටමේ සහ 4000 මට්ටමේ ව්‍යවසායකත්ව විශේෂඥ සිසුන් | 3000 මට්ටමේ සහ 4000 මට්ටමේ ව්‍යවසායකත්ව විශේෂඥ සිසුන් |
| ජපානයේ ශිෂ්‍යත්ව පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | සම්පත් දායකයින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (සභාපති) එච්.ඩී කරුණාරත්න, කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති. ජපානයේ ටෝකියෝ විශ්වවිද්‍යාලයේ නියෝජිත සතිෂ් පෙරේරා මහතා | 17/05/2023 | පීඨයේ සියලුම සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් | පීඨයේ සියලුම සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් |

| වැඩසටහන/තේමාව | සංවිධානය කරනු ලැබූයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කොළඹ කොටස් වෙළෙඳපොළ (CSE) පිළිබඳ වැඩමුළුව කොළඹ කොටස් වෙළඳපොළ වෙත අන්තර්දෘෂ්ටිය: වෙනස්වන ආර්ථික භූ දර්ශන වලට අනුගත වීම | මූල්‍ය අධ්‍යයනාංශය | 29/11/2023 | මූල්‍ය ශිෂ්‍යයන් | මූල්‍ය ශිෂ්‍යයන් |
| රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් සහ අනෙකුත් සංගම්වල මූල්‍ය කටයුතු හැසිරවීම පිළිබඳ වැඩමුළුව | කළමනාකරණ පීඨය | 22/11/2023 | රුහුණ විශ්වවිද්‍යාලයේ සියලුම ශිෂ්‍ය සංගම්, ශිෂ්‍ය සංගම්, ශිෂ්‍ය සභාව, අධ්‍යයන කව, ශිෂ්‍ය සමාජ සහ සංගම්වලට අනුයුක්ත සියලුම ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික, කනිෂ්ඨ භාණ්ඩාගාරික සහ රුහුණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකවරුන් | |
| විෂයමාලා සිතියම්කරණය පිළිබඳ වැඩමුළුව | අ.ත.ආ.ඒ. සහ තා.පී. | 2023 සැප්.20 | තා.පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| පීඨ මට්ටමේ ලින්ක්ඩ්ඉන් වැඩමුළුව | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, තා.පී. | 2023 ඔක්.24 | අළුතින් බඳවා ගත් ශිෂ්‍යයන් | අළුතින් බඳවා ගත් ශිෂ්‍යයන් |
| "භාව 2023" පීඨ මට්ටම | 7වන කාණ්ඩයේ ශිෂ්‍යයන් (නවක ශිෂ්‍යයන්) | 2023 දෙසැම්බර් 12 වැනිදා | මෙය නවක සිසුන්ගේ කුසලතා එළි දැක්වීමේ ප්‍රසංගයකි. | පීඨයේ සියලු ශිෂ්‍යයන් සහ තාක්ෂණ පීඨයේ සියලු කාර්ය මණ්ඩලය මේ සඳහා සහභාගි විය. |
| ගුරුදේව රවීන්ද්‍රනාත් තාගෝරයන්ගේ 82 වැනි අනුස්මරණය සැමරීම | ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ | 2023 අගෝස්තු 7 | රුහුණු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් | 300කට වැඩි පිරිසක් |
| අවසාන කථික තරඟය | | 2023 දෙසැම්බර් 23 | පීඨයේ ශිෂ්‍යයන් | පීඨයේ ශිෂ්‍යයන් |
| ලේ දන්දීමේ වැඩසටහන | | 2023 මාර්තු 28 | | |
| කර්මාන්ත නවෝත්පාදන ක්ෂේත්‍ර ප්‍රදර්ශනය | | 2023 ජූනි 22 | කේ.ඩී.එස්.වී. කරුණානායක මිය | සම සෞඛ්‍ය විද්‍යා පීඨය. |
| නායකත්ව වැඩසටහන | ශ්‍රී ලංකා යුනයිටඩ් ආයතනයේ සහයෝගීතාවයෙන් වෛද්‍ය පීඨය | 2023 ජූලි 08 සහ 09 | 2017/2018 කණ්ඩායම | සිසුන් 104 දෙනෙකු සහභාගි විය (හෙද- 42; වෛ.ර.වි. - 12; ඖෂධවේද -08). |
| ටෙරා ප්‍රොස්පෙරා 2023 | රුහුණ විශ්වවිද්‍යාල පාංශු විද්‍යා සංගමය සහ පාංශ විද්‍යා අධ්‍යයනාංශය | 2023 ජූනි 14 | පාංශු විද්‍යා ක්ෂෙත්‍රයේ සම්භාවනීය තැනැත්තන් | පාංශ විද්‍යා ක්ෂෙත්‍රයේ සම්භාවනීය තැනැත්තන් |

| වැඩසටහන/තේමාව | සංවිධානය කරනු ලැබූයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රුහුණ නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය (RIIE) 2023 | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය සහ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව සමඟ රුහුණ විශ්වවිද්‍යාලය | 2023 ජූනි 5 | සිසුන් සහ කාර්ය මණ්ඩලය | |
| ප්‍රොෆුඩ් සහ ප්‍රොපැක් ඇග්‍රි බිස් ප්‍රදර්ශනය | ශ්‍රී ලංකා ආහාර පිරිසැකසුම්කරුවන්ගේ සංගමය | 2023 අගෝස්තු 4, 5 සහ 6 | | |
| තරුණ ගොවිපල නිෂ්පාදන සහ කෘෂිකාර්මික තාක්ෂණ ප්‍රදර්ශනය "GREEN TALENTS WITH GEN Z" | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා තරුණ සංගමය සහ ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව | 2023 සැප්තැම්බර් 1,2 හා 3 | | |
| "දක්ෂිණ කෘෂි නවෝදය" ප්‍රදර්ශනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, දකුණ පළාත | 2023 සැප්තැම්බර් 13 සිට 17 දක්වා | | |
| "රුහුණු රස සරණිය" ප්‍රදර්ශනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, දකුණ පළාත | 2023 ඔක්තෝබර් 27 සහ 28 | | |
| අගය එකතු කළ තේ, කෝපි, කුළුබඩු, කිරි නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, ඇසුරුම් කර්මාන්ත පිළිබඳ පර්යේෂණ සොයාගැනීම්, නව නිපැයුම් සහ නවෝත්පාදන වාණිජකරණය සඳහා මාර්ගයක් | කර්මාන්ත අමාත්‍යාංශය | 2023 නොවැම්බර් 17 | | |
| කර්මාන්ත නවෝත්පාදන ක්ෂේත්‍ර ප්‍රදර්ශනය | | 2023 ජූනි 22 | | කේ.ඩී.එස්.වී. කරුණානායක මිය සම සෞඛ්‍ය විද්‍යා පීඨය නියෝජනය කරන ලදී. |

| වැඩසටහන/තේමාව | සංවිධානය කරනු ලැබූයේ | දිනය/කාල සීමාව | ඉලක්ක කණ්ඩායම | සහභාගිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2017/2018 කණ්ඩායම සඳහා නායකත්ව වැඩසටහන | ශ්‍රී ලංකා යුනයිටඩ් ආයතනයේ සහයෝගීතාවයෙන් වෛද්‍ය පීඨය | 2023 ජූලි 08 සහ 09 | | සිසුන් 104 දෙනෙකු සහභාගි විය (වෛද- 42; වෛ.ර.වි. - 12; ඖෂධවේද -08). |
| අගය එකතු කළ තේ, කෝපි, කුළුබඩු, කිරි නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, ඇසුරුම් කර්මාන්ත පිළිබඳ පර්යේෂණ සොයාගැනීම්, නව නිපැයුම් සහ නවෝත්පාදන වාණිජකරණය සඳහා මාර්ගයක් | කර්මාන්ත අමාත්‍යාංශය | 2023 නොවැම්බර් 17 | වොටර්ස් එජ් හෝටලය, බත්තරමුල්ල | |
| රුහුණු ජාත්‍යන්තර නවෝත්පාදන හා තාක්ෂණ සමුළුවට (RICIT) සමගාමීව සංවිධානය කරන ලද නිෂ්පාදන ප්‍රදර්ශනාගාරය | තාක්ෂණ පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය | 2023 නොවැම්බර් 24 | තාක්ෂණ පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය | |

## සංස්කෘතික උත්සව

### ගුරුදේව රවීන්ද්‍රනාත් තාගෝරයන්ගේ 82 වැනි ගුණානුස්මරණය

ගුරුදේව් රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ 82 වැනි ගුණ සමරුව නිමිත්තෙන් හම්බන්තොට ඉන්දීය කොන්සල් ජනරාල්වරයා, කොළඹ ස්වාමී විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය හා එක්ව මාතර රුහුණ විශ්වවිද්‍යාලයීය රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේ දී ගුරුදේව් රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ උඩුකය රුවක් නිරාවරණය කිරීම 2023 අගෝස්තු 07 වැනි දින සිදු විය.

## සහෝදරත්වයේ පියාපත් - අදියර 2

සහෝදරත්වයේ පියාපත් - අදියර 2 රුහුණ විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලය අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහනක් ලෙස 2023 නොවැම්බර් 29 සිට දෙසැම්බර් 3 දක්වා පවත්වන ලදී. එය ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය (ONUR) සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ එක්ව සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය, රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය සහ සංස්කෘතික මධ්‍යස්ථානය විසින් විසින් සංවිධානය කරන ලදී.

| වැඩසටහන/තේමාව | සංවිධානය කරනු ලැබූයේ | දිනය/කාල සීමාව | සහභාගිකයන් |
|---|---|---|---|
| සින්දු හැන්දෑව | කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සෞන්දර්ය සංගමය | 2023 ජූලි 11 | රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාව |
| Snow is Falling – 2023 | | 2023 දෙසැම්බර් 19 | |
| සරසාභි වන්දනා | මානව සම්පත් සංවර්ධන කවය, | 08/06/2023 | විශ්වවිද්‍යාල ප්‍රජාව |
| ත්‍රෛයිතාල සජීවී ප්‍රසාංගය | ගිණුම්කරණ කවය | 26/07/2023 | විශ්වවිද්‍යාල ප්‍රජාව |
| තෛයිපොන්ගල් උත්සවය | වෛද්‍ය පීඨය | 2023 ජනවාරි 22 | වෛද්‍ය පීඨයේ සිසුන් |
| නිම්වළල්ල සංගීත වැඩසටහන | වෛද්‍ය පීඨයේ සංස්කෘතික මධ්‍යස්ථානය | 2023 ජනවාරි 26 | වෛද්‍ය පීඨයේ සිසුන් |
| "වසත් නූපුර" | තාක්ෂණ පීඨයේ සංස්කෘතික මධ්‍යස්ථානයේ නර්තන අනුකම්ටුව | මාර්තු, 2023 | වෛද්‍ය පීඨයේ සිසුන් |
| තෛයිපොංගල් දිනය | තාක්ෂණ පීඨයේ දෙමළ සිසුන් | 2023 ජනවාරි | පීඨයේ සියලුම සිසුන් සහ ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| හීන -පීඨ මට්ටම | EconBridge සංගමය, තාක්ෂණ පීඨය | 2023 ඔක්තෝබර් 26 | ශිෂ්‍යයන් සහ කාර්යමණ්ඩලය |
| "කාව්‍යමය ධර්ම දේශනය හා බෙලිමල් දන්සල". පොසොන් උත්සවය සඳහා ආගමික වැඩසටහන | ආර්ථික හා සමාජීය සංඛ්‍යාන ශිෂ්‍ය සංගමය සහ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 ජූනි 02 | සියලු ශිෂ්‍යයන් |
| නත්තල් උත්සවය | ආර්ථික හා සමාජීය සංඛ්‍යාන ශිෂ්‍ය සංගමය සහ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | 2023 දෙසැම්බර් 24 | සියලු ශිෂ්‍යයන් |

# කොටස VIII

# පුස්තකාලය

"විශ්වවිද්‍යාලයක හදවත" බඳු වූ ශාස්ත්‍රීය පුස්තකාලයක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම සහ ඉගෙනීම සඳහා සහාය ලබා දීමෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. රට තුළ පැවැති ආර්ථික අර්බුදය මධ්‍යයේ විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රයත්න දැරීමේ දී රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතිය 2023 වසරේදී සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දුණි. මෙම තත්ත්වය තුළ, පුස්තකාලයට අදාළ පෙළපොත් වෙත ප්‍රවේශය ලබා දීම, අවශ්‍ය තොරතුරු සැපයීම සහ පුස්තකාලය සාමාන්‍යයෙන් සිදුකරන අනෙකුත් ප්‍රජා පාදක ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

බාධාකාරී මූල්‍ය පරිසරයක් තුළ "නව සාමාන්‍යය" මගින් මතුවූ ඉල්ලීම්වලට අනුව කටයුතු කිරීමේ දී, පුස්තකාලය විවිධ ක්‍රියාකාරකම් සහ සේවා සාර්ථකව ක්රියාවට නංවන ලදී. මෙම ප්‍රයත්නයන් විශ්වවිද්‍යාලයේ අරමුණු අභිවර්ධනය කෙරෙහි දිශානත වූවේ ය.

## සාමාජිකත්ව විස්තර

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජි . | වෛද්‍ය. | තාක්ෂණ. |
|---|---|---|---|---|---|---|
| **වත්මන් සාමාජිකත්වය** | | | | | | |
| • **ශිෂ්‍යයන්** | 9998 | 1203 | 1015 | 2732 | 2220 | 1157 |
| • අධ්‍යයන කාර්යමණ්ඩලය | 446 | 138 | 41 | 81 | 146 | 39 |
| • අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 305 | 57 | 27 | 47 | 110 | 24 |
| නව සාමාජිකත්ව (2023 වසරෙහි | | | | | | |
| ශිෂ්‍යයන් | 2576 | 238 | 288 | 545 | 304 | 190 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 13 | 09 | 03 | 02 | 11 | 01 |
| • අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 18 | 02 | 05 | 01 | 09 | 03 |

## විවෘතව තබන වේලාවන්

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජි . | වෛද්‍ය. | තාක්ෂණ. |
|---|---|---|---|---|---|---|
| සතියේ දින | පෙ.ව. 8.00 ප.ව. 4.30 | පෙ.ව. 8.00 ප.ව. 6.00 | පෙ.ව. 8.00 ප.ව. 4.15 | පෙ.ව. 8.00 ප.ව. 6.00 | පෙ.ව. 8.00 ප.ව. 7.00 | පෙ.ව. 8.00 ප.ව. 4.30 |
| සෙනසුරාදා | වසා ඇත | පෙ.ව. 8.00 ප.ව. 6.00 (විභාග කාලසීමාවේදී පමණි) | වසා ඇත | වසා ඇත | 8.00 a.m - 6.00 p.m (විභාග කාලසීමාවේ දී පමණි) | වසා ඇත |
| ඉරිදා | වසා ඇත | වසා ඇත | වසා ඇත | වසා ඇත | වසා ඇත | වසා ඇත |
| | | | | | | |
| බහුමාධ්‍ය මධ්‍යස්ථානය | ක්‍රියාත්මක නොවේ | ක්‍රියාත්මක නොවේ | ක්‍රියාත්මක නොවේ | ක්‍රියාත්මක නොවේ | ක්‍රියාත්මක නොවේ | ක්‍රියාත්මක නොවේ |
| ස්වයං-ඉගෙනුම් ප්‍රදේශය | පෙ.ව. 8.00 ප.ව. 6.00 | පෙ.ව. 8.00 ප.ව. 6.00 (විභාග කාලසීමාවේ | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දී පමණි) | | | | |
| සෙනසුරාදා | | නැත | | පැය 24 (පරිශීලකයන්ගේ ඉල්ලීම මත) | පෙ.ව. 08.30 සිට ප.ව.12.00. | |
| ඉරිදා | | පෙ.ව. 08.00 සිට. ප.ව. 12.00 | | | | |

### දඩ සහ වෙනත්

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජි . | වෛද්‍ය. | තාක්ෂණ. |
|---|---|---|---|---|---|---|
| ප්‍රමාදිත පොත් සඳහා දඩ (රු.)<br>**අන්තර් පුස්තකාල තාවකාලිකව ලබා දුන්**<br>• යැවූ<br>• ලත් | 174,899 | 3781.00 | 12,061.00<br><br>03 | **20,111.00** | 48,895.00 | 7464.50 |
| නිල භාවිතය සඳහා | | 1070 | 7120 | | 7025 | 1600 |

### පොත් හා වාර ප්‍රකාශන

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි | ඉංජි . | වෛද්‍ය. | තාක්ෂණ. |
|---|---|---|---|---|---|---|
| වාර ප්‍රකාශන | | | | | | |
| දැනටමත් ඇති මුළු වාර ප්‍රකාශන ගණන | | | | | **365** | 191 |
| නව පරිත්‍යාග | | 25 | | | 10 | 143 |
| | | | | | | |
| පොත් | | | | | | |
| දැනටමත් ඇති මුළු පොත් සංඛ්‍යාව | 197,189 | **23,672** | 4,446 | 19,939 | 25,445 | **2664** |
| අළුතින් මිලදී ගත් | **2011** | **136** | **11** | **06** | **10** | **05** |
| නව පරිත්‍යාග | 884 | 78 | 27 | 16 | 83 | 20 |
| පරිගණක ගත පොත් | | | | | | |
| ඉංග්‍රීසි | 94 | 64 | | | | |
| සිංහල | 1961 | 14 | | | | |
| සංයුක්ත තැටි | 01 | | | | | |
| ඊ පොත් | | | | 101 | | |
| නිකුත් කළ පොත් | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සංඛ්‍යාව | | | | | | |
| - ශිෂ්‍යයන් | **44,454** | **2,540** | **2,978** | **3,819** | **3,774** | **663** |
| - අධ්‍යයන කාර්ය මණ්ඩලය | **2,341** | **182** | **229** | **356** | **628** | **99** |
| - අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 2,157 | 252 | 94 | 323 | 656 | 201 |

# කොටස IX

# සුබසාධන සේවා

## 1. වෛද්‍ය මධ්‍යස්ථානය

වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවා සපයන අතර විවිධ විශේෂ අවස්ථා සඳහා සෞඛ්‍ය සේවා සපයයි. (උදා: උපාධි ප්‍රදානෝත්සවය, විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟ, අනෙකුත් විශේෂ අවස්ථා ආදී)

### වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරීන් (සහායක පදනමින් සහ සේවා මුර පදනමින්) | 11 |
| මනෝවිද්‍යාත්මක උපදේශක (සහායක පදනමින්) | 01 |
| හෙද නිලධාරී | 02 |
| ඖෂධවේදී | 01 |
| මහජන සෞඛ්‍ය නිලධාරීන් (සහායක පදනමින්) | 01 |
| උපස්ථායක (කාන්තා) | 01 |
| උපස්ථායක (පිරිමි) | 01 |
| වැඩ සහායක | 02 |
| කම්කරු (සෞඛ්‍ය සේවා) | 01 |

### සායනික සේවා

| සේවාව | ශිෂ්‍ය | කාර්ය මණ්ඩල | එකතුව |
|---|---|---|---|
| බාහිර රෝගී අංශය | 10498 | 2570 | **13068** |
| දන්ත වෛද්‍ය ඒකකය (2023/01/01 සිට 2023/07/31) | 2657 | 563 | **3220** |
| විශේෂ සායන වෙත යොමු කිරීම | 220 | 26 | **246** |
| මනෝවිද්‍යාත්මක උපදේශන සේවය (2023/10/01 - 2023/12/31) | 46 | 2 | **48** |

### නිවාරණ සෞඛ්‍ය සේවා

- ඩෙංගු රෝග නිවාරණ වැඩසටහන
- බෝවන රෝග හා බෝනොවන රෝග නිවාරණය
- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, කාර්ය මණ්ඩලය සහ ආපන ශාලා කාර්ය මණ්ඩලය සහ පිරිසිදු කිරීමේ සේවා කාර්ය මණ්ඩලය වෙත සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දෙන ලදී.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් උපදෙස් හා පූර්ව අනතුරු ඇඟවීම්

**ප්‍රතිකාර හා මහජන සෞඛ්‍ය සේවා**

| | | | |
|---|---|---|---|
| **ප්‍රතිකාර හා විශේෂ පරීක්ෂණ** | තුවාල සැරහුම | **806** | 1213 |
| | නික්ෂේපණ හා අවිලයනය | 108 | |
| | සුළු ශල්‍යකර්ම | 22 | |
| | ECG | 143 | |
| | රුධිර ග්ලූකෝස් පරීක්ෂාව (ග්ලූකෝමීටරය මගින්) | 134 | |
| | නීහාරීකරණය | 87 | 87 |
| **වෛද්‍ය පරීක්ෂණ** | බෝ නොවන රෝග | 10 | 17 |
| | විශේෂ | 07 | |
| **වෛද්‍ය සහතික (වෛද්‍ය මධ්‍යස්ථානය නිකුත් කරනු ලැබූ))** | ශිෂ්‍යයන් සඳහා | 1028 | 1050 |
| | කාර්ය මණ්ඩලය | 22 | |
| **වෛද්‍ය සහතික (පිළිගනු ලැබූ)** | නවක ශිෂ්‍යයන් | 3083 | 3729 |
| | විභාග සහ වෙනත් | 429 | |
| | කාර්ය මණ්ඩලය | 158 | |
| | බාහිර | 59 | |
| **මහජන සෞඛ්‍ය සේවා** | ආපන ශාලා පරීක්ෂාව | 220 | 725 |
| | නේවාසිකාගාර පරීක්ෂාව | 160 | |
| | පාරිසරික | 200 | |
| | අනෙකුත් පරිශ්‍ර | 145 | |

## 2. ශාරීරික අධ්‍යාපන අංශය

### අන්තර් පීඨ ඉසව්

| අන්තර් පීඨ ඉසව් | ජයග්‍රාහක |
|---|---|
| ක්‍රිකට් | තාක්ෂණ පීඨය |
| මාර්ග ධාවන | විද්‍යා පීඨය |

### අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා ඉසව්

| ඉසව්ව | ස්ථානය |
|---|---|
| වෙරළ වොලිබෝල් (පිරිමි) | 2වන ස්ථානය |
| වොලිබෝල් (පිරිමි) | 2වන ස්ථානය |
| එල්ලේ (පිරිමි) | 2වන ස්ථානය |
| චෙස් (පිරිමි) | 3වන ස්ථානය |
| පැසිපන්දු (පිරිමි) | 3වන ස්ථානය |
| ඔරු පැදීම (පිරිමි) | 3වන ස්ථානය |
| බේස්බෝල් (පිරිමි) | 3වන ස්ථානය |
| හොකී (කාන්තා) | 4 වන ස්ථානය |
| වොලිබෝල් (කාන්තා) | 4 වන ස්ථානය |
| මාර්ග ධාවන | 4 වන ස්ථානය |
| ටයිකොන්ඩෝ (පිරිමි) | 4 වන ස්ථානය |
| ටයිකොන්ඩෝ (කාන්තා) | 4 වන ස්ථානය |
| බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා) | හොඳම 8 දෙනා අතරට |
| මේස පන්දු (පිරිමි/කාන්තා) | හොඳම 8 දෙනා අතරට |

### ජාතික/අන්තර්ජාතික ඉසව්

| ඉසව්ව | ජයග්‍රාහක |
|---|---|
| ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා 2023 (පිහිනුම්) | කේ.පී.සී. දල්පදාදු |
| මධ්‍යම ආසියානු වොලිබෝල් ශූරතාවලිය 2023 (ශූරාතවය) | ජේ.ඒ.එම්. අයි. බණ්ඩාර |
| ආසියානු වොලිබෝල් ශූරතාවලිය 2023 | |
| ස්විට්සර්ලන්ත පළමු පෙළ ලීග් තරඟාවලිය 2023 (වඩාත්ම වටිනා ක්‍රීඩකයා) | |
| ජාතික යෞවන ක්‍රීඩා උළෙල 2023. (ශූරතාවය) | එම්.ටී.ඩබ්.ඩබ්.ඒ. පෙරේරා |
| කාන්තා ජාතික හොකී ශූරතාවලිය 2023 | ඩී.ටී.පී.එම්.පෙරේරා |
| කාන්තා ජාතික සහ ජ්‍යෙෂ්ඨ ජාතික හොකී ශූරතාවලිය 2023 | එච්.බී.ජී.අයි.ජේ. චතුරංග |
| කණිෂ්ඨ ජාතික පිරිමි හා කාන්තා හොකී ශූරතාවලිය 2023 | කේ.එච්. කන්දේගෙදර |
| | ටී.ඩී.ටී. දක්ෂිණ |
| | ඩී.අයි.සී. පිංගමගේ |
| | එම්.එච්.එම්. අස්ලාම් |
| | ඩී.එම්.ආර්. අකලංක |
| | ඩී.එම්.කේ.එම්. දිසානායක |
| | කේ.ඩී.එම්.එස්.ඩී.බී. දිසානායක |

### වර්ණ ප්‍රදාන

- එල්ලේ සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 20)
- මාර්ග ධාවන තරඟ සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 04)
- ජවන හා පිටිය සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 08)
- මේස පන්දු සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 02)
- පැසි පන්දු සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන්12)
- කැරම් සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 01)
- කරාටේ සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන්03)
- ඔරු පැදීම සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 10)
- බීච් වොලිබෝල් සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 04)
- ටයිකොන්ඩෝ සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 08)
- බර ඉසිලීම සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 02)
- බේස්බෝල් සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 17)
- චෙස් සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 01)
- චෙස් සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන් 27)
- හොකී සඳහා විශ්වවිද්‍යාල වර්ණ (ක්‍රීඩකයන්16)
- චෙස් සඳහා ශ්‍රීලවික්‍රිස වර්ණ (ක්‍රීඩකයන් 02)
- හොකී සඳහා ශ්‍රීලවික්‍රිස වර්ණ (ක්‍රීඩකයන් 02)
- පැසි පන්දු සඳහා ශ්‍රීලවික්‍රිස වර්ණ (ක්‍රීඩකයන් 02)
- කබඩි සඳහා ශ්‍රීලවික්‍රිස වර්ණ (ක්‍රීඩකයන් 01)
- පිහිනුම් සඳහා ශ්‍රීලවික්‍රිස වර්ණ (ක්‍රීඩකයන් 01)
- හොකී සඳහා ශ්‍රීලවික්‍රිස වර්ණ (ක්‍රීඩකයන් 01)

# කොටස X

# අංශ/ඒකක/මධ්‍යස්ථාන වාර්තා

# 1. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

## ➢ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය

උපාධි අපේක්ෂකයන්ට සංකීර්ණ වැඩ ලෝකයෙහි අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය කරනු ලබන ස්වයං ඇගයීම්, තොරතුරු සෙවුම් සහ තීරණ ගැනීමේ කුසලතා සහ හැකියා වර්ධනය කර ගැනීමට සහ යාවජීව ඉගෙනුම් අභිලාෂයන් වර්ධනය කර ගැනීමට වෘත්තිය මාර්ගෝපදේශන ඒකකය සහාය වේ. රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට අධ්‍යාපනයේ සිට අනාගත අවස්ථා දක්වා සංක්‍රමණය වීමට උපකාර වෙමින්, ඔවුනට නව්‍යකරන හා අන්තර්කරණ සහාය ලබා දීම පිණිස වෘත්තිය මාර්ගෝපදේශන ඒකකය රුහුණ විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කරනු ලැබුයේ 2000 වසරේ මාර්තු මාසයේදීය. අභ්‍යන්තර තොරතුරු ලබා ගැනීම සහ වැඩි වර්ධන අවස්ථා ලබා දීම පිණිස පුළුල් පරාසයක සේව්‍යයන් සහ කර්මාන්ත වෘත්තිකයන් සමග හවුල්කාරිත්ව ගොඩනගා පවත්වා ගෙන යාමට අපි සැලසුම් කරමින් සිටින්නෙමු. වෘත්තීය මාර්ගෝපදේශනයේ සාර්ථකත්වය රඳා පවතිනුයේ පුහුණුව සහ රැකියා අවස්ථා පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු ලබා දීම සහ දේශිය සහ ජාත්‍යන්තර පුහුණු වෙළඳපොළ තුළ පවතින අවස්ථා පිළිබඳව මනා දැනුමක් තිබීම මතය. අන්තර්කරණ, විස්තීරණ සහ ප්‍රවේශ්‍යතාවය සහිත වෘත්තීන් සහ රැකියා නියුක්ත කරවීමේ සහාය සඳහා හැකියාව ඇති කරමින් ඒ සඳහා අන්තර්ක්‍රියාකාරී වැඩසටහන් සහ පුහුණු සැසි පැවැත්වීමට අපි සැලැසුම් කර ඇත්තෙමු. රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යභාවයෙන් ආරම්භ කරමින්, උපාධියෙන් පසු පළමු ගමනාන්තය කරා වන මාර්ගය සැකසීමට සෑම සිසුවෙකුම විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමඟ ලියාපදිංචි විය යුතු අතර ඔහුට/ඇයට පීඨ අධ්‍යයන වෘත්තීය උපදේශකවරයාගේ උපදෙස් ඇතිව ස්වේච්ඡා පදනමින් තෝරාගත් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා සහභාගී විය හැකිය. එවැනි වැඩසටහන්වලට නිත්‍ය මෘදු කුසලතා සංවර්ධන පාඨමාලා ඇතුළත් වේ. මෙම ප්‍රයත්නයේදී, විභව්‍ය සේවායෝජක අවශ්‍යතාවන්ට ගැළපෙන ප්‍රමිති කරා ළඟා වීමට උපාධි අපේක්ෂකයන්ට සහාය වන ගුණාංග හා මෘදු කුසලතා සපුරා ගැනීමට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ඔවුනට අත්වැලක් සපයයි. මේ සඳහා, ඒකකය සාමාන්‍යයෙන් මෘදු කුසලතා අංශ ඉහළ නැංවීම අරමුණු කරගත් වෘත්තීය ජීවිතයේ විවිධ පැති පිළිබඳව වැඩසටහන් ගණනාවක් පවත්වයි, උදා: පෞරුෂ සංවර්ධනය, නායකත්වයේ ගුණාංග, සන්නිවේදන සහ ඉදිරිපත් කිරීමේ කුසලතා යනාදිය සහ ප්‍රායෝගික පුහුණුවේදී උදා. ඵලදායි ජීව දත්ත පත්‍රිකාවක් ලිවීම, සම්මුඛ පරීක්ෂණ ආදියට මුහුණ දීම, ආත්ම විශ්වාසය ගොඩනගා ගැනීමට සහ ආයතනික අංශයට ඇතුළු වීම සඳහා ප්‍රගාමී පියවර ගැනීමට සූදානම් කරවීම ඊට අන්තර්ගත වේ. අපගේ උපාධිධාරීන්ට ආයතනික අංශයේ පිළිගත් සමාගම්වල රැකියා සුරක්ෂිත කිරීමට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය අවස්ථා සලසා දෙන අතර එමඟින් උපාධිධාරීන්ට සහ කර්මාන්තයට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට වේදිකාව සකසයි. සෑම සිසුවෙකුම විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ ලියාපදිංචි විය යුතු අතර ඔහුට/ඇයට පීඨ අධ්‍යයන වෘත්තීය උපදේශකවරයාගේ උපදෙස් ඇතිව ස්වේච්ඡා පදනමින් තෝරාගත් වෘත්තීය මාර්ගෝපදේශන ඒකක වැඩසටහන් සඳහා සහභාගී විය හැකිය. එවැනි වැඩසටහන්වලට නිත්‍ය මෘදු කුසලතා සංවර්ධන පාඨමාලා, නායකත්ව පුහුණු, නිපුණතා අභිවර්ධන වැඩසටහන්, බාහිර පුහුණු, වෘත්තීය සමාජ, කර්මාන්ත සංචාර, සීමාවාසික පත්වීම්, රැකියා ස්ථාපන ආදිය ඇතුළත් වේ. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ මධ්‍යම කාර්යාලය වැල්ලමඩම පරිශ්‍රයේ පිහිටා ඇත; කෙසේ වෙතත් වැඩසටහන් පීඨ මට්ටමින් පවත්වනු ලබන අතර ඒකකයේ වෙබ් අඩවිය සහ පීඨ තොරතුරු ප්‍රචාරණ පද්ධති හරහා කලින් කලට එම තොරතුරු නිවේදනය කරනු ලැබේ.

## ➢ සපයනු ලැබූ සීමාවාසික/කර්මාන්ත පුහුණු

- 2023 නොවැම්බර් මස රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා රැකියා පොළක් සංවිධානය කරන ලදී.
- කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිසුන් සඳහා කෙටි කාලීන වෘත්තීමය ඉගෙනුම් අත්දැකීම් වැඩසටහන පැවැත්වීම.

## ➢ පැවැත්වූ වැඩසටහන්

**කෘෂිකර්මය**

'රූ' ඡායාරූප ප්‍රදර්ශනය සහ සම්මාන ප්‍රදානෝත්සවය, රෝවර් බාලදක්ෂයන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන, බටඅත දකුණ කණිෂ්ඨ විද්‍යාලයේ, වැලිපටන්විල මහා විද්‍යාලයේ සහ කහද මෝදර කණිෂ්ඨ වද්‍යාලයේ සිසුන් සඳහා නායකත්ව පුහුණු බාහිර වැඩසටහන

කණුකැටිය ක/වී. පුද්ගලික ප්‍රභාව සහ සංවිධාන සංස්කෘතිය පිළිබඳ වෙබ් මන්ත්‍රණය, ජීව දත්ත ලියන ආකාරය සහ ඵලදායී ජීව දත්ත පිළිබඳ වැඩමුළුව, "සහසක් නිමැවුම්" ප්‍රදර්ශනයේ සංවිධායක කමිටුව, ඩිජිටල් සාක්ෂරතා විශ්වවිද්‍යාල සංස්කරණය, ජයග්‍රාහී අනාගතයක් සඳහා ඔබේ ජීවිතය පරිවර්තනය කිරීම, නිල ලාංඡනය පැළැඳවීමේ උත්සවය - රෝවර් බාලදක්ෂ රුහුණ විශ්වවිද්‍යාලය, වෘත්තීය සංවර්ධන පාඨමාලාව පුද්ගල සංවර්ධන සැලැස්ම, කොටස් වෙළෙඳපොළ හඳුන්වාදීම පිළිබඳ වැඩමුළුව, වෘත්තීය සංවර්ධන පාඨමාලාව ‘‘සන්නිවේදන කුසලතා’’, ජයග්‍රාහකයෙකු වන්නේ කෙසේද යන්න පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය, වෘත්තීය සංවර්ධන පාඨමාලාව ‘‘ඉදිරිපත් කිරීමේ කුසලතා’’, දියේ ගිලීමෙන් වැළැක්වීම සඳහා ජීවිතාරක්ෂක පුහුණුව, දෙවිනුවර විෂ්ණු දේවාලය. -පෙරහැර රාජකාරිය, වෘත්තීය සංවර්ධන පාඨමාලාව ‘‘අන්තර් පුද්ගල කුසලතා’’, බෝසත් සමාජය සඳහා තරුණ පරපුරේ දායකත්වය, විමර්ශනාත්මක පුවත්පත් කලාව, කෙටි චිත්‍රපට සහ ඡායාරූප, ජීව දත්ත ලිවීමේ ශිල්පීය ක්‍රම. ජීව දත්ත ලිවීමේ රහස් - II අදියර, තීරණ ගැනීමේ කුසලතා, ජීව දත්ත සමඟ ඔබේ ජීවිතය ආරම්භ කරන්න, දැනුවත් කිරීමේ වැඩසටහන, සාර්ථකත්වය සඳහා පදනම, පුද්ගලික නායකත්වය සහ පැවරිය හැකි නිපුණතා සංවර්ධන බාහිර පුහුණුව, සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීමේ ක්‍රම, RUAGCC සඳහා නිලධාරීන් තෝරා ගැනීම සඳහා විවෘත තරඟ සම්මුඛ පරීක්ෂණය, පළමු RUAGCC හි මහා සභා රැස්වීම්, යෞවනයන් සඳහා ස්මෘතිමතිභාවය

අනාගත ව්‍යවසායකත්වය සඳහා නායකයින්, දියේ ගිලීමෙන් වැළැක්වීම සඳහා ජීවිතාරක්ෂක වැඩසටහන.

**සම සෞඛ්‍ය විද්‍යාව**

සෞඛ්‍ය සේවකයින් සඳහා නිශ්වයෝක්තිකභාවය, සමාරම්භක වැඩසටහන, නායකත්ව කඳවුර, තොරතුරු සඳහා අයිතිය පිළිබඳ වැඩමුළුව, ඡායාරූප පුහුණුව.

**ඉංජිනේරු**

පාසලෙන් විශ්වවිද්‍යාල ජීවිතයට හැඩ ගැසීම, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සහ පාඨමාලා මොඩියුලය හඳුන්වාදීම, මොඩියුලය 01 හඳුන්වාදීම -මම කවුද, වෘත්තීය සැලසුම් සංවර්ධනය, පෞරුෂය සහ වෘත්තීයභාවය, ඔබේ සාර්ථකත්වයේ සැඟවුණු සාධක, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන "නොයා යුතු මග", මානසික සෞඛ්‍ය උපදේශන වැඩසටහන, මහමෝදර කන්නන්ගර මහා විද්‍යාලයේ දැනුම බෙදාගැනීමේ වැඩසටහන, එකම විකල්පය සියදිවි නසාගැනීම ද -Riseup වැඩසටහන් මාලාව, ජපානයට ගමන් මාර්ගය-Rise up වැඩසටහන් මාලාව

**ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණය**

ඡායාරූප පාඨමාලාව, අනුස්ථාපන වැඩසටහන ‘‘වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය හඳුන්වාදීම’’, අනුස්ථාපන වැඩසටහන ‘‘අපට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය අවශ්‍ය වන්නේ ඇයි’’, අනුස්ථාපන වැඩසටහන ‘‘ඵලදායී ජීව දත්ත නිර්මාණය කරන්නේ කෙසේද’’, දින දෙකක නායකත්ව පුහුණු වැඩසටහන, ඡායාරූප පාඨමාලාව, ස්මෘතිමතිභාවය පිළිබඳ වැඩසටහන, මූලික වීඩියෝ නිෂ්පාදන පාඨමාලාව

**මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා**

දෙදින බාහිර පුහුණු වැඩසටහන, "ගවේෂණාත්මක මාධ්‍ය පුහුණුව, කෙටි චිත්‍රපට සහ ඡායාරූප-මාධ්‍යවේදී තරඟාවලිය, "ඩිජිටල් අලෙවිකරණය 2.0 – ඩිජිටල් අලෙවිකරණය සමඟ ඉදිරි මාවත" පිළිබඳ වැඩමුළුව, "ඩිජිටල් සාක්ෂරතා විශ්වවිද්‍යාල සංස්කරණය" පිළිබඳ වැඩමුළුව, "ඔරිගාමි සහ කඩදාසි කුයිලින් කලාව" පිළිබඳ ප්‍රේරක සැසිය, "අල්ලස් දූෂණ විරෝධී යාන්ත්‍රණ සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත" පිළිබඳ දැනුවත් කිරීමේ කලාවවැඩසටහන, ස්ටේන් ස්ටුඩියෝ හි V-Force අනාගත නායකයින්ගේ සංසදය, POP UP SALE, පුද්ගලික නායකත්වය සහ පැවැරිය හැකි කුසලතා සංවර්ධන බාහිර පුහුණු වැඩසටහන, රෝවර් බාලදක්ෂ කණ්ඩායම, රුහුණ විශ්වවිද්‍යාලය, ක්‍රියාකාරකම් පාදක වෘත්තීය මාර්ගෝපදේශන ඒකක සැසිය, වීඩියෝ නිෂ්පාදන මූලික පාඨමාලාව, වෘත්තීය අධ්‍යාපන මාර්ගෝපදේශ සහ පුද්ගලික ආයිත්තම් විධි ", ඡායාරූප ශිල්පයේ පාඨමාලා විෂය නිර්දේශය පිළිබඳ සහතිකය හඳුන්වාදීම, වීඩියෝ නිෂ්පාදන මූලික පාඨමාලාව, ආකල්ප පෝෂණය කිරීම, චිත්තවේගීය බුද්ධිය විස්තාරණය කිරීම, ජංගම ඡායාරූප කෝණ, කැමරාවේ ඉතිහාසය සහ ජංගම ඡායාරූපකරණය කොටස 2 / ඡායාරූප සමාලෝචනය, කැමරා ඉතිහාසය කොටස 2 / ඡායාරූප සමාලෝචනය/ සංගීත වීඩියෝ කෝණ, SLR කැමරාව සහ DSLR කැමරාව / ඡායාරූප සමාලෝචනය (ඡායාරූප විචාරය), ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය, මාතර ගන්දර මහා විද්‍යාලයේදී "මත්ද්‍රව්‍ය වැළැක්වීම සහ ආකල්ප වෙනස් කිරීමේ වැඩසටහන මතට තිත - හෙටට සවිය", ජයාරූප ශිල්පියෙකු සතු ගුණාංගයන් / ඡායාරූප සමාලෝචනය (ඡායාරූප විචාරය)

**කළමනාකරණය සහ මූල්‍ය**

නායකත්ව සංවර්ධන වැඩසටහන, සන්නිවේදන මෙවලම්, ජීව දත්ත ලිවීම පිළිබඳ භෞතික වැඩමුළුව, ඔබේ ජීවිතය පුබුදුවන්න - මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන, සවන්දීමට එරෙහිව ශරීර භාෂාව ඇසීම, ආකල්ප වෙනස් කිරීම, ක්‍රියාකාරකම් පදනම් කරගත් වැඩසටහන, ආදර්ශ සම්මුඛ සාකච්ඡා, ඉදිරිපත් කිරීමේ කුසලතා, උපාධිධාරී ව්‍යවසායකයා 2023 (උපාධිධාරී ව්‍යවසායක උදානය-2023), ඔබේ කාලය කළමනාකරණය කිරීම, වෘත්තීය අවස්ථා, ඡායාරූප ශිල්පීය පාඨමාලාව, ආදර්ශ සම්මුඛ සාකච්ඡා, ව්‍යාපාර පූර්ව උපදේශන වැඩසටහන ව්‍යවසායකත්ව චින්තනය පිළිබඳ වැඩමුළුව, ආදර්ශ සම්මුඛ සාකච්ඡා, ව්‍යාපාර සංවර්ධන අධිශිෂ්‍යත්ව වැඩසටහන

**වෛද්‍ය**

"සුහුරු වාහනයක් නඩත්තු කරන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩමුළුව", සහ "සතුට හඹා යාම"

**විද්‍යාව**

අනාගතය හැඩගැස්වීම රැකියා වැඩමුළු මාලාව, ප්‍රථමාධාර පුහුණු වැඩසටහන, පසුගාමී සිසුන් කෙරෙහි අවධානය යොමු කිරීම, සන්නිවේදන සහ ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධන වැඩසටහන, නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය (RIIE - 2023), ආදර්ශ සම්මුඛ සාකච්ඡා, උපාධිධාරී ව්‍යවසායකයා 2023 , ඡායාරූප පාඨමාලාව, ව්‍යාපාර සංවර්ධන සහයෝගිතා වැඩසටහන (මාස 06 සීමාවාසික වැඩසටහන)

**තාක්ෂණය**

නායකත්ව කළමනාකරණ වැඩසටහන, උපාධිධාරී ව්‍යවසායක 2023 (උපාධිධාරි ව්‍යවසායක උදානය-2023), Techno- ව්‍යවසායකත්ව චින්තනය පිළිබඳ ව්‍යවසායකත්ව වැඩමුළුව, තරුණ සංසදය, තාක්ෂණ කර්මාන්ත සඳහා භාෂා කුසලතා සංවර්ධනය, අනුස්ථාපන වැඩසටහන

## 2. ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය

- **අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය**

දිනෙන් දින ව්‍යාප්ත වන ඉගැන්වීම්, පර්යේෂණ සහ ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම්, විදේශ සහයෝගිතා හරහා විස්තාරණය කිරීම පිණිස වන රුහුණ විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික කවුළුව වනුයේ ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානයයි. තවද එය සියලු විදේශීය සහයෝගිතාකරුවන් සඳහා පළමු සම්බන්ධතා ස්ථානය වන අතර තොරතුරු, සහාය සහ පහසුකම් සැපයීමේ පළමු ස්ථානය ද වේ. ඊට අමතරව, රුහුණ විශ්වවිද්‍යාලය ගෝලීය විශ්වවිද්‍යාල පද්ධතිය කරා ව්‍යාප්ත කිරීම සහ නිරාවරණය කිරීම දක්වා සහ ආකර්ෂණීය පැකේජ ලබා දීම මගින් රුහුණ විශ්වවිද්‍යාලය කරා විදේශීය විද්‍යාඥයින්, පර්යේෂකයන් සහ විද්වතුන් ආකර්ෂණය කර ගැනීම දක්වා මධ්‍යස්ථානයේ කාර්යභාරය පුළුල් වේ.

නව යුගයට ගැලපෙන නව වටිනාකම් නිර්මාණය කිරීම පිණිස සහ අනාගත අභියෝග ජයගත හැකි නම්‍යශීලි, ක්‍රියාශූර සහ නිපුණතාවලින් සපිරි ආචාර්යවරුන් සහ පර්යේෂකයන් අභිවර්ධනය කිරීම ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම වේ. මෙම සියලු වගකීම් අවබෝධ කරගනිමින්, සියලුම සුළු ගැටලු නිරාකරණය කර ගනිමින් සියලු විදේශ සහයෝගිතාකරුවන් සඳහා සුමට සේවා පරිසරයකට සහාය වීම පිළින පරිශීලක හිතකාමී පරිසරයක් සැපයීම පිණිස සිය කාර්ය භාරය සුසංවිධිත කරමින් ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මධ්‍යස්ථානය සිය කටයුතු වේගවත් කර තිබේ.

- **විවිධ ව්‍යාපෘති යටතේ ශිෂ්‍ය හුවමාරු**

  - **ට්‍රොපිමුන්ඩෝ මාස්ටර්ස් වැඩසටහන යටතේ ශිෂ්‍ය හුවමාරුව**

නිවර්තන ජෛව විවිධත්වය පාඨමාලාවේ ප්‍රායෝගික සංරචකයක් සඳහා හුවමාරු ශිෂ්‍යයන් 06 දෙනෙකු බඳවාගත් අතර අප විශ්වවිද්‍යාලයේ දී ඔවුන්ගේ අධ්‍යයන සම්පූර්ණ කරන ලදී.

  - **නෝර් ලංකා නීල ව්‍යාපෘතිය**

නෝර්වීජියානු සිසුන් තිදෙනෙකු ශ්‍රී ලංකාව වෙත හුවමාරු කිරීමේ වැඩසටහනක් මත විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන විදේශීය සිසුන් සඳහා වන URUH581 පාඨමාලාව සම්පූර්ණ කරන ලදී.

2023 ශාස්ත්‍රපති සංචලතා සිසුන් (අගෝස්තු-දෙසැම්බර් 2023)

ශාස්ත්‍රපති සිසුන් 03 දෙනෙකු සහ ආචාර්ය උපාධිධාරී ශිෂ්‍යයන් දෙදෙනෙකු ට්‍රොම්සෝ හි නෝර්වේ UiT ආක්ටික් විශ්වවිද්‍යාලයේ හි හුවමාරු සමාසිකයක සිටියහ.

  - **නෝර්වේහි ඇග්ඩර් විශ්වවිද්‍යාලය සමඟ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන**

නෝර්වේ ඇග්ඩර් විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රවේදී උපාධිය හදාරන එක් හුවමාරු ශිෂ්‍යයෙක් 2023 ජනවාරි සිට මා.ශා. සහ ස.වි. පීඨයේ මාස තුනක ක්ෂේත්‍ර වැඩ සහ අධ්‍යයන වැඩසටහනක යෙදී සිටී. නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ සහයෝගී අධ්‍යයන වැඩසටහන යටතේ සිසුන් එකොළොස් දෙනෙකි.

  - **රුහුණ විශ්වවිද්‍යාලය සහ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලය අතර සහයෝගී පර්යේෂණ අධ්‍යයන වැඩසටහන**

ලන්දේසි උපාධි අපේක්ෂකයින් 15 දෙනෙක් 2023 මාර්තු 01 සිට මාස තුනක් රුහුණ විශ්වවිද්‍යාලයේ සහයෝගී පර්යේෂණ අධ්‍යයනයකට සහභාගී වූහ.

  - **ඩියුක් රුහුණ පර්යේෂණ සහයෝගිතාව**

ඕියුක් විශ්වවිද්‍යාලයේ එක් ශාස්ත්‍රපති ශිෂ්‍යයෙක් 2023 මැයි සිට මාස දෙකක පර්යේෂණ අධ්‍යයනයක නිරත විය.

- **රුහුණ විශ්වවිද්‍යාලයට සැපැමිණි විදේශ නියෝජිතයන්**
  - ප්‍රංශ තානාපති ජීන් ෆ්‍රංසුවා පැක්ටෙට් ගේ සංචාරය (01-02-2023) සහ (24-02-2023)
  - රුමේනියාවේ බ්‍රසොව් හි ට්‍රාන්සිල්වේනියානු විශ්ව විද්‍යාලයේ නියෝජිත පිරිසේ සංචාරය (17-03-2023)
  - චීනයේ චීන විද්‍යා ඇකඩමියේ (CAS) නියෝජිත පිරිසේ සංචාරය (27-04-2023)
  - ජපාන තානාපති අතිගරු මිසුකොෂි හිදෙයාකි මහතාගේ සංචාරය (17-05-2023)
  - චීනයේ චීන විද්‍යා ඇකඩමියේ (CAS) නියෝජිත පිරිසේ සංචාරය (25-05-2023)
  - කොචින් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් නියෝජිත පිරිසේ සංචාරය, (ජුනි 14-16)
  - හම්බන්තොට ඉන්දියාවේ කොන්සල් ජනරාල්වරයාගේ සංචාරය (07-08-2023)
  - හොකයිඩෝ බුන්කයෝ විශ්වවිද්‍යාලයේ නියෝජිත පිරිසගේ පැමිණීම (27-09-2023)
  - තායිලන්තයේ චුලබෝර්න් උපාධි ආයතනයේ නියෝජිත පිරිසේ සංචාරය (22-11-2023)
  - ඇමරිකා එක්සත් ජනපදයේ තානාපති කාර්යාලයේ නියෝජිත පිරිසේ සංචාරය (30-11-2023)

- **ව්‍යාපෘති:**
  - FOUNTAIN ව්‍යාපෘතිය
  - WashU ව්‍යාපෘතිය
  - UAlg සන්ධාන ව්‍යාපෘතිය
  - CAPAGE ව්‍යාපෘතිය
  - MARIE ව්‍යාපෘතිය

- **අත්සන් තබා ඇති අවබෝධතා ගිවිසුම්**
  - රුහුණ විශ්වවිද්‍යාලය සහ බෙල්ජියමේ බ්‍රසල්ස් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - රුහුණ විශ්වවිද්‍යාලයේ පරිසර හා ජීව විද්‍යා උපාධි පාසල, ඔකායාමා විශ්වවිද්‍යාලය සහ කෘෂිකර්ම පීඨය අතර අවබෝධතා ගිවිසුම
  - චීනයේ ෂැංඩොං විද්‍යා ඇකඩමිය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - ඕස්ට්‍රේලියාවේ කර්ටින් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ රියිකියුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි පාසල අතර අවබෝධතා ගිවිසුම
  - චීනයේ නිරිතදිග මින්සු විශ්ව විද්‍යාලය සහ රුහුණ විශ්ව විද්‍යාලය අතර ගිවිසුම (අලුත් කිරීමට බලාපොරොත්තු වේ)
  - SCSIO, චීන විද්‍යා ඇකඩමිය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම - අධ්‍යාපන හා පර්යේෂණ සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානය (CSL-CER) පිහිටුවීම
  - රුහුණ විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනය අතර ගිවිසුම
  - ඉන්දියාවේ වෙල්ලෝර් තාක්ෂණ ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - ජපානයේ ඔකායාමා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - ජපානයේ හොකයිඩෝ බුන්ක්යෝ විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර ශාස්ත්‍රීය හුවමාරුව සඳහා අවබෝධතා ගිවිසුම
  - විද්‍යා හා තාක්ෂණ පීඨය, නෝර්වේ ස්ටැවන්ජර් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය අතර අවබෝධතා ගිවිසුම
  - රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය (RMIT) ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - ගැලිලී ජාත්‍යන්තර කළමනාකරණ ආයතනය (GIMI), ඊශ්‍රායලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

- කළමනාකරණ පීඨය සහ ස්ලෝවැකියාවේ ප්‍රෙසොව් හි ව්‍යාපාරික විශ්වවිද්‍යාලය සහ රුහුණ කළමනාකරණ හා මූල්‍ය පීඨය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලයේ ජපාන සත්කාරක ඉගෙනුම් මධ්‍යස්ථාන සංගමය, ජපානය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨය අතර අවබෝධතා ගිවිසුම
- ඇමරිකා එක්සත් ජනපදයේ ඔහියෝ හි යංග්ස්ටවුන් රාජ්‍ය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ඉන්දුනීසියාවේ මුහමාදියන් සෙමරංග් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ කනසාවා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- කෘෂිකර්ම පීඨය, කෘෂිකර්ම උපාධි පාසල, ජපානයේ කගාවා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය අතර අවබෝධතා ගිවිසුම සහ ශාස්ත්‍රීය හුවමාරු ගිවිසුම

➢ අත්සන් තැබූ නව අවබෝධතා ගිවිසුම්

- කෘෂිකර්ම පීඨය, කෘෂිකර්ම උපාධි පාසල, ජපානයේ කගාවා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය අතර අවබෝධතා ගිවිසුම සහ ශාස්ත්‍රීය හුවමාරු ගිවිසුම (2023.02.24)
- රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සහ තායිලන්තයේ තමාසට් විශ්වවිද්‍යාලයේ සිරින්දෝර්න් ජාත්‍යන්තර තාක්ෂණික ආයතනය සමග අවබෝධතා ගිවිසුම සහ ශාස්ත්‍රීය හුවමාරු ගිවිසුම (2023.03.10)
- රුමේනියාවේ බ්‍රසොව් හි ට්‍රාන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්ව ගිවිසුම (17-03-2023)
- දකුණු චීන මුහුදේ සාගර විද්‍යා ආයතනය, චීන විද්‍යා ඇකඩමිය, චීනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම (25-04-2023)
- නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය අතර අවබෝධතා ගිවිසුම (අලුත් කිරීම)
- වොෂින්ටන් විශ්වවිද්‍යාලය, ශාන්ත ලුයිස්, ඇමරිකා එක්සත් ජනපදය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පරපෝෂිත විද්‍යා දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුම (08-05-2023)
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ සයිටාමා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම (28-06-2024)
- කොචින් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම (15-06-2023)
- ආසියානු තාක්ෂණ ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම (05-07-2023)
- ජාත්‍යන්තර විධායක සේවා බලකාය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර සහයෝගීතා පර්යේෂණ ගිවිසුම (17-07-2023)
- සයිබීරියානු රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

## 3. දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

- **වැඩසටහන් සමාලෝචනය (ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (QAC) විසින් රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රවේදී (බාහිර) සාමාන්‍ය උපාධි වැඩසටහන පිළිබඳ සමාලෝචනයක් 2023 මැයි 29 සහ 30 යන දිනවල පවත්වන ලදී. මහාචාර්ය එච් එම් ඒ හේරත්ගේ සභාපතිත්වයෙන් යුත් බාහිර සමාලෝචන කණ්ඩායම බාහිර සමාලෝචකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය.




කණ්ඩායම විසින් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් ඉදිරිපත් කරන ලද ස්වයං ඇගයීම් වාර්තාවේ ලේඛන ඇගැයීම, පාර්ශවකරුවන්ගේ රැස්වීම්, අඩවි චාරිකා යනාදිය ඇතුළුව දැඩි ඇගයීම් ක්‍රියාවලියක් සිදු කරන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් උසස් තත්ත්වයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධියක් පිරිනමන බව තීරණය කරන ලදී. ඒ අනුව එම උපාධියට සමස්ත ලකුණු 90ක් සමඟින් "A" ශ්‍රේණියක් පිරිනමා ඇත.




- **ඩිප්ලෝමා සහ සහතික පත්‍ර වැඩසටහන් සඳහා නවක ශිෂ්‍යයන් බඳවා ගැනීම්**

ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා සඳහා නවක බඳවා ගැනීම් කිහිපයක් 2023 වසර තුළ සිදු කරන ලදී. ශිෂ්‍යයන් 75 දෙනෙකු අයත් වූ මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාවේ තෙවන කාණ්ඩය සඳහා මාර්ගගත සමාරම්භක උත්සවය 2023 ජූලි 17 වන දින පෙ.ව. 8.00 ට පවත්වන්නට යෙදුණි.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය හා එක්ව ව්‍යාප්ති පාඨමාලා හතරක් පවත්වන ලදී. එහි දෙවන ශිෂ්‍ය කාණ්ඩයේ සමාරම්භක උත්සවය 2023.05.21 දින පෙ.ව. 9.30ට කලා පීඨ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එම ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා, උසස් සහතිකපත්‍ර සහ සහතික පත්‍ර වැඩසටහන් සඳහා නවක සිසුන් 353 දෙනෙකු ලියාපදිංචි වී ඇත.





➢ **ඩිප්ලෝමා පාඨමාලා**

| පාඨමාලාවේ නම | පාඨමාලා කාලසීමාව |
|---|---|
| මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව | අවුරුදු 1යි |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | අවුරුදු 1යි |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | අවුරුදු 1යි |
| ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව | අවුරුදු 1යි |
| ඉංග්‍රීසි උසස් සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1යි |
| ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1යි |
| ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | අවුරුදු 1යි |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාව | අවුරුදු 1යි |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබද සහතික පත්‍ර පාඨමාලාව | මාස 6 යි |
| කෘෂි ව්‍යවසායකත්වය සහ තිරසාර ගෙවතු වගාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1යි |

➢ **විභාග**

| විභාගයේ නම | විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය 1 වැනි වසර 2 වැනි සමාසිකය | 844 | ශ්‍රේණිගත කිරීම් නිකුත් කරන ලදී |
| ශාස්ත්‍රවේදී උපාධිය කොටස I පුනරීක්ෂණ විභාගය | 1140 | ශ්‍රේණිගත කිරීම් නිකුත් කරන ලදී |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව (2වැනි කාණ්ඩය අවසාන විභාගය) | 74 | 45 |

| | | |
|---|---|---|
| මනෝවිද්‍යාත්මක උපදේශන ඩිප්ලෝමාව 1වැනි සමාසිකය අවසාන විභාගය | 102 | ශ්‍රේණිගත කිරීම් නිකුත් කරන ලදී |
| ඉංග්‍රීසි ව්‍යාප්ති පාඨමාලා 2023 ජනවාරි 07 වැනි දින අවසාන විභාගය (ලිඛිත) – 1 වැනි කාණ්ඩය | 180 | 136 |
| ඉංග්‍රීසි ව්‍යාප්ති පාඨමාලා 2023 ජූලි 23 අවසාන පුනරීක්ෂණ විභාගය (ලිඛිත) – 1 වැනි කාණ්ඩය | 55 | 34 |
| ඉංග්‍රීසි ව්‍යාප්ති පාඨමාලා 2023 නොවැම්බර් 19 අවසාන විභාගය – 2 වැනි කාණ්ඩය | 69 | 54 |

**ඩිප්ලෝමා සහ සහතික ප්‍රදාන උත්සවය**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ පළමු ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයේදී සිසුන් 219 දෙනෙකුට ඩිප්ලෝමා ප්‍රදානය කළ අතර තවත් සිසුන් 126 දෙනෙකුට සහතිකපත් හිමි විය. මෙම උත්සවය 2023 ජනවාරි 28 වන දින රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශාලාවේදී ප්‍රධාන ආරාධිතයා ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාගේ සම්භාවනීය සහභාගිත්වයෙන් පැවැත්වුණි.





දෙවන උත්සවයේදී සිසුන් 45 දෙනෙකුට උසස් ඩිප්ලෝමා ප්‍රදානය කරන ලද අතර සිසුන් 218 දෙනෙකුට ඩිප්ලෝමා හිමි විය. උත්සවය පැවැත්වුණේ 2023 ජූලි 9 වන දින රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශාලාවේදීය. රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වීමට නැවතත් පැමිණ සිටියේය.

| වැඩසටහනේ නම | සම්මාන සංඛ්‍යාව |
|---|---|
| 1. මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | 43 |
| 2. මනෝවිද්‍යාත්මක උපදේශන ඩිප්ලෝමාව | 78 |
| 3. ඉංග්‍රීසි සහතිකපත්‍ර ඩිප්ලෝමාව | 402 |

- **ශිෂ්‍ය ආධාරක සේවා**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය විසින් පිරිනමනු ලබන සියලු වැඩසටහන්වලට බඳවා ගනු ලබන ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල පුස්තකාලය වෙත ප්‍රවේශය ඇත. බාහිර ශිෂ්‍යයන්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස 2023 වසරේදී දුක් ගැනවිලි කමිටුවේ රැස්වීම් වාර පහක් පවත්වන ලදී.

ඊට අමතරව, තම ශිෂ්‍යයන්ට ප්‍රායෝගික නිරාවරණය සැපයීම පිණිස දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය සහ එහි අදාළ අධ්‍යයනාංශ විසින් වැඩමුළු සහ ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදී. උදාහරණයක් ලෙස, මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව හදාරන ශිෂ්‍යයන් පෞරුෂත්ව වර්ධන වැඩමුළුවකට සහභාගි වන ලදී. මනෝවිද්‍යාත්මක උපදේශන ඩිප්ලෝමා වැඩසටහනට ඇතුළු වූ ශිෂ්‍යයන් අංගොඩ ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, නයනාලෝකගම සහ වීරවිල සිර කඳවුර වෙත ක්ෂේත්‍ර සංචාර කිහිපයක නිරත විය. එපමණක් ද නොව, අන්තර්කරණ සේවා උසස් සහතික පත්‍ර පාඨමාලාව හදාරණ සිසුන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී සහ අම්බලන්තොට මැලේ කොළණියේ දී පුහුණුව ලැබීය.

| වැඩසටහන | දේශන වේලාව | ප්‍රතිපෝෂණ සම්මන්ත්‍රණය |
|---|---|---|
| **ශාස්ත්‍රවේදී වැඩසටහන (බාහිර) නව විෂයමාලාව** | එක් එක් විෂය සඳහා පැය 45 | නැත |
| **මානව සම්පත් කළමනාකරණය ඩිප්ලෝමාව පෞරුෂත්ව සංවර්ධනය** | පැය 3 | පැය 1. |
| **මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව ක්ෂේත්‍ර චාරිකා** | නයනාලෝකගම (2023 මාර්තු 04, 05 සහ 06) | |
|  | වීරවිල සිර කඳවුර (2023 නොවැම්බර් 12) – දේශන පැය – 083<br>අංගොඩ - 2023 දෙසැම්බර් 17) ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැය ගණන - 08 | |





## 4. තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය

➢ ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්ති

- විශ්වවිද්‍යාල මාර්ගගත ඇගයීම් ප්‍රතිපත්තිය
- විෂයමාලා සංවර්ධනය සහ සංශෝධනය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිය
- උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා කාර්ය සාධන ඇගයීම් නිර්ණායක
- විභාග අත්පොත සංශෝධනය කිරීම

### තත්ත්ව සහතික වැඩිදියුණු කිරීම්

- සමපදස්ථ ඇගයීම සඳහා සමපදස්ථ සමාලෝචකයින් පත් කිරීමේ මාර්ගෝපදේශ
- විෂයමාලා සංවර්ධනය සහ සංශෝධනය පිළිබඳ පිරික්සුම් ලැයිස්තුව
- තත්ත්ව ආරක්ෂණ ඒකකයේ සම්මත මෙහෙයුම් පරිපාටි
- රුහුණ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන විදේශීය සිසුන්ගේ අර්ස මාරු කිරීමේ මාර්ගෝපදේශ
- සහතික පත්‍ර/උසස් සහතික පත්‍ර පාඨමාලා සඳහා අවම ප්‍රමිතීන් සැකසීම
- අධ්‍යයන වගවීම සහ වැඩ බර ආකෘතිය සංවර්ධනය කිරීම
- උපාධිය ලබා වසර තුනකට පසු උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය පිළිබඳ ඇගයීමක් සිදුකිරීම.

➢ තත්ත්ව ආරක්ෂණ ඒකකය රුහුණ විශ්වවිද්‍යාලයේදී පැවැත්වූ වැඩමුළු

| පීඨය | උපාධි වැඩසටහනේ නම | වත්මන් රැකියා නියුක්ති තත්ත්වය % | |
|---|---|---|---|
| | | රැකියා නියුක්ත | රැකියා විරහිත |
| කෘෂිකර්ම පීඨය | කෘෂිව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | 50.0 | 28.6 |
| | කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය | 69.4 | 19.4 |
| | හරිත තාක්ෂණ විද්‍යාවේදී විභාගය | 55.0 | 46.0 |
| ඉංජිනේරු පීඨය | ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | 80.50 | 15.9 |
| ධීවර හා සමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය | 64 | 28 |
| | සමුද්‍රීය හා මිරිදිය විද්‍යා විද්‍යාවේදී උපාධිය | 69.6 | 17.4 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 12.6 | 79.7 |
| | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 18.1 | 66.7 |
| වෛද්‍ය පීඨය | වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යා උපාධිය | 87.4 | 5.7 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය රසායානගාර විද්‍යා විද්‍යාවේදී උපාධිය | 87.5 | 6.3 |
| | ඖෂධවේද උපාධිය | 100.0 | 00.00 |
| | හෙද විද්‍යාවේදී උපාධිය | 82.4 | 8.8 |

| පීඨය | උපාධි වැඩසටහනේ නම | වත්මන් රැකියා නියුක්ති තත්ත්වය % | |
|---|---|---|---|
| | | රැකියා නියුක්ත | රැකියා විරහිත |
| විද්‍යා පීඨය | විද්‍යාවේදී (විශේෂ) | 68.1 | 17.4 |
| | පරිගණක විද්‍යා උපාධිය (විශේෂ) | 90.0 | 10.00 |

| | | | |
|---|---|---|---|
| **තාක්ෂණ පීඨය** | ඉංජිනේරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය | 54.7 | 37.7 |
| | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විද්‍යාවේදී උපාධිය | 70.0 | 23.3 |

- **අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය සහ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක පිහිටුවීම හා ඒවායේ කළමනාකරණ කමිටු රැස්වීම්**

තත්ත්ව ආරක්ෂණය පිළිබඳ පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව, පවත්වන ලද රැස්වීම් ගණන: 10

ත.ආ.මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ සහ අ.ත.පා.ඒකක සභාපතිවරුන්ගේ රැස්වීම්: පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව 08

**පරිපාලන සහ මූල්‍ය අංශය සඳහා අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය ස්ථාපිත කරන ලදී.**

- **විශ්වවිද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්**

රුහුණ විශ්වවිද්‍යාලයීය 3 වන තත්ත්ව ආරක්ෂණ සැසි 2023 සැප්තැම්බර් 21 දින පවත්වන ලදී.

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ, විද්‍යා පීඨයේ සහ ශාස්ත්‍රවේදී බාහිර වැඩසටහනේ වැඩසටහන් සමාලෝචන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

අභ්‍යන්තර සමාලෝචන සහ වැඩසටහන් සමාලෝචන ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම**.**

- **අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය රුහුණ විශ්වවිද්‍යාලයේ පැවැත්වූ වැඩමුළු**

විෂයමාලා සංශෝධනය සහ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව

| **පීඨය** | **වැඩමුළුවේ නම** | **ඉලක්ක කණ්ඩායම** |
|---|---|---|
| **ධීවර හා සමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨය** | රසායනාගාරවල ආරක්ෂිත වැඩ පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීම | සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් (අධ්‍යයන සහ අනධ්‍යයන) |
| | විභාග පැවැත්වීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත් කිරීම | විභාග ශාලා කාර්ය මණ්ඩල සාමාජිකයින් (අධීක්ෂකවරුන් සහ ශාලා කාර්ය මණ්ඩලය) |
| | සාර්ථක සාහිත්‍ය සමාලෝචනයේ විද්‍යුත් දත්ත පදනම් වලින් සම්පත් සොයා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම | අවසන් වසරේ ශිෂ්‍යයන් |
| | දෛනික පාඩම් සැලැස්ම සකස් කිරීම පිළිබඳව නව අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සමාලෝචනය කිරීම සහ දැනුවත් කිරීම | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| **තාක්ෂණ පීඨය** | විෂයමාලා නිර්මාණය/සංශෝධනය, මැනිය හැකි අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| **මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය** | වැඩසටහන් සමාලෝචනය පිළිබඳ වැඩමුළුව | අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය |

## 5. නූතන භාෂා සහ ශිෂ්ටාචාර මධ්‍යස්ථානය (CMLC)

- **සේවා**

1. රුසියානු භාෂා සහතික පත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් අනුමත කරන ලදී. රුසියානු භාෂාව සමඟ භාෂා පාඨමාලා ගණන අටක් දක්වා වැඩි විය.

2. ජර්මානු භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් අනුමත කරන ලද අතර අයදුම්පත් කැඳවීමට සූදානම්. එය විශ්වවිද්‍යාලයේ දු.අ.අ.ඒකකය යටතේ පවත්වනු ලැබේ.

3. විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා භාෂා පාඨමාලා හතක් පවත්වනු ලැබේ. එම භාෂා පාඨමාලා හතේ විස්තර පහත දැක්වේ.

- **නූතන භාෂා සහ ශිෂ්ටාචාර මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන භාෂා පාඨමාලා**
දෙවන ශිෂ්‍ය කාණ්ඩයේ තොරතුරු

| භාෂා පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ජපන් භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 769 |
| ජර්මන් භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 175 |
| චීන භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 44 |
| දෙමළ භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 261 |
| කොරියානු භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 187 |
| ප්‍රංශ භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 114 |
| හිංදි භාෂා ප්‍රවීණතා උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 19 |

- **කාර්ය මණ්ඩල සාමාජිකයන්**

  - සම්බන්ධීකාරක
    ආචාර්ය ඒ.ඒ.රවිඳු ප්‍රියංක
    පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය

  - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛාධිකාරී
    තනූජා පතිරණ මිය
    මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

- **භාෂා සම්බන්ධීකාරකවරු**

| | | |
|---|---|---|
| • | හින්දි | සොනාලි දසනායක මිය<br>ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය |
| • | චීන | අනුධා කාංචනා මිය<br>පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය |
| • | ජපන් | පී.ඩබ්.එස්. ප්‍රනාන්දු මිය<br>භූගෝල විද්‍යා අධ්‍යයනාංශය |
| • | දෙමළ | එන්.ඒ. ධම්මික ජයසිංහ මයා<br>සිංහල අධ්‍යයනාංශය |
| | | ඊ.වී. ධනුෂ්කා දිල්හානි<br>ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය |
| • | කොරියානු | ජයනි සමීරා මිය<br>සිංහල අධ්‍යයනාංශය |
| • | ප්‍රංශ | චක්‍රාංගි දහනායක මිය<br>ඉංග්‍රීසි භාෂාව සහ ඉගැන්වීම් අධ්‍යයනාංශය |
| • | ජර්මන් | ආචාර්ය දිල්ශාන් රාජපක්ෂ මයා<br>පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය |
| • | රුසියානු | එල්.ජී.ඩී. සෙව්වන්දි යාපා<br>භූගෝල විද්‍යා අධ්‍යයනාංශය |

# 6. සංස්කෘතික මධ්‍යස්ථානය

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානය ස්ථාපිත කරනු ලැබුයේ රුහුණ විශ්වවිද්‍යාල ප්‍රජාවේ කලා රසාස්වාදනය සහ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙනි. එසේම, රුහුණු ප්‍රදේශයට අනන්‍ය වූ සහ ජාතික වැදගත්කමක් ඇති සංස්කෘතිකාංග පිළිබඳ පර්යේෂණ කිරීම, සංරක්ෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ද අරමුණකි.

මෙම අරමුණු සපුරා ගනු වස් සංස්කෘතික මධ්‍යස්ථාන මූලික අංශ දෙකකට වෙන් කොට තිබේ. ඒ අනුව, සෞන්දර්ය ඒකකය සහ පර්යේෂණ ඒකකය ලෙස සංස්කෘතික මධ්‍යස්ථානය ඒකක දෙකක් ස්ථාපිත කර තිබේ.

සෞන්දර්ය ඒකකය ප්‍රධානකොටම ශාස්ත්‍රීය හා සාහිත්‍යමය අදාළත්වයක් සහිත චිත්‍රපට වීඩියෝ පට ප්‍රදර්ශනය කිරීම, නූතන, සම්ප්‍රදායික සහ පැරණි වේදිකා නාට්‍ය වේදිකා ගත කිරීම, ජනකලාවන්ට අදාළ ඉදිරිපත් කිරීම්, සංගීත පුහුණු පාඨමාලා සහ ප්‍රසංග පැවැත්වීම, නර්තන පුහුණු පාඨමාලා සහ ප්‍රසංග ආදිය කෙරෙහි අවධානය යොමු කරයි.

පර්යේෂණ ඒකකයේ වගකීම් වනුයේ පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම, ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක භූමි ගවේෂණය සහ ජනවාර්ගික, සංස්කෘතික හා ජනශ්‍රැති සංරක්ෂණය මූලාරම්භයන් සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීම වේ.

මේ අනුව, මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්කෘතික මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂය තුළ විවිධ සිදුවීම් සහ වැඩසටහන් මෙන්ම පර්යේෂණ අධ්‍යයන ද සිදු කර ඇත. අනෙකුත් කරුණු අතර, රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථාන මඟින් පවත්වනු ලැබූ වැඩසටහන් මුල පිරීම්වල ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන කිරීමක් මෙම වාර්තාවට ඇතුළත් වේ.

## 2023 ජනවාරි

- **ක්‍රියාකාරකම 01- තෛයිපොංගල් සැමරුම් වැඩසටහන -2023 ජනවාරි 21**

විශ්වවිද්‍යාල ප්‍රජාව සමග සහයෝගිතාවයෙන් යුතුව සංස්කෘතික මධ්‍යස්ථානය 2023 ජනවාරි 21 තෛයිපොංගල් සැමරුම් වැඩසටහන පවත්වන ලදී. එය ඉතා සාර්ථකව නිමාව දුටු අතර එහිදී තෛයිපොංගල් උත්සවයේ සංස්කෘතික වැදගත්කම අවධාරණය කරන ලද අතර සංස්කෘතික වෙනස්කම් නොතකා සැලකිය යුතු ශිෂ්‍යයන්, ආචාර්යවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් රැසක් මෙම අවස්ථාවට සහභාගි විය.

## 2023 අප්‍රේල්

- **ක්‍රියාකාරකම 02- 2018 අප්‍රේල් 18 වැනි දින නව පාඨමාලා ආරම්භ කිරීම**

රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ විවිධ පීඨවලින් සිසුන් 450ක් ලියාපදිංචි කර ගනිමින් නර්තනය, සංගීතය, කෙටි චිත්‍රපට, නාට්‍ය, ඡායාරූපකරණය සහ චිත්‍ර පාඨමාලා ආරම්භ විය.

## 2023 ජුනි

- **ක්‍රියාකාරකම 03- "පොසොන් බැති ගී සරණි" වැඩසටහන**

2023 වසරේ පොසොන් පොහොය දින "පොසොන් බැති ගී සරණි" වැඩසටහන සංස්කෘතික මධ්‍යස්ථානයේ සංගීත හා නැටුම් හදාරන සිසුන් විසින් සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගේ සහ රුහුණ විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩලයේ මගපෙන්වීම යටතේ පවත්වන ලදී.

**2023 ජූලි**

- **ක්‍රියාකාරකම - 04 "නව උදානයක්" අදියර 02 (මැයි - ජූලි)**

සංස්කෘතික මධ්‍යස්ථානය විසින් 2023 මැයි මාසයේදී "නව උදාවක්" වැඩසටහනේ දෙවන අදියර පවත්වන ලදී. "නව උදාවක්" දෙවන අදියර රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය සහ සමාජ සංහිදියා මධ්‍යස්ථානය හා එක්ව සංවිධානය කර දියත් කරන ලදී. කැනේඩියානු තානාපති කාර්යාලය සහ ජාතික භාෂා වැඩිදියුණු කිරීමේ සහ දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NLEAP) මූල්‍යමය වශයෙන් දායක විය.

**ක්‍රියාකාරකම - 05**

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානයේ නර්තනය හදාරන සිසුවියන් පස් දෙනෙක් ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ තරුණ හුවමාරු වැඩසටහනකට සහභාගී වූහ. මෙම සිසුන් සම්බන්ධ කර ගන්නා ලෙස මාතර ජාතික තරුණ සේවා සභාව ඉල්ලා සිටියේය.

**2023 අගෝස්තු**

- **ක්‍රියාකාරකම 06 - රබීන්ද්‍රනාත් තාගෝර් ප්‍රතිමාව විවෘත කිරීම සහ "සර්වෝද්" ප්‍රසංගය - 2023.08.07**

මෙම උත්සවය ශ්‍රී ලංකාවේ හම්බන්තොට ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කර ඇත

- **ක්‍රියාකාරකම 07 - “සරසවි උයන” වැඩසටහන**

2023.08.07 දින පැවැති මෙම වැඩසටහනට සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සත්කාරකත්වය දරන ලද අතර මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශිෂ්‍ය සංගමය විසින් සම සත්කාරකත්වය දරන ලදී.

**2023 සැප්තැම්බර්**

- **ක්‍රියාකාරකම 08 - මලයගම් ප්‍රදර්ශනය සහ සංවාද මණ්ඩපය - "මලයාගම්" දෙමළ ප්‍රජාවේ වසර 200ක උරුමය සැමරීම සඳහා "මලයාගම් 200" ඉසව්ව- 2023.09.23**

රුහුණ විශ්වවිද්‍යාලය සහ සමාජ ප්‍රතිසන්ධාන හා සංස්කෘතික මධ්‍යස්ථානය සහයෝගීව ශ්‍රී ලංකා මහනුවර සමාජ සංවර්ධන ආයතනය සමඟ එක්ව 2023 දී මලයගම් දෙමළ ප්‍රජාවගේ වසර 200ක උරුමය සැමරීම සඳහා “මලයාගම් 200” උත්සවය සංවිධානය කර පවත්වන ලදී. මෙම වැඩසටහන දින දෙකක් පුරා පැවැත්වුණි. එය ප්‍රදර්ශනයකින් සහ සංවාද මණ්ඩපයකින් සමන්විත විය. මෙම වැඩසටහන 2023 සැප්තැම්බර් 22 සහ 23, 20 දෙදින තුළ රුහුණ විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි.

- **ක්‍රියාකාරකම 09 - විවාද තරඟාවලිය 2023.09.26**

"නීති සතිය" සැමරුම වෙනුවෙන් රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය මෙම ක්‍රියාකාරකම සංවිධානය කළේය. මාතර දිස්ත්‍රික් නීතිඥ සංගමයේ එකමුතුවෙන් මෙම උත්සවය සංවිධානය කර පවත්වන ලදී.

**2023 ඔක්තෝබර්**

- **ක්‍රියාකාරකම 10 - "ප්‍රතිභා" (ප්‍රතිභා) අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන තරඟයට සහභාගී වීම - දිස්ත්‍රික් මට්ටම - 2023.10.01**

රුහුණ විශ්වවිද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "ප්‍රතිභා" දිස්ත්‍රික් මට්ටමේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන තරගයේ දෙවන ස්ථානය දිනා ගැනීම. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ, කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සහ විද්‍යා පීඨයේ සිසුන් තරගයට ඉදිරිපත් වූහ.

- **ක්‍රියාකාරකම් 11 - යෝජනා ලිවීමේ නව පාඨමාලා ආරම්භ කිරීම, මාධ්‍ය පුහුණුව - 2023.10.14**
- **ක්‍රියාකාරකම් 12 – "ප්‍රතිභා" අන්තර් සංස්කෘතික නර්තන තරගයට සහභාගී වී තරඟ කිරීම – පළාත් මට්ටම - 2023.10.28**

රුහුණ විශ්වවිද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය මගින් "ප්‍රතිභා" පළාත් මට්ටමේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීම. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිසු සිසුවියෝ තරගයට ඉදිරිපත් වූහ.

**2023 නොවැම්බර්**

- ක්‍රියාකාරකම් 13 – "කුවේණි" වේදිකා නාට්‍ය වේදිකා ගත කිරීම 11.15.2023

කුවේණි යනු ශ්‍රී ලාංකේය ඓතිහාසික චරිතයක් පාදක කරගත් ස්වායත්ත වේදිකා නාට්‍යයකි. මෙය අධ්‍යක්ෂණය සහ තිර රචනය හෙන්රි ජයසේන අතින් සිදුවිය. රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රජාවගේ රසවින්දනය සහ නිර්මාණශීලිත්වය ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතික මධ්‍යස්ථානය විසින් මෙම වේදිකා නාට්‍යය ප්‍රදර්ශනය කරන ලදී.

- **ක්‍රියාකාරකම් 14 - අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි වේදිකා නාට්‍ය තරඟයේ සහභාගීත්වය සහ තරඟ කිරීම - 2023**

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානයේ ශිෂ්‍යයන් අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන-2023 කෙටි වේදිකා නාට්‍ය තරගයට සහභාගී වී තරඟ වැදුණි. රුහුණ විශ්ව විද්‍යාල සංස්කෘතික මධ්‍යස්ථානය මගින් අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි වේදිකා නාට්‍ය තරඟය - 2023 ප්‍රථම ස්ථානය දිනා ගැනීම.

- **ක්‍රියාකාරකම් 15 - ජාතික මට්ටමේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි වේදිකා ක්‍රීඩා තරඟයට සහභාගී වීම සහ තරඟ වැදීම - 2023.11.27**

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානයේ ශිෂ්‍යයන් 2023ජාතික මට්ටමේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි වේදිකා නාට්‍ය තරඟයට සහභාගී වී තරඟ කළේය. තවමත් තරඟයේ ප්‍රතිඵලය නිකුත් කර නොමැත.

**2023 දෙසැම්බර්**

- **ක්‍රියාකාරකම් 16 – "සහෝදරත්වයේ පියාපත්" දෙවන අදියර 2023.11.29**

"සහෝදරත්වයේ පියාපත්," II අදියර, 2023 ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය සමාජ සංහිඳියා මධ්‍යස්ථානය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානය සහයෝගීතාවයෙන් ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය (ONUR), අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය 2023 නොවැම්බර් 29 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ සහ මාතර දිස්ත්‍රික්කයේ සංවිධානය කරන ලදී.

## 7. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන

- 2023 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්වල සාරාංශය

| අංකය | කාණ්ඩය | මාසය | වැඩමුළුවේ නම | සම්පත් දායක |
|---|---|---|---|---|
| 1 | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා | 2023 මැයි 30 | • සිසුන්ගේ සිතුම් පැතුම් වෙනස් කිරීමේදී කථිකාචාර්ය / මිත්‍රෝපදේශක / උපදේශක භූමිකාව: සම්ප්‍රදායානුකූල චින්තනය (සම්මුතිගත / චින්තනය) | මේජර් අසංක හිදැල්ලආරච්චි |
| 2 | | 2023 සැප්තැම්බර් 20 | • "අතුරු නීති" පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කාන්ති යාපා /විද්‍යා පීඨය |
| 4 | අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 18/07/2023 සිට 31/03/2024 දක්වා | • උසස් අධ්‍යාපන වෘත්තීය සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව - 2023 | - |
| 5 | අ.ත.ආ.ම. සාමාජිකයන් (රු.වි.) | 2023 ජූලි 05 | • විෂයමාලා සැලසුම | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කාන්ති යාපා /විද්‍යා පීඨය |
| 6 | ව්‍යාපෘති සම්බන්ධීකාර කයන් | 2023 ජූනි 16 | • ප්‍රසම්පාදන සැලැස්ම අනුව ව්‍යාපෘති අරමුදල් කළමනාකරණය කිරීම | කේ.ඒ.ආර්.එස්. ජයකොඩි, මූල්‍යාධිකාරී (රු.වි.) |

- **මාර්ගගතව පැවැත්වූ කෙටි පාඨමාලා**

| අංකය | කාණ්ඩය | මාසය | වැඩමුළුවේ නම | සම්පත් දායක |
|---|---|---|---|---|
| 1 | සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් | 2023 පෙබරවාරි | • රසායනික, ජීව විද්‍යාත්මක සහ වායු අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මේජර් අසංක හිදැල්ලආරච්චි |
| 2 | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | 2023 ජූලි 21 | • ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත්භාවය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කාන්ති යාපා /විද්‍යා පීඨය |
| 3 | සියලු අංශ ප්‍රධානීන් හා පීඨාධිපතිවරුන් | 2023 නොවැම්බර් 23 | • බඳවාගැනීමේ චක්‍රලේඛ පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන/ උපකුලපති |

## 8. සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය

ප්‍රතිසන්ධානය යනු ප්‍රචණ්ඩකාරී ගැටුම්වලින් හානියට පත් සමාජ සංස්කෘතිය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සහ අතීත වැරදි සුවපත් කිරීම පිණිස ප්‍රාදේශීය සහ ජාතික ධාරිතාවල ආයෝජනය කිරීමේ ක්‍රියාවලියයි. ප්‍රචණ්ඩ ගැටුම්වල විෂම චක්‍රය සඳහා හේතු කාරක වන දුක්ගැනවිලිවල මූල හේතු විසඳීමට අවශ්‍ය සමාජ, සංස්කෘතික, මනෝවිද්‍යාත්මක, ආර්ථික සහ දේශපාලන වත්කම්වල සම්පූර්ණ පරාසය උපරිම වාසිය සඳහා යොදා ගැනීම එයට ඇතුළත් වේ.

සමාජ ප්‍රතිසන්ධාන මැදිහත්වීම් විශේෂිතව සැලසුම් කර ඇත්තේ අන්තර් කණ්ඩායම් අවබෝධය පෝෂණය කිරීම, ගැටුම් නිරාකරණය කිරීමේ අවිහිංසාවාදී යාන්ත්‍රණ ශක්තිමත් කිරීම සහ ප්‍රචණ්ඩ ගැටුම්වල හානි සුව කිරීම සඳහා ය. සාම්ප්‍රදායික ව්‍යාපෘති සහ වැඩසටහන්වලින් ඒවා වෙනස් වන්නේ ඒවායේ මූලික අරමුණ සමාජ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම මිස සේවා සැපයීම හෝ ආර්ථික, සමාජීය හෝ දේශපාලන සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම නොවන බැවිනි.

සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය කේන්ද්‍රීය අරමුණ වන්නේ පටු අනන්‍යතා වෙනුවට ශ්‍රී ලාංකේය ජීව ගුණය ප්‍රවර්ධනය කරමින් විවිධ ආගම් සහ වාර්ගිකත්වයන් අවබෝධ කරගැනීමට අනුබල දීමයි. සංස්කෘතික හා අධ්‍යාපන වැඩසටහන් හරහා, විවිධ වාර්ගික නායකයන් සහ ඔවුන්ගේ ප්‍රජාවන් සමගි සම්පන්න කිරිමට ස.ප්‍ර.මධ්‍යස්ථානයට හැකිය. වඩා ඉහළ අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රජාවන් සහ එයින් බාහිර පිරිස් කරා ළඟා වීම පිණිස සංස්කෘතික හා ආගමික භේද සමනය කිරීමේ කර්තව්‍යයන් සහ ආවේණික සහ උපාර්ජිත පූර්ව විනිශ්චයන් ඉවත් කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් මධ්‍යස්ථානය සංවිධානය කරයි.

මේ ආකාරයෙන් මධ්‍යස්ථානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, එය 2023 වසරේදී විවිධාකාර වූ උත්සව සහ වැඩසටහන් සංවිධානය කළේය. රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ වැඩසටහන් මූලාරම්භයන්ගේ ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන තොරතුරු පහත සඳහන් කොට ඇත.

### ක්‍රියාකාරකම -01 "නව උදානයක්" අදියර 02 (මැයි-ජූලි) 2023

"නව උදානයක්" වැඩ සටහනේ දෙවන අදියර මධ්‍යස්ථානය විසින් 2023 මැයි මාසයේදී පවත්වනු ලැබූ අතර රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය සහ සංස්කෘතික මධ්‍යස්ථානය සමග හවුල්කාරිත්වයෙන් එය සංවිධානය කොට දියත් කරන ලදී. එම වැඩසටහන සඳහා මූල්‍ය දායකත්වය දරන ලද්දේ කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය යි.

ආරාධනා අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීම සහ ක්‍රියාවට නැංවීම සහ සම්මාන ප්‍රදානෝත්සවය ඇතුළු අදියර කිහිපයකින් වැඩසටහන ක්‍රියාවට නංවන ලදී.

### ක්‍රියාකාරකම 02- මලයියගම් ප්‍රදර්ශනය සහ සංවාද මණ්ඩපය - මලයියගම් දෙමළ ප්‍රජාවේ වසර 200 ක උරුමය සැමරීම පිණිස "මලයගම් 200" උත්සවය - 23.09.2023

මලයගම් දෙමළ ප්‍රජාවේ වසර 200 ක උරුමය සැමරීම පිණිස රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය සහ සංස්කෘතික මධ්‍යස්ථානය සහයෝගීතාවයෙන් සහ මහනුවර සමාජ සංවර්ධන ආයතනය සමග එක්ව 2023 වසරේදී "මලයියගම් 200" උත්සවය සංවිධානය කර පවත්වන ලදී. දින දෙකක් පුරා පැවැති උත්සවය ප්‍රදර්ශනයකින් සහ සංවාද මණ්ඩපයකින් සමන්විත විය. එම වැඩසටහන රුහුණ විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි 2023 සැප්තැම්බර් 22 සහ 23 දිනවල දී පවත්වනු ලැබීය.

### ක්‍රියාකාරකම 03- "සහෝදරත්වයේ පියාපත්" දෙවන අදියර -29.11.2023 -01.12.2023

රුහුණ විශ්වවිද්‍යාලය සහ යාපනය විශ්වවිද්‍යාලය අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන වන "සහෝදරත්වයේ පියාපත්" දෙවන අදියර අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය සමග සහයෝගීතාවයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය සහ සංස්කෘතික මධ්‍යස්ථානය ඒකාබද්ධව සංවිධානය කර 2023 නොවැම්බර් 29 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ සහ මාතර දිස්ත්‍රික්කයේ පවත්වන ලදී.

# කොටස XI

# සහායක සේවා

## 1. සාමාන්‍ය පරිපාලනය

2023 වර්ෂය සඳහා ආදායම හා වියදම

| උපයෝගිතා බිල්පත් ගෙවීම | රු. |
|---|---|
| - ජලය | 20,499,824.00 |
| - විදුලිය | 84,745,249.38 |
| - දුරකථන | 570,416.39 |
| - අන්තර්ජාල | 14,573,655.00 |
| අනෙකුත් සේවා: | |
| - දුම්රිය බලපත්‍ර | 1,018,925.00 |
| - තැපැල් ගාස්තු | 1,937,445.00 |
| - දුම්රිය වාර ප්‍රවේශපත් | 151,200.00 |
| ගිවිසුම්කර සේවා: | |
| - පිරිසිදු කිරීමේ සේවා | 128,567,289.13 |
| - පුද්ගලික ආරක්ෂක සේවා | 43,288,199.58 |
| ප්‍රවාහන: | |
| - වාහන කුලියට ගැනීම, නඩත්තුව, අධිවේග මාර්ග ගාස්තු | 4,586,247.09 |
| - ඉන්ධන | 10,026,132.01 |
| - වාහන | - |
| උපකරණ නඩත්තුව | |
| - උපකරණ අළුත්වැඩියාව | 3,954,944.54 |
| වෙනත් ආදායම් | |
| - රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය | 2,026,550.00 |
| - අමුත්තන්ගේ නිවහන | 647,400.00 |

## 2. නෛතික හා ප්‍රලේඛන අංශය

2023 වසරේදී ආයතනය විසින් මෙහයවනු ලැබූ නඩුකර.

| නඩු කාණ්ඩය | මුළු නඩු සංඛ්‍යාව | | විශ්වවිද්‍යාලයට එරෙහිව පවරන ලද නඩු සංඛ්‍යාව | | විශ්වවිද්‍යාලය විසින් පවරන ලද නඩු සංඛ්‍යාව | | නඩුවල වත්මන් තත්ත්වය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | විභාගවෙමින් පවතින නඩු සංඛ්‍යාව | | අවසන් වූ නඩු සංඛ්‍යාව | |
| | **1** | **2** | **1** | **2** | **1** | **2** | **1** | **2** | **1** | **2** |
| කම්කරු විනිශ්චය සභා/ සේවක වන්දි අධිකරණය ඉදිරියේ | 02 | 03 | 02 | 03 | - | - | 02 | 03 | - | 01 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය ඉදිරියේ | 02 | 07 | 02 | 07 | - | - | 02 | 07 | - | - |
| දිසා අධිකරණය ඉදිරියේ | 02 | - | - | - | 02 | - | 02 | - | - | - |
| මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ | - | - | - | - | - | - | - | - | - | - |
| අභියාචනාධිකරණය සහ සිවිල් මහාධිකරණය | 02 | 08 | 02 | 08 | - | - | 02 | 08 | - | 02 |
| ශ්‍රේෂ්ඨාධිකරණය | - | 08 | - | 08 | - | - | - | 08 | - | 02 |
| මුළු නඩු සංඛ්‍යාව | **08** | **26** | **06** | **26** | **02** | **-** | **08** | **26** | **-** | **05** |

සටහන 1- *ඉහතින් සඳහන් කළ කාලසීමාව තුල විසින්/එරෙහිව පවරනු ලැබූ නඩු*

2- *පෙර වසරේ විසින්/එරෙහිව පවරනු ලැබූ නඩු*

| නඩු කාණ්ඩය | | මුළු පරීක්ෂණ සංඛ්‍යාව | විභාගවෙමින් පවතින පරීක්ෂණ සංඛ්‍යාව | පරීක්ෂණ අවසන් වූ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ශිෂ්‍ය විනය පරීක්ෂණ** | | | | |
| ශිෂ්‍ය විනය පරීක්ෂණ | විධිමත් පරීක්ෂණ | 06 | 02 | 04 |
| | මූලික පරීක්ෂණ | 18 | 02 | 16 |
| මුළු පරීක්ෂණ සංඛ්‍යාව | | 24 | 04 | 20 |
| **සේවක විනය පරීක්ෂණ** | | | | |
| අනධ්‍යයන සේවක විනය පරීක්ෂණ | විධිමත් පරීක්ෂණ | 01 | - | 01 |
| | මූලික පරීක්ෂණ | 08 | 02 | 06 |
| අධ්‍යයන සේවක විනය පරීක්ෂණ | විධිමත් පරීක්ෂණ | 04 | 01 | 03 |
| | මූලික පරීක්ෂණ | 04 | 01 | 03 |
| මුළු පරීක්ෂණ සංඛ්‍යාව | | 17 | 04 | 13 |

# කොටස XII

# මූල්‍ය ප්‍රකාශන

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ගණන්දීමේ නිලධාරියාගේ සහතිකය, රුහුණ විශ්වවිද්‍යාලය**

2023 දෙසැම්බර් 31න් අවසන් මුදල් වර්ෂය සඳහා රුහුණ විශවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ස්වරූපයෙන් හා ආකාරයෙන් සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 සහ 107 වගන්ති සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත ප්‍රකාරව පිළියෙල කරන ලදුව මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් කොට ඇති උපලේඛන සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබූ මූල්‍ය නියමයන් සහ පරිපාටිවලට අනුකූලව කටයුතු කර ඇති අතර ගනුදෙනුවල විධි සාරූෂය සහ වියදමේ කාර්යක්ෂමතාවය සහතික කිරීම පිණිස ප්‍රායෝගිකව ඉටුකළ හැකි තාක් දුරට පද්ධති හා පාලන පවත්වා ගනු ලැබ තිබේ. මාගේ උපරිම දැනීමට අනුව, 2023 වසරට අදාළ ප්‍රකාශනය සතුටුදායක ලෙස සකස් කර ඇති අතර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් නිරූපණය කරයි.

**ජ්‍යෙෂ්ය මහාචාර්ය සුජීව අමරසේන**
**උප කුලපති** (ගණන්දිමේ නිලධාරී)
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර
2024 පෙබරවාරි 27 වැනි දින

**රුහුණ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 3 | 739,598,393 | 519,228,820 |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 4 | 6,743,117 | 9,108,519 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය හා අත්තිකාරම් | 5 | 19,495,802 | 23,743,529 |
| ප්‍රාග්ධන අත්තිකාරම් | 6 | - | 141,242 |
| වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ | 7 | 325,729,149 | 382,406,140 |
| වට්ටෝරු භාණ්ඩ | 8 | 45,800,052 | 45,566,093 |
| **මුළු ජංගම වත්කම්** | | **1,137,366,513** | **980,194,343** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 9 | 9,130,334,431 | 8,581,288,814 |
| නොනිමි වැඩ | 10 | 4,301,914,547 | 3,691.395,625 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 7,424,272 | 11,557,908 |
| දිගුකාලීන ආයෝජන | 12 | 85,999,033 | 71,044,483 |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් | 5 | 38,845,584 | 44,559,551 |
| වෙනත් මූල්‍ය වත්කම් | 13 | 1,184,870,376 | 654,210,961 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **14,749,388,243** | **13,054,057,343** |
| **මුළු වත්කම්** | | **15,886,754,756** | **14,034,251,686** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| තැන්පතු | 14 | 25,494,543 | 20,740,275 |
| ණයහිමියෝ සහ ගෙවිය යුතු දෑ | 15 | 1,502,988,409 | 858,377,115 |
| අනකුත් බැරකම් | 16 | 7,708,367 | 13,098,197 |
| විලම්බිත ආදායම | | 230,156,243 | 207,555,076 |
| **මුළු ජංගම බැරකම්** | | **1,766,347,563** | **1,099,770,663** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 1,651,795,532 | 1,594,398,984 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **1,651,795,532** | **1,594.398,984** |
| **මුළු බැරකම්** | | **3,418,143,095** | **2,694,169,647** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | **12,468,611,661** | **11,340,082,039** |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| **සමුච්චිත අරමුදල් හා සංචිත** | | | |
| සමුච්චිත අරමුදල -ජංගම හා ප්‍රාග්ධන | 17 | 8,902.659,999 | 8,181.371,522 |
| සංචිත | 18 | 2,085,710,248 | 2,085,710,248 |
| පර්යේෂණ ප්‍රදාන | 19 | 24,818,715 | 24,837,623 |
| සීමිත අරමුදල් හා ප්‍රදාන | 20 | 239,605,096 | 222,607,608 |
| නම්කළ අරමුදල් | 21 | 1.120,415,375 | 750,191,860 |
| පරිත්‍යාග අරමුදල් | 22 | 95,402,229 | 75,363,177 |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධ** | | **12,468,611,661** | **11.340,082,039** |

පිටු අංක 10 සිට 53 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත.

**කේ.ඒ.ආර්.එස්.ජයකොඩි**
මූල්‍යාධිකාරී
මූල්‍ය නිලධාරී

**ඩී.වී.එල්. ක්‍රිෂාණි**
ජ්‍යෝෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභා මණ්ඩලයේ සාමාජිකයක් වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභා මණ්ඩලයේ සාමාජිකයන් අනුමත කර ඇත.

ජ්‍යෝෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන
උප කුලපති
ගණන්දීමේ නිලධාරී

පී.එස්. කලුගම
ලේඛාධිකාරී
සහකාර ගණන්දීමේ නිලධාරී

පාලක සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී.

සුදත් ජයසේකර මහතා
පාලක සභා මණ්ඩල සාමාජික

කපිල සමරසිංහ මහතා
පාලක සභා මණ්ඩල සාමාජික

රුහුණ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

# මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| **හුවමාරු නොවන ගනුදෙනුවල ආදායම -ජංගම** | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 4,406,000,000 | 4,430,000,000 |
| ශිෂ්‍යාධාර සඳහා වි.ප්‍ර.කො.සභාවේ ප්‍රදානය | | 92,190,000 | 77,676,000 |
| අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවය සඳහා වි.ප්‍ර.කො.ස. ප්‍රදානය | | - | 2,500,000 |
| විවිධ ආදායම | 24 | 5,551,676 | 4,653,625 |
| විනිමය ලාභ /අලාභ | | - | 95,323,344 |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම-ජංගම** | | **4,503,741,676** | **4,610,152,970** |
| **හුවමාරු ගනුදෙනුවලින් ආදායම - ජංගම** | | | |
| පොළී ආදායම | | 76,411,351 | 45,001,130 |
| කුලී ආදායම | | 6,527,157 | 4,058,996 |
| උත්පාදිත ආදායම - වෙනත් මූලාශ්‍ර | 23 | 269,700,936 | 149,308,790 |
| විවිධ ආදායම | 24 | 89,375,959 | 86,423,782 |
| ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ආදායම | 26 | 65,245,498 | 70,427,337 |
| මාපලාන කෘෂිකර්ම ගොවිපොළෙන් ආදායම | 27 | 9,626,299 | 11,859,021 |
| නම්කළ අරමුදල් ආශ්‍රිත ආදායම | | 208,158,751 | 150,508,312 |
| බැහැර කළ වත්කම් මත ලාභ | | 30,110 | 5,609 |
| සප්තවාර්ෂික ගුවන් ප්‍රවේශපත් | | 4,238,200 | - |
| **හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම- ජංගම** | | **729,314,261** | **517,592,976** |
| **මුළු ආදායම -ජංගම** | | **5,233,055,937** | **5,127,745,945** |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම - ප්‍රාග්ධන** | | | |
| ප්‍රාග්ධන පැවැරුම් | | 1,535,011,807 | 1,152,016,141 |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -දේශීය | | 1,681,208 | 516,965 |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -විදේශීය | | 133,475,723 | 212,652,042 |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම - ප්‍රාග්ධන** | | **1,670,168,738** | **1,365,185,149** |
| **මුළු ආදායම** | | **6,903,224,675** | **6,492,931,095** |
| **මෙහෙයුම් වියදම් -ජංගම** | | | |
| පුද්ගල පඩිනඩි | 28.1 | 3,777,145,873 | 3,935,942,403 |
| ගමන් වියදම් | 28.2 | 6,969,287 | 5,651,552 |
| සැපයුම් සහ පරිභෝජ්‍ය ද්‍රව්‍ය | 28.3 | 132,748,522 | 126,572,453 |
| නඩත්තුව | 28.4 | 45,109,420 | 27,635,348 |
| ගිවිසුම්කර සේවා | 28.5 | 488,070,638 | 327,791,665 |
| පර්යේෂණ හා සංවර්ධන | 28.6 | 4,221,687 | 1,855,426 |

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 28.7 | 92,190,000 | 77,676,000 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 28.6 | 128,119,196 | 100,801,727 |
| පාරිතෝෂික ප්‍රතිපාදනය | 28.1 | 154,961,680 | 122,588,957 |
| ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් සඳහා වියදම් | 26 | 65,245,498 | 70,427,337 |
| වියදම - මාපලාන කෘෂිකර්ම ගොවිපොළ | 27 | 16,631,660 | 16,179,153 |
| වියදම -නම්කළ අරමුදල් ආශ්‍රිත | | 95,680,547 | 94,707,510 |
| විනිමය ලාභ/අලාභ | | 26,602,598 | - |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **5,033,696,607** | **4,907,829,530** |

| | | | |
|---|---|---|---|
| **මෙහෙයුම් නොවන වියදම්** | | | |
| ක්ෂයවීම හා ක්‍රමක්ෂය | 9 | 863,925,465 | 694,391,565 |
| පර්යේෂණ ශක්තිමත් කිරීම හා මානව ප්‍රාග්ධන සංවර්ධනය | | 568,675 | 1,010,127 |
| පුනරුත්ථාපන වියදම් - ප්‍රාග්ධන නොවන ස්වභාවයේ | | 22,939 | 719,954 |
| **මුළු මෙහෙයුම් නොවන වියදම්** | | **864,517,080** | **696,121,647** |
| **මුළු වියදම්** | | **5,898,213,686** | **5,603,951,177** |
| **කාලසීමාව සඳහා මුළු අතිරික්තය/හිඟය** | | **1,005,010,989** | **888,979,918** |

කාලසීමාව සඳහා මුළු අතිරික්තය/(හිඟය) පහත දැක්වෙන පරිදි කාලසීමාව සඳහා ජංගම සහ ප්‍රාග්ධන අතිරික්තය හෝ හිඟයෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| **කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය** | 199,359,330 | 219,916,416 |
| **ාාලසීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/හිඟය** | **805,651,658** | **669,063,502** |

"ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වන්නේය."

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන
උප කුලපති
ගණන්දීමේ නිලධාරී

පී.එස්. කලුගම
ලේඛාධිකාරී
සහකාර ගණන්දීමේ නිලධාරී

කේ.ඒ.ආර්.එස්. ජයතොඩි
මූල්‍යාධිකාරී
මූල්‍ය නිලධාරී

**රුහුණ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**

## මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**
**(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | 2023 | 2022 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| කාල පර්ච්ඡේදය සඳහා අතිරික්තය/හිගය | 1,005,010,989 | 888,979,918 |
| මුදල් නොවන සංචලන සඳහා ගැලපීම් | | |
| ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂ වියදම් | 863,925,465 | 694,391,565 |
| විදේශ විනිමය ගනුදෙනු මත (ලාභ)/අලාභ | 26,602,598 | (95,323,344) |
| සාධාරණ වටිනාකම් වෙනස්වීම් මත (ලාභ)/අලාභ - කෘෂිකර්ම ගොවිපොළ | (1,218,397) | (2,315,274) |
| වත්කම් බැහැර කිරීම් මත ප්‍රතිලාභ | (30,110) | (5,609) |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -දේශීය | (1,681,208) | (516,965) |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -විදේශීය | (133,475,723) | (212,652,042) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 154,961,680 | 122,588,957 |
| උපයෝගිතා පිරිවැය සහ ඇවර කළ අලාභ ආපසු අයකර ගැනීම - මුදල් නොවන | (3,395,947) | (502,252) |
| පොදු සංචිතය සහ ප්‍රාග්ධන අතිරික්තය සඳහා මුදල් නොවන ගැලපීම් | 73,844,259 | 60,629,957 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | **1,984,543,606** | **1,455,274,911** |
| වැඩිවීම/(අඩුවීම) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 56,676,992 | (232,849,976) |
| වැඩිවීම/(අඩුවීම) කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් | 9,961,693 | 6,737,878 |
| වැඩිවීම/(අඩුවීම) වට්ටෝරු භාණ්ඩ | 984,439 | (16,784,967) |
| වැඩිවීම/(අඩුවීම) අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 2,365,402 | (2,336,798) |
| වැඩිවීම/(අඩුවීම) තැන්පතු | 4,754,269 | (4,449,800) |
| වැඩිවීම/(අඩුවීම) විලම්බිත ආදායම | 22,601,167 | (36,521,624) |
| වැඩිවීම/(අඩුවීම) ගෙවිය යුතු දෑ | 64,175,191 | 54,790,860 |
| වැඩිවීම/(අඩුවීම) අනෙකුත් බැරකම් | (5,389,829) | 6,511,276 |
| **මෙහෙයුම්වලින් ජනිත/(යෙදවූ) මුදල්** | **156,129,323** | **(224,903,151)** |
| ගෙවනු ලැබූ පාරිතෝෂිකය | (97,565,132) | (106,268,452) |
| ගෙවනු ලැබූ මූල්‍ය පිරිවැය | - | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) ශුද්ධ මුදල්** | **2,043,107,797** | **1,124,103,308** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) ශුද්ධ මුදල්** | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම | (206,523,924) | (251,067,793) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | 30,110 | 5,609 |
| නොනිමි වැඩ | (1,149,039,869) | (1,071,152,971) |
| ප්‍රාග්ධන අත්තිකාරම් - ශුද්ධ | (2,586,896) | 412,454 |
| දිගු කාලීන ආයෝජන - ශුද්ධ | (14,954,550) | (13,252,022) |
| අනෙකුත් මූල්‍ය වත්කම් - ශුද්ධ | (530,659,415) | (102,764,655) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) ශුද්ධ මුදල්** | **(1,903,734,544)** | **(1,437,819,378)** |

| | 2023 | 2022 |
|---|---|---|

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| | | |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| අනෙකුත් ප්‍රදාන, පරිත්‍යාග සහ අරමුදල්වලින් ශුද්ධ මුදල් ගලා ඒම(යාම) | 107,598,919 | 80,201,696 |
| කල්බදු ණය හිමියාගෙන් ලතු මුදල් (ආපසු ගෙවීම) | - | |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **107,598,919** | **80,201,696** |
| මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | 246,972,171 | (233,514,374) |
| විදේශ මුදලින් රඳවාගත් මුදල් හා මුදල් සමාන දෑ මත විනිමය අනුපාත වෙනස්වීම්වල බලපෑම | (26,602,598) | 95,323,344 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | 519,228,820 | 657,419,850 |
| **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | **739,598,394** | **519,228,820** |

**රුහුණ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**

# අරමුදල් හා සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| විස්තරය | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අරමුදල-ජංගම | සමුච්චිත අරමුදල-ප්‍රාග්ධන | පරිසීමිත අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|
| **2021.01.01 දිනට ගැලපූ ශේෂය** | **2,063,545,191** | **(510,227,078)** | **7,846,900,197** | **888,550,318** | **10,288,768,628** |
| කාල පරිච්ඡේදය සඳහා හිඟය/අතිරික්තය | - | 219,916,416 | 669,063,502 | - | **888,979,918** |
| අධි ප්‍රතිපාදන වියදම් ප්‍රතිවර්තනය | - | 46,771,655 | - | - | **46,771,655** |
| පරිසීමිත අරමුදල්වලින් ප්‍රාග්ධන පැහැදම වෙත දායකත්වය | - | | 100,924,547 | (100,924,547) | - |
| නම් කළ අරමුදල්වලට පැවැරූ - උත්පාදිත අරමුදල් | - | (149,308,790) | - | 149,308,790 | - |
| නම්කළ අරමුදල් ආශ්‍රිත පුනරාවර්තන අතිරික්තය පැවැරූම | - | (55,800,802) | - | 55,800,802 | - |
| පෙර වසරෙ ගැලපුම (ශුද්ධ) | - | 13,131,876 | - | - | **13,131,876** |
| වර්ෂය තුළදී ශුද්ධ දායකත්වය | - | - | - | 80,264,906 | **80,264,906** |
| ප්‍රත්‍යාගණන සංචිතය | 22,165,056 | | - | - | **22,165,056** |
| **2022.12.31 දිනට ශේෂය** | **2,063,545,191** | **(510,227,078)** | **7,846,900,197** | **888,550,318** | **10,288,768,628** |
| කාල පරිච්ඡේදය සඳහා හිඟය/අතිරික්තය | | 199,359,330 | 805,651,658 | | **1,005,010,989** |
| අධි ප්‍රතිපාදන වියදම් ප්‍රත්‍යාවර්තනය | | 32,010,178 | | | **32,010,178** |
| පරිසීමිත අරමුදල්වලින් ප්‍රාග්ධන පැහැදම වෙත දායකත්වය | | | 82,536,913 | (82,536,913) | - |
| නම්කළ අරමුදල් සඳහා පැවැරුම් - උත්පාදිත ආදායම | | (269,700,936) | | 269,700,936 | - |
| නම්කළ අරමුදල් ආශ්‍රිත පුනරාවර්තන අතිරික්තය පැවැරම් | | (112,478,204) | | 112,478,204 | - |
| පෙර වසරෙ ගැලපුම (ශුද්ධ) | | (91,462,226) | 75,371,762 | | **(16,090,464)** |
| වර්ෂය තුළදී ශුද්ධ දායකත්වය | | | | 107,598,919 | **107,598,919** |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | - |
| **2023.12.31 දිනට ශේෂය** | **2,085,710,247** | **(677,788,580)** | **9,580,448,579** | **1,480,241,415** | **12,468,611,660** |

රුහුණ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## අයවැය සහ තථ්‍ය සංඛ්‍යා සංසන්දනය පිළිබඳ ප්‍රකාශනය

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | මුල් අයවැය | ප්‍රතිශෝධිත අයවැය | සංසන්දනාත්මක පදනමක් මත තථ්‍ය |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පුනරාවර්තන වියදම සඳහා රජයේ ප්‍රදානය | 4,653,000,000 | 4,653,000,000 | 4,406,000,000 |
| පොළී ආදායම | 33,160,000 | 33,160,000 | 76,411,351 |
| කුලී ආදායම | 5,600,000 | 5,600,000 | 6,527,157 |
| විවිධ ආදායම | 113,301,000 | 113,301,000 | 89,375,959 |
| **මුළු අයවැය** | 4,805,061,000 | 4,805,061,000 | 4,578,314,467 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 4,079,244,000 | 3,983,952,200 | 3,799,029,383 |
| ගමන් වියදම් | 3,169,250 | 2,952,710 | 6,969,287 |
| සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 104,390,500 | 107,120,240 | 137,751,095 |
| නඩත්තු | 18,794,000 | 26,156,260 | 45,630,820 |
| ගිවිසුම්කර සේවා | 402,943,200 | 408,838,420 | 492,119,083 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 121,615,050 | 105,844,370 | 117,219,112 |
| පරිතෝෂිකය | 74,905,000 | 170,196,800 | 155,259,182 |
| **ක්ෂයවීමට පෙර මුළු මෙහෙයුම් වියදම්** | **4,805,061,000** | **4,805,061,000** | **4,753,977,962** |
| **ශුද්ධ ලැබීම් / (ගෙවීම්)** | **-** | **-** | **(175,663,495)** |

සටහන: අයවැය සහ ගිණුම්කරණ පදනම වෙනස් වේ. අයවැය හා තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබඳ මෙම සංසන්දනාත්මක ප්‍රකාශය අයවැය පදනමින් පිළියෙළ කොට ඇත.

## රුහුණ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

### 1. සාමාන්‍ය තොරතුරු

### 1.1 නෛතික හා නිත්‍ය වාස ස්වරූපය

රුහුණ විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානයක් කරගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකි. වත්මනෙහි විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 10 කි. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, විද්‍යා, කළමනාකරණ සහ මූල්‍ය සහ ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණවේද පීඨ මාතර, වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. වෛද්‍ය, ඉංජිනේරු සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨ පිළිවෙළින් ගාල්ල දිස්ත්‍රික්කයේ කරාපිටිය, හපුගල සහ උළුවිටකේ පිහිටා ඇත. කෘෂිකර්ම හා තාක්ෂණ පීඨය මාතර කඹුරුපිටියේ පිහිටා ඇත. උපාධි අධ්‍යයන පීඨය මාතර කොටුවේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

කෘෂිකර්ම, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, වෛද්‍ය, විද්‍යා, සම සෞඛ්‍ය විද්‍යා, කළමනාකරණ සහ මූල්‍ය, ඉංජිනේරු, ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණවේද යන ක්ෂෙත්‍රයන්හි උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාලය මූලිකවම දේශීය ශිෂ්‍යයන්ට අවස්ථා සපයයි.

### 1.3 මූල්‍ය කාලසීමාව

රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වන මාස දොළහක කාල පරිච්ඡේදයයි.

### 1.4 නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

2024 පෙබරවාරි 29 වැනි දින පැවැති විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලයේ 444 වැනි රැස්වීමේදී 2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම අනුමත කොට ඒ සඳහා බලය පවරන ලදී.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

#### 1.5.1 අනුකූලතා ප්‍රකාශනය

රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය.

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්සසාධනය පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත වේ. විශ්වවිද්‍යාලය විසින් යොදාගෙන ඇති සියලු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයේ ප්‍රතිපත්තිවලට අනුරූපව ඉදිරිපත් කර ඇති අතර අවශ්‍ය තන්හිදී වත්මන් වසරේ සංඛ්‍යා ඉදිරිපත් කිරීමේදී වෙනස්වීම්වලට අනුකූල වන ලෙස සංසන්දනාත්මක සංඛ්‍යාවන්ට ගැලපීම් සිදු කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විස්තර කොට ඇත.

#### 1.5.2 මැණීමේ පදනම

අදාළ සටහන් මගින් පැහැදිළි කර ඇති සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන අවස්ථාවන් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

### 1.5.3 සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සඳහා සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩිදියුණු කිරීම පිණිස, මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබ ඇත. අවශ්‍ය විටදී, ප්‍රවර්ථන වසරේ ඉදිරිපත් කිරීම සමග අනුකූල වනසේ සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ නැවත සකස් කර ඇත ඇත.

### 1.5.4 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මෙම මුදල් ප්‍රකාශන මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයනය කර ඇත.

### 1.5.5 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීන්දු

ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමණාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවට වඩා වෙනස්විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්, ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වන අතර ප්‍රවර්ථන හා යම් අනාගත කාලසීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමා හා අනාගත කාලසීමාවන් සඳහාද පිළිගනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ තීරණාත්මක තීන්දුවල යම් වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් මගින් හෙළිදරව් කොට ඇත.

### 1.5.6 අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්ම සහිතය යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය

### 2.1 වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

### 2.1.1 දේපළ, පිරියත හා උපකරණ

#### (අ) පිළිගැනීම සහ මැනීම

දේපල, පිරියත හා උපකරණ හඳුනාගනු ලබන්නේ වත්කම හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමේ හැකියාවක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය මැණිය හැකි විටදීය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ අයිතම මුලින්ම හඳුනාගෙන ඇත්තේ පිරිවැයටය. දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයට හෝ එකතු වූ ක්ෂය කිරීම හා හානි අලාභ අඩුකොට සාධාරණ වටිනාකමටය. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ඉඩම්, රථ වාහන සහ ගොඩනැගිලි කාණ්ඩ හැර දේපළ පිරියත හා උපකරණ මණිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැයටය. ඉඩම්, රථ වාහන සහ ගොඩනැගිලි තදනන්නතරව මණිනු ලබන්නේ ප්‍රත්‍යාගණන ආකෘතියට වන අතර ප්‍රත්‍යාගණන දිනයට යම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්නතර සමුච්චිත හානි අලාභ අඩු කොට එහි සාධාරණ වටිනාකම වන ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකමට දක්වනු ලැබේ.

හුවමාරු නොවන ගනුදෙනු හරහා අත්කර ගත් වත්කම් එසේ අත්කර ගත් දිනයට සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබේ. දේපළ පිරියත හෝ උපකරණවලට රජයේ ප්‍රදාන, ව්‍යාපෘති, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරිකව උත්පාදිත අරමුදල් සහ පරිත්‍යාග මගින් ලබාගත් වත්කම්ද ඇතුලත් වේ. පරිත්‍යාග සහ ත්‍යාග ලෙස ලත් දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනුවලින් ලත් ආදායම ලෙස හඳුනාගනු ලැබේ. අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය දරන ලද විටදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

අළුතින් බඳවා ගන්නා සිසුන්ට ඉඩ පහසුකම් සැපයීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස ඉංජිනේරු පීඨයේ විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයට යාබදව පිහිටි "පියොන් ආරච්චිගේ වත්ත" නම් ඉඩම අත්පත් කර ගැනීම පිණිස බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම්වරයාට රුපියල් මිලියන 25 ක් ගෙවන ලදී. එකී ඉඩමේ හිමිකාරිත්වය 2021 අප්‍රේල් 08 වැනි දින විශ්වවිද්‍යාලයට පවරන ලදී. එකී ඉඩම ප්‍රාග්ධනීකරණය කර මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව යටතේ දක්වා තිබේ.

"කෙසෙල්ගස්හේන වත්ත" නම් අක්කර තුනක ඉඩම වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 13.28ක ප්‍රතිශ්ධාවකට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පවරා ගනු ලැබ ඇත. එම ප්‍රතිශ්ධාව සමාන වාරික 60කින් ගෙවීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කැමැත්ත ලබා දී ඇත. 2023.12.31 දිනට ගෙවිය යුතු ශේෂය රුපියල් මිලියන 3.09 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. මෙම ඉඩම සඳහා මිලදී ගැනීමේ ප්‍රතිශ්ධාව සහ දරන ලද අනෙකුත් මූලික වියදම් ප්‍රාග්ධනීකරණය කොට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත.

විශ්වවිද්‍යාලට එකඟ වූ කුලියකට විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි හා පරිශ්‍ර ලංකා බැංකුවට හා මහජන බැංකුවට කුලියට ලබා දී තිබේ. මෙම දේපළ කුලී ඉපැයීම හෝ ප්‍රාග්ධන අධිමූල්‍යනය (හෝ දෙකම) රඳවා ගනු නොලබන බැවින් ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කර නොමැති අතර දේපළ, පිරියත හා උපකරණ ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පිළිගෙන තිබේ.

දක්ෂිණ නාවුක අධ්‍යයන සහ නාවික කටයුතු මධ්‍යස්ථානය සඳහා හපුගල සහ මාගාල්ලේ පිහිටි ගොඩනැගිලි දෙකක ප්‍රධාන ඉදිකිරීම් කටයුතු වත්මන් මූල්‍ය වර්ෂය තුළ නිමා කොට ඇත. කොන්ත්‍රාත්තුවල මුළු පිරිවැය ප්‍රාග්ධනීකරණය කොට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත. රුහුණ විශ්වවිද්‍යාලයේ ශාරීරික අභ්‍යාස ශාලාවේ තවදුරටත් සිදු කළ ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු මූල්‍ය වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. තාක්ෂණ පීඨයේ ශිෂ්‍ය ආපන ශාලාව වර්ෂය තුළ සම්පූර්ණ කළ අතර ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තාකෂණ ධාරාව මගින් අරමුදදල් සපයන ලදී. එහි මුළු පිරිවැය රු. මිලියන 56 කි.

තවද, රුහුණ විශ්වවිද්‍යාලයට අයත් මාතර කොටුවේ පැරණි ප්‍රතිසංස්කරණය කරන ලද ගොඩනැගිල්ලේ රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ නව සංකීර්ණය ස්ථාපිත කරන ලදී. ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුවේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 99.68 කි.

## (ආ) තදනන්තර පිරිවැය

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත. ප්‍රධාන පරික්ෂාකිරීම් සහ පූර්ණ අළුත්වැඩියා ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක

සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

### (ඇ) දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

වෘත්තීමය සුදුසුකම් ලත් තැනැත්තෙකු විසින් 2006 වසරේදී ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරනු ලැබීය. ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අවස්ථාවේදී ගිණුම්ගත කරනු නොලැබූ ඉඩම් එම ඉඩම් අත්පත් කරගත් අවස්ථාවේදී පැවැති අනුපාතයන් භාවිතා කරමින් තක්සේරු කොට ගිණුම්ගත කරන ලදී.

මුළු වාහන ඇණියම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ වෘත්තිකයකු විසින් 2020 සහ 2022 වර්ෂ තුළදී ප්‍රත්‍යාගණනය කරන ලදී. ප්‍රත්‍යාගණනය කරන ලද වාහනවලින් ඇතිවූ ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබූ අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සමුච්චිත අරමුදලේ සහ සංචිතයේ අන්තර්ගත කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ට අනුකූල වීම පිණිස සියලු පංතිවල රථවාහන සඳහා සිදු කළ ඉහත ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය 2023 වසරේදී මාතර තක්සේරු දෙපාර්තමේන්තු කාර්යාලයට 2023 වසරේ බාර දුන්න ද, වාර්තාකරණ දිනය වන තෙක් ප්‍රත්‍යාගණන වටිනාකම විශ්වවිද්‍යාලයට නොලැබුණු බැවින්, 2022 හා 2023 ප්‍රත්‍යාගණන අගයන් වත්මන් මුදල් වසරේදී වෙනස් නොකරන ලදී.

### (ඇ) ක්ෂයවීම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ක්ෂයවීම හඳුනාගනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් භාවිතයට ගනු ලැබූ දිනයේ සිට ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයටය. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කම ප්‍රයෝජනය සඳහා ගත් මාසයේ සිට වත්කමක ක්ෂයවීම ආරම්භ වන අතර වත්කම හඳුනාගැනීම ඉවත් කරනු ලැබූ හෝ පූර්ණව ක්ෂය කරනු ලැබූ මාසයේ එය අවසන් වේ. ව්‍යාපෘති හා පර්යේෂණ ප්‍රදාන සහ සීමිත අරමුදලින් මිලදී ගනු ලැබූ දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට වැය බරක් වේ.

ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | වසර 10 |
| දුරකථන හුවමාරුව | වසර 10 |
| ජල සැපයුම | වසර 10 |
| කාර්යාල උපකරණ | වසර 05 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 05 |
| පරිගණක හා උපාංග | වසර 05 |
| ක්‍රීඩා භාණ්ඩ | වසර 05 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | වසර 05 |
| පුස්තකාල පොත් | වසර 05 |
| රථ වාහන | වසර 05 |
| ලෝගු | වසර 05 |

කොමිෂන් සභා චක්‍රලේඛ 09/2022 ප්‍රකාරව ක්‍රීඩා භාණ්ඩ/ උපකරණ වාර්ෂිකව 25% කින් ක්ෂය කර ඇති අතර වත්මන් මුදල් වසරේ සහ පෙර වසරේ අව්‍යාශ ගැලපීම් සිදු කොට ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව පිරිවැය ආකෘතිය මත පදනම්ව හඳුනාගනු ලබන පූර්ණව ක්ෂයකරනු ලැබූ වත්කම්වල පිරිවැය 2022 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 2,210 ක් විය.

තවද, මුළුමණින්ම ක්ෂය කර ඇති පහත දැක්වෙන රථ වාහන තුන ධාවන තත්ත්වයේ නොපවතින අතර අළුත්වැඩියා කිරීම නොපිරිමහනසුලු වේ. එබැවින් එම වාහන සක්‍රිය භාවිතයෙන් ඉවත් කර ඇති අතර අපහරණය සඳහා රඳවා ගෙන තිබේ.

| වාහන අංකය හා වර්ගය | මූලික පිරිවැය (රු) |
|---|---|
| 117-4328 යතුරු පැදිය | 24,000 |
| 70-7923 රෝද දෙකේ අත් ට්‍රැක්ටරය | 90,000 |
| 70-7923 රෝද දෙකේ අත් ට්‍රැක්ටරය | 110,000 |

### (ඉ) හඳුනාගැනීම ඉවත්කිරීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් භාවිතා කිරීම හෝ බැහර කිරීම මත අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එහි හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. රථ වාහන හැර වත්කමක හඳුනාගැනීම ඉවත්කිරීම මගින් ඇතිවන කිසියම් ලාභයක් හෝ අලාභයක් ශුද්ධ බැහැර කිරීම් උත්පාදන සහ ධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරන අතර වත්කමේ හඳුනාගැනීම ඉවත් කළ වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

### 2.1.2 මූල්‍ය කල්බදු

කල්බදු නියමයන් මගින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ බදු ගැනුම්කරුට සාරනුකූලව පවරනු ලැබූ විටදී ඒවා මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. 2020 වර්ෂය තුළ අශොක් ලේලන්ඩ් බස් රථයේ (NC 4780)) සහ ටොයොටා කැම්රි මෝටර් රථයේ (CAP 7905) කල් බදු සඳහා මූල්‍ය කල්බදු බැඳීම් වර්ෂය තුළදී මුළුමණින්ම පියවූ අතර කල්බදු ගත් වත්කම්වල හිමිකාරිත්වය විශ්වවිද්‍යාලයට පවරන ලදී. වර්ෂයේ අවසාන දිනයේදී කල්බදු සැකසුම්වලින් මතුවන කිසිදු ප්‍රාග්ධන බැඳීමක් නොවීය.

### 2.1.3 නොනිමි වැඩ සහ පුනරුත්ථාපනය

නොනිමි ප්‍රාග්ධන වැඩ සහ පුනරුත්ථාපනය පිරිවැයට ප්‍රකාශ කොට ඇත. මේවා ප්‍රාග්ධනායනය කිරීමට තිබෙන්නා වූ දේපළ, පිරියත හා උපකරණ ඉදිකිරීමේදි හා වැඩි දියුණු කිරිමේදී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වේ. මුළු පිරිවැය විශ්වසනීය ලෙස මණිනු ලබන විටදී සහ වත්කම භාවිතය සඳහා ඇති විටදී නොනිම ප්‍රාග්ධන වැඩ සහ පුනරුත්ථාපන වියදම් දේපළ, පිරියත හා උපකරණවල අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයට හඳුනාගැනීමේ නිර්ණායක සපුරනු නොලැබූ වසර තුළ දරන ලද ප්‍රාග්ධන වියදම් නොනිමි ප්‍රාග්ධන වැඩ සහ පුනරුත්ථාපන ලෙස පෙන්වා ඇත.

### 2.1.4 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අස්පෘශ්‍ය වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. වෙන වෙනම අත් කර ගනු ලබන සියලු අස්පෘශ්‍ය වත්කම් මුලින්ම පිරිවැයට මණිනු ලැබේ. අනතුරුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාරව පිරිවැය ආකෘතිය යටතේ යම් සමුච්චිත ක්‍රමක්ෂයක් පිරිවැයට දක්වනු ලැබේ. හුවමාරු නොවන ගනුදෙනුවකින් අත්කර ගත් අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය හුවමාරුවේ දිනයට ඒවායේ සාධාරණ වටිනාකම වේ.

පරිමිත ආයු කාලයක් ඇති සියලු අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ජීවිත කාලය මත සරල රේඛීය ක්‍රමයට ක්‍රමක්ෂයකරනු ලබන අතර පහත දැක්වෙන පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට වැය බරක් වේ.

### (අ) පරිගණක මෘදුකාංග

අත් කර ගනු ලැබූ පරිගණක මෘදුකාංග බලපත්‍ර ඒවා අත් කර ගැනීමට සහ භාවිතයට ගැනීමට දරන ලද පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනගත කරනු ලැබේ. එම පිරිවැය පස් (5) වසරක් වූ ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්‍රමක්ෂය කරනු ලැබේ.

### (ආ) මානව ප්‍රාග්ධනය සංවර්ධනය සහ තත්ත්ව ආරක්ෂණ වියදම්

මානව ප්‍රාග්ධන සංවර්ධනයෙන් සහ තත්ත්ව ආරක්ෂණයෙන් මතුවන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට ඇත්තේ ප්‍රමාණවත් නොවන පාලනයක් බැවින්,මෙම අයිතම සඳහා වන පිරිවැය අස්පෘශ්‍ය වත්කම්වල නිර්වචනය සපුරාලයි. මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ තත්ත්ව ආරක්ෂණ සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ සියලු වියදම් එසේ දරනු ලැබූ විටදී වියදමක් ලෙස හඳුනාගන්නා අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලැබේ.

### (ඇ) අභ්‍යන්තරව උත්පාදිත අස්පෘශ්‍ය වත්කම්

#### පර්යේෂණ වියදම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාරව, පර්යේෂණ අදියරෙන් මතුවන කිසිදු අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගත යුතු අතර පර්යේෂණ වියදම් දරන ලද විටදී වියදමක් ලෙස හඳුනාගත යුතුය. ඒ අනුව, පර්යේෂණ සඳහා දරන ලද සියලු වියදම් එසේ දරන ලද වියදමක් ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලැබේ.

### (ඈ) සංවර්ධන වියදම්

අභ්‍යන්තරව සංවර්ධිත සියලු අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20හි 55 වන වගන්තිය ප්‍රකාරව පිළි සැකසුම් නිර්ණායක සපුරාලන්නේ නම් පමණි.

### 2.1.5 ආයෝජන

ස්ථාවර තැන්පතු සහ ඉතුරු කිරීම් ගිණුම් ආශ්‍රිත ආයෝජන පිරිවැයට ප්‍රකාශ කරනු ලබන අතර, කෙටි කාලීන අරමුදල්වල ආයෝජන මත උපචිත වූ පොළිය මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු දෙයක් ලෙස ගිණුම් ගත කරනු ලබන අතර පරිත්‍යාග අරමුදල්, නම් කළ අරමුදල් සහ ව්‍යාපෘති උපලබ්ධිවීම වීම මත හඳුනාගෙන අදාළ පරිසීමිත අරමුදල් ගිණුමට බැර කරන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

## 2.2 වට්ටෝරු භාණ්ඩ

### 2.2.1 වට්ටෝරු භාණ්ඩ (තොග)

අභාවිත අයිතම සඳහා නිසි ගැලපීම් සිදුකිරීමෙන් පසු වට්ටෝරු භාණ්ඩ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට ප්‍රකාශ කර ඇති අතර පිරිවැය තීරණය කරනු ලැබූයේ ප්‍රථමයෙන් ලැබූ ප්‍රථමයෙන් නිදහස් කළ පදනමිනි. මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය. විශ්වවිද්‍යාලයේ වට්ටෝරු භාණ්ඩවලට ලිපිද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, නඩත්තු තොග සහ වෛද්‍ය තොග ඇතුළත් වේ.

### 2.2.2 පශු සම්පත්

කෘෂිකර්ම පීඨයේ ගොවිපොළ විසින් කළමනාකරණය කරනු ලබන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන ජීවී සතුන්ගෙන් පශු සම්පත් සමන්විත වේ. මූලික හඳුනා ගැනීම මත සහ එක් එක් වාර්තාකරණ දිනයට විකිණීම සඳහා පිරිවැය

අඩුකොට සාධාරණ වටිනාකමට පශු සම්පත් මනිනු ලැබේ. පශු සම්පත්වල සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබුයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රකාශිත අනු ප්‍රමාණ සහ සමාන වත්කම්වල වත්මන් වෙළඳපොළ මිල පදනම්වය. පශු සම්පතක් එහි සාධාරණ වටිනාකමට සහ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලට හඳුනාගැනීම මත පැන නගින ලාභයක් හෝ පාඩුවක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 18 ප්‍රකාරව එය පැන නැගුණු කාල සීමාව සඳහා අතිරික්තයේ හෝ හිඟයේ ඇතුළත් කරනු ලැබේ.

### 2.2.3 එලදා තොග

එලදා තොග කෘෂිකර්ම ගොවිපොළේ නෙලාගත් නිෂ්පාදනවලින් සමන්විත වේ. එලදා තොග තක්සේරුව සත්‍යාපනයේ දිනයට වෙළඳපොළ මිල මත පදනම් විය.

## 2.3 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, ජංගම ගිණුමේ ඇති මුදල්, කාල තැන්පතු සහ ඉල්ලීම මත ගෙවිය යුතු බැංකු ණය ගැනුම්වලින් ප්‍රමාණ මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. එහෙත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ කාර්යය සඳහා, ශිෂ්‍යත්ව සහ රන් පදක්කම් තැන්පතු වැනි පරිසීමිත මුදල් තැන්පතු මුදල් හා මුදල් සමාන දෑවල කොටසක් ලෙස හඳුනාගනු නොලැබේ.

2023 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය පහත දැක්වෙන පරිසීමිත බැංකු ගිණුම් පවත්වාගෙන යන ලදි.

| බැංකු ගිණුමේ නම | ගිණුම් අංකය | අරමුදල් අධිකාරිය | කාර්යය |
|---|---|---|---|
| නෝ(ර්)හෙඩ් CPDS ව්‍යාපෘතිය | මහජන බැංකුව/ 032-1001-900-42806 | නොරාඩ් | නෝ(ර්)හෙඩ් ව්‍යාපෘතිය ප්‍රකාරව පීඑ, දර්ශනශූරී විද්වතුන්, විද්‍යාපති ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය හුවමාරුව, සුළු පර්යේෂණ ව්‍යාපෘති, ඒකාබද්ධ ප්‍රකාශන, සමපදස්ථ සමාලෝචිත සඟරා ආදිය සඳහා විධිවිධාන සපයයි. |
| නෝ)ර්)හෙඩ් දේශගුණික විපර්යාස ව්‍යාපෘතිය | මහජන බැංකුව/ 032-1001-000-44126 | නොරාඩ් | ශ්‍රී ලංකාවේ ධීවර සහ ජලජීවී වගා කළමනාකරණයට දේශගුණික වෙනස්වීම් සහ පාරිසරික පද්ධති ප්‍රවේශ අන්තර්ගත කරයි. |
| දකුණු චීන සාගර ආයතන ව්‍යාපෘතිය | මහජන බැංකුව/ 032-1001-100-42592 | දකුණු චීන සාගර විද්‍යා ආයතනය | අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා චීන- ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යාපන සහයෝගිතාව ඇති කරයි. |
| AHEAD OTS ව්‍යාපෘතිය | මහජන බැංකුව 032-1-001-000-2-0053209 | ලෝක බැංකුව | ප්‍රමුඛතා ශික්ෂාවන් සඳහා බඳවාගැනීම් පුළුල් කරයි, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව ඉහළ නංවයි, උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය කරයි. |
| BRIATE ව්‍යාපෘතිය යුරෝ | ලංකා බැංකුව/84869161 | යුරෝපීය කොමිෂම | උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන, කළමනාකරණ, පරිපාලන සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පාර්ශවකරුවන්ගේ නිපුණතා සහ කුසලතා, කළමනාකරණ, පාලන සහ නව්‍යකරණ ධාරිතා ඉහළ නැංවීම |
| ත්‍රී ලංකා ව්‍යාපෘතිය (යුරෝ( | ලංකා බැංකුව/0086439101 | යුරෝපීය කොමිෂම | ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති පුහුණු කේන්ද්‍රයක් සඳහා ව්‍යාපෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා විදේශ මුදල් ගනුදෙනු සහ ශ්‍රී ලංකා |

| | | | |
|---|---|---|---|
| | | | රුපියල්වලින් දේශීයය වියපැහැදම් ගෙවීම සඳහා පහසුකම් සැපයීම (ශ්‍රී ලංකා) |
| ෆවුන්ටන් ගිණුම (යුරෝ) | ලංකා බැංකුව 0090480149 | යුරෝපීය කොමිසම | ආසියානු විශ්වවිද්‍යාලවල විශ්වවිද්‍යාල-කර්මාන්ත අතර උපායමාරගික හවුල්කාරිත්ව අඩුව ආමන්ත්‍රණය කිරිම |

## 2.4 බැරකම් හා ප්‍රතිපාදන

### 2.4.1 බැරකම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනය වන විට දන්නා සියලු බැරකම් මූල්‍ය වාර්තාවන්හි අන්තර්ගත කර ඇති අතර ඉල්ලුම මත හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති බැදීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ.. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරකින් පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් ලෙස සලකනු ලැබේ.

### 2.4.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී සහ බැඳීම විශ්වසනීය ලෙස මැණිය හැකි විටදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රතිපාදන පිළිගනු ලැබේ.

### 2.4.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යතා

අසම්භව්‍යතා යනු අතීත සිදුවීමකින් පැන නගින හව්‍ය වත්කම් හෝ බැඳීම් වන අතර විශ්වවිද්‍යාලයේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් හට ගැනීමෙන් හෝ හට නොගැනීමෙන් පමණක් සනාථ කරනු ලබනු ඇත. 2023.11.30 දින ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨයේ විද්‍යාගාරයක හටගත් ගින්නකින් සිදුවූ හානිය ප්‍රාග්ධන බැඳීමක් ලෙස විශ්වවිද්‍යාලය හඳුනා ගන්නා ලදී. හානිය ගණනය කිරීම සඳහා විමර්ශනයක් සිදු කරමින් පවතින අතර හානියේ වටිනාකම ගණනය අවසන් කිරීමෙන් අනතුරුව එය මූල්‍ය ප්‍රකාශනවලට ගලපනු ඇත. සම්භාව්‍යතා වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් විශ්වවිද්‍යාලය හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය මූර්තිමත් කරන්නා වූ සම්පත් ගලා යාමක හෝ ගලා ඒමක හව්‍යතාව දුරස්ථ නම් හැර, යම් අසම්භාව්‍යතාවක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල හෙළිදරව් කරනු ලැබේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයට පහත දැක්වෙන නඩු හබ අඛණ්ඩව පැවැති අතර නඩුකීම් ක්‍රියාකාරකම්වලින් මතුවන බැඳීම්වලට අදාළව ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.

**නඩු සංඛයාව**

| නඩු වර්ගය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 08 |
| අභියාචනාධිකරණ නඩු | 08 |
| දිසා අධිකරණ නඩු | 02 |
| පළාත්බද මහාධිකරණ නඩු | 01 |
| සිවිල් අභියාචනා මහාධිකරණය | 02 |
| කම්කරු විනිශ්චය සභා | 05 |
| විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය | 09 |
| එකතුව | 34 |

**නඩු පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුව**

| නඩු අංකය<br>ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු | අදාළ පාර්ශවය |
|---|---|
| SC/FR/232/16 | වී.ජී.එස් විජිත් කුමාර මයා |
| SC/FR/235/16 | පූජ්‍ය සංබපාල පඤ්ඤාසාර හිමි |
| SC/FR/236/16 | පූජ්‍ය කොටියාගල උපරත්න හිමි |
| SC/FR/74/20 | හිරෝෂිණී පියදාස මිය |
| SC/(FRA)/308 | පී.පී. සමිත් කුමාර මයා |
| SC/FR/267/20 | ඒ.ඩබ්. නිරාෂා මෙය |
| SC/SP/LA/74/21 | බී.පී.එදිරිසිංහ මහතා සහ තවත් පස් දෙනෙකු |
| SC/FR/216/20 | ජේ.ඒ.එස්. ප්‍රියදර්ශන සිල්වා මයා |

**අභියාචනාධිකරණ නඩු**

| | |
|---|---|
| CA/230/Writ/20 | සම්මානිත මහාචාර්ය ඩබ්.එම්.එම්.පී. විජේරත්න |
| CA/231/Writ/20 | ආචාර්ය විනීතා විජේරත්න මිය |
| CA/232/Writ/20 | සම්මානිත මහාචාර්ය ඩබ්.ඩබ්.ඩී.ඒ. ගුණවර්ධන |
| CA/233/Writ/20 | මහාචාර්ය රාජපක්ෂ |
| CA/234/Writ/20 | මහාචාර්ය පී.ආර්.ටී. කුමාරණතුංග මයා |
| CA/523/Writ/21 | නාලික සංජීව මහතා |
| CA/124/Writ/23 | වරුණ ප්‍රියංකර මහතා |
| CA/251/Wirt/23 | ඩී.කේ.එම්.යූ.කේ. කරුණාසාගර මහතා සහ තවත් අය |

**සිවිල් අභියාචනා මහාධිකරණය**

| | |
|---|---|
| SP/HCCR/MR/32/2018 | ආචාර්ය දර්ශන වික්‍රමසිංහ මයා |
| SP/HCCR/MR/32A/2018 | ආචාර්ය දර්ශන වික්‍රමසිංහ මයා |

**දිස්ත්‍රික් අධිකරණයේ නඩු**

| | |
|---|---|
| MR/20137 | පී.ටී.කේ. ආරච්චිගේ මහතා |
| MR/20138 | මහාචාර්ය අශාන්ති සහ මහාචාර්ය චින්තක |

**කම්කරු විනිශ්චය සභා නඩු**

| | |
|---|---|
| LT/04/36/20 | හිරෝෂිණී පියදාස මිය |
| LT/26/76/22 | උදේශ් ධර්මසිරි මයා |
| LT/04/112/22 | පුබුදු හේවාවසම් මයා |
| LT/04/04/23 | හිරෝෂිණී මිය |
| LT/G/62/23 | ඒ.ජී. විමලරත්න මයා |

**විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය**

| | |
|---|---|
| USAB 889 | වී.ජී.එස් විජිත් කුමාර මයා |
| USAB 893 | පූජ්‍ය සංබපාල පඤ්ඤාසාර ථෙර |
| USAB 892 | පූජ්‍ය කොටියාගල උපරත්න ථෙර |
| USAB 1038 | ජී.ජී.ඩී.ඩී. ගුණවර්ධන මයා |
| USAB 1045 | එන්.එච්.ඩී.පී. ෆොන්සේකා මයා |
| USAB 1051 | මහාචාර්ය ගංගාණි සමරවීර මිය |
| USAB 1067 | උදේශ් ධර්මසිරි මයා |
| USAB 1079 | වරුණ ප්‍රියංකර මයා |
| USAB 1085 | ආචාර්ය විදුර විතාන මයා |

තවද, 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් මත සිදු කළ ප්‍රාග්ධන බැඳීම්වල වටිනාකම රු. මිලියන 33.95 කි.

### 2.4.4 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

නිර්වචිත ප්‍රතිලාභ සැලැසම් යනු නිර්වචිත දායකත්ව සැලැස්මක් හැරුණු විට පශ්චාත් රැකියා නියුක්තික ප්‍රතිලාභ සැලැස්මකි. ඒ අනුව 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන යටතේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලබන අතර ආයුගණකව තක්සේරු නොකරයි. 2019 ජූනි 04 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 05/0219 චක්‍රලේඛය අනුව කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන අධ්‍යයන දීමනාව සහ මාසික හානිපූරක දීමනාව, 1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව 2019 ජූනි 01 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල සහ අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා පාරිතෝෂික ගණනය කිරීමේදී සලකා බලනු ලැබේ.

| විස්තරය | මුදල<br>මිලියන (රු.) |
|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | **1,594.39** |
| වර්ෂය තුළ සලසන ලද ප්‍රතිපාදනය | 154.96 |
| වර්ෂය තුළ සිදු කළ ගෙවීම් | (97.56) |
| **වර්ෂය අවසානයේදී ශේෂය** | **1,651.79** |

### 2.4.5 නිර්වචිත දායකත්ව සැලැස්ම - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

නිර්වචිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එහිදී අස්තිත්වයක් ස්ථිර දායක මුදලක් වෙනම අස්තිත්වයක් වෙත ගෙවන අතර තවත් වැඩිපුර මුදලක් ගෙවීම සඳහා නෛතික හෝ සම්මුතික බැඳීමක් නොමැත. නිර්වචිත දායකත්ව සැලසුම් සඳහා බැඳීම් ඒවා ලැබීමට නියමිත විටදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

අදාළ ව්‍යවස්ථාපිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව සේවකයන් ‘විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල’, සේවක භාරකාර අරමුදලේ දායකත්ව මුදල් සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සුදුසුකම් ලබයි. ඒවා දැරූ විටදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. සේවකයන්ගේ දළ පඩිනඩිවලින් 8%, 3%, සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක, විශ්වවිද්‍යාල භාරකාර අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල වෙත විශ්වවිද්‍යාලය පිළිවෙළින් දායක කරයි.

## 2.5 පරිසීමිත අරමුදල් සහ ප්‍රදාන

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන/පරිත්‍යාග ලැබුණු විටදී, එවැනි අරමුදල් පරිසීමිත අරමුදල ගිණුමක රඳවා ගනු ලබන අතර භාවිතයට නොගත් අරමුදල් ඒවායේ අදාළ අරමුදල් ගිණුම්වල රඳවාගෙන ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතට ඇතුලත් කරනු ලැබේ. එවැනි අනුමත ප්‍රදානයක වියදම ලැබුණු ආදායම ඉක්මවා යන විටදී සහ ශේෂය ලැබෙන බවට නියතතාවක් ඇති විටදී, එම මුදල් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු දෑ ලෙස හඳුනාගනු ලබයි.

## 2.6 නම්කළ අරමුදල්

පාලන මණ්ඩලයේ අනුමතිය ඇතිව යම් විශේෂිත කාර්යයක් සඳහා විශ්වවිද්‍යාලය විසින් නම්කළ යම් අරමුදලක් නම්කළ අරමුදලක් ලෙස හඳුනාගනු ලැබේ. අභාවිත අරමුදල් අදාළ අරමුදල් ගිණුම්වල රඳවා ගනු ලබන අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතට ඇතුලත් කරනු ලැබේ.

## 2.7 පරිත්‍යාග අරමුදල්

පරිත්‍යාගයක් ලෙස වත්කම් ලැබෙන විටදී, එවැනි වත්කම්වලින් උපයන ආදායම් පමණක් හඳුනාගැනීමට සහ ආදායමක් ලෙස භාවිතා කිරීමට ඉඩ ඇත. ඉහත එක් එක් කාණ්ඩ යටතේ පවතින අරමුදල්වලින් උපලබ්ධි වන අයෝජන ආදායම සහ

අනෙකුත් ප්‍රතිලාභ, අදාළ ගිවිසුම් හෝ කාර්යසටහන්වලින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, උචිත අරමුදල්වලට වෙන්කරනු ලැබේ.

තැන්පතු යටතේ රඳවා ගන්නා රන් පදක්කම් සහ ශිෂ්‍යත්ව වැනි පරිත්‍යාග අරමුදල් ප්‍රතිවර්ගීකරණය කොට සමුච්චිත අරමුදල් සහ සංචිත යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පරිත්‍යාග අරමුදල් යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

## 2.8 උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ප්‍රදානය

ප්‍රමුඛ ශික්ෂාවන් සඳහා බඳවාගැනීම් පුළුල් කිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව ඉහළ නැංවීම සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ මෙහෙයුම (AHEAD) ශ්‍රී ලංකා රජය සඳහා ලෝක බැංකුව අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වනුයේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මෙහෙයුම් අධීක්ෂණ සහ උපකාරක කණ්ඩායම විශ්වවිද්‍යාල තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරයි.

ඉහත ව්‍යාපෘතිය රුහුණ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS) හරහා වෙනමම ක්‍රියාත්මක කරනු ලබන බැවින්, AHEAD මෙහෙයුම්වල ප්‍රදාන ලැබීම් සහ වියදම් මූල්‍ය ප්‍රකාශනයේ අන්තර්ගත කර නොමැත. කෙසේ වෙතත් දේපළ, පිරියත හා උපකරණ, නිමා කරන ලද ඉදිකිරීම් වැඩ සහ මානව ප්‍රාග්ධන සංවර්ධන වියදම් ඇතුළුව මෙම ප්‍රදානය හරහා අත්කර ගත් ප්‍රාග්ධන වත්කම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලත් ආදායම ලෙස හඳුනා ගනු ලබන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය) යටතේ දක්වනු ලැබේ.

2018 සිට 2023 දක්වා කාලසීමාව තුළ, AHEAD ව්‍යාපෘතිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයට ප්‍රදාන කිහිපයක් පිරි නමා ඇති අතර අවසන් වූ වර්ෂය සඳහා එක් එක් උප වැඩසටහනේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

| ප්‍රදාන විස්තරය | පීඨය/අධ්‍යයනාංශය | අනුමත ප්‍රදානය (රු.) | 2023.12.31 දක්වා නිකුත් කරන ලද අත් මුදල් | 2023.12.31 දක්වා සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| STEM ව්‍යාප්තිය- දේශන ශාලාව ඉදිකිරීම ගොඩනැගිලි සංකීර්ණය, තාක්ෂණ පීඨය | | 390.00 | 392.54 | 391.42 |
| STEM ව්‍යාප්තිය උපකරණ (01,02 සහ 03 වටය) | වෛද්‍ය<br>තාක්ෂණවේදය<br>ඉංජිනේරු | 90.00<br>148.90<br>90.00 | 324.41 | 327.74 |
| HRD ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය | ආචාර්ය උපාධිධාරී විද්‍යාර්ථීන් (අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 14) | 113.06 | 85.535 | 90.035 |
| ELTA – ELSE පීඨ සංවර්ධන ව්‍යාපෘතිය | විද්‍යා<br>කළමනාකරණ<br>රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය | 120.00<br>120.00<br>18.00 | 237.86 | 117.48<br>120<br>16.60 |
| ELTA – ELSE අධ්‍යයනාංශ සංවර්ධන ව්‍යාපෘතිය | කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශය<br>රසායන විද්‍යා අධ්‍යයනාංශය<br>භූගෝල අධ්‍යයනාංශය | 18.00<br>18.00<br>18.00 | 50.51 | 14.83<br>17.11<br>16.40 |
| විශ්වවිද්‍යාල ව්‍යාපාරික සබැඳිය | තාක්ෂණික පැවරුම් කාර්යාලය | 18.00 | 7.611 | 11.786 |
| නව්‍යකරණ වාණිජකරණ අභිවර්ධනය | භෞතික වද්‍යා අධ්‍යයනාංශය | 40.00 | 38.24 | 39.77 |
| පර්යේෂණ, නව්‍යකරණය සහ වාණිජකරණය | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය<br>රසායන විද්‍යා අධ්‍යයනාංශය | 35.00<br>40.00 | 28.94<br>34.11 | 29.00<br>35.01 |
| සංවර්ධන දිශානත පර්යේෂණ | රසායන විද්‍යා අධ්‍යයනාංශය<br>උද්භිද විද්‍යා අධ්‍යයනාංශය, | 40.00<br>40.00 | 108.73 | 37.67<br>39.49 |

| | | | | |
|---|---|---|---|---|
| | ජෛව රසායන අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය | 35.00 | | 34.93 |
| OTS කාර්යමණ්ඩල වැටුප් | | අදාළ නොවේ | 20.837 | 20.837 |
| ලැබීමට නියමිත ප්‍රදාන | | | 30.685 | |
| **මුළු එකතුව** | | **1,388.96** | **1.227.38** | **1,360.108** |

*STEM - විද්‍යාව, තාක්ෂණවේදය,ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය
ELTA- ELSE - ඉගෙනුම් අභිවර්ධනය, ඉගැන්වීම් ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා නිපුණතා අභිවර්ධනය

### 2.9 ආදායම හඳුනාගැනීම

වර්ෂය තුළ විශ්වවිද්‍යාලය වෙත ලැබුණු සහ ලැබිය යුතු ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයේ දළ ගලා ඒම්වලින් ආදායම සමන්විත වන අතර ශුද්ධ වත්කම්/ස්කන්ධවල වැඩිවීමක් නිරූපණය කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 10හි (හුවමාරු ගනුදෙනුවලින් ආදායම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 11හි (හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම) නිර්ණායක අනුගමනය කරමින් විශ්වවිද්‍යාලය ආදායම හඳුනා ගනියි.

#### 2.9.1 හුවමාරු ගනුදෙනුවලින් ආදායම

#### (අ) උපාධි අපේක්ෂක සහ වෙනත් අභ්‍යන්තර ආදායම

උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වලින් ව්‍යුත්පන්න සියලු ආදායම් සහ වෙනත් අභ්‍යන්තර ආදායම් මුදල් පදනමකින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

#### (ආ) ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වලින් උත්පාදිත අරමුදල්

උපදේශන, පශ්චාත් උපාධි ඉගැන්වීම් පාඨමාලා, බාහිර උපාධි වැඩසටහන්, පරීක්ෂා කිරීම් ආදිය ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම් වන අතර වියදම පමණක් ආපසු අයකර ගැනීමේ හා ලාභාර්ථී නොවන පදනමින් සිදු කරනු ලැබේ. ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වල සංවර්ධන වැය ශීර්ෂ සඳහා ආදායම, වියදම හා දායක මුදල් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ 26 වැනි සටහන යටතේ හෙළිදරව් කර ඇත.

කාල පරිච්ඡේදය සඳහා දරන ලද වියදම් සහ අනාගත වියදම්වල ප්‍රමාණයට ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වල ආදායම හඳුනාගනු ලබන අතර සංවර්ධන වැය ශීර්ෂ සඳහා දායකත්වය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත ආදායම යටතේ පෙන්නුම් කෙරේ.

#### (ඇ) පොළී ආදායම

වියදම සඳහා ලබා දුන් මුදල් ප්‍රමාණය පමණක් ආදායම ලෙස පෙන්නුම් කරන බාහිරව සීමාකරනු ලැබූ පරිත්‍යාග හා අරමුදල් මත ඉපැයූ ආයෝජන ආදායම් සඳහා හැර අදාළ කාල පරිච්ඡේදය සඳහා ලත් පොළී ආදායම මූල්‍ය ප්‍රකාශනයන්හි ආදායම ලෙස වාර්තා කරනු ලැබේ. ඉපැයූ ආයෝජන ආදායම වියදම සඳහා ලබාදුන් ප්‍රමාණය ඉක්මවන වර්ෂයක් සඳහා එම අතිරික්තය පරිත්‍යාග හෝ පරිසීමිත අරමුදල්වල ඍජු වැඩිවීමක් සේ වාර්තා කරනු ලැබේ.

රන් පදක්කම් හා ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන මත පොළිය ගිණුම්කරණ කාලසීමාව තුළ කල් නොපිරුණහොත් උපචිත පදනමින් ගිණුම්ගත කරනු ලැබේ.

#### (ඈ) කුලී ආදායම

විශ්වවිද්‍යාල වත්කම් කුලියට දීමෙන් ලැබෙන කුලී ආදායම කුලී කාලය තුළ සරල රේඛීය ක්‍රමය මත ගිණුම්ගත කරන අතර ආදායමට ඇතුලත් කරනු ලැබේ.

### (ඉ) කෘෂිකර්ම ගොවිපොළෙන් ආදායම

මාපලාන කෘෂිකර්ම ගොවිපොළ ආශ්‍රිත ආදායම හා වියදම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන 27 යටතේ වෙනම හඳුනාගනු ලැබේ.

## 2.9.2 හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අය භාර

හුවමාරු නොවන ගනුදෙනු යනු හුවමාරුවේදී ආසන්න වශයෙන් සමාන වටිනාකමක් ලබා නොදී වෙනත් අස්තිත්වයකින් (උදා: මුදල් හෝ වෙනත් වත්කම්) විශ්වවිද්‍යාලය වෙත වටිනාකමක් ලැබෙන ඒවා වේ.

වත්කමක නිර්වචනය සපුරාලන භාණ්ඩවලින් ලැබෙන සේවාවන් හැර හුවමාරු නොවන ගනුදෙනුවලින් සම්පත් ගලා ඒම වතකමක් ලෙස පිළිගනු ලබන්නේ:

- විශ්වවිද්‍යාලයට ආර්ථික ප්‍රතිලාභයක් හෝ සේවා විභවයක් ලැබීමට ඉඩ ඇති විටදී; සහ
- සාධාරණ වටිනාකම විශ්වසනීයව මැණිය හැකි විටදී පමණි.

වත්කම් ලෙස හඳුනාගනු ලබන හුවමාරු නොවන අය භාරවලින් සම්පත් ගලාඒම, එම ගලා ඒමට අදාළව බැරකමක් හඳුනා නොගන්නා ප්‍රමාණයට හුවමාරු නොවන අය භාර ලෙස හඳුනාගනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ හුවමාරු නොවන ගනුදෙනුවලට අදාළව නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායක පහත දැක්වෙන පරිදි වේ.

### (අ) රජයේ ප්‍රදාන/පැවැරුම්

රජයේ ප්‍රදානවලින් පැන නගින වත්කම් හා අය භාර සාධාරණ වටිනාකමට හුවමාරු පැවැරුම් අනුගම්‍ය වන කාල සීමාව තුළ හඳුනාගනු ලැබේ. පැවැරුමක් කොන්දේසිවලට යටත් වන විටදී සහ හුවමාරු නොවන ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් පැන නගින විටදී, කොන්දේසිය සපුරාලන තුරු විශ්වවිද්‍යාලය බැරකමක් හඳුනා ගනියි.

රජයේ ප්‍රදානවලින් පැන නගින වත්කම් හා අය භාර හඳුනාගැනීමේ දිනයට සාධාරණ වටිනාකමට මණිනු ලැබේ. මූල්‍ය වත්කම් ඒවායේ නාමික වටිනාකමට මණිනු ලැබේ.

### (ආ) පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ස්වරූපයේ අය භාර සඳහා ලැබෙන රජයේ ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනු යටතේ හඳුනාගනු ලැබේ.

2023 වසර සඳහා පුනරාවර්තන ප්‍රදාන ලෙස රු. මිලියන 4,430 ක රජයේ ප්‍රදාන ලැබුණි.

| විස්තරය | මුදල (රු) මිලියන |
|---|---|
| අනුමත පුනරාවර්තන අයවැය | 4,683 |
| **වසර සඳහා නිකුත් කරන ලද අත් මුදල්** | **4,406** |
| පුද්ගල පඩිනඩි | 3,906 |
| අනෙකුත් පුනරාවර්තන | 500 |

### (ඇ) ප්‍රාග්ධන නියත ප්‍රදාන සහ අනෙකුත් පැවැරුම්

ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන සහ අනෙකුත් ප්‍රාග්ධන පැවැරුම් 2020 මූල්‍ය වර්ෂයේ සිට බල පැවැත්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11- හුවමාරු නොවන ගනුදෙනුවල අය භාර ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. ප්‍රාග්ධන ගනුදෙනුවලින් පැන නගින ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය) සමුච්චිත අරමුදල- මූල්‍ය ප්‍රකාශනයේ ඇති ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ.

### 2.9.3 සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට ප්‍රතිවර්ගීකරණය කිරීම

2020 වසරේ සිටබල පැවැත්වෙන පරිදි විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11- 'හුවමාරු නොවන ගනුදෙනුවල අය භාර' පිළි ගෙන ආදේශ කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම සුසංගත කිරීම පිණිස, වැය කළ ප්‍රාග්ධන ප්‍රදානය, වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදානය සහ ත්‍යාග සර පරිත්‍යාගවලට අදාළ සංසන්දනාත්මක සංඛ්‍යා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව "සමුච්චිත අතිරික්ත ප්‍රාග්ධනය" බවට ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

වර්ෂය සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවල සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | 2023 (රු) මිලියන |
|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රාග්ධනය | 250.00 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය-<br>12 මහල් ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය<br>වෛද්‍ය පීඨය | 174.48 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය-<br>දස මහල් ගොඩනැගිලි සංකීර්ණය ,වෛද්‍ය | 311.34 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය-<br>දක්ෂිණ මධ්‍යස්ථානය සඳහා ප්‍රදානය<br>ඉංජිනේරු පීඨය | 169.92 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය-<br>සම සෞඛ්‍ය විද්‍යා පීඨ සංකීර්ණය | 312.67 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය-<br>නාවුක උපකරණ | 90.37 |
| AHEAD ව්‍යාපෘතිය (අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම් ප්‍රදානය) | 226.2 |
| **මුළු ප්‍රාග්ධන ප්‍රදානය** | **1,535.01** |

### 2.9.4 ත්‍යාග, පරිත්‍යාග සහ ද්‍රව්‍ය ලෙස ලැබුණු භාණ්ඩ

ත්‍යාග සහ පරිත්‍යාග කොන්දේසිවලින් තොරව විශ්වවිද්‍යාලයට ලැබුණු මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් සහ භාණ්ඩ සහ සේවා ඇතුළුව ස්වේච්ඡා පැවරුම් වේ.

අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය විශ්වවිද්‍යාලය වෙත ගලා ඒමට ඉඩ ඇති විටදී සහ වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැනිය හැකි විටදී, ලැබුණු ත්‍යාග සහ පරිත්‍යාග සහ භාණ්ඩ සහ සේවා ඒවායේ සාධාරණ වටිනාකමට හුවමාරු නොවන අය භාර ලෙස හඳුනාගනු ලැබේ.
වර්ෂය තුළදී පහත දැක්වෙන ත්‍යාග හා පරිත්‍යාග ලැබුණි.

| ප්‍රදායක | සාධාරණ වටිනාකම (රු.) මිලියන |
|---|---|
| මහජනතාවගෙන් සහ ප්‍රජාවෙන් (දේශීය ප්‍රදාන) | 1.68 |
| AHEAD ව්‍යාපෘතිය | 133.47 |
| **මුළු ත්‍යාග සහ පරිත්‍යාග** | **135.15** |

## 2.10 වියදම හඳුනා ගැනීම

වැඩසටහන/ව්‍යාපෘතිය/අරමුණ අනුව වියදම විශ්ලේෂණය කර ඇති අතර ඒවා දරන ලද කාල සීමාව තුළ පොදු වාර්තාකරණ ආකෘතිය සමග අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මත පදනම්ව විවිධ වැය ශීර්ෂ යටතේ වර්ගීකරණය කරනු ලැබේ. උපාධි අපේක්ෂක අධ්‍යාපනයට අදාළව දරන ලද සියලු වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබ ඇති අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට වැය බරක් සේ දක්වනු ලැබේ.

වර්ෂය තුළදී, රු. මිලියන 187.99 ක වටිනාකමින් යුක්ත වූ මහපොළ ශිෂ්‍යාධාර මහපොළ භාරකාර අරමුදල සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සෘජුවම උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් වෙත ගෙවන ලදී. විශ්වවිද්‍යාලය සෘජුවම මෙම

ගනුදෙණුව සඳහා මැදිහත් නොවූ බැවින්, රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්ට ගෙවනු ලැබූ මහපොළ ශිෂ්‍යාධාර වටිනාකම, 2023 දෙසැම්බර් 31න් අවසන් වූ මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොමැත.

## 2.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කර ඇත.

## 2.12 වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්වල ප්‍රමාණාත්මකබව සලකා බලනු ලැබ ඇති අතර යෝග්‍ය තැන්හිදී, ගිණුම්වල ගැලපීම් සිදුකර ඇත.

## 2.13 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් ගනුදෙනු ව්‍යවහාර මුදල්, ගනුදෙනුවල දිනයේදී පැවැති තත්‍ය අනුපාතයන්ට ඉතා ආසන්න අනුපාත අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

ආදායම් උත්පාදනය පිණිස සහ පරිසීමිත අරමුදල් ගිණුම් මෙහෙයවීම පිණිස විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන සියලු විදේශීය මුදල් බැංකු ගිණුම් මුදල් වර්ෂය අවසානයේදී ප්‍රත්‍යාගණනය කළ අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 05 ප්‍රකාරව විනිමය ලාභ සහ අලාභ හඳුනාගෙන ඇත.

පරිසීමිත අරමුදල් මෙහෙයවීම පිණිස පවත්වාගෙන යනු ලබන විදේශීය බැංකු ගිණුම්වලින් මතුවන විනිමය ලාභ හෝ අලාභ අදාළ අරමුදල් ගිණුම්වලට සෘජුවම වැය බරක් වන අතර අනෙකුත් ලාභ සහ අලාභ ලාභාලාභ ගිණුමවට වැය බරක් වේ.

## 2.14 අන්තර් අංශ ගනුදෙනු

අන්තර් අංශ ගනුදෙනු සහ නොපියවා ඇති ශේෂ ඉවත් කිරීම මගින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. පහත දැක්වෙන අන්තර් අංශ ශේෂ ඉවත් කරනු ලැබීය. පීඨවලින් ලැබිය යුතු රු. මිලියන 8 ක ශේෂය සහ ගෙවිය යුතු මුදල් ප්‍රමාණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් ඉවත් කරනු ලැබීය.

## 2.15 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් වනුයේ විශ්වවිද්‍යාල පාලන මණ්ඩලයේ සාමාජිකයන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව පිරිස් වේ. උප කුලපති, නියෝජ්‍ය උප කුලපති සහ පීඨවල පීඨාධිපතිවරු, සනාතන සභාව විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන බාහිර සාමාජිකයන්ගෙන් සමන්විත විශ්වවිද්‍යාල පාලන සභාව විශ්වවිද්‍යාලයේ විධායක ආයතනය සහ පාලන අධිකාරිය වේ.

සෘජු හෝ වක්‍ර බැඳියා සහිත ප්‍රධාන කළමනාකරණ පිරිස්වල කවර හෝ සාමාජිකයකු විශ්වවිද්‍යාලය සමග ගිවිසුම්වලට එළඹ නොමැති අතර විකුණුම්, මිලදී ගැනීම්, ණය, පැවරුම්, කල්බදු සැකසුම්, ඇප සහ කාල සීමාව තුළ සපයනු ලැබූ සේවා සඳහා සේවක පාරිශ්‍රමික සහ දීමනා හැර සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු හෝ වෙත ගෙවිය යුතු මුදල් ඇතුළුව සම්බන්ධිත පාර්ශව සමග කිසිදු ගනුදෙනුවක් සිදුව නොමැත.

## 2.16 අයවැය සහ තත්‍ය මුදල් ප්‍රමාණ සංසන්දනය

අයවැය සහ ගිණුම්කරණ පදනම වෙනස් වේ. විශ්වවිද්‍යාල සඳහා අයවැය වාර්ෂිකව මුදල් පදනමින් අනුමත කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් විශ්වවිද්‍යාලයේ සියලු මූල්‍ය ක්‍රියාකාරකම් ආවරණය වන නමුත් අයවැය අනුමත කරනුයේ රජයේ ප්‍රදානය සඳහා පමණි. අයවැය සහ තථ්‍ය මුදල් ප්‍රමාණ සංසන්දනය කිරීමේ ප්‍රකාශනය අනුරූපී අයවැයගත මුදල් ප්‍රමාණ ගණනය කරනු ලැබූ පදනමින්ම තථ්‍ය මුදල් ප්‍රමාණ අවසාන අයවැයට සංසන්දනය කරයි.

රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

අංක 03: මුදල් හා මුදල් සමාන දෑ

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| **භාණ්ඩාගාර හා පොදු අරමුදල්** | | |
| පුනරාවර්තන - මහජන බැංකුව -032100112477589 | 5,541,413 | 32,130,104 |
| ප්‍රාග්ධන- මහජන බැංකුව 032100192477590 | 197,960,872 | 45,454,632 |
| පුනරාවර්තන - ලංකා බැංකුව -0003695757 | 84,641 | 564,154 |
| කෘෂිකර්ම පීඨය - මහජන බැංකුව -133100160000029 | 367,134 | 8,856,911 |
| ඉංජිනේරු පීඨය - මහජන බැංකුව -169100121871753 | 564,587 | 258,496 |
| වෛද්‍ය පීඨය - මහජන බැංකුව -343100121924633 | 2,748,725 | 1,793,383 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය - මහජන බැංකුව -343100170011983 | 145,162 | 373,826 |
| තාක්ෂණ පීඨය - මහජන බැංකුව -133100140070650 | 337,054 | 12,620,994 |
| **පරිසීමිත අරමුදල් හා සංචිත** | | |
| බාහිර විභාග ගිණුම - මහජන බැංකුව -032100112477594 | 6,178,186 | 16,307,729 |
| පශ්චාත් උපාධි පාඨමාලාව මහජන බැංකුව - 032100160036374 | 7,491,300 | 18,398,446 |
| නෝහෙඩ්-CPDS ව්‍යාපෘතිය - මහජන බැංකුව - 032100190042806 | 101,089 | 101,089 |
| චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ අධ්‍යාපනය - මහජන බැංකුව - 032100110042952 | 8,142,975 | 13,231,501 |
| බැඳුම්කර හා ගිවිසුම්කර උල්ලංඝනය - මහජන බැංකුව - 032100150043049 | 2,189,253 | 3,970,333 |
| නෝහෙඩ්-දේශගුණික වෙනස්වීම් - මහජන බැංකුව - 032100100044126 | 1,671,940 | 1,673,426 |
| මුදල් වෙළඳපොළ ඉතුරුම් - මහජන බැංකුව - 032200160049747 | 4,647,730 | 3,527,584 |
| රුහුණු විශ්වවිද්‍යාලය එකතු කිරීමේ ගිණුම - මහජන බැංකුව -032100170050213 | 2,977,376 | 1,051,050 |
| ව්‍යාපෘති හා පර්යේෂණ ප්‍රදානය - මහජන බැංකුව 0032100120055581 | 20,479,884 | 9,438,442 |
| වෛද්‍ය පීඨය- ලංකා බැංකුව-0000402437 | 14,191,824 | 7,085,339 |
| කෘෂිකර්ම පීඨය- ලංකා බැංකුව- 4441897 | 11,316,252 | 21,133,057 |
| ව්‍යාපෘති ගිණුම - ඉංජිනේරු පීඨය - ලංකා බැංකුව - 0085191762 | 12,698,531 | 12,634,042 |
| නේ.වි.ගිණුම - මහජන බැංකුව -032402142780602 | 946,311 | 46,846,978 |
| BRIATE ව්‍යාපෘතිය - යූරෝ ගිණුම - ලංකා බැංකුව - 84869161 | 88,027 | 2,011,139 |
| ත්රී ලංකා ව්යාපෘතිය -යූරෝ ගිණුම-ලංකා බැංකුව | 13,739,477 | 4,069,667 |
| ව්යාපෘති ගිණුම -ස.සෞ.පී- ලංකා බැංකුව - 0088138300 | 1,870,767 | 4,528,556 |
| ලංකා බැංකුව නේ.වි.මු. ගිණුම -FM - 90874112 | 35,430,895 | - |
| තැන්පතු ගිණුම -රුහුණ විශ්වවිද්‍යාලය -032100170065894 | 26,524,056 | - |
| ෆවුන්ටන් යූරෝ ගිණුම (කෘෂි) | 66,327,829 | - |
| කෙටිකාලින ස්ථාවර තැන්පතු - පරිසීමිත අරමුදල් | 25,200,000 | 20,000,000 |
| කෙටිකාලින ස්ථාවර තැන්පතු - CSL-CER චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානය | 34,020,000 | 27,000,000 |
| කෙටිකාලින තැන්පතු - විදේශ මුදල් තැන්පතු | 226,615,102 | 161,623,810 |
| කෙටිකාලින තැන්පතු - රඳවාගැනීම් අරමුදල | - | 42,544,131 |
| කාල තැන්පතු - උපාධි ප්‍රදානෝත්සව ආදායම -2023 | 9,000,000 | - |
| **මුදල් හා මුදල් සමාන දෑ මුළු එකතුව** | **739,598,393** | **519,228,820** |

රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

### සටහන 04: අත්තිකාරම් හා පූර්ව ගෙවීම්

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| තැපැල් අත්තිකාරම් | 169,948 | 164,108 |
| පූර්ව ගෙවීම් තැන්පතු | 610,000 | 1,451,999 |
| පර්යේෂණ අත්තිකාරම් (ඉංජිනේරු) | - | 25,000 |
| පර්යේෂණ අත්තිකාරම් (වැල්ලමඩම) | 250,616 | 2,094,526 |
| විවිධ අත්තිකාරම් (ඉංජිනේරු)) | 5,000 | 834,234 |
| විවිධ අත්තිකාරම් (දූ.අ.අ.ඒ) | - | 168,000 |
| විවිධ අත්තිකාරම් (ස.සෞ.පී.) | - | 11,506 |
| පර්යේෂණ ප්‍රදානයෙන් ගෙවන ලද අත්තිකාරම් | 48,837 | 1,119,469 |
| ව්‍යාපෘති ප්‍රදානයෙන් ගෙවන ලද අත්තිකාරම් | 3,120,003 | 1,228,463 |
| විදේශ ආන්තික ගිණුම - මහජන බැංකුව | 5,164 | 5,164 |
| ස්ථාවර වත්කම් සඳහා ආරක්ෂිත තැන්පතුව | 2,533,550 | 1,817,800 |
| විදේශ ගමන් අත්තිකාරම් | - | 188,250 |
| **අත්තිකාරම් හා පූර්ව ගෙවීම් මුළු එකතුව** | **6,743,117** | **9,108,519** |

### සටහන 05: කාර්ය මණ්ඩලය වෙත ණය හා අත්තිකාරම්

| නම<br>දෙසැම්බර් 31 දිනට | වසරක් තුළ අයකර ගත හැකි | වසරකට වැඩි කාලයක් තුළ අයකර ගත හැකි | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|---|---|
| පරිගණක ණය | 15,000 | 18,000 | 33,000 | 45,000.00 |
| ආපදා ණය | 17,104,914 | 38,281,451 | 55,386,365 | 63,858,113 |
| කාර්යමණ්ඩල ණය | 220,490 | 523,748 | 744,238 | 517,628 |
| වාහන ණය | 8,350 | 22,385 | 30,735 | 49,755 |
| උත්සව අත්තිකාරම් | 181,850 | - | 181,850 | 201,290 |
| වැටුප් අත්තිකාරම් (වැල්ලමඩම) | 20,200 | - | 20,200 | 1,375,200 |
| වැටුප් අත්තිකාරම් (ඉංජිනේරු) | - | - | - | 102,490 |
| විශේෂ අත්තිකාරම් (වැල්ලමඩම) | 33,450 | - | 33,450 | 30,250 |
| UPFA වෙතින් අයකර ගැනීමට නියමිත මුදල් | 1,911,548 | - | 1,911,548 | 2,123,353 |
| | **19,495,802** | **38,845,584** | **58,341,387** | **68,303,080** |

රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

### සටහන 06: ප්‍රාග්ධන අත්තිකාරම්

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| ප්‍රාග්ධන අත්තිකාරම | - | 141,242 |
| **ප්‍රාග්ධන අත්තිකාරම් එකතුව** | **-** | **141,242** |

### සටහන 07: වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වලින් ලැබිය යුතු දෑ | 478,400 | 212,600 |
| වි.ප්‍ර.කො. ස. සහ වෙනත් මූලාශ්‍රවලින් ලැබිය යුතු දෑ | 169,829,620 | 296,633,892 |
| ශිෂ්‍යත්වකර උල්ලංඝනය කිරීම්වලින් ලැබිය යුතු දෑ | 154,666,597 | 84,317,542 |
| ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු දෑ ( ඉංජිනේරු-කොවිඩ් අරමුදල ) | | 1,202,807 |
| වාහන රක්ෂණය -ලැබියයුතු හිමිකම් | 39,300 | 39,300 |
| **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ මුළු එකතුව** | **325,729,149** | **382,406,140** |

### සටහන 08 : තොග භාණ්ඩ

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| ප්‍රධාන ගබඩාව (වැල්ලමඩම) | 21,745,023 | 24,615,269 |
| උප ගබඩා (වෛද්‍ය) | 10,749,418 | 8,327,910 |
| උප ගබඩා (කෘෂිකර්ම) | 2,245,927 | 2,326,335 |
| පශු සම්පත් (කෘෂිකර්ම - ගොවිපොළ ) | 1,805,239 | 1,810,742 |
| උප ගබඩා (ඉංජිනේරු) | 1,754,382 | 1,589,788 |
| අස්වනු තොග (කෘෂිකර්ම - ගොවිපොළ) | 117,030 | 279,606 |
| නඩත්තු තොග ( වැල්ලමඩම ) | 6,265,037 | 4,323,289 |
| ගොවිපොළ තොග (කෘෂිකර්මය) | 679,450 | 840,717 |
| ඖෂධ තොග (වෛද්‍ය මධ්‍යස්ථානය, වැල්ලමඩම) | 227,406 | 1,101,793 |
| ඖෂධ තොග (වෛද්‍ය මධ්‍යස්ථානය, කෘෂිකර්ම) | 65,526 | 319,427 |
| ඖෂධ තොග (වෛද්‍ය මධ්‍යස්ථානය ඉංජිනේරු) | 145,615 | 31,218 |
| **මුළු තොග භාණ්ඩ** | **45,800,052** | **45,566,093** |

### රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
### 2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා
### සටහන 09 : දේපළ, පිරියත හා උපකරණ
(සංඛ්‍යා දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි )
### දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය

| වත්කම් | 2023/01/01 දිනට පිරිවැය | පෙර වසරේ ගැලපුම | වසර තුළ එකතුකිරීම්/ ප්‍රත්‍යාගණන | වසර තුළ බැහැර කිරීම් | 2023/12/31 දිනට පිරිවැය |
|---|---|---|---|---|---|
| ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | 1,679,720,054 | | | | **1,679,720,054** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 9,542,069,501 | | 1,119,401,927 | | **10,661,471,428** |
| ගෘහභාණ්ඩ හා සවිකුරු | 518,741,434 | 4,110,517 | 38,882,404 | | **561,734,356** |
| විදුලිය සැපයුම | 61,506,772 | 7,100,921 | 2,586,896 | | **71,194,589** |
| ජල සැපයුම් යෝජනා ක්‍රමය | 8,425,417 | | | | **8,425,417** |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 230,031,957 | 25,890,484 | 40,545,486 | | **296,467,928** |
| කාර්යාල උපකරණ | 676,302,806 | 1,878,171 | 21,520,396 | | **699,701,374** |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 430,933,162 | | 6,935,787 | (30,110) | **437,838,839** |
| මෝටර් රථවාහන | 120,839,600 | | | | **120,839,600** |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 1,730,122,585 | 29,545,155 | 126,446,841 | | **1,886,114,581** |
| උපාධි ලෝගු හා උපාංග | 11,259,040 | | 4,933,900 | | **16,192,940** |
| දුරකථන හුවමාරුව | 5,804,982 | | | | **5,804,982** |
| ක්‍රීඩා උපකරණ | 51,352,710 | | 2,115,329 | | **53,468,040** |
| පරිගණක හා උපාංග | 796,231,180 | 6,613,513 | 103,393,023 | | **906,237,717** |
| නේවාසිකාගාර උපකරණ | 106,514,505 | | | | **106,514,505** |
| **මුළු පිරිවැය** | **15,969,855,706** | **75,138,762** | **1,466,761,990** | **(30,110)** | **17,511,726,349** |

### දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම

| වත්කම් | 2023/01/01 දිනට සමුච්චිත ක්ෂය | පෙර වසරේ ගැලපුම | වර්ෂය සඳහා ක්ෂය | අපහරණය/ප්‍රත්‍යාගණන ගැලපුම | 2023/12/31 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|---|---|---|
| ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | - | - | | - | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 3,777,481,272 | 17,089,897 | 522,886,713 | | **4,317,457,882** |
| ගෘහභාණ්ඩ හා සවිකුරු | 251,254,143 | 4,311,583 | 47,924,369 | | **303,490,095** |
| විදුලිය සැපයුම | 33,761,546 | 1,892,403 | 5,665,349 | | **41,319,298** |
| ජල සැපයුම් යෝජනා ක්‍රමය | 5,114,043 | | 720,579 | | **5,834,622** |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 126,985,198 | 26,927,161 | 38,305,860 | | **192,218,219** |
| කාර්යාල උපකරණ | 628,714,588 | 3,401,799 | 19,991,298 | | **652,107,686** |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 420,179,037 | | 4,673,538 | (30,110) | **424,822,465** |
| මෝටර් රථවාහන | 57,119,780 | | 24,123,120 | | **81,242,900** |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 1,380,174,200 | 45,997,855 | 92,554,882 | | **1,518,726,936** |

| වත්කම් | 2023/01/01 දිනට පිරිවැය | පෙර වසරේ ගැලපුම | වසර තුළ එකතුකිරීම්/ ප්‍රත්‍යාගණන | වසර තුළ බැහැර කිරීම් | 2023/12/31 දිනට පිරිවැය |
|---|---|---|---|---|---|
| උපාධි ලෝගු හා උපාංග | 10,608,984 | | 515,058 | | **11,124,042** |
| දුරකථන හුවමාරුව | 5,173,404 | | 99,046 | | **5,272,450** |
| ක්‍රීඩා උපකරණ | 39,531,481 | 4,483,516 | 5,605,059 | | **49,620,056** |
| පරිගණක හා උපාංග | 550,879,572 | 27,263,884 | 96,565,238 | | **674,708,694** |
| නේවාසිකාගාර උපකරණ | 101,589,645 | | 1,856,929 | | **103,446,574** |
| **මුළු ක්ෂයවීම** | **7,388,566,892** | **131,368,099** | **861,487,037** | **(30,110)** | **8,381,391,918** |

## ධාරණ වටිනාකම

| වත්කම් | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | 1,679,720,054 | **1,679,720,054** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 6,344,013,546 | **5,764,588,229** |
| ගෘහභාණ්ඩ හා සවිකුරු | 258,244,260 | **267,487,291** |
| විදුලිය සැපයුම | 29,875,291 | **27,745,226** |
| ජල සැපයුම් යෝජනා ක්‍රමය | 2,590,796 | **3,311,374** |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 104,249,709 | **103,046,760** |
| කාර්යාල උපකරණ | 47,593,688 | **47,588,218** |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 13,016,374 | **10,754,124** |
| මෝටර් රථවාහන | 39,596,700 | **63,719,820** |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 367,387,645 | **349,948,385** |
| උපාධි ලෝගු හා උපාංග | 5,068,898 | **650,057** |
| දුරකථන හුවමාරුව | 532,532 | **631,578** |
| ක්‍රීඩා උපකරණ | 3,847,984 | **11,821,229** |
| පරිගණක හා උපාංග | 231,529,022 | **245,351,608** |
| නේවාසිකාගාර උපකරණ | 3,067,931 | **4,924,860** |
| **මුළු ධාරණ වටිනාකම** | **9,130,334,431** | **8,581,288,814** |

රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

### සටහන 10.1 : නොනිමි වැඩ - ඉදිකිරීම් කොන්ත්‍රාත්තු

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| කාල පර්ච්ඡේදය ආරම්භයේ නොනිමි වැඩ | 3,563,541,770 | 2,870,154,656 |
| වසර තුළ ප්‍රාග්ධන වියදම | 1,598,489,923 | 1,432,156,789 |
| වසර තුළ ප්‍රාග්ධනීකෘත ගොඩනැගිලි | (940,632,934) | (738,240,349) |
| පුනරාවර්තන ස්වභාවයේ වියදම්- මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට මාරු කරන ලද | | (529,326) |
| **Work In progress balance at the end of the period** | **4,221,398,758** | **3,563,541,770** |

කාල පර්ච්ඡේදය අවසානයේ නොනිමි වැඩ ශේෂය

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2023 | රු.<br>2022 |
|---|---|---|
| කාල පර්ච්ඡේදය ආරම්භයේ නොනිමි වැඩ | 127,853,854 | 53,230,158 |
| වසර තුළ ප්‍රාග්ධන වියදම | 80,032,984 | 88,084,901 |
| වසර තුළ ප්‍රාග්ධනීකෘත ගොඩනැගිලි | (178,768,993) | (13,442,204) |
| පුනරාවර්තන ස්වභාවයේ වියදම්- මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට මාරු කරන ලද | | (19,000) |
| **කාල පර්ච්ඡේදය අවසානයේ නොනිමි වැඩ ශේෂය** | **29,117,847** | **127,853,854** |

### සටහන 10.3 : නොනිමි වැඩ - විස්තරාත්මක උපල්බනය

| නම<br>දෙසැම්බර් 31 දිනට | Rs.<br>2023 | Rs.<br>2022 |
|---|---|---|
| 12 මහල් සංකීර්ණය (වෛද්‍ය පීඨය ) | 1,015,873,120 | 896,353,471 |
| 10 මහල් මහාචාර්ය සංකීර්ණය (වෛද්‍ය පීඨය ) | 1,174,054,124 | 790,060,922 |
| නාවුක අධ්‍යයන සංකීර්ණය (වෛද්‍ය පීඨය) | - | 467,763,825 |
| ස.සෞ.වි. සංකීර්ණය අදියර I , වලහන්දුව (සම සෞඛ්‍ය පීඨය ) | 1,909,238,129 | 1,241,595,670 |
| ප්‍රධාන ප්‍රතිසංස්කරණ - ජිම්නේසියම | | 106,961,367 |
| ප්‍රධාන ප්‍රතිසංස්කරණ - පරිපාලන ගොඩනැගිල්ල | | 1,898,164 |
| ප්‍රධාන ප්‍රතිසංස්කරණ - තනිකඩ නිල නිවාස | | 2,817,491 |
| ශිෂ්‍ය ආපන ශාලාව - තාක්ෂණික පීඨය | | 56,090,857 |
| පුස්තකාල ගොඩනැගිල්ල - අදියර I | 120,335,220 | - |
| පුනරුත්ථාපන කොන්ත්‍රාත්තු | 29,117,847 | 127,853,857 |
| **2023.12.31 දිනට මුළු නොනිමි වැඩ එකතුව** | **4,250,516,604** | **3,691,395,625** |

# කොටස XIII

# විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } SPCG/MT/D/FS/UOR/23

මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 28 දින

03 JUN 2024
RECEIVED
Office of the Vice - Chancellor

උපකුලපති,

රුහුණ විශ්වවිද්‍යාලය.

රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ජේ.ෆොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. SPCG/MT/D/FS/UOR/23 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 28 දින

උපකුලපති,
රුහුණ විශ්වවිද්‍යාලය.

**රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා සමඟ ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීමේ හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) වැල්ලමඩම පරිශ්‍රයේ සහ කෘෂිකර්ම විද්‍යා පීඨයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඉකුත් වර්ෂ වලදී වැය කරන ලද රු.56,952,897 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ බැවින් දේපළ, පිරියත හා උපකරණ ගිණුම හා සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන) එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂය ගණනය කිරීමේදී රු.145,176,156ක් වූ ගෙවිය යුතු වැට් බදු (VAT) ඇතුළත් නොකිරීම නිසා කොන්ත්‍රාත් ණයහිමි ශේෂය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2020 වර්ෂයේ වැඩිපුර ගෙවන ලද රු.2,726,945ක කාර්ය මණ්ඩල වැටුප් අයවිය යුතු වැටුප් ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට එම ප්‍රමාණය පිළිවෙලින් හර හා බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී එම මුදල බැඳුම්කර කඩකිරීම් අරමුදල් ගිණුම (Bond Violation Account) බැර කර ලැබිය යුතු බැඳුම්කර කඩකිරීම් ගිණුම (Bond Violation Receivable Account) හර කර තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන යටතේ වර්ෂයට අදාල ශිෂ්‍යාධාර රු.77,486,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ ආදායම හා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික රු.2,573,585ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ පාරිතෝෂික වියදම හා පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක ලෙසයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වාර්තාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නියා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික කත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පැවත එන එකතුව රු.36,044,249 ක් වූ තැන්පත් ශේෂයන් 34ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 221/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු.4,611,856,429ක දේපල පිරියත හා උපකරණ සහ රු.27,070,448ක වූ අස්පෘශ්‍ය වත්කම්වලට අදාළව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලය වෙත භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත්වීම මත සැපයුම්කරුවන්ගෙන් අය කරනු ලැබූ ප්‍රමාද ගාස්තු සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත ප්‍රසම්පාදන කමිටුව ආපසු ගෙවීමට තීරණය කිරීමෙන් 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් රු.2,127,306 ක් හා රු.413,454 ක් විශ්වවිද්‍යාල අරමුදලට අහිමි වී තිබුණි.

(ආ) 2019 වර්ෂයේ දී ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය විසින් රු.9,524,500 ක වියදමක් දරා අත්පත් කර ගත් අක්කර 03ක ඉඩම අදාල කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) පර්යේෂණ හා ව්‍යාපෘති සඳහා වෙන්කර ලැබී තිබුණු රු.1,468,463 ක් වසර 04 කට අධික කාලයක සිට උපයෝජනය කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල භූමියේ ඉදිකර තිබුණු දූරකථන කුළුනු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ පාර්ශවයන්ගෙන් අය විය යුතු රු.5,387,070 ක ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එම ශේෂය තුළ 2014 – 2021 වර්ෂ සඳහා රු.1,763,613 ක් ද 2022 වර්ෂය සඳහා රු.1,172,651 ක් සහ 2023 වර්ෂය සඳහා රු.2,450,806 ක් වශයෙන් අයවිය යුතුව පැවතුණි.

(ඉ) සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයෙකු වශයෙන් සේවය කරන ලද රුහුණ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවූ වැටුප් හා දීමනා වලින් රු.1,255,525 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම ආයතනයෙන් අයවිය යුතුව පැවතුණි.

(ඊ) වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුහුණ විශ්වවිද්‍යාලය විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමක් සමඟ එකඟ වූ ගිවිසුම, සමාගමේ දුර්වල කාර්ය සාධනය මත 2020 ජනවාරි 03 අවසන් කර තිබූ අතර ඒ වෙනුවෙන් 2022 නොවැම්බර් 30 දින ලංකා බැංකුවෙන් ලැබුණු රු.42,544,131ක කාර්ය සාධන බැඳුම්කර වටිනාකම එම කර්මාන්තය සඳහා වියදම් නොකර සැපයුම් ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීමේ ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

# 2. විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

<table>
<tr><th colspan="3">රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවාර්තාවෙන් විමසීම් කරන ලද කරුණු සඳහා පිළිතුරු</th></tr>
<tr><th colspan="2">විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ</th><th>විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර</th></tr>
<tr><td>1.</td><td><u>මූල්‍ය ප්‍රකාශන</u></td><td></td></tr>
<tr><td>1.1</td><td><u>තත්ත්වාගණනය කළ මතය</u><br><br>රුහුණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා සමඟ ප්‍රකාශයට පත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීමේ හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.<br><br>මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.</td><td>දැන ගැනීම සඳහා</td></tr>
<tr><td>1.2</td><td>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම<br><br>(අ) වැල්ලමඩම පරිශ්‍රයේ සහ කෘෂිකර්ම විද්‍යා පීඨයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඉකුත් වර්ෂ වලදී වැය කරන ලද රු.56,952,897 ක් ශ්‍රී</td><td>මෙම ව්‍යාපෘතිය සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියෙන් අප විශ්ව විද්‍යාලය විසින් ලිඛිතව කිහිප වරක්ම</td></tr>
</table>

<table>
<tr>
<td></td>
<td>ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 19 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ බැවින් දේපළ, පිරියත හා උපකරණ ගිණුම හා සමුච්චිත අරමුදල (ප්‍රාග්ධන) එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.</td>
<td>අදාළ පිරිවැය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම් කරද මේ වන තෙක් ඔවුන් අදාළ පිරිවැය සහ විස්තර අප වෙත ලබා දීමට කටයුතු කර නොමැත.එබැවින් විගණන විමසුමහි අඩංගු පිරිවැය අගය පදනම් කර ගෙන අදාළ වටිනාකම ගිණුම්වල ගැළපීමට කටයුතු කර ඇත. ගිණුම්ගත කළ ජර්නල් සටහන ඇමුණුම අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත .</td>
</tr>
<tr>
<td></td>
<td>(ආ) කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂය ගණනය කිරීමේදී රු.145,176,156ක් වූ ගෙවිය යුතු වැට් බදු (VAT) ඇතුළත් නොකිරීම නිසා කොන්ත්‍රාත් ණයහිමි ශේෂය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.</td>
<td>මෙම විගණන විමසුමෙන් පෙන්වා ඇති මුලු අගය ඇතුළත් වන්නේ පහත සඳහන් දිගු කාලීන කොන්ත්‍රාත් වල මිල විචලනයන්ට සහ අවසාන බිල්පත සම්බන්ධයෙන් වේ.එය පහත පරිදි දැක්විය හැකිය.
<table>
<tr><th>කර්මාන්තයේ නම</th><th>ගෙවීම් විස්තරය</th><th>බිල්පතහි වටිනාකම</th><th>VAT අගය</th></tr>
<tr><td>වෛද්‍ය පීඨයේ තට්ටු 10 ගොඩනැගිල්ල</td><td>මිල විචලනය</td><td>217,107,902</td><td>39,079,422.36</td></tr>
<tr><td>AHS ගොඩනැගිලි සංකීර්ණය</td><td>මිල විචලනය</td><td>428,468,319</td><td>77,124,297.42</td></tr>
<tr><td>NAVAL ගොඩනැගිල්ල</td><td>මිල විචලනය</td><td>120,697,015</td><td>21,725,462.70</td></tr>
<tr><td>NAVAL ගොඩනැගිල්ල</td><td>අවසාන බිල්පත</td><td>40,260,962</td><td>7,246,973.16</td></tr>
<tr><td colspan="3">මුළු එකතුව</td><td>145,176,155.64</td></tr>
</table>
උක්ත සදහන් වටිනාකමින් 01,02 සහ 03 අගයන් මිල විචලනයට අදාළ වන අතර මෙකී මිල විචලනයන් අදාළ වනුයේ 2022.07.04 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණ පදනම් කොට ගෙන දිගුකාලීන කොන්ත්‍රාත් වල මිල විචලනයන්ට අදාළව වේ. මෙම චක්‍රලේඛණය තුළ එම මිල විචලනයන්ට අදාළ VAT අගයන් පිළිබඳ කිසිදු දැනුම් දීමක් සිදුකර නොමැති අතර</td>
</tr>
</table>

මිල විචලනයන් ද පහත පෙරසැරි (Process) අනුව අනුමත විය යුතුය.

(I) තාක්ෂණික ඇගයීම් කමිටු (TEC )නිර්දේශය
(II) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC)නිර්දේශය හා අනුමැතිය
(III) අවසානයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු (MPC) නිර්දේශය සහ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් අදාළ අනුමැතිය ලැබේ.

ඒ අනුව ඉහත කොන්ත්‍රාත් තුනෙහි අනුමැතිය ලැබී ඇත්තේ පහත පරිදි වේ.

| <u>කර්මාන්තයේ නම</u> | TEC | DPC | MPC |
|---|---|---|---|
| වෛද්‍ය පීඨයේ තට්ටු 10 ගොඩනැගිල්ල | 2024.01.12 | 2024.01.31 | 2024.02.09 |
| AHS ගොඩනැගිල්ල | 2024.02.09 | 2024.03.05 | 2024.03.18 |
| NAVAL ගොඩනැගිල්ල | 2023.12.06 | 2024.01.31 | රු.මිලියන200ට අඩු අගයක් බැවින් නිර්දේශයට අදාළ නොවේ. |

ඒ අනුව ඉහත ව්‍යාපෘති වල TEC , DPC ,MPC නිර්දේශ හා අනුමැතින් ලැබී ඇත්තේ අදාළ ගිණුම් වර්ෂයේ ගිණුම් කාලසීමාවෙන් පසුව වේ. ගිණුම් පිළියෙල කර සියලු උපලේඛණ සහිතව 2024.02.28 දිනට පෙර ගිණුම් ඉදිරිපත් කළ යුතු හෙයින් මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය හා සාධාරණ තත්වය ඉදිරිපත් කළ යුතු හෙයින් සහ ඒ වන විටත් VAT සම්බන්ධයෙන් නිසි අනුමැතිය නොලැබී තිබූ හෙයින් තාක්ෂණික ඇගයීම් කමිටු ඇස්තමේන්තු පදනම් කොට ගෙන ගිණුම් වලට ගැලපීම් කොට ඇත.මෙය ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමක් වන අතර ගිණුම් ප්‍රමිත වලට අනුව නිවැරදි ඉදිරිපත් කිරීමකි.

මේ වන විට අදාල බිල්පත් හා අනුමැතින් ලැබී ඇති අතර මේ වන විට නිසිපරිදි ගිණුම්ගත කර ඇත.

NAVAL ගොඩනැගිලි 02 ක් ඉදිකිරීම් කළ ඇති

| | | |
|---|---|---|
| | | අතර මෙහි හපුගල පිහිටි ගොඩනැගිල්ල ඉදිකිරීම් නිම කර 2022.11.13 සිට භාවිතා කරන අතර මාගල්ලේ පිහිටි ගොඩනැගිල්ල 2023.11.26 දින සිට ඉදිකිරීම් නිම කර භාවිතා කරනු ලබයි.කෙසේ වුවද මෙම ගොඩනැගිලිවල අවසාන බිල්පත ගිණුම් පිළියෙල කරන දින තෙක් විශ්වවිද්‍යාලයට නොලැබුනු අතර ගිණුම් ප්‍රකාශ පිලියෙල කරන දින වන විට මෙම ගොඩනැගිලි භාවිතයට ගන්නා හෙයින් නොපමාව මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කල යුතු හෙයින් ඉංජිනේරුවරයාගේ දළ ඇස්තමේන්තුවක් ලබා ගෙන මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල අගය ඉදිරිපත් කරන ලදී.මෙය මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය හා සාධාරණ අගය ඉදිරිපත් කිරීම සඳහා ඇස්මේන්තු අගය අනුව ඉදිරිපත් කිරීම් කර ඇත. මෙය ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමක් වන අතර ගිණුම් ප්‍රමිත වලට අනුව නිවැරදි ඉදිරිපත් කිරීමකි.මේ වන විටද මෙහි අදාළ අවසාන බිල්පත විශ්වවිද්‍යාලයට ලැබී නොමැත. |
| | (ඈ) 2020 වර්ෂයේ වැඩිපුර ගෙවන ලද රු.2,726,945ක කාර්ය මණ්ඩල වැටුප් අයවිය යුතු වැටුප් ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට එම ප්‍රමාණය පිළිවෙලින් හර හා බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී එම මුදල බැඳුම්කර කඩකිරීම් අරමුදල් ගිණුම (Bond Violation Account) බැර කර ලැබිය යුතු බැඳුම්කර කඩකිරීම් ගිණුම (Bond Violation Receivable Account) හර කර තිබුණි. | විගණක විසින් පෙන්වා දෙන ලද විගනණ විමසුම මේ වන විට නිවැරදි කර ඇත. ***ඇමුණුම 02*** මගින් අදාළ ජර්නල් සටහන ඉදිරිපත් කර ඇත. |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන යටතේ වර්ෂයට අදාළ ශිෂ්‍යාධාර රු.77,486,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ ආදායම හා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණනයේ පෙන්වා දී ඇති කරුණු නිවැරදි වුවද අවසාන ගිණුම් සඳහා ආදායම හා වියදම යන දෙකම එකම අගයකින් වෙනස් වී ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනයේ අතිරික්තයට කිසිදු බලපෑමක් සිදු වී නොමැත.කෙසේ වුවද අදාළ ගැළපීම් 2024 වර්ෂයේ නිවැරදි කිරීම් සිදුකර අදාළ ජර්නල් සටහන ***ඇමුණුම 03*** මගින් ඉදිරිපත් කර ඇත. |
| | (ඉ) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික රු.2,573,585ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ පාරිතෝෂික වියදම හා පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.<br><br>ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය | අදාළ පාරිතෝෂිත ගණනය කිරීම සිදුකර ඇත්තේ මුදල් අංශයට ලැබූ මුල් පත්වීම් ලිපිය පදනම් කොට ගෙන වන අතර පසුව එක් එක් සේවකයා ස්ථිර සේවයට බඳවා ගැනීමට පෙර තාවකාලිකව සේවය කල කාලය අන්තර්ග්‍රහණය කර ඇති විට සහ නොමැති විට එම තොරතුරු මුදල් අංශයට නොලැබීම මත මෙම වෙනස්කම් සිදුවීමට ඉඩ ඇත.එබැවින් අදාළ උපලේඛණය ආයතන අංශයට ඉදිරිපත් කොට ඇති අතර එම අංශය මගින් කරනු ලබන සහතිකයට අනුව මෙම |

| | | |
|---|---|---|
| | කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. | වර්ෂය තුළ අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇති අතර අදාළ ජර්නල් සටහන ***ඇමුණුම අංක 04*** මගින් ඉදිරිපත් කර ඇත . |
| 1.3 | **විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**<br><br>මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.<br><br>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.<br><br>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.<br><br>විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වාර්තාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත. | දැන ගැනීම සඳහා. |
| 1.4 | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**<br><br>මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම | දැන ගැනීම සඳහා. |

| | | |
|---|---|---|
| | වේ.<br><br>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.<br><br>විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.<br><br>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, **විශ්වවිද්‍යාලයේ** වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. | |
| 1.5 | **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**<br><br>සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.<br><br>ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,<br><br>• ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන | දැන ගැනීම සඳහා. |

| | | |
|---|---|---|
| | ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.<br><br>• අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.<br><br>• භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.<br><br>• සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.<br><br>• මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.<br><br>මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි. | |
| 2. | **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | |

<table>
<tr><td></td><td></td><td rowspan="8">දැන ගැනීම සඳහා.</td></tr>
<tr><td>2.1</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .</td></tr>
<tr><td>2.1.</td><td>මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලයේ පවත්වාගෙන ගොස් තිබුණි.</td></tr>
<tr><td>2.1.</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.</td></tr>
<tr><td>2.1.</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.</td></tr>
<tr><td>2.2</td><td>අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.</td></tr>
<tr><td>2.2.</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.</td></tr>
<tr><td></td><td></td></tr>
<tr><td>2.2</td><td>2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.
<table>
<tr><th>නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව</th><th>නිරීක්ෂණ</th></tr>
<tr><td>අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික</td><td>2014 වර්ෂයේ සිට 2021</td></tr>
</table></td><td>
<table>
<tr><th>නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව</th><th>ලබා දී ඇති පිළිතුර</th></tr>
<tr><td>අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්</td><td>එම ව්‍යාපෘති සම්බන්ධව වැඩ ඉංජිනේරුතුමා විසින් යොමු කරන ලද</td></tr>
</table></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂය දක්වා පැවත එන එකතුව රු.36,044,249 ක් වූ තැන්පත් ශේෂයන් 34ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | තොරතුරු ඇමුණුම 05හි දැක්වේ. ඒ අනුව මෙම රඳවා ගැනීමේ මුදල් නිරවුල් කිරීම හෝ ආදායමට ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී මුදල් කමිටු පත්‍රිකාවක් යොමු කිරීමට නියමිතය |
| (ආ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 221/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු.4,611,856,429ක දේපල පිරියත හා උපකරණ සහ රු.27,070,448ක වූ අස්පෘශ්‍ය වත්කම්වලට අදාළව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | (ආ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 221/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද | රුහුණ විශ්ව විද්‍යාලය විසින් එක් එක් අංශයන්හි ස්ථාවර වත්කම් පවත්වා ගැනීම සඳහා ස්ථාවර වත්කම් කලමණාකරණ පද්ධතිය දැනට පවත්වා ගෙන යනු ලබන අතර මිලදී ගන්නා සියලුම ස්ථාවර වත්කම් මෙම පද්ධතියට ඇතුළත් කර ඇති අතර මෙම පද්ධතිය යාවත්කාලීන කිරීම පිණිස පාලන අංශය මගින් වාර්ෂිකව පවත්වනු ලබන තොග සමීක්ෂණය මෙම මෘදුකාංගයේ දත්ත පදනම් කොට ගෙන ඉටු කරන ලෙසත් එහිදී ඒ එක් එක් අංශවල ස්ථාවර වත්කම් ලේඛණය හා තොග සමීක්ෂණ වාර්තා අතර වෙනස්කම් නොපමාව මුදල් අංශය වෙත වාර්තා කරන ලෙසත් පැහැදිලිව දැනුම් දී ඇත.එම අදාළ වාර්තා ලැබූ විගස ස්ථාවර වත්කම් කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත. අප විසින් මෙම වාර්තා 2021 වර්ෂයේ සිට ඉල්ලුම් කර ඇති නමුත් අදාළ වාර්තා ලැබී නොමැති අතර මේ වන වට 2023 වසරේ සමීක්ෂණ කටයුතු කර ගෙන යනු ලබන බව පාලන අංශයෙන් අප වෙත වාර්තා කොට ඇත. |

<table>
<tr><td></td><td></td><td><table><tr><td></td><td>ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීම මුදල් අංශයට පමණක් කළ නොහැකි අතර මේ සඳහා සියලු පරිපාලන නිලධාරින්ගේ උපරිම සහයෝගය අවශ්‍ය බව වැඩිදුරටත් දන්වා සිටිමි.</td></tr></table></td></tr>
<tr><td>2.2.</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.</td><td rowspan="2">දැන ගැනීම සඳහා</td></tr>
<tr><td>2.2.</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.</td></tr>
<tr><td>2.3</td><td>වෙනත් කරුණු<br><br>(අ) ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලය වෙත භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත්වීම මත සැපයුම්කරුවන්ගෙන් අය කරනු ලැබූ ප්‍රමාද ගාස්තු සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත ප්‍රසම්පාදන කමිටුව ආපසු ගෙවීමට තීරණය කිරීමෙන් 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් රු.2,127,306 ක් හා රු.413,454 ක් විශ්වවිද්‍යාල අරමුදලට අහිමි වී තිබුණි.</td><td>ගිවිසුම්ගත කාල පරිච්ඡේදය තුළ සැපයුම්කරුවන්ගෙන් අය කරනු ලැබූ ප්‍රමාද ගාස්තු සැපයුම්කරුවනගේ ඉල්ලීම මත ප්‍රසම්පාදන කමිටුව ආපසු ගෙවීමට තීරණය කර තිබුනේ මුදල්, ආර්ථික ස්ථායීකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද MF/PF/02/CM/2022/131 චක්‍රලේඛය හා එම කාල පරිච්ඡේදයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන බව දන්වා සිටිමි. කෙසේ වෙතත් ප්‍රමාද ගාස්තු ගෙවීමේදී විශ්වවිද්‍යාලය තවදුරටත් රඳවා ගෙන ඇති ප්‍රමානයන් පහත වගුව මඟින් පෙන්වා දිය හැකිය.<br><br><table>
<tr><th>සැපයුම්කරු</th><th>අයකල ප්‍රමාද ගාස්තු</th><th>නැවත ගෙවූ මුදල</th><th>විශ්වවිද්‍යාලය රඳවාගත් ප්‍රමාණය</th></tr>
<tr><td>VS information Systems (pvt)Ltd</td><td>3,497,200.00</td><td>1,748,600.00</td><td>1,748,600.00</td></tr>
<tr><td>DSI Showroom</td><td>14,859.00</td><td>14,859.00</td><td>-</td></tr>
<tr><td>Softlogic Compute</td><td>21,612.0</td><td>19,450.8</td><td>2,161.20</td></tr>
</table></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| rs | 0 | 0 | |
| Avon Pharmo Chem (pvt)Ltd | 81,400.00 | 20,250.00 | 61,150.00 |
| DB Gangoda | 56,400.00 | 28,200.00 | 28,200.00 |
| Prasanna Furniture | 464,600.00 | 232,300.00 | 232,300.00 |
| Hemsons International | 213,761.70 | 63,572.38 | 150,189.32 |
| Orel Corporation | 265,700.00 | 265,700.00 | - |
| Orel Corporation | 145,332.00 | 145,332.00 | - |
| State timber | 2,422.44 | 2,422.44 | - |

| | | | |
|---|---|---|---|
| | (ආ) | 2019 වර්ෂයේ දී ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨය විසින් රු.9,524,500 ක වියදමක් දරා අත්පත් කර ගත් අක්කර 03ක ඉඩම අදාළ කාර්යය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | 2022.10.31 දින වන විට වෛද්‍ය පීඨය මසකට රු. 221500/- බැගින් වාරික 43ක් එනම් 9,524,500ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් මෙම ඉඩම 2023 වර්ෂය වන විට සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ මට්ටම දක්වා සංවර්ධනය කල නොහැකි වූ අතර, එම ඉඩමෙහි ඉදි කිරීමට අපේක්ෂා කරන ක්‍රීඩා භූමියෙහි දළ සැලැස්ම 2023.10.05 දින පැවති විශ්වවිද්‍යාලයීය ඉඩම් හා ගොඩනැගිලි කමිටු රැස්වීම සඳහා යොමු කර අනුමත කර ගන්නා ලදී. ටෙන්ඩර් පරිපාටිය අනුව ලැබෙන මුදල් ප්‍රතිපාදන මත ඉදිකිරීම් කඩිනමින් සිදුකර මෙම ක්‍රීඩා පිටිය සිසුන්ගේ පරිහරණය සඳහා ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| | (ඇ) | පර්යේෂණ හා ව්‍යාපෘති සඳහා වෛද්‍ය පීඨයට | වෛද්‍ය පීඨයේ Lung Function Testing of |

| | | | |
|---|---|---|---|
| | | ලැබී තිබුණු රු.1,408,463 ක් වසර 04 කට අධික කාලයක සිට උපයෝජනය කර නොතිබුණි. | Employees Working in the Manufacturing Plants of Asbestos Related product in Sri lanka (1C03206) යන ව්‍යාපෘතියේ 2023.12.31දිනට ශේෂය වූ රු.459,301.07 මුදල ව්‍යාපෘති සම්බන්ධීකාරකගේ ඉල්ලීම පරිදී 2024.02.05 දරන මුදල් අනුකමිටු හා 2024-2 පාලක සභා අනුමැතිය යටතේ 2024.07.29 වන දින 075270 චෙක් අංක යටතේ Chrysotile Information Center වන අදාළ ප්‍රදාන ආයතනය වෙත ආපසු යවා ඇත.<br><br>Encourage Accreditation- Medicine (1C02097) යන ව්‍යාපෘතියේ 2023.12.31දිනට ශේෂය වූ රු.949,162.72 ක වටිනාකම දීර්ඝ කාලයක සිට උපයෝජනය කර නොමැති අතර විගණනය විසින් පෙන්වා දුන් පරිදි ඒ පිළිබඳ සොයා බලා මුදල් අනුකමිටු හා පාලක සභා අනුමැතිය යටතේ එම වටිනාකම සම්බන්ධයෙන් කටයුතු කිරීමට **ඉදිරියේදී** පියවර ගන්නා බව දන්වනු කැමැත්තෙමි. |
| | (ඇ) | විශ්වවිද්‍යාල භූමියේ ඉදිකර තිබුණු දුරකථන කුළුනු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන්ගෙන් අය විය යුතු රු.5,387,070 ක ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. එම ශේෂය තුළ 2014 – 2021 වර්ෂ සඳහා රු.1,763,613 ක් ද 2022 වර්ෂය සඳහා රු.1,172,651 ක් සහ 2023 වර්ෂය සඳහා රු.2,450,806 ක් වශයෙන් අයවිය යුතුව පැවතුණි. | රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම, මාපලාන කෘෂි පීඨය සහ හපුගල ඉංජිනේරු පීඨ භූමියන්හි සවිකර ඇති මොබිටෙල් කුළුනු සඳහා රුහුණ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල් ආයතනය සමඟ 2019 වර්ෂයේ සිට ගිවිසුමකට එළඹ ඇත. ඒ අනුව 2019 ජනවාරි මාසයේ සිට 2023 නොවැම්බර් දක්වා අදාල අයවිය යුතු මුදල් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත. |
| | (ඉ) | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයෙකු වශයෙන් සේවය කරන ලද රුහුණ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවූ වැටුප් හා දීමනා වලින් රු.1,255,525 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම ආයතනයෙන් අයවිය යුතුව පැවතුණි. | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියෙන් අයවිය යුතු මුලු ශේෂයෙන් රු.350,049.19 මුදලක් 2024.01.31 දින වන විට අය වී ඇති අතර ඉතිරි ශේෂය අයකිරීම සම්බන්ධව එම අධිකාරියද අදාළ නිලධාරියාද ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර ඇත. |
| | (ඊ) | වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුහුණ විශ්වවිද්‍යාලය විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමක් සමඟ එකඟ වූ ගිවිසුම, සමාගමේ දුර්වල කාර්ය සාධනය මත 2020 ජනවාරි 03 අවසන් කර තිබූ අතර ඒ වෙනුවෙන් 2022 නොවැම්බර් 30 දින ලංකා බැංකුවෙන් ලැබුණු රු.42,544,131ක කාර්ය | වෛද්‍ය පීඨයේ මහල් 12 ගොඩනැගිල්ල සෑදිම වෙනුවෙන් පළමු කොන්ත්‍රාත්කරු වන Link Engineer (Pvt) Ltd විසින් අදාළ ඉදිකිරීම සම්බන්ධව විශ්වවිද්‍යාලයට එරෙහිව නඩු අංක ARB/06/20/UR යටතේ බේරුම්කරණය නඩුවක් පනවා ඇති අතර මේ සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් අප |

| | | | |
|---|---|---|---|
| | | සාධන බැඳුම්කර වටිනාකම එම කර්මාන්තය සඳහා වියදම් නොකර සැපයුම් ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීමේ ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | විශ්වවිද්‍යාලය කිහිපවරක් උපදෙස් ඉල්ලා සිටි අතර මේ වන තෙක් ඒ සම්බන්ධ උපදෙස් අප වෙත ලැබී නොමැත. කෙසේ වුවද විගණන විමසුම පදනම් කර ගෙන අදාළ වටිනාකම ගිණුම්වල ගැළපීමට කටයුතු කර ඇත. (ඇමුණුම 06 ) |

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන**
**උපකුලපති**
**රුහුණ විශ්වවිද්‍යාලය**
**2024.10.10**

University of Ruhuna,Wellamadama,Matara (81000) , Sri Lanka

Web: www.ruh.ac.lk
Facebook : www.facebook.com/universityofruhunasl
Tel. : +94 412222681 – 2
Fax : +94 412227001